72 වන කාණ්ඩය
4 වන කලාපය

සඳුදා
1967 ජූලි 17

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

## නිල වාර්තාව

### අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදනය [තී. 401] :
ව්‍යවස්ථාදායක කාරක සභා

පෞද්ගලික මන්ත්‍රීන්ගේ කෙටුම්පත් පනත් [තී. 404] :
**Galle Municipal Staffs Benevolent Association (Incorporation) Bill**—[සුගතදාස අරඹවල මයා.]
පළමුවන වර කියවන ලදී.

අග්‍රාණ්ඩුකාරතුමාගේ කථාව [තී. 405] :
ස්තුති යෝජනාව පිළිබඳ විවාදය [හතරවන දිනය]
විවාදය ඉදිරියට ගෙන යන ලදී.

අග්‍රාණ්ඩුකාරතුමාගෙන් ලත් සන්දේශය [තී. 630]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 72
இல. 4

திங்கட்கிழமை
17 ஜூலை 1967

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகார அறிக்கை

பிரதான உள்ளடக்கம்


அறிவிப்பு : [ப. 401] :
சட்டவாக்க நிலையற் குழுக்கள்

தனியங்கத்தவர் மசோதா [ப. 404] :
**Galle Municipal Staffs Benevolent Association (Incorporation) Bill—**
[திரு. சுகததாச அரம்பவெல]
முதன்முறை மதிப்பிடப்பட்டது.

மகாதேசாதிபதியினது பேச்சு [ப. 405] :
உரை மீதான விவாதம் [நான்காம் நாள்]
விவாதம் ஒத்திவைக்கப்பட்டது

மகாதேசாதிபதியிடமிருந்து வந்த செய்தி [ப. 630]


---

Volume 72
No. 4

Monday
17th July 1967

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS


**ANNOUNCEMENT [Col. 401]:**
**Legislative Standing Committees**

**PRIVATE MEMBER'S BILL [Col. 404]:**
**Galle Municipal Staffs Benevolent Association (Incorporation) Bill**—[Mr. Sugathadasa Arambewela]
**Read the First time**

**GOVERNOR-GENERAL'S SPEECH [Col. 405]:**
**Debate on the Address** [*Fourth Day*]
**Debate adjourned**

**MESSAGE FROM THE GOVERNOR-GENERAL [Col. 630]**


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

## பிரதிநிதிகள் சபை

## *House of Representatives*

**1967 ජූලි 17 වන සඳුදා**

*திங்கட்கிழமை, 17 ஜூலை 1967*

*Monday, 17th July 1967*

---

පූ. භා. 10ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. නියෝජ්‍ය කථානායකතුමා [සී. එස්. ෂර්ලි කොරයා මයා.] මූලාසනාරූඪ විය.

*சபை, மு.ப. 10 மணிக்குக் கூடியது. உபசபாநாயகர் அவர்கள் [திரு. சீ. எஸ். ஷேர்லி கொறயா] தலைமை தாங்கினார்கள்.*

*The House met at 10* A.M., MR. DEPUTY SPEAKER [MR. C. S. SHIRLEY COREA] *in the Chair.*

---

## නිවේදනය

### அறிவிப்பு

### ANNOUNCEMENT

### ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව

*சட்டவாக்க நிலையற் குழுக்கள்*

LEGISLATIVE STANDING COMMITTEES

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

122 වන ස්ථාවර නියෝගය අනුව තේරීම් කාරක සභාව විසින් මතු සඳහන් වන මන්ත්‍රීන්, "ඒ" සහ "බී" ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවල සේවය සඳහා නම් කර ඇත:

**"ඒ" ස්ථාවර කාරක සභාව**

එම්. ෆලීල් අබ්දුල් කෆූර් මයා., එම්.බී.ඊ.
එම්. එස්. අමරසිරි මයා.
කා. පො. ඉරත්තිනම් මයා.
චන්ද්‍රා කරුණාරත්න මයා.
පී. ජී. බී. කෙනමන් මයා.
එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
ඩී. ඊ. තිලකරත්න මයා.
බී. වයි. තුඩාවෙ මයා.
නීල් ද අල්විස් මයා.
වෛද්‍යාචාර්ය ඊ. එම්. වී. නාගනාතන්
ෆෙස්ටස් පෙරේරා මයා.
ජී. ජේ. පාරිස් පෙරේරා මයා.

2——එච් 5174—773 (67/7)



ආචාර්ය එන්. එම්. පෙරේරා
එස්. ඩී. බණ්ඩාරනායක මයා.
වෛද්‍යාචාර්ය ඒ. රත්නපාල
ආර්. පී. විජේසිරි මයා.
එම්. සිවසිතම්පරම් මයා.
මෛත්‍රීපාල සේනානායක මයා.
ආර්. ජී. සේනානායක මයා.
එස්. බී. හේරත් මයා.

**"බී" ස්ථාවර කාරක සභාව**

එම්. අබ්දුල් බකීර් මාකර් මයා.
ජෝර්ජ් අබයගුණසේකර මයා.
සුගතදාස අරඹවල මයා.
පී. බී. ජී. කලුගල්ල මයා.
එච්. කුලරත්න මයා.
ලෙස්ලි ගුණවර්ධන මයා.
ප්‍රින්ස් ගුණසේකර මයා.
වී. ධර්මලින්ගම් මයා.
එස්. එම්. මානික්කරාජා මයා.
සී. එන්. මැතිව් මයා.
ඩී. බී. රණතුංග මයා.
එස්. බී. ලේනව මයා.
පර්සි වික්‍රමසිංහ මයා.
වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
ඩී. බී. විජේතුංග මයා.
පී. බී. ඒ. වීරකෝන් මයා.
ටී. සිවසිතම්පරම් මයා.
එස්. කේ. කේ. සූරියාරච්චි මයා.
බර්නාඩ් සොයිසා මයා.
ටී. බී. එම්. හේරත් මයා.

In terms of Standing Order No. 122, the following Members have been nominated by the Committee of Selection to serve on Legislative Standing Committees "A" and "B":

STANDING COMMITTEE "A"

Mr. M. Falil Abdul Caffoor, M.B.E.
Mr. M. S. Amarasiri
Mr. K. P. Ratnam
Mr. Chandra Karunaratne
Mr. P. G. B. Keuneman
Mr. F. R. Dias Bandaranaike
Mr. D. E. Tillekeratne
Mr. B. Y .Tudawe
Mr. Neal de Alwis
Dr. E. M. V. Naganathan
Mr. Festus Perera

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම්

Mr. G. J. Paris Perera
Dr. N. M. Perera
Mr. S. D. Bandaranayake
Dr. A. Ratnapala
Mr. R. P. Wijesiri
Mr. M. Sivasithamparam
Mr. Maithripala Senanayake
Mr. R. G. Senanayake
Mr. S. B. Herat.

STANDING COMMITTEE "B"

Mr. M. Abdul Bakeer Markar
Mr. George Abeyagoonasekera
Mr. Sugathadasa Arambewala
Mr. P. B. G. Kalugalla
Mr. H. Kularatne
Mr. Leslie Goonewardene
Mr. Prins Gunasekera
Mr. V. Dharmalingam
Mr. S. M. Manickarajah
Mr. C. N. Mathew
Mr. D. B. Ranatunga
Mr. S. B. Lenawa
Mr. Percy Wickremasinghe
Dr. S. A. Wickremasinghe
Mr. D. B. Wijetunga
Mr. P. B. A. Weerakoon
Mr. T. Sivasithamparam
Mr. S. K. K. Suriarachchi
Mr. Bernard Soysa
Mr. T. B. M. Herath

## මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම්

*சபை அமர்வுகள்*

## SITTINGS OF THE HOUSE

**ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති හා සභානායක)**

*(கௌரவ சீ. பீ. டி சில்வா—காணி, நீர்ப் பாசன, மின்விசை அமைச்சரும் சபை முதல் வரும்)*

(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

මෙම යෝජනාව මම ඉදිරිපත් කරමි:

"අද දින විසිර යැමේදී මන්ත්‍රී මණ්ඩලය 1967 ජූලි මස 18 වැනි අඟහරුවාදා පූ. භා. 10 වන තෙක් කල් තැබිය යුතුය."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

පෞද්ගලික මන්ත්‍රීන්ගේ කෙටුම්පත් පණත්

**ගරු සී. පී. ද සිල්වා**

*(கௌரவ சீ. பீ. டி சில்வா)*

(The Hon. C. P. de Silva)

මෙම යෝජනාව මම ඉදිරිපත් කරමි:

"අංක 8 දරණ සථාවර නියෝගයේ කුමක් සඳහන් වී තිබුණද 1967 ජූලි මස 18 වැනි අඟහරුවාදා මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම පූ. භා. 10 සිට දවල් 12 දක්වා ද; ප. භා. 2 සිට ප. භා. 7.30 දක්වා ද විය යුතුය; කථානායකතුමා ප. භා. 7.30ට ප්‍රශ්නය නොවිමසා මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම කල් තැබිය යුතුය."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ කෙටුම්පත් පණත්

*தனி அங்கத்தவர் மசோதா*

## PRIVATE MEMBERS' BILL

### GALLE MUNICIPAL STAFFS BENEVOLENT ASSOCIATION (INCORPORATION) BILL

**සුගතදාස අරඹෙවල මයා. (අක්මීමන)**

*(திரு சுகததாச அரம்பவல—அக்மீமன)*

(Mr. Sugathadasa Arambewala—Akmeemana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "Bill to incorporate the Galle Municipal Staffs Benevolent Association" නමැති, ගාලු නගර සභාවේ සේවක සින්ගේ ශුභසාධක කටයුතු සම්බන්ධයෙන් සම්පාදනය කරන ලද පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දෙන ලෙස ඉල්ලා සිටිමි.

**එම්. එස්. අමරසිරි මයා. (හිනිදුම)**

*(திரு. எம். எஸ். அமரசிறி—ஹினிதும)*

(Mr. M. S. Amarasiri—Hiniduma)

විසින් ස්ථිර කරන ලදී.

ஆமோதித்தார்.

*Seconded.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත වීය.

කෙටුම්පත් පනත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

වාර්තා කිරීම සඳහා 51 (4) වන සථාවර නියෝගය යටතේ කෙටුම්පත් පනත පළාත් පාලන ඇමති වෙත පවරන ලදී.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

இதன்படி, மசோதா முதன்முறை மதிப்பிடப்பட்டு அச்சிடப்படப் பணிக்கப்பட்டது.

மசோதா, நிலையற்கட்டளை இல. 51 (4) இன்படி உள்ளூராட்சி அமைச்சருக்கு, அறிக்கை செய்யப்படுதற் காகச் சாட்டப்பட்டது.

*Question put, and agreed to.*

*Bill accordingly read the First time, and ordered to be printed.*

*The Bill stood referred, under Standing Order No. 51 (4), to the Minister of Local Government for report.*

## අග්‍රාණ්ඩුකාරතුමාගේ කථාව : ස්තුති යෝජනාව පිළිබඳ විවාදය [හතරවන දිනය]

## மகா தேசாதிபதியினது பேச்சு : உரை மீதான விவாதம் [நான்காம் நாள்]

## GOVERNOR-GENERAL'S SPEECH : DEBATE ON THE ADDRESS [FOURTH DAY]

ඉදිරිපත් කරන ලද සංශොධන [ජූලි 15] පිළිබඳ කල් තබන ලද විවාදය නැවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාළ ප්‍රශ්නය— [ජූලි 8]

ஜூலை 15 ஆம் தேதி கொண்டுவரப்பட்ட திருத்தப் பிரேரணைகளின் மீதான ஒத்திவைக்கப்பட்ட விவா தத்தை மீண்டும் ஆரம்பிப்பதற்கான கட்டளை வாசிக் கப்பட்டது—[8, ஜூலை]

*Order read for resuming Adjourned Debate on Amendments* [15*th July*] *to Question*—[8*th July*].

" අතිගරු අග්‍රාණ්ඩුකාරතුමන් විසින් පවත්වන ලද කථාවට පිළිතුරු වශයෙන් මෙම මන්ත්‍රි මණ්ඩලය විසින් පහත දැක්වෙන ස්තුති යෝජනාව ඉදිරිපත් කළ යුතුය :

' අතිගරු උතුමාණනි,

පාර්ලිමේන්තුව විවෘත කිරීමේදී ඔබතුමාණන් විසින් පවත්වන්නට යෙදුණු කථාව වෙනුවෙන් නියෝජිත මන්ත්‍රි මණ්ඩලයේ සාමාජිකයෝ වන අපි ඔබතුමාණන්ට ස්තුති කරමු. අප වෙත ඉදිරිපත් කරන ලද සියලුම කරුණුවලට අපගේ අවධානය යොමු කරන බව අපි ඔබතුමාට සථිර ලෙස ප්‍රකාශ කරමු.' " [රණතුංග මයා.]

" மேன்மை தங்கிய மகா தேசாதிபதி அவர்களால் நிகழ்த்தப்பட்ட பேச்சுக்கு மறுமொழியாக இச்சபை பின்வரும் நன்றியுரையைச் சமர்ப்பிப்பதாக :

' மேன்மை தங்கிய உத்தம,

பாராளுமன்றத் திறப்பின்போது மேன்மை தங்கிய தங்களால் நிகழ்த்தப்பட்ட பேச்சுக்கு, பிரதிநிதிகள் சபை அங்கத்தினராம் நாம் எங்களது நன்றியைத் தெரிவிக்கின்றோம். மேன்மை தங்கிய தங்களால் எம்முன் சமர்ப்பிக்கப்பட்ட எல்லா விடயங்கள் மீதும் எம் கவனத்தைச் செலுத்துவோம் என உறுதி பகர் கிறோம்.' "—[திரு. ரணதுங்க]

" That this House do present the following Address to His Excellency the Governor-General in reply to his Speech :

' May it please Your Excellency,

We, the Members of the House of Representatives, thank Your Excellency for the Speech with which you have been pleased to open Parliament. We assure Your Excellency that we shall give our attention to all matters placed before us.' "—[*Mr. Ranatunga.*]

යෝජිත සංශෝධන, ප්‍රශ්නයේ අගට එකතු කිරීමට:

பிரேரணை இறுதியில் சேர்ப்பதற்காக எடுத்தியம்பப் பெற்ற திருத்தங்கள் :

*Which Amendments were, at the end of the Question, to add :*

I

" එතෙකුදුවුවත්, උතුමාණන් වහන්සේගේ රජය, එහි නීත්‍යානුකූල නිල කාලයෙන් අඩක් වූ ඉකුත් සැසි වාර දෙක තුළදී,

(අ) ලංකාවේ ස්වාධීනත්වයට හා ඒකීයත්වයට අන්තරායකර ;

(ආ) ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් වලට සහ නිදහසට හානි පැමිණවූ ;

(ඉ) ආර්ථිකයෙහි බැරෑරුම් හා ඉතා ගැඹුරු පිරිහී මක් මෙන්ම ජනතාවගේ ජීවන තත්ත්ව යෙහි සීඝ්‍ර පහත වැටීමක් ඇති කළ ;

(ඊ) දේශීය අභිමතාර්ථයන්ට සහ ජනතාවගේ ජීවිතයට සම්බන්ධ අවශ්‍යතාවන්ට පාඩු වන සේ විදේශීය හා දේශීය මුල් බැස ගත් ස්වර්ථවාදී කණ්ඩායම්වලට පුළුල් අනුග්‍රහයන් ලබාදුන් ;

(උ) දේශපාලන විරුද්ධවාදීන්ට එරෙහිව පළි ගැනීමේ ව්‍යාපාර ගෙනයනු සඳහාත් පළි ගැනීමේ චේතනාවෙන් රජයේ සේවක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යන්ට දඩුවම් පැමිණවීම සඳහාත් පරිපාලනමය බලතල අයුතු ලෙස යෙදවීම ලක්ෂණ කොට ගත් ;

(ඎ) 1965 මහා මැතිවරණයේ දීත් පසුව පැවැත්වූ පාර්ලිමේන්තු අතුරු මැතිවරණවලදීත්, පාර්ලිමේන්තුවේ පළමුවැනි හා දෙවන සැසිවාරයන්ට කරන ලද උතුමාණන් වහන්සේගේ කථාවලදීත් දෙන ලද බොහෝ පොරොන්දු ඉටු නොකළ අතර ඒවාට පට හැනිවූ ප්‍රතිපත්ති අනුගමණය කළ හෙයින් ද ;

තවද, උතුමාණන් වහන්සේගේ කථාව—

(1) රජයේ දේශපාලන, ආර්ථික සහ සදාචාරමය බංකොලොත් බව මෙන්ම ලංකාවත්, ලාංකික ජනතාවත් දැනට වැටී සිටින දේශපාලන ප්‍රතිගාමිත්වය, පරිපාලනමය ක්‍රියා විරහිත භාවය සහ ආර්ථික පරිහානිය පිළිබඳ මඩ වගුරින් ගොඩගැනීමට හැකි අංග සම්පූර්ණ ප්‍රතිපත්තියක් තබා පැහැදිලි ප්‍රතිපත්තියක් පමණවත් සකස් කිරීමට රජයට කිසි සේත්ම නුපුළුවන් බව හෙළි කරන හෙයින් ද ;

(2) විශේෂයෙන්ම උඩරට පෙදෙස්වල, ගොවි ජනතාවගේ සහ දේශීය ජනතාවගේ වෙනත් කොටස්වල නිත්‍යානුකූල අයිතිවාසිකම්වලට කොපමණ පාඩු සිදුවුවත්, බොහෝසේ බිය සැක ඇති කළ, ඉමහත් විරෝධයට හේතුවූ ඉන්දු-ලංකා ගිවිසුම (ක්‍රියාවට නැඟීම) පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට රජය අධිෂ්ඨානයෙන් සිටින බව පෙන්වන හෙයින් ද ;

(3) රජය සැදුම් ලබන දේශපාලන පක්ෂ විසින් පාලනය කෙරෙන ප්‍රාදේශීය බල මණ්ඩල ඇතුළු නොයෙක් ප්‍රාදේශීය බල මණ්ඩල විසින්ද සමස්ත ලංකා ද්‍රවිඩ සංගමය වැනි සුළු ජන අභිමතාර්ථ නියෝජනය කරන වෙනත් දේශපාලන පක්ෂ විසින් ද ප්‍රකාශ කර ඇති පුළුල් විරෝධය නොතකා, දැනට දිස්ත්‍රික්ක සභා පිහිටුවීම තරයේ ඉල්ලා සිටින එකම දේශපාලන පක්ෂය වූ ඉලංකායි තමිල් අරසු කච්චියේ ඇඩි ඉල්ලීම සලකා දිස්ත්‍රික්ක සභා පිහිටුවිමට රජය අධිෂ්ඨානයෙන් සිටින බව දක්වන හෙයින් ද ;

උතුමාණන් වහන්සේගේ කථාව, විශේෂ වශයෙන්—

(i) සියලු බලතල මහජනතාවගෙන්ම ලබා ගන්නා වූ සත්‍ය වශයෙන් ස්වාධීන, ස්වෛරී සහ ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවක් ඇති කරන නව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් ක්‍රියාත්මක කිරීමට පියවර කිසිත් යෝජනා කිරීමට අපොහොසත් වන හෙයින් ද ;

(ii) දින දහයක් හැර ගතවූ සැසි වාරය පුරා පැවති පක්ෂග්‍රාහී දේශපාලන පරමාර්ථයන් සඳහා යොදවනු ලබන මූළුමණීන් අසාධාරණ හදිසි තත්ත්වය අස්කර ගැනීමට රජය අදහස් කරන බවක් පෙන්නුම් නොකරන හෙයින් ද ?

(iii) රැකී රක්ෂා විරහිත භාවය සහ දිනපතා ප්‍රයෝජනයට ගැනෙන අත්‍යාවශ්‍ය ද්‍රව්‍යයන්ගේ අධික මිළ ගණන් සහ ඒවා හිඟවීම පිළිබඳ දරුණු ප්‍රශ්න විසඳීම පිණිස යෝජනා කිසිත් ඉදිරිපත් කරනු තබා, මෙම ප්‍රශ්න ගැන සඳහනකුදු නොකරන හෙයින් ද ?

(iv) කලින් පැවැති සහල් සලාකය නැවත ඇති කරලීමට හෝ මහ කන්නයේ අස්වැන්න අතින් වාර්තාවක් පිහිටුවීම පිළිබඳ උදම් අනතත් ආරෝග්‍යශාලාවල රෝගීන්ටවත් ප්‍රමාණවත් බත් ආහාර සැපයීමට හෝ රජය අදහස් කරන බවක් හෙළි නොකරන හෙයින් ද ;

(v) වාරිමාර්ග බද්ද අහෝසි කිරීම, ගොවි ජනපදවල කට්ටිකරුවන්ගෙන් අය කෙරෙන අධික අක්කර බද්ද අඩු කිරීම, පෞද්ගලික ට්‍රැක්ටර් හිමියන් දැනට කරන, ගැමියන් සූරාකෑම නතර කිරීම, බැංකු හා වෙනත් ණය දෙන ආයතනවලින් ගන්නා ණය මුදල් සඳහා ගෙවිය යුතු පොළිය අඩු කරලීම හා වෙනත් යම් යම් පියවර ගැනීම යන ක්‍රම යොදා, ඒ මගින් ගැමි ජනතාවට අද උසුලන්නට සිදු වී ඇති බර සැහැල්ලු කරන අදහසක් රජය කෙරෙහි ඇති බවක් සඳහන් නොවන හෙයින් ද ?

(vi) ජීවන වියදම ඉහළ යෑම හේතුකොටගෙන රාජ්‍ය හා පෞද්ගලික අංශවල නියුක්ත සේවකයින්ගේ නියම වේතන හා වැටුප් පිරිහීම නිසා ඒ අයට සිදුවී ඇති පාඩුව මකාලීම සහතික කරනු සඳහා යෝජනා ඇතුලත් නොවන හෙයින් ද ?

(vii) මාළු පිටරට යැවීම ගැන කියමින් පුරසාරම් දොඩන නමුත්, ලංකාවේ පාරිභෝගිකයන්ට ප්‍රමාණවත් තරම් මාළු සාධාරණ මිළට සපයා දීමටවත්, මාළු ඇල්ලීමේ යෙදී සිටින ජනතාවට විඳින්නට සිදු වී ඇති නොයෙකුත් දුෂ්කරතාවන් අඩුකරලීමටවත් අදහස් කරන බවත් සඳහන් නොවන හෙයින් ද ;

(viii) අත් යන්ත්‍රවලින් රෙදි විවීමේ හා හස්ත කර්මාන්තවල යෙදී සිටින විශාල ජනකායකගේ අභාග්‍යයටත්, විනාශයටත් හේතු වූ රජයේ වර්තමාන ප්‍රතිපත්ති අත්හරින්නට රජය අදහස් කරන බවක් නොපෙන්වන හෙයින් ද ;

(xi) රජයේ කාර්මික ප්‍රතිපත්තිය වනුයේ දැනට පවත්නා කාර්මික ව්‍යාපාරවලින් බොහෝමයකගේ ප්‍රගතියට හානි කරමින් ඒවායේ කාර්යක්ෂම ක්‍රියාකාරිත්වයටද බාධා කරන අතර, කලින් පැවති රජය තිබුණු කාලයේ ආරම්භ කරන ලද ව්‍යාපාර එසේම කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගෙන යෑම හා ඒවා පුළුල් කිරීම විනා ඊට වැඩි යමක් නොකිරීම බව හඟවන හෙයින් ද ;

(x) රජයේ ඉඩම් අක්කර දහස් ගණන් අතිරේක ආහාර ද්‍රව්‍ය වගාකිරීම සඳහා දේශීය හා විදේශීය ධනේශ්වර ව්‍යාපාරවලට පවරා දීමටත්, කුඹුරුවල වල් නෙලීම පිණිස දහස් ගණන් ශිෂ්‍ය ශිෂ්‍යාවන් බලහත්කාරයෙන් යෙදවීමත්, දේශපාලන පරමාර්ථ අරමුණු කොටගත් " ගොවි හමුදාවක් " ඇති කිරීමත් වැඩි වැඩියෙන් ආහාර වගා කරන් නැයි අසන්නන්ට ඇවිලි කරන හරයක් නැති ගී අසන්නන්ට තිත්ත වන නොක් තොර තෝන්චියක් නැතිව ලංකා ගුවන් විදුලි සංස්ථාව ලවා නැවත නැවත ප්‍රචාරය කරවීමත්, ආහාර අතින් ස්වයංපෝෂිතභාවය ලඟාකර ගැනීම සඳහා දරණ " මහා ප්‍රයත්නයක් " හැටියට පෙන්වීමේ මුලාව තවදුරටත් කරගෙන යෑමට රජය අදහස් කරන බව පෙනී යන හෙයින් ද ;

(xi) උසස් අධ්‍යාපනය දැනටමත් සීමාකර තිබෙනවා මදිවාට නිදහස් අධ්‍යාපන ක්‍රමයට හානි කිරීමේ ප්‍රතිපත්තියද වෙනස් කර නැති බව හැඟෙන හෙයින් ද ;

(xii) බලංගොඩ අතුරු මැතිවරණ කාලයේ දී රජය පුන පුනා කථා කළ නින්දගම් පනත කෙරෙහි දැන් සැලකිල්ලක් නොමැති බව හෙළි කරන හෙයින් ද ;

(xiii) රජයේ සේවකයින්ට දේශපාලන අයිතිවාසිකම් දීම පිළිබඳව කිසිම අදහසක් හෙළිදරව් නොකරන හෙයින් ද ;

(xiv) දැනට තදින් පැතිර තිබෙන, විශේෂයෙන් උසස් තැන්වල පවතින දූෂණ නැවැත්වීම ගැන රජය තුළ කිසිම අදහසක් ඇති බව හෙළිදරව් නොකරන හෙයින් ද ;

උතුමාණන් වහන්සේගේ ආණ්ඩුව කෙරෙහි මෙම සභාවේ විශ්වාසයක් නොමැති බව ප්‍රකාශ කර සිටිමු. "—[ආචාර්ය එන්. එම්. පෙරේරා]

" எனினும், மேன்மை தங்கிய தங்களது அரசாங்கம் அதன் பதவித் தவணையின் பாதிக்காலமாகிய இரண்டு கூட்டத் தொடர்களிலும் கைக்கொண்ட கொள்கைகள்—

(அ) இலங்கையின் சுதந்திரத்தையும் பிரிக்க முடியாத தன்மையையும் ஆபத்துக்குள்ளாக்கியும் ;

(ஆ) மக்களின் சனநாயக உரிமைகளையும் சுதந்திரத்தையும் அவமதித்தும்,

(இ) பொருளாதாரத்தில் பாரதூரமான பெரும் விழுக்காட்டை உண்டுபண்ணி மக்களின் வாழ்க்கைத் தரத்தைப் பெருமளவில் குறைத்தும்;



(ஈ) தேசிய நலன்களையும், மக்களின் அவசிய தேவைகளையும் பணயம் வைத்து, பிற நாட்டிலும் உள் நாட்டிலுமுள்ள தன்னலவாதிகட்குப் பெரும் சலுகைகளைக் கொடுத்தும்;

(உ) நிருவாக அதிகாரத்தைத் துஷ்பிரயோகம் செய்து, அரசியல் எதிரிகட்கெதிராக வஞ்சம் சாதிக்கவும், அரசாங்க ஊழியரைப் பழிவாங்கவும் பயன் படுத்தியும்;

(ஊ) 1965 ஆம் ஆண்டுப் பொதுத் தேர்தலிலும் பின்னர் நடந்த பாராளுமன்ற உப தேர்தல்களிலும், பாராளுமன்றத்தின் முதலாம் இரண்டாம் கூட்டத்தொடர்களில் மேன்மை தங்கிய தங்களது பிரசங்கங்களிலும் கொடுக்கப்பட்ட வாக்குறுதிகள் பலவற்றை நிறைவேற்றாமலும், அதில் பலவற்றுக்கு முரணாக நடந்தும் இருப்பதாலும்;

மேலும், இப்பிரசங்கம்—

(1) அரசியல், பொருளாதார, நீதி நெறித் துறைகளில் அரசாங்கத்தின் வெறுமையையும், இலங்கையையும் அதன் மக்களையும் தற்போதுள்ள அரசியல் மாறுட்டம், நிர்வாகச செயலின்மை, பொருளாதார விழுக்காடு ஆதியன கொண்ட படுகுழியிலிருந்து மீட்பதற்கு ஒரு விரிவான அல்லது ஓரளவேனும் இணங்கக் கூடியதான கொள்கையினை வகுக்க முடியாத தன்மையையும் வெளிக்காட்டுவதாலும்;

(2) விவசாயிகளும், இதர பிரிவினரும் ஆகிய இந்நாட்டு மக்களின், முக்கியமாகக் கண்டிப் பகுதியினரின் முறைமையான நலன்களுக்கு என்னதான் நேர்ந்தாலும், பெரும் சந்தேகங் கட்கும், எதிர்ப்புக்கு முள்ளான இந்திய–இலங்கை உடன்படிக்கை (செயற்படுத்தல்) சட்டத்தை அனுஷ்டிப்பதென்று அரசாங்கம் திடங்கொண்டிருப்பதனைக் காட்டுவதாலும்;

(3) அரசாங்கத்திலுள்ள அரசியற் கட்சிகளின் கட்டுப்பாட்டில் உள்ளவை உட்பட்ட, உள்ளூராட்சிச் சபைகளினதும், அகில இலங்கைத் தமிழ்க் காங்கிரஸ் போன்ற சிறுபான்மையினரின் நலன் கருதும் அரசியற் கட்சிகளினதும் பரந்த எதிர்ப்பையும் பொருட்படுத்தாமல் தற்சமயம் மாவட்ட சபைகள் அமைக்கப்பட வேண்டுமெனக் கோரும் ஒரேயொரு அரசியற் கட்சியாகிய இலங்கைத் தமிழரசுக் கட்சியின் பிடிவாதமான கோரிக்கையை நிறைவேற்ற அரசாங்கம் மாவட்ட சபைகளை அமைக்கத் திடம் கொண்டிருப்பதைக் காட்டுவதாலும்;

அத்துடன் முக்கியமாக, இப்பிரசங்கம்,—

(i) மக்களிடமிருந்தே சகல அதிகாரத்தையும் பெறக்கூடிய உண்மையான சுதந்திர, ஆதிபத்திய, ஜனநாயகக் குடியரசை அமைப்பதற்கு வகை செய்யும் புதிய அரசியற்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

திட்டமொன்றை நடைமுறைக்குக் கொண்டு வருவதற்கான நடவடிக்கைகளைக் குறிப்பிடத் தவறியதாலும்;

(ii) கடந்த கூட்டத் தொடரில் பத்து நாட்களுக்கு மட்டுமில்லாதிருந்த முற்றிலும் அநீதியான பாரபட்சமான அரசியற் தேவைகட்குப் பயன்படும் அவசர கால நிலையை நீக்குவதற்கான யோசனை எதையும் அரசாங்கம் கூறத் தவறியதாலும்;

(iii) வேலையில்லாத் திண்டாட்டம், நாளாந்தத் தேவைகட்கான அத்தியாவசியப் பொருட்களுக்குத் தட்டுப்பாடு, அவற்றின் உயர் விலைகள், முதலிய பிரச்சினைகளைத் தீர்ப்பதற்குரிய ஆலோசனைகளைத் தராத பட்சத்தில் இப்பிரச்சினையையாவது குறிப்பிடத்தவறியதாலும்;

(iv) கட்டுப்பாட்டின் கீழ் முன்னர் கொடுக்கப்பட்ட அளவு அரிசியை மீண்டும் கொடுப்பதற்கு அல்லது காலபோகத்தில் முன்னொருபோதும் இல்லாத அளவு நெற்சாகுபடி செய்யப்பட்டதென்று பெருமையுடன் கூறிக்கொண்ட போதிலும் வைத்தியசாலைகளிலுள்ள நோயாளிகளுக்காவது உரிய சோற்றுத் தீனை கொடுப்பதற்கான ஆலோசனைகளைக் குறிப்பிடத் தவறியுள்ளதாலும்;

(v) நீர்ப்பாசன வரிகளை இரத்துச் செய்வதன் மூலமாகவும், குடியேற்றப் பகுதிகளில் குடியேற்றவாசிகள் மீது விதிக்கப்படும் நில வரியை இரத்துச் செய்வதன் மூலமாகவும் தனிப்பட்ட டிராக்டர் சொந்தக்காரர் தற்போது விவசாயிகளைச் சுரண்டும் முறையைத் தடுக்கும் நடவடிக்கைகளை எடுப்பதாலும், வங்கிகள் மற்றும் கடன் கொடுக்கும் தாபனங்கள் அளிக்கும் கடன்களுக்குரிய வட்டி விகிதத்தைக் குறைப்பதாலும், ஏனைய நடவடிக்கைகளை எடுப்பது மூலமாக விவசாயிகள் மீதுள்ள பளுவைக் குறைக்கும் நோக்கங்களைக் கொண்டிருப்பதாக எடுத்துக் காட்டாததாலும்;

(vi) வாழ்க்கைச் செலவு ஏறிக்கொண்டு வருவதால் அரசாங்க, தனித்துறையில் உள்ள சேவையாளர்களின் ஊதியத்தின் மதிப்புக்குறைவை ஈடுசெய்வதற்கான நடவடிக்கைகளைக் கொண்டிராததாலும்;

(vii) மீன் வகைகளை வெளிநாட்டுக்கு ஏற்றுமதி செய்வதாகப் பெருமையுடன் கூறிக்கொண்ட போதிலும் மீனவரின் கஷ்டங்களைக் குறைக்கவோ அல்லது இலங்கையிலுள்ள பாவனையாளர்களுக்கு நியாயமான விலையில் போதிய அளவு மீனை விற்கும் நோக்கம் கொண்டிருப்பதாக எடுத்துக் காட்டாததாலும்;

(viii) பெருந்தொகையான குடிசைக் கைத்தொழிற் பொருட்கள், கைத்தறித் துணிகள் உற்பத்தியில் ஈடுபட்டிருக்கும் பெருந்தொகையான மக்கட்கு நட்டத்தையும் அழிவையுங் கொண்டுவந்துள்ள தற்போதைய கொள்கைகளைக் கைவிடும் நோக்கம் கொண்டிருப்பதாகக் காட்டாததாலும்;

(ix) அரசாங்கத்தின் கைத்தொழிற் கொள்கையானது திறம்படக் கூறின் முந்திய அரசாங்கத்தின் காலத்தில் ஆரம்பிக்கப்பட்ட திட்டங்களைப் பெருப்பிக்கவோ அல்லது தொடர்ந்து நடத்துவதே எனக்காட்டும் அதே வேளையில் நடைமுறையில் தற்போதுள்ள பல திட்டங்களின் முன்னேற்றத்தைத் தடுத்தலும், திறம்படச் செயலாற்றுவதைப் பாதிக்கும் முறையிலுள்ளதெனக் காட்டுவதாலும்;

(x) முடிக்குரிய ஆயிரக்கணக்கான ஏக்கர் காணி நிலத்தை பிறநாட்டு உள்நாட்டு முதலாளித்துவ நலன்கட்குத் தானியச் செய்கைக்கென அளித்தும் நெற்காணிகளில் களை பிடுங்குவதற்கென ஆயிரக் கணக்கான பாடசாலை மாணவர்களை நிர்ப்பந்தித்து வேலை வாங்கியும், காணிப்பட்டாளத்தை அரசியல் நோக்குடன் உருவாக்கியும் இலங்கை ஒலி பரப்புக் கூட்டுத்தாபனத்தால் இரசிகர்களை உணவு உற்பத்தியைக் கூட்டும்படி கருத்தற்ற பல்லவியை மீண்டும் மீண்டும் கூறுவதாலும், இவையெல்லாம் உணவு சுயதேவை பூர்த்தியைப் பெற நடாத்தப்படும் பகீரதப் பிரயத்தனமெனக் காட்டி மக்களைத் தொடர்ந்து ஏமாற்றும் நோக்கத்தைக் காட்டுவதாலும்;

(xi) மேற்படிப்பிற்கென அளிக்கப்படும் சந்தர்ப்பங்களை ஏற்கெனவே தடுக்கும் நடவடிக்கைகளைக் கைக்கொண்டதுமல்லாமல் இலவசக்கல்வித் திட்டத்தைப் பாதிக்கும் முறையை மாற்றவில்லையெனக் காட்டியுள்ளதாலும்;

(xii) பலாங்கொடை உப தேர்தலின்போது பெருமளவில் பிரசாரஞ் செய்யப்பட்ட பரவணி நிலவுரிமைச் சட்டத்தில் அக்கறையிழந்துவிட்டதைக் காட்டுவதாலும்;

(xiii) அரசாங்க ஊழியர்களுக்கும் அரசியல் உரிமைகள் அளிக்கும் நோக்கத்தை எடுத்துரைக்காததாலும்;

(xiv) விசேடமாக. உயரிடங்களிலும், பொதுவாக எங்கும் பரந்திருக்கும் ஊழல்களைக் களைந்தெடுக்கும் நோக்கத்தை எடுத்துரைக்காததாலும்

மேன்மை தங்கிய தங்கள் அரசாங்கத்தின் மீது இச் சபைக்கு நம்பிக்கையில்லை." [கலாநிதி என். எம். பெரேரா]

"but inasmuch as Your Excellency's Government has, in the past two Sessions which cover half its permissible term of office, pursued policies that have—

(*a*) endangered the independence and indivisibility of Ceylon;

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(b) undermined the democratic rights and liberties of the people ;

(c) brought about a serious and deep-going deterioration in the economy and a sharp decline in the standard of living of the people ;

(d) made extensive concessions to foreign and local vested interests at the expense of national interests and the vital needs of the people ;

(e) been characterized by the abuse of administrative power in order to pursue vendettas against political opponents and to inflict vengeance upon public employees ; and

(f) failed to give effect and acted contrary to many of the promises made during the General Election of 1965, the subsequent Parliamentary by-elections, and in Your Excellency's Address to the *first* and *second* Sessions of Parliament ;

and further, as the Address :

(1) reveals the political, economic and moral bankruptcy of the Government and its complete inability to formulate a comprehensive or even coherent policy that can take Ceylon and its people out of the present morass of political reaction, administrative paralysis and economic decline ;

(2) shows that the Government, whatever may be the cost to the legitimate interests of the peasantry and other sections of the indigenous population, especially of the Kandyan areas, is determined to enforce the provisions of the Indo-Ceylon Agreement (Implementation) Act that has aroused such misgiving and opposition ; and

(3) indicates that the Government, despite the widespread opposition expressed by local authorities, including those controlled by constituent political parties of the Government, and by other political parties representing minority interests such as the All-Ceylon Tamil Congress, is determined to establish District Councils in response to the insistent demand of the Illankai Thamil Arasu Kachchi, which is the only political party that insists on the establishment of such councils at the present time ;

and, in particular, as the Address :

(i) fails to propose any steps to bring into effect a new Constitution that will establish a truly independent, sovereign and democratic Republic in which all power will be derived from the people ;

(ii) does not disclose any intention by the Government to withdraw the totally unjust State of Emergency that existed for all but ten days of the past Session and which is being used for partisan political purposes ;

(iii) does not even mention the acute problems of unemployment and the high prices and scarcities of essential articles in everyday use, let alone advance any proposals to solve these problems ;

(iv) does not disclose any intention by the Government to restore the former rice ration or, despite the boast of a record *Maha* harvest, even to provide patients in hospitals with adequate rice meals ;

(v) makes no reference to any intention by the Government to ease the burdens on the peasantry, through the abolition of irrigation rates, the reduction of the high acreage taxes levied from allottees in peasant colonies, the stopping of the present exploitation of the peasants by the private tractor owners, the reduction of the rates of interest on loans from banks and other lending institutions, and by other measures ;

(vi) contains no proposals to ensure that employees in the public and private sectors are compensated for the decline in their real wages and salaries as a result of the increased cost of living ;

(vii) while boasting of exporting fish abroad, makes no reference to any intention to see that consumers in Ceylon are supplied with an adequate quantity of fish at reasonable prices or that the many hardships of the fishermen are ameliorated ;

(viii) shows no intention by the Government to discontinue its present policies which have brought misfortune and ruin to large numbers of persons engaged in the production of handloom textiles and handicrafts ;

(ix) indicates that the industrial policy of the Government is, at best, no more than to continue or expand

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

projects that originated at the time of the previous Government while in practice impeding the progress and impairing the efficient working of many existing industrial ventures ;

(x) shows that the Government intends to continue the hoax that the alienation of thousands of acres of State land to private foreign and local capitalist interests to grow subsidiary foodstuffs, the compulsory dragooning of thousands of school-children to weed paddy lands, the creation of a politically-motivated 'Land Army', and the boring reiteration over the Ceylon Broadcasting Corporation of senseless jingles urging listeners to grow more food, represents an 'all-out effort' to achieve self-sufficiency in food ;

(xi) indicates that the Government in addition to the restrictions it has already imposed on opportunities for higher education, has not changed its policy of making inroads into the scheme of Free Education ;

(xii) reveals that the Government has lost interest in the Nindagama Lands Bill, about which it spoke so eloquently at the time of the Balangoda by-election ;

(xiii) does not disclose any intention to grant political rights to public employees ; and

(xiv) does not reveal any intention by the Government to end the widespread corruption that prevails, particularly in high places ;

this House has no confidence in Your Excellency's Government."—[*Dr. N. M. Perera*].

II

"එතකුදුවුවත්,

1967 ජූනි මස 4 වැනි දිනට පසුව, ඊශ්‍රායල් රජය බලයෙන් අල්ලාගත්, එක්සත් අරාබි ජනරජයට, සිරියාවට හා ජෝර්දානයට අයත් ප්‍රදේශයන්ගෙන් ඊශ්‍රායල් සන්නාහ සන්නද්ධ හමුදා ඉවත් කර ගන්නා තෙක්, ලංකාව හා ඊශ්‍රායලය අතර පවත්නා තානාපති හා අනෙකුත් සබඳතාවන් අත් හිටුවන මෙන් රජයෙන් ඉල්ලා සිටිමු."—[ආචාර්ය එන්. එම්. පෙරේරා]

"எனினும், 1967 ஆம் ஆண்டு ஜூன் மாதம் 4 ஆம் தேதிக்குப் பின்னர் இஸ்ரவேல் ஆயுதப் படைகளினால் பலவந்தமாகக் கைப்பற்றப்பட்ட ஐக்கிய அரபுக்குடியரசு, சிரியா, ஜோர்டான் ஆகிய நாடுகளின் ஆள்புலங்களிலிருந்து அப்படைகளை இஸ்ரவேல் அரசாங்கம் வாபஸ் பெற்றுக் கொள்ளும்வரை இலங்கைக்கும் இஸ்ரவேல் நாட்டுக்குமிடையிலுள்ள ராஜரீகத் தொடர்புகளையும் ஏனைய தொடர்புகளையும் தற்காலிகமாகத் துண்டித்துக் கொள்ளுமாறு அரசாங்கத்தைக் கேட்டுக்கொள்ளுகிறோம்."—[கலாநிதி என். எம். பெரேரா]

"but call on the Government to suspend diplomatic and other relations between Ceylon and Israel until such time as the Government of Israel withdraws its armed forces from the territories in the U. A. R., Syria and Jordan which they occupied by force after 4th June 1967."—[*Dr. N. M. Perera*].

III

"එතෙකුදුවුවත්,

"වියට්නාම් ප්‍රශ්නය පිළිබඳ සාධාරණ ස්ථිරව පවතින තීරණයකට එළඹීම සඳහා කටයුතු කිරීම පිණිස සෑම අවස්ථාවක්ම ප්‍රයෝජනයකට ගැනීමට උත්සාහ ගෙන ඇති අතර, මතුවටත් එසේ කරනු ඇත", යන ඔබතුමාගේ ආණ්ඩුවේ ප්‍රකාශයට පට හැනිව, දකුණු හා උතුරු වියට්නාමයට විරුද්ධව ඇමෙරිකානු එක්සත් ජනපදයේ ආක්‍රමණය හෙළා දැකීමටත්, මෙම ප්‍රශ්නය පිළිබඳව සාධාරණ හා ස්ථිරව පවතින තීරණයකට එළඹීම සඳහා අත්‍යාවශ්‍ය වන, අමෙරිකානු සන්නාහ සන්නද්ධ හමුදා වන් කොන්දේසි විරහිතව වියට්නාමයෙන් ඉවත් කර ගන්නා ලෙස ඉල්ලා සිටීමටත්, ඔබ තුමාගේ ආණ්ඩුව ඇත්ත වශයෙන්ම අපොහොසත් වී ඇති නිසා අපගේ කනගාටුව ප්‍රකාශකර සිටිමු."—[ආචාර්ය එන්. එම්. පෙරේරා]

எனினும், "வியட்நாம் பிரச்சினைக்கு நியாயமான, நிலைத்திருக்கக் கூடிய தீர்வைத் தோற்றுவிப்பதற்குரிய சகல சந்தர்ப்பத்தையும் பயன்படுத்த முனைந்துள்ளதுடன் தொடர்ந்தும் அவ்வாறு செய்வதற்கு முயற்சிக்கும்" என்று தங்கள் அரசாங்கம் வெளிப்படையாகக் கூறிக் கொண்டபோதிலும், இப்பிரச்சினைக்கு நியாயமானதும், நிலைத்திருக்கக்கூடியதுமான, தீர்வைத் தோற்றுவிப்பதற்கேதுவாக வட வியட்நாம், தென் வியட்நாம் ஆகியவற்றிற்கெதிராக ஐக்கிய அமெரிக்க நாடுகளினால் நடாத்தப்படும் ஆக்கிரமிப்பினைக் கண்டிப்பதற்கும், ஐக்கிய அமெரிக்கப் படைகளை வியட்நாமிலிருந்து நிபந்தனையின்றி வெளியேறுமாறு வற்புறுத்துவதற்கும் தங்கள் அரசாங்கம் தவறியுள்ளமையையிட்டு எங்கள் வருத்தத்தைத் தெரிவித்துக் கொள்கிறோம்."—[கலாநிதி என். எம். பெரேரா]

"but regret that, contrary to Your Government's profession that it has 'sought to use every opportunity to promote a just and lasting solution of the problem of Vietnam and will continue to do so', Your Government has in fact failed to condemn the aggression of the United States of America against South and North Vietnam and to demand the unconditional withdrawal of U. S. armed forces from Vietnam, which are essential for a just and lasting solution of this problem."—[*Dr. N. M. Perera*].

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

IV

" එතෙකුදුවුවත් ලකිසුරුතුමනි,

ඉටු නොකළ පැරණි පොරොන්දු රාශියක් ගැන යළිත් සඳහන් කරමින් තෙවෙනි වරටත් ඔබ වහන්සේ ලවා කියවූ මෙවර රාජාසන කථාව, පුනරුත් දොසින් පිරුනු බැවින් ද ;

රටේ බලවත්ම පරිහානියට, පන්ති බේදයට හා ජාතික අසමගියට මූලික හේතුව වූ ඉංග්‍රීසි භාෂා ආධිපත්‍යයෙන් රට මුදා ගැනීමට මේ රජය අකැමැති බව දැන් හොඳින්ම පැහැදිලිවී ඇති බැවින් ද ;

රජ බස් පැනය ගැන වචන මාත්‍රයකින්වත් සඳහන් නොකර, එබඳු පැනයක් රටේ නැතැයි එය ඉතා සාර්ථක ලෙස විසඳී ක්‍රියාත්මක වන්නේ යැයි රටවැසියාට ඇඟවීමට දෝ පැස්බර ව්‍රතයක් අනුගමනය කරමින් ඔබ වහන්සේගේ වර්තමාන රජය සිංහල රාජ්‍ය භාෂා පනත කුණු කූඩයට විසිකර දමා පරිපාලන කටයුතු ඉංග්‍රීසි බසින් පවත්වා ගෙන යන බැවින් ද ;

පසුගිය රජය යටතේ පරිපාලන කටයුතු අනුක්‍රම යෙන් සිංහල බසට පෙරලීම අහෝසිකර දමා රාජ්‍ය කටයුතු යළිත් ඉංග්‍රීසි බසට ඇබ්බැහි කරවීමට ක්‍රියා කරන බැවින් ද ;

ජාතික අධ්‍යාපනය මාතෘ භාෂාවෙන් ලබා දෙන බව කියතුදු, උසස් අධ්‍යාපන කටයුතු විෂයෙහි මව් බස යෙදවීම සඳහා කිසිදු පියවරක් නොගෙන, විශ්ව විද්‍යාලයීය, වෛද්‍ය, නීති, ඉංජිනේරු හා වෙනත් වෘත්තීය පුහුණුව ලබා දීමේදී ඉංග්‍රීසි මාධ්‍යය තව දුරටත් පවත්වාගෙන යමින් ගම්බද හා දුප්පත් නගර බද අසරණ දරුවන් අතරමං කරන බැවින් ද ;

උසාවියේ භාෂා පනතකැයි 1961 අංක 3 දරණ පනතක් ඇතත්, ලංකාවේ එකද මහෙස්ත්‍රාත් උසාවියක, එකද රික්වැස්ට් උසාවියක, එකද දිස්ත්‍රික් උසාවියක, එකද අපරාධ අධිකරණයක, එකද ශ්‍රෙෂ්ඨාධිකරණ මණ්ඩලයක හෝ එකද අපරාධ අභියාචන අධිකරණයක එකම දවසක්වත්, එකම නඩු විභාගයක්වත් රජබසින් නොපවත්වා, එකම නඩු තීන්දුවක්වත් රජබසින් නොලියවා පොදු දනාට නොවැටහෙන පරබසකින් සියලු අධිකරණ කටයුතු පවත්වාගෙන යන බැවින් ද ;

වර්තමාන අධිකරණ ක්‍රමය, නීති වෘත්තිය හා ඊට අදාල සම්ප්‍රදායයන් රැසක් මේ රටේ ඓතිහාසික, සංස්කෘතික පරිසරයට කිසිසේත් නොගැලපෙන්නේ වී නමුදු, එංගලන්තයේ ඉංග්‍රීසි ජීවිතයට ඔබ වහන්සේගේ වර්තමාන රජය දක්වන ලෙන්ගතු කම හා දීන ගැතිකම නිසා එය වෙනස් කිරීමට අකැමැත්තෙන් ලංකා මාතාව ඉංග්‍රීසි නීති සම්ප්‍රදායයේ ඌරු වල්ගා සහිත ලොම් තොප්පියෙන් වසා තැබීමට තැත් කරන බැවින් ද ;



කම්කරු ආරාවුල් පනත යටතේ සාමාන්‍ය සේවක පක්ෂයේ පහසුව පතා පිහිටුවන ලද කම්කරු උසාවි වල පවා වැඩ කටයුතු නඩු විභාග ලේඛන ගත කිරීම හා නඩු තීන්දු ලිවීම ආදිය මේ රටේ කම්කරුවනට වැටහෙන සිංහලෙන් නොව එංගලන්තයේ මහ රැජිනගේ මාතෘ භාෂාවෙන් පවත්වා ගෙන යන බැවින් ද ;

අළුතින් පිහිටුවන රජයේ නීතිගත සංස්ථාවක හෝ අභ්‍යන්තර පාලන කටයුතු පවා රාජ්‍ය භාෂා වෙන් නොඅරඹා ඔබ වහන්සේගේ රජයේ ගරු ඇමතිවරුන් ස්වකීය මාතෘ භාෂාව ලෙස සලකන ඉංග්‍රීසියෙන්ම සිදු කෙරෙන බැවින් ද ;

මේ රටේ උපන් ජනයාගේ ආර්ථික, සංස්කෘතික හා අධ්‍යාත්මික නිදහසේ පදනම වශයෙන් සැලකිය යුතු ජාතික අභිමානයේ හා ස්වාධීනත්වයේ සුපිරි සිදු සංකේතය වශයෙන් ගිණිය යුතු, අපගේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව අප විසින්ම, අප බසින්ම, සකස් කිරීම තිබියදී, කලු සුද්දන්ට රට බාරදී ගිය සුදු සුද්දන් විසින් රහසිගතව ගැට ගසා තකහනියේ ගෙනැවිත් අප හිසමත පැලැන්දු සෝල්බරි ආණ්ඩු ක්‍රමයේ ඉංග්‍රීසි කටු ඔටුන්න අතනින් මෙතනින් කොන් කඩා මුළු කපා පාස්සමින් පැලැස්තර ඇල වීමකට සූදානම් වන බැවින් ද ;

ඔබ වහන්සේගේ වර්තමාන රජය බලයට පත්වූ දා සිට රටේ හා සමාජයේ අස්සක් මුල්ලක් නෑර පැතිර ගිය විවිධ දූෂණය, සදාචාර පරිහානිය, දේශ පාලන පලිගැනීම් අනියම් ඥාති මිත්‍ර අනුග්‍රහය, අයුක්තිය, අසාධාරණත්වය හා අවිචාරත්වය නිසා අපගේ අනාගත බාල පරම්පරාවේ ගුණ වගාව, රුචිකත්වය, ජීවන දර්ශනය හා සදාචාරවත් පිළිවෙත් පිළිබඳ හැඟීම් පවා විකෘතවීමට සහ විරූපවීමට අවසර ඇති හෙයින්ද ;

ඔබ වහන්සේගේ වර්තමාන රජයේ බියකරු, අහංකාර, විනාශකාරී, ස්වරූපය ගැන අපගේ අප්‍රසාදය හා සංවේගය මෙසේ පළ කර සිටිමු."
[ආචාර්ය එන්. එම්. පෙරේරා]

" எனினும் மகா தேசாதிபதியவர்களே,

நிறைவேற்றப்படாத, தொகையான பழைய வாக்குறுதிகளை மீண்டும் குறிப்பிட்டு மூன்றும் முறையும் தங்களைக் கொண்டு வாசிப்பிக்கப்பட்ட உரையானது திரும்பக்கூறும் குற்றமுடைமையாலும் ;

நாட்டின் மோசமான சீர்குலைவுக்கும், வர்க்கபேதத்துக்கும், தேசிய ஒற்றுமையின்மைக்கும் அடிப்படைக் காரணமான ஆங்கில மொழி ஆதிக்கத்திலிருந்து, நாட்டை விடுவிக்க இந்த அரசாங்கம் விரும்பவில்லையென்பது தற்பொழுது தெளிவாகி யிருக்கின்றமையாலும் ;

அரசகருமமொழிப் பிரச்சினையைப் பற்றி ஒரு வார்த்தைதானும் குறிப்பிடாமல், அவ்விதப் பிரச்சினையில்லை, அது வெற்றிகரமாகத் தீர்க்கப்பட்டு அமுல் நடத்தப்பட்டுவருகிறதென நாட்டு மக்களுக்கு உணர்த்துவிப்பதற்காக, தீப்பறவை முறையைக் கையாண்டு

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தங்களின் இன்றைய அரசாங்கம் சிங்கள அரசகரும மொழிச்சட்டத்தைக் குப்பைத் தொட்டியில் வீசிவிட்டு, நிர்வாக வேலைகளை ஆங்கிலத்தில் நடத்துகின்றமையாலும் ;

கடந்த அரசாங்கம் நிர்வாக வேலைகளை படிப்படியாக சிங்கள மொழிக்கு மாற்றுவதற்கு எடுத்துக்கொண்ட நடவடிக்கையைக் கைவிட்டு, அரசாங்க அலுவல்களை மீண்டும் ஆங்கிலத்துக்கடிமைப்படுத்த நடவடிக்கையெடுக்கின்றமையாலும் ;

தேசியக் கல்வியைத் தாய்மொழி மூலம் பெற்றுத் தருவதாகக் கூறிக்கொண்டு, உயர்கல்வியைத் தாய் மொழியில் போதிப்பதற்காக எவ்வித நடவடிக்கையும் எடுக்காது, பல்கலைக்கழக, வைத்திய, சட்ட, பொறியியல், மற்றும் தொழில் நுட்பக்கல்வியை ஆங்கில மொழி மூலமாக கிராமத்திலும், நகரிலுமுள்ள ஏழைக் குழந்தைகளிடையேயும் தொடர்ந்துபோதிக்க முயலுகின்றமையாலும் ;

நீதிமன்ற மொழிச்சட்டமென, 1961 ஆம் ஆண்டு 3 ஆம் இலக்கச் சட்டமிருந்தபோதிலும், இலங்கையிலுள்ள ஒரு மாஜிஸ்திரேட்டு நீதிமன்றமாவது, ஒரு கேள்வி நீதிமன்றமாவது, ஒரு மாவட்ட நீதிமன்றமாவது, ஒரு குற்ற நீதிமன்றமாவது, ஒரு உயர் நீதிமன்றமாவது ஒரு நாளாவது எந்த ஒரு விசாரணையைத்தானும் அரசமொழியில் நடத்தாமல், ஒரு வழக்குத் தீர்ப்பையாவது அரசமொழியில் எழுதாமல், பொது மக்கள் விளங்கமுடியாத அந்நிய மொழியில் சகல நீதிமன்ற அலுவல்களையும் நடத்திவருகின்றமையாலும் ;

இன்றைய நீதிமன்றங்களின் அமைப்பும், நிர்வாக முறையும், சட்டத் தொழிலும், அவை சம்பந்தப்பட்ட சம்பிரதாயங்களும், இந்நாட்டின் வரலாற்றுக்கும் பண்பாட்டுக்கும் எவ்விதத்திலும் ஒத்தவையாகாத போதிலும், இங்கிலாந்தின் ஆங்கிலேய வாழ்க்கைமீது தங்களின் இன்றைய அரசாங்கம் காட்டுகின்ற மோகத்தின் காரணமாக, அதனை மாற்றியமைப்பதற்கு விருப்பமில்லாமல், இலங்கை யன்னையை ஆங்கிலேய சட்டசம்பிரதாயமென்னும் பன்றிவாலுடன் கூடிய உரோமத் தொப்பியினால் மூடி வைக்க முயலுகின்றமையாலும் ;

தொழிலாளர் பிணக்குச் சட்டத்தின் கீழ் சாதாரண தொழிலாளர்களின் நன்மைக்காக நிறுவப்பட்ட தொழிலாளர் நீதிமன்றங்களிற்தானும் அலுவல்கள், வழக்குவிசாரணைகளைப் பதிதல், தீர்ப்புகளை எழுதுதல் என்பனவற்றை இந்நாட்டின் தொழிலாளர்கள் விளங்கிய சிங்களத்திலில்லாமல், இங்கிலாந்து மகாராணியின் தாய் மொழியில் நடத்துகின்றமையாலும் ;

புதிதாக நிறுவப்போகும் அரசாங்க கூட்டுத்தாபனத்திலும், கூட, உள் விவகார அலுவல்களைத்தானும் அரசமொழியில் ஆரம்பிக்காமல் தங்களின் அரசாங்க கௌரவ அமைச்சர்கள் தங்களின் தாய்மொழியாகக் கருதுகின்ற ஆங்கிலத்திலேயே நடத்துகின்றமையாலும் ;

இந்நாட்டிற் பிறந்த மக்களின் பொருளாதார, கலாசார, ஆத்மீக சுதந்திரத்தின் அடித்தளமாகக் கருதப்படுகின்ற தேசீயப்பற்றின் புனிதமான இலச்சினையாகக் கொள்ளப்படத்தக்க, எமது அரசியலமைப்புச் சட்டத்தை நாமே, நமது மொழியால் வகுக்க வேண்டியிருக்க, கழுப்புத்துரைகளுக்கு நாட்டைக் கையளித்துச் சென்ற வெள்ளைத்துரைமார்களால், இரகசியமாகச் சிக்கல்களுடன் வகுத்து அவசர அவசரமாகக் கொண்டு வந்து எமது தலையிற் சுமத்தப்பட்ட சோல்பரி அரசியலமைப்புச் சட்டமான பிரித்தானிய முட்கிரீடத்தை அங்குமிங்கும் ஒடித்து மூலைகளை வெட்டி ஒதுக்கி, ஒட்டுப்போட ஆயத்தப்படுகின்றமையாலும் ;

தங்களின் தற்போதைய அரசாங்கம் ஆட்சிக்கு வந்த நாள்முதல், நாட்டினதும், சமுதாயத்தினதும் சகல அம்சங்களிலும் பரவியுள்ள பலவிதமான ஊழல்கள், ஒழுக்கச் சீர்கேடுகள், அரசியல் பழிவாங்கல், முறையற்ற சுற்றந்தழுவல், நியாயமின்மை என்பனவற்றின் காரணமாக எமது எதிர்கால இளம் பரம்பரையினரின் ஒழுக்கவளர்ச்சி, இரசிகத்தன்மை, வாழ்க்கையின் குறிக்கோள் ஆதியனவை சம்பந்தமான உணர்வுகள் தானும் அழிந்துபோகும் நிலையிருக்கின்றமையாலும்

தங்களின் இன்றைய அரசாங்கத்தின் பயந்தாங் கொள்ளி, அழிவுகாண் உருவத்தைக்குறித்து எமது அதிருப்தியையும், துக்கத்தையும் இவ்விதமாக எடுத்துக் காட்டுகிறோம் ”—[கலாநிதி என். எம். பெரேரா]

“ but inasmuch as,

this Speech, which refers again to numerous unfulfilled old pledges and which Your Excellency was required to read for the third time as well, is full of repetitions ;

it is now abundantly clear that this Government is unwilling to liberate the country from the stranglehold of the English language which has been the primary cause of the greatest national decline, class distinction and national discord ;

Your Excellency's present Government, without mentioning even a word about the official language question but purporting ostrich-like, perhaps to indicate to the people that there is no such problem and that it has been solved successfully and that the Act is being implemented, is doing administrative work in the English language, having thrown the Official Language Act into the waste paper basket ;

the gradual change-over to Sinhala in administrative work, brought about by the previous Government has been abandoned and action is taken to re-introduce English into Government affairs ;

Your Excellency's Government while claiming that national education is being imparted in the mother-tongue, is not taking any steps to employ the mother-tongue in the sphere of higher education but is foresaking rural children and poor, helpless urban children by

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

continuing the English medium in medical, law, engineering and other professional studies in the universities ;

in spite of there being an Act called the Language of the Courts Act, No. 3 of 1961, never was a single case heard or a single judgement written in the official language in any Magistrate's Court, in any Court of Requests, in any District Court, in any Assize Court, in any Supreme Court, in any Court of Criminal Appeal, in Ceylon, but instead all judicial work is conducted in an alien language, not understood by the masses ;

while the existing system of justice, the legal profession and many of its related conventions are totally alien to the historical and cultural environment of this country, Your Excellency's present Government, because of its attachment and abject servility to the English mode of life, as prevailing in England, is attempting to shroud Mother Lanka with the pig-tailed wig and other English legal conventions, in its reluctance to effect any change in this state of affairs ;

even in the Labour Tribunals set up, under the Industrial Disputes Act, for the convenience of ordinary employees, the proceedings, maintenance of records and writing judgments are done not in the Sinhala language, understood by the workers of this country, but in the mother-tongue of Her Majesty the Queen of England ;

in the newly established corporations too, even internal administration is not conducted in the official language, but in English, which is regarded by the Honourable Ministers of Your Excellency's Government, as their mother-tongue ;

instead of framing ourselves in our own language our own Constitution which should be the foundation of the economic, cultural and spiritual freedoms of the people born in this country, and which should be the purest symbol of national pride and sovereignty, preparations are being made to cut the corners, snip the edges, piece together and thereby patch up the Soulbury Constitution which is an English crown of thorns hastily and secretly put together and placed on our heads by the white sahibs who handed over this country to the black sahibs ;

the various forms of corruption, moral degeneration, political vindictiveness, nepotism, injustice, inequity and irrationality which have spread throughout the length and breadth of the land and in every nook and corner of society since Your Excellency's Government came into power, have paved the way, for the perversion and distortion of moral precepts and practices, the philosophy of life, the aesthetic sensibility, and the moral virtues of our future generations ;

we express our displeasure and deep regret in regard to the alarming, arrogant and destructive aspect of Your Excellency's Government."—[*Dr. N. M. Perera*].

"එම වචන එතැනට ඇතුළත් කළ යුතුය", යන ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.

"அச்சொற்கள் அங்கு சேர்க்கப்படுமாக" எனும் வினா மீண்டும் எடுத்தியம்பப்பெற்றது.

*Question again proposed, "That those words be there added."*

පූ. භා. 10.3

**එස්. ද එස්. ජයසිංහ මයා. (කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ—தொழில், தொழில் வசதி, வீடமைப்பு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. S. de S. Jayasingha—Parliamentary Secretary to the Minister of Labour, Employment and Housing)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ මේ සභාව විසිර යන අවස්ථාවේදි මා මේ ගරු සභාවට මතක් කරමින් සිටියේ විරුද්ධ පාර්ශ්වයෙන් මේ රජයට විරුද්ධව නඟා තිබෙන ප්‍රබල චෝදනාව බෞද්ධාගමට නිසි තැන දුන්නෙ නැහැ කියන චෝදනාව බවයි. මේ රාජාසන කථාවේ මේ අන්දමට සඳහන් වී තිබෙනව :

"භික්ෂූන් වහන්සේලාගේ උසස් අධ්‍යාපනය සඳහා විශ්ව විද්‍යාලයක් පිහිටුවීම පිණිස කෙටුම්පත් ව්‍යවස්ථාවක් දැනට සකස් කරගෙන යනු ලැබේ. එය ඉක්මණින් ඉදිරිපත් කරනු ඇත."

භික්ෂූන් වහන්සේලාට විශ්ව විද්‍යාල දෙකක් තිබූ බව මා මුලින්ම සඳහන් කරන්ට කැමතියි. විද්‍යාලංකාර, විද්‍යෝදය යන නාම දෙකින් විශ්ව විද්‍යාල දෙකක් පසුගිය රජය මගින් ආරම්භ කළා. ඒ පනත එදා ක්‍රමානුකූලව සකස් කර තිබුණ නම්, මේ රජයට මේ රාජාසන කථාවේ මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කරන්ට වුවමනාවක් වෙන්නෙ නැහැ. ඒ විශ්ව විද්‍යාල දෙකම ලංකා විශ්ව විද්‍යාලයේ සම්ප්‍රදාය අනුව ඒ රෙගුලාසි අනුව පවත්වා තිබෙන නිසා ඒ විශ්ව විද්‍යාල දෙක එසේම තිබෙන්නට හැර භික්ෂූන් වහන්සේලාට ධර්ම විනය, ශබ්ද ශාස්ත්‍රය, ආදිය ප්‍රගුණ කර ගැනීම පිණිසත්, ධර්ම ප්‍රචාරක කටයුතු පිළිබඳ පුහුණුවක් ලබා දීම සඳහාත්, මෙම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ද එස්. ජයසිංහ මයා.]

අළුත් විශ්ව විද්‍යාලය පිහිටුවන්ට අදහස් කළ බව මෙහිදී ප්‍රකාශ කරන්ට කැමතියි.

අපේ රටේ භික්ෂූන් වහන්සේලාට සිංහල භාෂාව, පාලි භාෂාව, සංස්කෘත භාෂාව පමණක් නොව වෙනත් විදේශීය භාෂාවන්ද ඉගැන්වීමෙන් මේ රජය බලාපොරොත්තු වෙන්නෙ ලෝකයේ වෙනත් රටවල බුද්ධ ධර්මය ප්‍රචාරය කර හැරීමටයි. අදත් ලංකාව එක්තරා ප්‍රමාණය කට ලෝකයේ බුද්ධ ධර්මය ප්‍රචාරය කිරීමට ඉදිරිපත් වී සිටිනව.

අපේ යම් යම් ඓතිහාසික ධර්ම පුස්තක වල තිබෙනව, මේ රටේ හිටපු ඇතැම් භික්ෂූන් වහන්සේලා මීට ඉහතත් සිංහල පාළි භාෂා පමණක් නොව වෙනත් විදේශීය භාෂාවන් ගැන හසළ බුද්ධියක් ඇති කරගෙන සිටි බව. පොත්පත්වල කියනව, ෂඩ් භාෂා පරමේශ්වර තොටගමුවේ ශ්‍රී රාහුළ හිමියෝ භාෂා හයක් පිළිබඳව නිපුණත්වයක් ලබා සිටියා කියා. ඒ වගේම මේ රටේ මෙහෙණි සස්නෙහි මහණ වී සිටි එක්තරා කුමාරිකාවක් චීනයට මෙහෙණි සස්න ගෙන ගොස් තිබෙනව, එයින් පෙනී යන්නේ, එදා මේ රටේ සිටි ජනතාව චීන බසත් දැනගෙන සිටි බවයි. නැත්නම් චීනයට මේ රටෙන් මෙහෙණි සස්න ගෙන යන්ට පුළුවන් කමක් ලැබෙන්නේ නැහැ. එම නිසා මේ විශ්ව විද්‍යාල ඇති කිරීමෙන් අපි බලාපොරොත්තු වෙන්නෙ, භික්ෂූන් වහන්සේලාට වෙනත් භාෂා සම්බන්ධයෙන් සෑහෙන අවබෝධයක් ලබා දී ඒ මගින් ලෝකය පුරා බුද්ධ ධර්මය පතුරවා හැරීමටයි.

තමුන්නාන්සේලා බුද්ධාගමට කළ සේවය කුමක්දැයි තවත් ප්‍රශ්නයක් ඇහැව්ව. මේ රටේ සිංහල රාජධානිය නැතිවූ දා සිට දළදා මාළිගාවට අයත්ව තිබුණු පත්තිරිප්පුව පසුගිය රජය විසින් දළදා මාළිගාවට අහිමි කළා. පත්තිරිප්පුව නැවත වරක් දළදා මාළිගාවට, සංඝ රත්න යට භාර දුන්නෙ මේ රජය බලයට පත් වුණාට පස්සෙ වර්තමාන ගරු අගමැතිතුමා විසින් බව මෙහිදී ප්‍රකාශ කරන්නට කැමතියි. අවුරුදු 9ක පාලන කාලයක් තුළ දී පත්තිරිප්පුව නැවත වරක් දළදා මාළිගාවට දෙන්නට තමුන්නාන්සෙලාට බැරි වුණේ ඇයි? මේ තරම් ජාතිය වෙනුවෙන් කෑ ගහන භාෂාව වෙනුවෙන් ඝෝෂා කරන, ආගම් වෙනුවෙන් මොර දෙන විරුද්ධ පක්ෂය මේ ඓතිහාසික වස්තුව—පත්තිරිප්පුව—නැවත වරක් දළදා මාළිගාවට පවරා දෙන්නට කල්පනා කළේ නැහැ. [බාධා කිරීම්] අපි ඒකත් කියා දෙන්නම්. තමුන්නාන්සේලා බෞද්ධාගම නගා සිටුවන්නට බොහොම කෑ ගැසුවා. නමුත් ඝෝෂාව පමණයි. බෞද්ධාගම නගා සිටුවන්නට ක්‍රියා කරන්නෙ මේ පැත්තෙ උදවියයි. [බාධා කිරීම්]

තමුන්නාන්සෙලාට බැරි වුණා, මේ රටේ බෞද්ධයන්ට පෝය දවසවත් නිවාඩු දෙන්ට.

**පර්සි වික්‍රමසිංහ මයා.** (කඹුරුපිටිය)
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ—கம்புருப்பிட்டிய)*
(Mr. Percy Wickremasinghe—Kamburupitiya)

පසළොස්වක පෝය නිවාඩු දුන්න.

**එස්. ද එස්. ජයසිංහ මයා.**
*(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ)*
(Mr. S. de S. Jayasingha)

පසළොස්වක පෝය නිවාඩු දුන්නෙ තමුන්නාන්සේලා නොවෙයි, ඊට කලින් තිබුණු රජය.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Order please !

**එස්. ද එස්. ජයසිංහ මයා.**
*(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ)*
(Mr. S. de S. Jayasingha)

තමුන්නාන්සේ අද උදේ එනකොට පාර වැරදිලා ඇවිත්. වෙනදා එන පාරෙන් නොවෙයි, ඒ ගරු මන්ත්‍රීතුමා අද ඇවිත් තිබෙන්නෙ. ඊට කලින් තිබුණු රජයත් පසළොස්වක පෝය නිවාඩු දුන්න. ඉංග්‍රීසි රජයත් පසළොස්වක පෝය කීපයක් නිවාඩු දී තිබෙනව. එතුමා කොහෙන්දෝ ඇවිත් හදිසියෙන් කඩාවැදී, පාර වැරදී කථා කරනව. [බාධා කිරීම්] මට හෙම්බිරිස්සාව හැදිලා නැහැ. මගේ සෞඛ්‍ය තත්ත්වය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බොහොම හොඳයි. ඔය පැත්තෙ ඉන්න දොස්තර මහත්වරුන්ට කථා කරන්නට පුළුවන් නොවැ, අමාරුවක් තිබුණොත් ? ඒ අවස්ථාවෙදි තමුන්නාන්සෙලාගෙ සේවය අපට ලැබේය කියා අප හිතනවා.

**එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා.** (මිනුවන්ගොඩ)
*(திரு. எம். பீ. டி சொய்சா சிறிவர்தன—மினுவாங்கொட)*
(Mr. M. P. de Zoysa Siriwardena—Minuwangoda)

ඔය පැත්තෙ ඉන්න දොස්තර නාග නාදන් ?

**එස්. ද එස්. ජයසිංහ මයා.**
*(திரு. எஸ். டி எஸ். ஜயசிங்க)*
(Mr. S. de S. Jayasingha)

මේ රජය සතර පෝය නිවාඩු දුන්නා පමණක් නොවෙයි; කැළණිය, මහියංගනය, කතරගම ආදි ස්ථාන ශුද්ධ භූමි බවට පත් කර, පූජ්‍ය ස්ථානයක් අවට ඇති පරිසරය ඇති කෙරෙන විධියට ඒවා සකස් කරන බව මේ රාජාසන කථාවේ එක් කොටසක සඳහන් වී තිබෙනවා. [බාධා කිරීම්] තවත් කරන්නට තිබෙනවා.

**රාජා වෙලේගම මයා.** (මොනරාගල)
*(திரு. ராஜா வெலேகம—மொனராகலை)*
(Mr. Raja Welegama—Monaragala)

ඇයි, ඒවා කරන්නෙ නැත්තෙ ?

**එස්. ද එස්. ජයසිංහ මයා.**
*(திரு. எஸ். டி எஸ். ஜயசிங்க)*
(Mr. S. de S. Jayasingha)

කරන්නට තිබෙන ඔක්කොම කරනවා. හැබැයි තමුන්නාන්සේලා කටින් කළා වගේ නොවෙයි. අපි ක්‍රියාවෙන් කරල පෙන්වනවා.

**රාජා වෙලේගම මයා.**
*(திரு. ராஜா வெலேகம)*
(Mr. Raja Welegama)

අප කළ ඒව, තමුන්නාන්සේලා විවෘත කරනවා.

**එස්. ද එස්. ජයසිංහ මයා.**
*(திரு. எஸ். டி எஸ். ஜயசிங்க)*
(Mr. S. de S. Jayasingha)

අපි කළ ඒවා, තමුන්නාන්සේලා විවෘත කළා. කැළණියෙ පාලම කවුද හැදුවෙ; කවුද විවෘත කළේ ? ඒකට උත්තර දෙන්න. කැළණි පාලම හැදුවෙ, අපි. තමුන්නාන්සේලා එය විවෘත කළා.

**රාජා වෙලේගම මයා.**
*(திரு. ராஜா வெலேகம)*
(Mr. Raja Welegama)

වයර් කම්හල ?

**එස්. ද එස්. ජයසිංහ මයා.**
*(திரு. எஸ். டி எஸ். ஜயசிங்க)*
(Mr. S. de S. Jayasingha)

වයර් කම්හල තමුන්නාන්සේලත් හැදුව; අපිත් හැදුව; අපි විවෘත කළා.

**බී. වයි. තුඩාවේ මයා.** (මාතර)
*(திரு. பி. வை. துடாவ—மாத்தறை)*
(Mr. B. Y. Tudawe—Matara)

මාතර පාලම ?

**එස්. ද එස්. ජයසිංහ මයා.**
*(திரு. எஸ். டி எஸ். ஜயசிங்க)*
(Mr. S. de S. Jayasingha)

මාතර පාලම—[බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Please allow the hon. Member who is on his feet to continue his speech. If hon. Members do not interrupt, his speech would be shorter.

**එස්. ද එස්. ජයසිංහ මයා.**
*(திரு. எஸ். டி எஸ். ஜயசிங்க)*
(Mr. S. de S. Jayasingha)

ඒ සමඟම, පාර්ලිමේන්තු ලේකම්වරයකුට කාර් එකක් ලැබුණේ කෙසේද කියා අසමින් ඊයේ රාජ්‍ය ඇමතිතුමාට අභියෝගයක් කළා. මාත් රාජ්‍ය ඇමතිතුමාට අභියෝග කරනවා, යටියන්තොට ගරු මන්ත්‍රීතුමාට (ආචාර්ය එන්. එම්. පෙරේරා) අච්චු කන්තෝරුවක් ලැබුණේ කෙසේද කියා ප්‍රකාශ කරන ලෙස. අච්චු කන්තෝරුව සඳහා වූ විදේශ විනිමය මේ අවුරුද්දෙම යටියන්තොට ගරු මන්ත්‍රීතුමාට ලැබී තිබෙනවා. ඊයේ රාජ්‍ය ඇමතිතුමාට කළ අභියෝගයට පිළිතුරු දෙන ගමන්ම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ද එස්. ජයසිංහ මයා.]

යටියන්තොට ගරු මන්ත්‍රීතුමාට අච්චු කන්තෝරුවක් ලැබුණේ කෙසේද කියා මේ ගරු සභාවේ ප්‍රකාශයක් කරන හැටියට මා දැන් රාජ්‍ය ඇමතිතුමාට අභියෝග කරනව. [බාධා කිරීම්]

**ලීලාරත්න විජේසිංහ මයා.** (පොළොන්නරුව)
*(திரு. லீலாரத்ன விஜேசிங்ஹ—பொலன்னறுவை)*
(Mr. Leelaratne Wijesinghe—Polonnaruwa)

මන්ත්‍රීවරු කාර් ඉල්ලුව—[බාධා කිරීම්]

**එස්. ද එස්. ජයසිංහ මයා.**
*(திரு. எஸ். டி எஸ். ஜயசிங்க)*
(Mr. S. de S. Jayasingha)

මන්ත්‍රීවරු තවත් ඒවා ඉල්ලුව. කාර් ඉල්ලු කථාව වෙනම ප්‍රශ්නයක්.

**ලීලාරත්න විජේසිංහ මයා.**
*(திரு. லீலாரத்ன விஜேசிங்ஹ)*
(Mr. Leelaratne Wijesinghe)

ඒකට මොනවද, කියන්නෙ ?

**එස්. ද එස්. ජයසිංහ මයා.**
*(திரு. எஸ். டி எஸ். ஜயசிங்க)*
(Mr. S. de S. Jayasingha)

කාර් ඉල්ලු ප්‍රශ්නය ගැන නොවෙයි, මා කියන්නෙ.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Hon. Members who have already spoken are interrupting the most.

**එස්. ද එස්. ජයසිංහ මයා.**
*(திரு. எஸ். டி எஸ். ஜயசிங்க)*
(Mr. S. de S. Jayasingha)

රාජ්‍ය ඇමතිතුමා දැන් මේ ගරු සභාවෙ නැහැ. [බාධා කිරීම්] බය නෑ. පත්තරේ ගහන්නවද මොනවටද මම දන්නෙ නැහැ. 1967 අවුරුද්දෙ යටියන්තොට ගරු මන්ත්‍රීතුමාට අච්චු කන්තෝරුවක් ලැබුණේ කෙසේද කියා මේ ගරු සභාවේ ප්‍රකාශ කරන හැටියට රාජ්‍ය ඇමතිතුමාට මමත් අභියෝග කරනව.

දිස්ත්‍රික් සභා පිහිටුවීම ගැනත් කියැවුණා. මේ දිස්ත්‍රික් සභා පිහිටුවීම සම්බන්ධයෙන් හැම අතුරු මැතිවරණයක් ගානෙම විරුද්ධ පාර්ශවයෙ ගරු මන්ත්‍රීවරු රජයට චෝදනා කරන්නට පටන් ගත්ත. දිස්ත්‍රික් සභා දෙන ක්‍රමය පිළිබඳව සඳහන් කර ඇති වචන දෙක තුනවත් හරි හැටි කියවන්නෙ නැතිවයි, මේ සම්බන්ධව අපට චෝදනා කරල තියෙන්නෙ. 1956 සිට ඇති වූ තමුන්නාන්සේලාගේ සෑම රාජාසන කථාවකම සඳහන් කර තිබුනා, දිස්ත්‍රික් සභා ක්‍රමය මේ රටේ ඇති කරනවය කියා. බණ්ඩාරනායක මහතාගේ යුගයේදීත්, බණ්ඩාරනායක මැතිනියගේ යුගයේදීත්, එසේම ඩඩ්ලි සේනානායක මහතාගේ යුගයේදීත් ඇතිවූ සෑම රාජාසන කථාවකම දිස්ත්‍රික් සභා ඇති කරන බව සඳහන් කර තිබුනා. මේ අවුරුද්දේ රාජාසන කථාවේ මේ සම්බන්ධව මොනවද කියා තිබෙන්නෙ ?

> "මහා ආණ්ඩුවේ පාලනය හා විධානය යටතේ කටයුතු කරන දිස්ත්‍රික් සභා පිහිටුවීමට නීති සම්පාදනය කරනු ලැබේ."

කොහොමද මේ දිස්ත්‍රික් සභා ඇති කරන්නෙ ? මහ ආණ්ඩුවේ පාලනය යට තෙයි. කෝ මේ දිස්ත්‍රික් සභාවලට ස්වාධිනත්වයක් ? අපි උදාහරණයක් ගනිමු. රජය යටතේ තිබුණු පාඨශාලා ගණනාවක්ම මහා විද්‍යාලය කියා දැන් නම් කර බෝඩ් ගසා තිබෙනව. අපි කච්චේරි කියන බෝඩ් ලෑලි ගළවා දිස්ත්‍රික් සභා කියා බෝඩ් ලෑලි ගහනව. කච්චේරිවල දිස්ත්‍රික් සම්බන්ධතා කාරක සභා තියෙනව. ඒ කාරක සභාවල ඒ ඒ මන්ත්‍රීවරු, නියෝජිතවරු ඉන්නව. ඒ කාරක සභා රට සභා ක්‍රමයට පරිවර්තනය කරන්න බැරිද ? මේ වචන දෙකේ සම්පූර්ණ විස්තරය තිබෙනව. සම්පූර්ණ අර්ථය තියෙද්දී අර්ථය හංගාගෙන මහජනතාව මුළා කිරීම සඳහා මේ රට ද්‍රවිඩ ජාතිකයන්ට පාලනය කිරීමට ඉඩ දෙන්න දිස්ත්‍රික් සභා ඇති කරනවය කියා අපට චෝදනා කරනව. මම නැවතත් මේ කොටස කියවන්න කැමතියි.

> "මහා ආණ්ඩුවේ පාලනය හා විධානය යටතේ කටයුතු කරන දිස්ත්‍රික් සභා පිහිටුවීමට නීති සම්පාදනය කරනු ලැබේ."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මොකක්ද මේකෙ තිබෙන වැරද්ද? සවාධීනත්වයක් තියෙනවද? අද ගම් සභාවකට, සුළු නගර සභාවකට, පළාත් ආණ්ඩු සභාවකට, නගර සභාවකට තිබෙන බලතලත් මෙයින් නැති වෙන වට කිසිම සැකයක් නැහැ. මමත් අවුරුදු 25 ක් තිස්සේ පළාත් පාලන සේවයේ යෙදී සිටින නිසා මට ඒ ගැන කියන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ පළාත් පාලන ආයතනවල රජය මගින් නිවාස රාශියක් ගොඩනගා තිබෙනවා. අප නිතරම කියා තිබෙනව, ඒවා පදිංචි කරුවන්ට කුලියට සින්න වීමේ ක්‍රමයක් ඇති කරන්න ඕනෑය කියා. ඒ සම්බන්ධව ක්‍රියාරම්භ කිරීමට රාජාසන කථාවෙන් යෝජනා කර තිබෙන අතර මේ රටේ ජනතාවගේ අවශ්‍යතාවයන් සපුරාලීමට තට්ටු ගෙවල් 1,800 ක් සෑදීමට රාජාසන කථාවෙන් ප්‍රතිඥා දී තිබෙනව. පසුගිය රජය තිබුණු කාලයේදිත්, මේ රජයේ පසුගිය අවුරුදු දෙක ඇතුළතත් කිසිම වර්ෂයක නිවාස දෙපාර්තමේන්තුවට වෙන් කර තිබුණු මුදල් සම්පූර්ණයෙන්ම වියදම් කරල තිබුනෙ නැහැ. නමුත් මෙම වර්ෂය සඳහා නිවාස දෙපාතීමේන්තුවට වෙන් කර තිබුණු මුදල් අය වැය වර්ෂය අවසාන වන්නටත් ප්‍රථමයෙන් සම්පූර්ණයෙන්ම ජනතාවට නිවාස සෑදීම සඳහා දී තිබෙන බව මම ආඩම්බරයෙන් ප්‍රකාශ කරනව. එපමණක් නොවෙයි, නිවාස සෑදීම සම්බන්ධව මම රජයට යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනව. මේ රටේ නිවාස හිඟය මකාලීම රජයට පමණක් කළ නොහැකි බව අප දෙපක්ෂයම පිළිගන්න ඕනෑ. මේ සඳහා පෞද්ගලික අංශයත් අපට සහාය දෙන්න ඕනෑ. ඒ නිසා පෞද්ගලික ව්‍යාපාර හිමියන්ගේ ලාභයෙන් සියයට දහයක් සෑම වර්ෂයේම ගෙවල් සෑදීම සඳහා වෙන් කළ යුතුය යන යෝජනාවක් අපේ අමාත්‍යාංශයේ තියෙනව.

මේ රටේ පෞද්ගලික ආයතන කීපයක් ගැන අපි සලකා බලමු. තේ පිටරට යවන ආයතන, පොල් පිටරට යවන ආයතන, රබර් පිටරට යවන ආයතන, මෝටර් රථ මේ රටට ගෙන්වන ආයතන, මෝටර් රථ බඩු විකුණන ආයතන, ප්‍රවෘත්ති පත්‍ර ආයතන ආදි සෑම අංශයක් ගැනම බැලුවම ආයතන සියයක් එක අවුරුද්දකට නිවාස 5 බැගින් සෑදුවත් එක අවුරුද්දකට නිවාස 500 ක් හැදෙනව. ඔය ආදී ක්‍රමවලින් මේ රටේ නිවාස හිඟය හැකිතාත් දුරට අඩු කර ගැනීමට අපි බලාපොරොත්තු වෙනව.

අප හදන තට්ටු නිවාස හැරෙන්නට මාරු වන රජයේ සේවකයන් සඳහා වෙනම නිවාස ඇති කිරීමට අපේ යෝජනාවක් තියෙනව. රජයේ සේවය සඳහා පිට පළාත්වලින් කොළඹ නගරයට මාරු වී එන අයට ගෙයක් ලබා ගැනීමට තිබෙන දුෂ්කරතාවය ගැන අපි දන්නව. එපමණක් නොවෙයි, තමන්ට අයිති එකම ගෙය කුලියට දී පිට ප්‍රදේශයකට මාරු වී ගොස් නැවත ආපසු ඒ ගෙය ලබා ගැනීමත් ඉතා අපහසු තත්ත්වයක තිබෙන බව අපි දන්නව. ඒ නිසා රජයේ සේවකයන් වෙනුවෙන් වෙනම නිවාස යෝජනා ක්‍රමයක් ගැන අපේ අවධානය යොමු වී තිබෙනව. මාරු වී එක් තැනක සිට තවත් තැනකට යන රජයේ සේවකයන්ට සහනයක් එයින් ලැබෙනව. එක් සේවකයකු තමන් සිටින ස්ථානයෙන් වෙනත් තැනකට මාරු වී යන විට හිස් වන ගෙය ඒ තැනැත්තා වෙනුවට පැමිණෙන සේවකයට ලැබෙනවා. ඒ විධියේ නිල නිවාස යෝජනා ක්‍රමයකුත් තිබෙනව. එපමණක් නොව, දුප්පත් ජනතාවට කොළඹින් පිට සුළු ඉඩම් කැබැල්ලක ගෙයක් හදා දී එය ඔහුටම සින්න වීමේ ක්‍රමයට ලබා දීමේ තවත් වැඩ පිළිවෙළක් ගැන අපේ සැලකිල්ල යොමු වී තිබෙනව. ඔය ආදි කාරණා ගැන සලකා බලන විට නිවාස දෙපාතීමේන්තුව මගින්, නිවාස අමාත්‍යාංශය මගින්, කරගෙන යන වැඩ සම්බන්ධයෙන් විරුද්ධ පාර්ශ්වයේ තමුන්නාන්සෙලාටත් ආඩම්බර වෙන්න පුළුවනි.

නිවාස අමාත්‍යාංශයේ වැඩ සම්බන්ධයෙන් තවත් එක් කාරණයක් සඳහන් කරන්න කැමතියි. පසුගිය ආණ්ඩුව පැවති කාලයටත් වඩා, පසුගිය අවුරුදු දෙකටත් වඩා, මේ අවුරුද්දෙ නිවාස අමාත්‍යාංශය ඉතාමත් දක්ෂ ලෙස වැඩ කර තිබෙනව. ජනතාවගේ යහපත සඳහා ඉතාමත් ඕනෑකමින් සහ කාර්යක්ෂම ලෙසත් ක්‍රියා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ද එස්. ජයසිංහ මයා.]

කරමින් ජනතා වුවමනාවන් ඉෂ්ට කර තිබෙනව. අවුරුද්දක් දෙකක් නොවෙයි, අවුරුදු නවයක් තිස්සේ විරුද්ධ පාර්ශ්වයේ තමුන්නාන්සෙලාගෙ ආණ්ඩු වලට කරන්නට බැරි වුණු දෙයක් තමයි වියදම් කිරීම සඳහා නිවාස දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතු වෙනුවෙන් ඒ ඒ අවුරුද්දට වෙන් කරන ලද මුදල් ඒ ඒ අවුරුද්ද අවසාන වන විට සම්පූර්ණයෙන් වැය වන ආකාරයට කටයුතු කිරීම. වෙන් කළ මුදල් හරියාකාර පරිහරණය කර ජනතාවට නිසි ලෙස බෙදා දෙන්නට පසුගිය කාලයේදී කිසිම ආණ්ඩුවකට බැරි වුණා. එහෙත් අපේ ආණ්ඩුව මේ අවුරුද්දෙ ජනතාවගෙන් ලැබුණු ඉල්ලුම් පත්‍රවලට ගෙවිය යුතු මුදල් ඉතා ඉක්මනින් ගෙවීමට කටයුතු කළා. මුදල් ඉවර වනතුරුම බෙදා දුන්නා. දෙපාර්තමේන්තුවේ සුළු සුළු ප්‍රමාද තිබෙනවා වෙන්න පුළුවනි. හැම දෙපාර්තමේන්තුව කම වාගේ සුළු සුළු අඩුපාඩු ප්‍රමාද දෝෂ තිබෙන බව කවුරුත් පිළිගන්නව. එහෙත් ඉතාම කාර්යක්ෂම ලෙසත් දක්ෂ ලෙසත් වැඩ කිරීම නිසා නිවාස දෙපාර්තමේන්තුව මේ අවුරුද්ද තුළ වැය කිරීම සඳහා වෙන් කරන ලද මුදල් හරියාකාර බෙදා අවසන් කර තිබීම කාගේත් සන්තෝෂයට හේතු වෙනවා ඇති. එයින් තමුන්නාන්සෙලාට වටහා ගන්න පුළුවනි කොයි තරම් හොඳින් වැඩ කටයුතු කරගෙන ගොස් තිබෙනවද යන්න. ගිය මාසෙ ඉකුත් වීමට පෙර මුදල් සියල්ලම ගෙවා හමාරයි. දැන් මුදල් නැතිවයි බලාගෙන ඉන්නෙ, නැවතත් මුදල් වෙන් කර දෙන තුරු.

රාජාසන කථාවේ එක් තැනක මෙසේ සඳහන් වෙනව :

"මෙරට නිපදවන ලුණු ප්‍රමාණය අධික කරන ලදී. යාපනයේ තනනු ලබන නව ලේවාවල වර්‍ෂීය කට ලුණු ටොන් එක් ලක්‍ෂ පසළොස් දහසක් නිපදවනු ඇත."

එක්සත් ජාතික පක්‍ෂයේ ආණ්ඩුව මැතිවරණයේදි පරාජය වන විට මේ රටේ නිෂ්පාදනය වෙමින් තිබුණු ලුණු ප්‍රමාණය මේ රටේ වුවමනාවන්ට වඩා තිබුණු බවත් ඒ නිසා වැඩි ලුණු ප්‍රමාණයෙන් කොටසක් ජපානයට විකිණීමට යෝජනා ක්‍රමයක් එවකට ලෑස්ති වී තිබුණු බවත් තමුන්නාන්සෙ දන්නව. ඒ කොයි හැටි වෙතත් පසුගිය ආණ්ඩුව—බණ්ඩාරනායක යුගයේ ආණ්ඩුව—ඒ ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම කඩාකප්පල් කර දැමූ සැටිත් තමුන්නාන්සෙ දන්නව. හම්බන්තොට තිබුණු ලුණු ලේවාය සම්පූර්ණයෙන් විනාශ කර වෙන තැනක ලේවායක් සකස් කරන්නට ගිහිල්ලා වෙච්ච සිද්ධියත් විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීන්ට මතක් කර දෙන්න කැමතියි. ඒ සිද්ධිය හා සම්බන්ධ තොරතුරුත්, කොමිෂන් සභා වාර්තාවල අඩංගු නොයෙක් කරුණුත්, එකිනෙක ගෙන හැර දක්වමින් දීර්ඝ ලෙස කථා කිරීමට මා මේ අවසථාවේ බලාපොරොත්තු වන්නෙ නැහැ. එහෙත් එකක් කියන්න කැමතියි. අපේ ආණ්ඩුව දැනට කරගෙන යන ව්‍යාපාරය යටතේ අපේ රටට වුවමනා කරන ලුණු ප්‍රමාණය පමණක් නොවෙයි ඊටත් වඩා ලුණු නිපදවන්නට පුළුවන් වේවි. මේ රටට පිටරටවලින් ලුණු ගෙන්වූ බවක් අපේ ලංකා ඉතිහාසයේ කවදාවත් තිබුණේ නැහැ. පසුගිය ආණ්ඩුව පැවති කාලේ පිටරටින් ලංකාවට ලුණු ගෙන්වා ගත්තා. ලංකාව වටේටම තියෙන්නෙ මහ මුහුද. විරුද්ධ පාර්ශ්වයේ තමුන්නාන්සෙලාගෙ අදුරදර්ශි ක්‍රියාවන් නිසා ලුණු කැටයත් අපට පිටරටින් ගෙන්වා ගැනීමට ඒ කාලයේ සිදු වුණා. විදේශ විනිමය ඔය තරමටම පහළ බැස්සෙ ඔන්න ඔය වගේ වැඩ නිසයි. මේ රටේ අවශ්‍යතාවන්ට සරි ලන පරිද්දෙන් පමණක් ලුණු නිපදවීම නොවෙයි අපේ බලාපොරොත්තුව. අපේ රටේ නිපදවන ලුණුවලින් අපට අවශ්‍ය ප්‍රමාණය ප්‍රයෝජනයට ගෙන ඉතිරි හරිය පිටරට පටවා ඒ මගින් අපේ විදේශ විනිමය පවා සකස් කර ගැනීමයි අපේ අදහස.

මැණික් ගැරීමේ කර්මාන්තය ගැනත් රාජාසන කථාවේ සඳහන් වෙනව. අපේ ශ්‍රී ලංකාද්වීපයට පහළ වී තිබෙන වටිනා සම්පත් අතර මැණික් ඉතා වැදගත් තැනක් ගන්න බව තමුන්නාන්සෙ දන්නව. රත්නපුරය මැණික්වලට බොහොම ප්‍රසිද්ධයි. රත්නපුරයෙන් පිටත ප්‍රදේශවලත් දැන් මැණික් ලැබෙන බව මේ ගරු සභාවේ කවුරුත් දන්නව. මැණික්වලින් නියම ආදායමක් ලංකා රජයට ලැබෙන්නෙ නැතැයි විරුද්ධ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පාර්ශ්වයේ ගරු මන්ත්‍රීතුමන්ලා අපේ ආණ්ඩුවට චෝදනා කරනව. එහෙත් ඒ සම්බන්ධයෙන් වැදගත් ක්‍රියා මාර්ගයක් ගන්න අපේ ආණ්ඩුව බලාපොරොත්තු වෙනව. සංවිධානාත්මක වැඩ පිළිවෙළක් අනුගමනය කරමින් අපේ විදේශ විනිමය වැඩි කර ගැනීමට මැණික් කර්මාන්තය උපයෝගි කර ගන්නට බලාපොරොත්තු වන බවත් සඳහන් කරන්න කැමතියි. මැණික්වලින් මේ රටට ලැබිය යුතු ආදායම ලබා ගැනීමට යහපත් පදනමක් මත ක්‍රියා කරන්නට බලාපොරොත්තු වන බව රාජාසන කථාවේ සඳහන් වෙනව.

රෙදිපිළි සම්බන්ධයෙන් අපේ රට ස්වයංපෝෂිත කිරීමට ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය කලක සිට වැඩ කර ගෙන යනව. අත් යන්ත්‍ර දාහක් යොදවා පේසකර්මාන්තය දියුණු කිරීමට පසුගිය අවුරුද්දේ වැඩ ආරම්භ කළා. ඒ අත් යන්ත්‍ර දාහෙන් පුද්ගලයන් විසිපන් දාහකට රක්ෂාවල් ලබා දීමට ඒ යෝජනා ක්‍රමයේ වැඩ පිළිවෙළ සකස් කර තිබුණා. දැනටමත් එයින් විශාල ප්‍රමාණයක් පිහිටුවා තිබෙනව. ඒ මධ්‍යස්ථානවල සැලකිය යුතු පිරිසකට රක්ෂාත් දැනටමත් ලැබී තිබෙනව. පෞද්ගලික අංශයෙනුත් බොහෝ දෙනා දැනටමත් අත් යන්ත්‍ර මධ්‍යස්ථාන පටන් අරන් තිබෙනව. තවමත් අපේ රටට වුවමනා කරන රෙදිපිළි ප්‍රමාණය මෙහිම නිපදවන්නෙ නැති බව පිළිගන්නව. ඉදිරි කාලයේදී තව තවත් වැඩි වැඩියෙන් රෙදිපිළි නිපදවන්නට අපේ ආණ්ඩුව බලාපොරොත්තු වෙනව. අත් යන්ත්‍ර වලින් වැඩ කරන මධ්‍යසථාන වලට මේ ආණ්ඩුව දැනටමත් ආධාර දීගෙන යනව. පොල්ගහවෙල, තුල්හිරියේ විශාල කර්මාන්තශාලාවක් ආරම්භ කරගෙන යනව. එපමණක් නොවෙයි. විදුලි බලයෙන් රෙදි වියන මධ්‍යසථාන තවත් 50ක් පිහිටුවීමටත් මේ රජය දැනටමත් විධිවිධාන යොදා තිබෙන බව මා මේ අවස්ථාවේදී ඉතාම සන්තෝෂයෙන් මතක් කරන්ට සතුටුයි.

ජාතික වේතන සභාවක් පිහිටුවීමටත් අපි අදහස් කරනව. අපේ රටේ ජනතාවගේ වැටුප් ක්‍රමවල නොයෙකුත් විෂමතාවයන් තිබෙන බව අපි දන්නවා. එම නිසා මේ සියලුම වැටුප් ක්‍රම පිළිබඳව සම්පූර්ණ පරීක්ෂණයක් කර වර්තමාන තත්ත්වයට ගැලපෙන පරිදි, ඒ ඒ වෘත්තීන්ට ගැලපෙන පරිදි වැටුප් ක්‍රම සකස් කිරීමට අපි කටයුතු කරගෙන යන බව මා ඉතාම සන්තෝෂයෙන් මතක් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිවාස ණය ඉල්ලුම්කරුවන්ට මහත් දුෂ්කරතා රාශියකට මුහුණපාන්නට සිදුවන බව අපි දන්නවා. බොහෝ අවස්ථාවලදී ඔප්පු නිරවුල් නැත කියා වාර්තා කරනව. අවුරුදු හතළිස් අටක් සොයා ගෙන යන ඔප්පුවෙ සමහර විට හතළිස් නවවැනි අවුරුද්දෙ මොකක් හරි පොඩි වරදක් පෙනෙනව. ඉතින් නීතිඥ මහත්වරු ඒ ඔප්පුව අවුරුදු 50ක් නිරවුල් නැත, එම නිසා අනුමත කරන්ට නොහැකිය කියා වාර්තා කරන සිරිතක් තිබෙනව. අප ඒ නීති ලිහිල් කිරීමට බොහෝ කාලයක් තිස්සේ ප්‍රයත්න දරා ගෙන යනවා. ලබන අවුරුද්ද තුළදී ඒ නිවාස ණය වුවමනා අයට නීතිය ලිහිල් කිරීමට අප කටයුතු සංවිධානය කර තිබෙන බව මා සන්තෝෂයෙන් මතක් කරන්ට සතුටුයි. නිවාස දෙපාර්තමේන්තුවට නිතරම ලැබෙන තවත් පැමිණිල්ලක් තිබෙනව. "මගෙ ඉඩම නීතිඥ මහත්වරු ප්‍රතික්ෂේප කළා ; නමුත් අවුරුදු හතළිස් අටක් තිස්සෙ අපි මේ ඉඩමෙයි පදිංචිව සිටියෙ ; අපේ තාත්තත් සීයත් සිටියෙ මේ ඉඩමෙමයි ; නමුත් දැන් නීතිඥ මහත්වරු මේ ඉඩමට ණය මුදලක් ගන්න බැරිය කියනව" යන පැමිණිල්ල අපට නිතරම ලැබෙනව. ජනතාවට ඒ විධියෙ අමාරුකම් තිබෙනව. ඒ අමාරුකම්වලින් මුදා ජනතාවට සහනයක් අත් කර දීමට අපි සෑහෙන විධිවිධාන යොදා තිබෙන බව මා සන්තෝෂයෙන් මතක් කරන්ට සතුටුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විරුද්ධ පක්ෂය එදත් රාජාසන කථාව නරකය කිව්ව. අදත් රාජාසන කථාව නරකය කියනව. නමුත් මේ රාජාසන කථාව කාලයට ඔබින, වර්තමාන තත්ත්වයට ඔබින, ජනතාවගේ දියුණුව උදෙසා සකස් කර තිබෙන රාජාසන කථාවක් බව මතක් කරමින් මගේ කථාව මෙයින් අවසාන කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 10.25

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்கிரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රාජාසන කථාව ගැන මට මුලින්ම කියන්ට තිබෙන්නෙ මේකයි. කතරගම යනකොට පාර අයිනෙ දිවුල් විකුණන්ට තබා තිබෙනව. දිවුල් ගැන හරියට නොදන්න අය මේ දිවුල් අරගෙන බිඳිනව. බිඳ බැලුවම දිවුල් ගෙඩියෙ ඇතුළ පුහු. අලිය ගිලපු දිවුල්. මේ රාජාසන කථාවත් අලිය ගිලපු දිවුල් ගෙඩිය වගෙයි. මැද මොකවත් නැහැ. අනිත් කාරණය මේ ආණ්ඩුව අද ගමන් කරන්නෙ නිදිමත ගතියකින්. දවල් වන තුරු නිදා ගන්න මිනිහ වස්තු භංගත්වයට පත් වෙනවාය කියා පුරාණ කවියක් තිබෙනව. ඒකට උපමා කරනව අලිය ගිලපු දිවුල් ගෙඩිය. තමුන්නාන්සෙට දැනගන්ට වුවමනා නම් මම ඒ කවියෙ පද දෙකක් කියන්නම් :

" නිදන දන උදූ වන තෙක් රිවි කිරණ
නිදන වේය ගිලි දිවුලු සෙ මත වරණ "

මේ ආණ්ඩුවත් අන්න ඒ තත්ත්වයටයි වැටිල තියෙන්නෙ. මේ රාජාසන කථාව අලිය ගිලපු දිවුල් ගෙඩිය වගෙයි ; ඒ ගොල්ලන්ගෙම අලිය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජාසන කථාව ගැන වැඩිදුර යමක් කියන්ට ප්‍රථමයෙන් දෙහිවල-ගල්කිස්ස ගරු මන්ත්‍රීතුමා (එස්. ද එස්. ජයසිංහ මයා.) මතු කළ ප්‍රශ්න කීපයකට පිළිතුරු දිය යුතුව තිබෙනව. ඒ ගරු මන්ත්‍රීතුමා ග්‍රාම සේවක ප්‍රශ්නය ගැන ඊයෙ බොහොම තදින් කථා කළා. ග්‍රාම සේවක ප්‍රශ්නය ගැන කථා කරමින් එතුමා කිව්ව, ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුවට වුවමනා හැටියට, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අනුගාමිකයින් ග්‍රාම සේවක තනතුරුවලට පත් කොට, එමගින් ඡන්ද ලැයිස්තු වෙනස් කර, සෑම ඡන්ද කොට්ඨාශයකම ඡන්ද ලැයිස්තුවලට හොර ඡන්ද තුන් දහස බැගින් ඇතුළු කර පාර්ලිමේන්තුව විසුරුවා හැර සෑම ආසනයකින්ම ජයග්‍රහණය කරන්ට අපේ විරුද්ධ පක්ෂයේ නායිකාව තුළ බලාපොරොත්තුවක් තිබුණාය කියා.

**එස්. ද එස්. ජයසිංහ මයා.**
*(திரு. எஸ். டி எஸ். ஜயசிங்க)*
(Mr. S. de S. Jayasingha)

මම ඒක ඊයෙත් කිව්ව. දැනුත් කියනව.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்கிரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

කී නිසා තමයි මම උත්තර දෙන්නෙ.

එතුමා ඒ ප්‍රකාශය කළාට සවදේශ කට යුතු භාර ගරු ඇමතිතුමාවත් අපෙ විරුද්ධ පක්ෂයේ නායිකාව පිළිබඳව එවැනි ප්‍රකාශයක් කරාවිය කියා මා සිතන්නෙ නැහැ.

**එස්. ද එස්. ජයසිංහ මයා.**
*(திரு. எஸ். டி எஸ். ஜயசிங்க)*
(Mr. S. de S. Jayasingha)

ඒක අහගන්න ඒ ඇමතිතුමාගෙන්.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

ග්‍රාම සේවකයින් පත් කළ අවසථාවේදී, මේ ග්‍රාම සේවක ප්‍රශ්නය ඉදිරිපත් කළ අවස්ථාවේදී අප එදා මේ ගරු සභාවේ සිටි බව මා මතක් කරන්ට සතුටුයි. ග්‍රාම සේවකයන් පත් කිරීමේදි විභාගයක් පවත්වා, එයින් සමර්ථ වුණු අයවලුන්ගෙ නම් ගැසට් කර ඒ ඒ ගම්මුලාදෑනි කොටස් අනුව පත් කරන්ට යෙදුණ. ඒ අන්දමට වැඩිම ලකුණු ගත් අයයි එම ඇබෑර්තුවලට පත් වුණේ. එම අවස්ථාවෙදි ඒ පිළිබඳව විවාදයක් ඇති වුණා. එවේලෙ ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා නැගිට අභියෝගයක් කළා, "එම පත්කිරීම් සම්බන්ධයෙන් යම් අක්‍රමිකතාවයක් සිදු වී තිබෙනව නම් ඕනැම කෙනෙකු නැගිට එය පෙන්වා දෙන්ට ; එසේ පෙන්නුම් කළොත් මම ඉල්ලා අස් වන්ට සූදානම්" යනුවෙන්. නමුත් එදා කිසිම අක්‍රමිකතාවයක් කොයිම මන්ත්‍රීවරයකුටවත් පෙන්වන්ට පුළුවන් වුණේ නැහැ.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙ ආණ්ඩුව මගින් මේ විධියෙ වැඩ දෙකක් කළා. එකක් තමයි, ග්‍රාම සේවකයන් පත් කිරීම අනික තමයි, ශිෂ්‍ය ගුරුවරුන් පත් කිරීම.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නිසි අන්දමට විභාග පවත්වා ලබා ගත් ලකුණු අනුව අප්‍රමාදව නම් ගැසට් කර මුළු මහත් ජනතාවටම තත්ත්වය පෙන්නුම් කිරීමෙන් පසුවයි, පත්වීම් දුන්නෙ. එදා විරුද්ධ පාර්ශ්වයෙ සිටි මන්ත්‍රීවරයෙකු වශයෙන් මා අද මෙහිදී ප්‍රකාශ කර සිටිනව, ඒ පත්වීම් දුන්නෙ සාධාරණ අන්දමටය කියා. එවැනි තත්ත්වයකිනුයි, ග්‍රාම සේවකයන් පත් කරන්ට යෙදුණේ. නමුත් අද මන්ත්‍රීවරයෙක් ඇවිත් විලිලජ්ජා නැතුව මේ රටේ හිටපු අගමැතිවරියට—ලෝකයෙ පළමුවන අගමැතිවරියට—නින්දා අපහාස වන අන්දමට කතා කළා. සෑම ආසනයකටම ඡන්ද 3,000 බැගින් ඇතුළත් කරගෙන කටයුතු කරන්ට එතුමිය සූදානම් වුණායැයි කීම කනගාටුවට කරුණක්. එතුමා හැරෙන්නට වෙන කිසි කෙනෙක් ඔවැනි ප්‍රකාශයක් කරන්නෙ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සෙ දන්නව, කාටද හොර ඡන්ද ව්‍යාපාරය ගැන පළපුරුද්දක් තිබෙන්නෙ කියා. කොයි පිලේද හොර ඡන්ද තක්කඩින් සිටින්නෙ කියාත් තමුන්නාන්සෙ දන්නව. හොර ඡන්ද නැතුවාට සාධාරණව යුක්ති සහගතව ඡන්ද ලබා ගෙන වැඩි කල් යන්ට මත්තෙන් එක්සත් ජාතික පක්ෂයත් හත් හවුලත් ලංකා භූමි තලෙන් අතුගා දමන්ට අපට පුළුවන්කම ලැබෙන බව මා මෙහිදී කියන්ට කැමතියි.

දිස්ත්‍රික් සභා ගැන දෙහිවල-ගල්කිස්සෙ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. එම පනතත් මේ සභාවට ඉදිරිපත් වන නිසා මා ඒ ගැන කතා කරන්ට බලාපොරොත්තු වන්නෙ නැහැ. එතුම කීව, බෝඩ් ලැල්ල ගළවන එක විතරය කියා. "කච්චේරිය" යන්නට "දිස්ත්‍රික් සභාව" කියා බෝඩ් ලැල්ලක් දමාවිය කීව. පෙඩරල් පක්ෂය බෝඩ් ලැල්ල පමණක් ගළවා නිකම් සිටීවිද, එ පමණකින් නවතින්ට ඔවුන්ගෙන් අවසර ලැබේවිද, කියන ප්‍රශ්නයයි අපි අහන්නෙ. දිස්ත්‍රික් සභා ගැන මේ වර රාජාසන කථාවෙත් පසුගිය රාජාසන කතාවෙත් සඳහන් වුණා. එම පණත ඉදිරිපත් වුණු විට අපට පෙනේවි, බෝඩ් ලැල්ල ගැළවීමක් පමණක් සිදු වෙනවද කියා. මේ බෝඩ් ලැල්ල ගළවන එකට ද්‍රවිඩ සංගමය සම්පූර්ණයෙන්ම විරුද්ධයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජාසන කතාව කියවන්ට පටන් ගන්නෙ කොහොමද? බොහොම ලස්සනට පටන් ගන්නව. අපේ නිලධාරි මහත්වරු පිහාටු තොප්පි දමා ගෙන එනව. වේත්‍රධාරීන් මෝල් ගස් ගිලපු අය වාගෙ පොල්ල උස්ස ගෙන එනව. අපි සියලු දෙනාමත් කැඳවනව. විශේෂ අමුත්තනුත් කැඳවනව. ඒ අන්දමට මහා ලොකු ජරමරයක් කරලයි, මෙම කතාව කියවන්ට පටන්ගන්නෙ. මේ වර එය භාෂා තුනෙන්ම කියවන්ට පැය එක හමාරක් විතර ගියා. අපිත් වාඩි වෙලා අහගෙන ඉන්නව. ඊළඟට තමුන්නාන්සෙත් ඔතන වාඩි වෙනව. මේ ගැන විවාදයක් කරන්ටත් පටන් ගන්නව. එතකොට අපි එකක් කියනව. අනික් පැත්තෙන් තව එකක් කියනව. එච්චරයි වෙන්නෙ. කවදාවත් මොනම ආණ්ඩුවකටවත් පුළුවන් වුණාද, රාජාසන කතාවක් ක්‍රියාත්මක කරන්ට. මේ සඳහා අපේ කාලෙත් තමුන්නාන්සෙගෙ කාලෙත් නිකම් ගත වෙනව. මේව අධිරාජ්‍යවාදීන්ගෙන් ඉතිරි වෙච්ච දේවල්. මෙවැනි සම්ප්‍රදායයන් අතහැර දමන්ට බැරිද? මේව කළේ නැතුවට අපට කරන්ට ඕනෑතරම් වැඩ තියෙනව. නමුත් මේක විවාදයට අරගත්තාම ඒක කරන්ටත් එපායැ. දැන් ඉතින් අපි මෙහෙන් කියනව. ඒ උදවිය එහෙන් කියනව. ඔක තමයි, රාජාසන කතා විවාදය. "මාගේ ආණ්ඩුව අරෙහෙමයි, මෙහෙමයි" කියන එක තමයි හැමදාම මෙම රාජාසන කතාවෙ තියෙන්නෙ.

ඒවගෙම ප්‍රජාතන්ත්‍රවාදය ගැනත් කතා කරනව. දැන් අමුතුම විධියක ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදයක් ගැන කතා කරනව. නමුත් ආණ්ඩු කරන්නෙ හදිසි නීතිය දමා ගෙන. ඕකද, ප්‍රජාතන්ත්‍රවාදය? ජාතික සමගිය ගැන කතා කරන්ට පෙර හදිසි නීතිය ඉවත් කරන්න. "අපේ ආණ්ඩුව ජාතික සමගිය ගොඩ නගා තිබෙනවා" යනුවෙන් කියනව. අපි සියලුදෙනාම සාමකාමීව, සාමදානයෙන් යුතුව ජීවත් වෙනව නම්, අපි සැම දෙනා ලඟම ජාතික සමගියක් තිබෙනව නම්, ඇයි හදිසි නීතිය දමන්නෙ? තුවක්කුවයි පොලිස් පොල්ලයි මොකටද සාමයෙන් ඉන්නවානම්? හදිසි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි වික්‍රමසිංහ මයා].
නීතිය තියන කොට පමණක් ජාතික සමගිය තිබෙන බවයි අපට පෙනී යන්නෙ. ඔන්න රාජාසන කථාවෙ තිබෙන ජාතික සමගිය.

ඊ ළඟට මේ සියල්ලම අමතක කර ගොවිතැනට ප්‍රමුඛත්වය දී තිබෙනව. මොකටද ? ගොවිය රජ කරන්න. අපි කාගෙවත් ඒ ගැන විරුද්ධත්වයක් නැහැ. මේ රට ස්වයංපෝෂිත කිරීම සම්බන්ධයෙන් කරන කටයුතුවලට එදත් අදත් කවදත් කිසිම කෙනෙක් විරුද්ධ නැහැ. සැම කෙනෙකුගේම සහයෝගය ඒ සඳහා ලැබෙනව. නමුත් ඒකට නොවෙයි අපේ විරුද්ධත්වය. රට ස්වයංපෝෂිත කරනවාය කියා නිෂ්ප්‍රයෝජනෝ විශාල ධනස්කන්ධයක් වැය කෙරෙනවා නම් අන්න ඒකට අපි විරුද්ධයි. ඒ වාගේම රට ස්වයංපෝෂිත කරනවාය කියා ඒ කටයුතු කිරීමේදී මහජනතාවගේ ඡන්දයෙන් පත් වූ මන්ත්‍රීන් පිරිසක් පැත්තකට කර, ඒ උදවිය සමග තරඟ කර පරාජය වූ උදවිය අරගෙන ඒ කටයුතුවල යෙදවීමෙන් ආණ්ඩුව බලාපොරොත්තු වන සහයෝගය මොකක්ද කියා තමුන්නාන්සේ කල්පනා කර බලන්න.

පසු ගිය කාලයේදී, විශෙෂයෙන්ම පසු ගිය යුද්ධ කාලයේදී, මේ රටේ සමුපකාර ක්‍රමය දියුණු වී, ඊට පසු පසුගිය ආණ්ඩුව මගින් විවිධ සේවා සමුපකාර සමිති ක්‍රමය ද ආරම්භ වූ බව තමුන්නාන්සේලා දන්නවා ඇති. මේ සමුපකාර ක්‍රමය තුළින් සාමාන්‍ය මහජනතාවට විපුල ප්‍රයෝජනයක් ලැබෙන බව තමුන්නාන්සේලා දන්නව. සමුපකාර ක්‍රමයට කිසිම කෙනෙක් විරුද්ධත්වය ප්‍රකාශ කර නැහැ. එහෙත් අද මේ රජය අරගෙන ඇති පියවරවලින් විවිධ සේවා සමුපකාර සමිති වසා දමන තත්ත්වයක් ඇති වී මුළු සමූපකාර ක්‍රමයටම පහරක් වැදී තිබෙනව. ඒ මන්ද? හාල් සේරුව කපූ නිසා වී මිල වැඩි වී තිබෙනව. සමුපකාර සමිති වී ගන්නේ බුසලක් රුපියල් 12 බැගිනුයි. නමුත් රුපියල් 13ට 14ට පිට විකුණන්න තිබියදී ගොවියන් රුපියල් 12 බැගින් සමුපකාරයට දේවිද ? ඒ නිසා සමුපකාරය ලබන ආදායම නැති වී ගියා. හාල් සේරුව කපා දමූ නිසා හාල් වෙළඳාමෙන් ලැබෙන ආදායම නැතිවී ගියා. ඒ වාගේම පරිප්පු, ලූනු, මිරිස්, උම්බලකඩ, ආදී ආහාර ද්‍රව්‍ය මංචාඩි ක්‍රමයට දෙන විට සමුපකාරය ලබන ආදායමත් මංචාඩි ගණනට බැස්සා. ඒ නිසා එතැනින් ලැබෙන ලාභයත් නැති වුණා. අද කළමනාකාරවරුන්ටත් පඩි ගෙවන්න බැරි තත්ත්වයකට සමුපකාර සමිති වැටී තිබෙනව. කිසිම පිද්දවීමක් නැතිව, එක පාරටම ගහන්නෙ නැතිව, සමුපකාර සමිති ක්‍රමය ක්‍රමක්‍රමයෙන් සම්පූර්ණයෙන්ම කාබාසිනියා කිරීමේ වැඩ පිළිවෙළක් තමයි අද මේ ජාතික රජයෙන් කරගෙන යන්නෙ.

ජාත්‍යන්තර සමුපකාර උත්සව පවත්වනව. නොයෙකුත් ප්‍රකාශ කරනව. නමුත් සංගම්වල තත්ත්වය දෙස බලන්න. මහජන ඡන්දයෙන් සමූපකාර සංගම්වලට පත් වී සිටි නියෝජිතයන් ඒවායින් සම්පූර්ණයෙන්ම ඉවත් කර අද ඒ සංගම් රජයේ නිලධාරීන්ට භාර දී තිබෙනව. ඩී. ආර්. ඕ. මහත්වරු තමයි සමූපකාර සංගම් වල සභාපතිවරු. යම් කිසි සංගමයක කාරක සභාවක් විසින් යම් කිසි වැරදි අන්දමකින් ක්‍රියා කළා නම්, ඒ කාරක සභාව එයින් ඉවත් කර ඒ වෙනුවට අනික් සාමාජික භවතුන්ගෙන් යුත් අලුත් කාරක සභාවක් පත් කිරීමට පුළුවන්කම තිබෙනවා නොවේද ? එවැනි පුළුවන්කමක් තිබියදී එය ක්‍රියාත්මක නොකර සමුපකාර සංගම් පෞද්ගලික අයගේ පාලනයට දී තිබීමෙන් ඇති වී තිබෙන තත්ත්වය කුමක්ද ?

තමුන්නාන්සේ දන්නවා ඇති, දැරුන්ගල උස් බිම් යෝජනා ක්‍රමය ගැන. තේ වගා කිරීම සඳහා ගොවීන්ට අක්කර දෙක තුන බැගින් දීමේ ඒ යෝජනා ක්‍රමය යටතේ කඹුරුපිටිය, මාතර, අකුරැස්ස, ආදී කොට්ඨාශවලින් මහජනයා ගිහින් ඉඩම් අරගෙන ඒවායේ පදිංචි වී ඒ මගින් උස් බිම් යෝජනා ක්‍රමයේ වැඩ කටයුතු කරගෙන ගියා. ඒ පිළිබඳ කටයුතු කෙළේ පළාතේ දිසාපතිතුමායි. දැන් එය රාජ්‍ය වැවිලි සංයුක්ත මණ්ඩලයට භාර දී තිබෙනව. එසේ භාර දීමෙන් අද සිද්ධ වී තිබෙන්නෙ කුමක්ද? ඒවායේ තිබුණ සමූපකාර සමිති සංගම් සංයුක්ත මණ්ඩලයට අරගෙන අර තිබුණ සමූපකාර සමිති සංගම්වල ක්‍රියාකාරිත්වය සම්පූර්ණයෙන්ම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නැති කර දමා තිබෙනව. මේක තමයි ප්‍රජාතන්ත්‍රවාදය. මේක තමයි තමුන්නාන්සේලා ගොවි ජනතාව උසස් කිරීම සඳහා අත දීමට කරන වැඩ පිළිවෙල.

මේවා මෙහෙම කෙරෙද්දී තමුන්නාන්සේලා ඔය පැත්තෙ ඉඳගෙන ගොවිතැන ගැන කථා කරනව. අස්වැන්න වැඩි කිරීම ගැන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ව්‍යාපාරයක් ගෙන යනව. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙ ව්‍යාප්ති අංශයෙන් විශාල ප්‍රචාරයක් කර පෝර ආදිය දීමෙන් ඒ උපදෙස් අනුව කටයුතු කිරීම නිසා එච්-4 නමැති වී වර්ගයෙන් වැඩි අස්වැන්නක් ලබාගෙන තිබෙනව. එය ලබා ගැනීමට හැකි වූයේ අර මා කලින් කී පරිදි, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙ ව්‍යාප්ති අංශයේ ප්‍රචාරය නිසයි. ඒකට ගරුත්වය ලබාගන්න හදනව අපේ අධ්‍යාපන ඇමතිවරයා. උන්නැහෙ කියනව, ඉස්කෝල ළමයින් කුඹුරු වැඩට දමා වල් නෙළීම නිසා අස්වැන්න වැඩි වුණාය කියා. කොහොම වුණත් මම එතුමාට මතක් කර දෙන්න කැමතියි, ඉස්කෝල ළමයින්ට "වැඩ හුරුවීමේ සතිය" කියා නොයෙකුත් දේවල් පැවැත්තුවත්, සාමාන්‍ය ගම්බද දෙමව්පියන් ළමයින් ඉස්කෝල යවන්නෙ වැඩ හුරු වීමට නොවෙයි, ඉගෙන ගැනීමට බව. මොකද? ගම්බද ළමයින්ට වැඩ හුරු වෙන්න ඕනෑ තරම් අවස්ථා තිබෙනව ; ඕනෑතරම් වැඩ හුරු වෙනව. ඒ ළමයින් තමන්ගෙ වත්තෙ වැඩ කරනව ; වතුර අදිනව ; ගෙදර වැඩ කරනව ; කන්න උයනව ; තමන්ගේ ගේදොර මිදුල අතුපතුගාගෙන සුද්ධ කර ගන්නව ; මේ ආදී දහසකුත් වැඩ කරනව ; ඒ නිසා අමුතුවෙන් වැඩ හුරු වන්න දෙයක් නැහැ. ඕනෑම ගම්බද දරුවෙක් ඉපදිල ටික දවසක් යන කොට වැඩට ඉබේටම හුරු වෙනව. එම නිසා ගම්බද ළමයින්ට වැඩ හුරු වීමක් ගැන කථා කිරීමේ තේරුමක් නැහැ.

මෙහිදී කල්පනා කරන්න ඕනෑ මෙන්න මේ කාරණයයි. විශේෂයෙන්ම ගම්බද ළමයින්ට බොහෝ අවස්ථාවලදී අඳින්ට තිබෙන්නෙ ඇඳුම් දෙකයි. එහෙම නම් ඉගෙනීම සඳහා පාඨශාලාවලට යන ළමයින් වල් නෙළීමටය කියා කුඹුරුවල බඩගෑමට දැමීමෙන් ඇති වන තත්ත්වය ගැන කල්පනා කළාද? වැඩ හුරු වීමටය කියා විහලක් සෑදීම සඳහා ළමයින් යොදවා එයින් එක් ළමයෙක් පරාලයක් කඩාගෙන වැටී එතැනම මැරුණා. මේ දුප්පත් ළමයින්ට වන්දි ගෙවන්නෙ කව්ද? මෙය පසුගිය දවස්වල සිදු වුණු දෙයක්. අපේ ප්‍රදේශයෙ වල් නෙළන්නට කැලයට යැවූ ළමයින් කණ්ඩායමින් එක් ළමයෙක් සර්පයෙකුට භය වෙලා තොවිල් දෙක තුනක් නටන්නත් සිද්ධ වුණා. ඇමතිතුමා මෙහෙන් නටනව, වැඩ හුරු කරන්නටය කියමින් අහිංසක පුංචි ළමයින් කුඹුරුවලට දාල. මම අහන්නෙ ඇමතිතුමා කැමතිද ඇමතිතුමාගෙ ළමයින් අර කැලෑවලට පිටත් කරන්න, වැඩ හුරු කරන්ටය කියල? එහෙම නැත්නම් වෙන ගරු මන්ත්‍රීවරයෙක් කැමතිද? නැහැ. කවුරුන්වත් කැමති නැහැ. එහෙම නම් මේක සම්පූර්ණයෙන්ම මහ විහිළුවක් නේද?

අපි කැමතියි, ශ්‍රමදාන ව්‍යාපාරයට. නමුත් ඇත්ත වශයෙන්ම අපේ ගොවිතැන දියුණු වී තිබෙන්නෙ ඔය වල්නෙළීම වාගෙ දේවල් නිසා නොවෙයි, ගොවීන්ගෙ උත්සාහය නිසා. ගොවීන් නිසියාකාර පෝර දමා, පේළියට ක්‍රමානුකූලව පැළ සිටෙව්වාම "සීඩර්" ප්‍රයෝජනයට ගනිමින් නියම අන්දමට වැපුරුවාම නිෂ්පාදනය වැඩි වෙනව, ගොවිතැන දියුණු වෙනව. එහෙන් බස්නායක මහත්මය "තායිවාන්" වී ගෙන්වනව. මෙහෙන් එන්. එම්. අප්පුහාමි, එතකොට වික්ටර් රත්නායක ඔය ආදී මහත්වරු, අයි.ආර්.ඩී.ඩී., එච්-8 කියන වී වර්ග ගෙන්වනව. බොහොම හොඳයි, වී වර්ග ගෙන්වා පර්යේෂණ කිරීම. එන්. එම්. අප්පුහාමි මහත්මය ප්‍රකාශ කර තිබෙනව අයි.ආර්.ඩී.ඩී. කියන වී වර්ගය අපේ රටට ඉතා හොඳය කියා. ඒ වාගේම වික්ටර් රත්නායක මහත්මයත් පර්යේෂණ කරන වී වර්ගය හොඳයි කියා තිබෙනව. මේ අන්දමට පර්යේෂණ පැවැත්වීම හොඳයි. එයින් අපේ වී වගාව දියුණු වෙනව. නමුත් රජයත් මේවා ගැන උනන්දුවෙන් ක්‍රියා කරන්න ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඩී. බී. වෙලගෙදර මයා. (ජනසතු සේවා ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. டீ. பி. வெலகெதர—தேசியமய சேவை அமைச்சரின் பாராளுமன்றக் காரிய தரிசி)*

(Mr. D. B. Welagedera—Parliamentary Secretary to the Minister of Nationalized Services)

පර්යේෂණ කරගෙන යනව.

**පර්සි වික්‍රමසිංහ මයා.**

*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*

(Mr. Percy Wickremasinghe)

කවදද ඔය පර්යේෂණ ඉවර වෙන්නෙ? අධ්‍යාපන ඇමතිතුමා ළමයින් යොදවා වල් නෙළීම නොකළාට අස්වැන්න වැඩියෙන් ලැබිය හැකි වී වර්ගයක් නියම අන්දමට පොහොර යොදා ක්‍රමානුකූලව වගා කළාම අස් වැන්න වැඩියෙන් ලබාගන්න පුළු වනි. ගොවීන් ඒක අවබෝධ කර ගෙන තිබෙනව. ඒ අන්දමට කටයුතු කළ නිසයි මෙවර අස්වැන්න වැඩි වී තිබෙන්නෙ. ඒ අතරම අනික් පැත්තෙන් හිටපු අග්‍රවිනිශ්චයකාර බස්නායක මහත්මය රටේ හැම තැනකම යනව. උන්නැහෙ යම්කිසි වැඩක් කරනව. ඒක රහසක් නොවෙයි. ලංකාවෙ සෑම කොට්ඨාශයක් ගානෙ ගිහින් වැව් බලනව, පොකුණු බලනව, සොරොව් බලනව; ගොවීන් සමග සාකච්ඡා කරනව. ඒ පිළිබඳව වාර්තාවකුත් ආණ්ඩුවට ඉදිරිපත් කර ඇති බව පසුගිය දවස්වල පත්‍ර මාර්ගයෙන් අපට දැනගන්න ලැබුණා. එම වාර්තාවෙ වැදගත් කරුණු රාශියක්ම ගැබ් වී තිබෙනව. වෙනත් මැති ඇමතිවරු වාගෙ නොවෙයි, උන්නැහෙ සෑම තැන කම ඇවිද්දා. ගොවීන් සමග සාකච්ඡා කළා, අස්වැන්න වැඩි කිරීමේ ක්‍රම ගැන. කවුරුන් කළත් හොඳ වැඩකට හොඳය කියන්න ඕනෑ. එසේ රට හැමතැනකම ගොස් ඒවා ගැන සොයා බලා රජයට වාර්තාවක් ඉදිරිපත් කළත්, ඒවා ක්‍රියාත්මක කිරීමට පියවරක් ගන්නවාය කියාවත් රාජාසන කථාවෙ සඳහන් කර තිබෙනවද? නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රැකී රක්ෂා ප්‍රශ්නය ගැනත් කථා කරනවා පමණයි, නමුත් මෙම ප්‍රශ්නය විසඳීමට ස්ථිර වැඩ පිළිවෙළක් මේ දක්වා අනුගමනය කර නැහැ. ස්ථිර වැඩ පිළිවෙළක් අනුගමනය කිරීම තබා ගන්නා වැඩ පිළිවෙළක් ගැනවත් සඳහන් කර නැහැ. "මාගේ ආණ්ඩුව කල්පනා කරනව." එදා සිටන්ම කල්පනා කරනව. ප්‍රශ්නය දවසින් දවසම උග්‍ර වෙනව. දැන් උපාධිධාරීන්ම පමණක් හය දහසකට වඩා සිටිනව රක්ෂා නැතුව. ඒ සම්බන්ධයෙන් කිසිවක් මතක් කර නැහැ. එපමණක් නොවෙයි, රැකිරක්ෂා ප්‍රශ්නය විසඳීම සම්බන්ධයෙන් පසුගිය ආණ්ඩුව මේ රටේ කර්මාන්ත රාශියක්ම ආරම්භ කළා. නමුත් දැන් කියන්නෙ මොකක්ද? දෙහිවල-ගල්කිස්ස මන්ත්‍රීතුමා (එස්. ද එස්. ජයසිංහ මයා.) කියනව, පටන් ගත් ඒ කර්මාන්ත බොහොම දුර්වලලු; බ්ලේඩ් තලයක් ගත්තාම රැවුල හරියට කැපෙන් නෙත් නැතිලු. ලංකාවේ නිපදවන දැලි පිහියා තලවලින් රැවුල කැපෙන්නෙ නැතිලු. එහෙම නම් කරන්නට තිබෙන්නෙ ඒ කර්මාන්තයේ යෙදී සිටින්නන්ට නියම උපදෙස් හා උපකරණ සපයා දී ඔවුන්ගේ නිෂ්පාදන හොඳ තත්ත්වයට ගෙන එන් නට උදව් කිරීමයි. පිටරට නිපදවන "බ්ලේඩ්ස්" සමග තරග කරන්නට පුළු වන් වන විධියට අපේ රටේ "බ්ලේඩ්ස්" නිපදවිය යුතු බව නිෂ්පාදකයන්ට කියා ඒ සඳහා අවශ්‍ය ගුරුහරුකම් ඔවුන්ට දිය යුතුයි.

ලංකාවේ නිපදවන බයිසිකල් ටයරයක් සුමාන තුනකින් තරම පුපුරා යනවා නම් එය වඩා හොඳට නිෂ්පාදනය කිරීමට විධි විධාන යෙදිය යුතුයි. අපේ රටේ නිෂ්පාදන වල තත්ත්වය උසස් කර ගැනීම අපේ යුතුකමයි.

විදේශ විනිමය ආරක්ෂා කර ගැනීම සඳහා පසුගිය රජය මේ රටෙහි නොයෙකුත් කර්මාන්ත ආරම්භ කළා. නමුත් අද ඒවා නොයෙකුත් පුද්ගලයන්ගේ අතට යවන් නට වැඩ සකස් කෙරෙනවා. බ්ලේඩ් එකෙත්, ටයර් එකෙත් වරද පෙනෙන්නෙ ඒ නිසයි. අපේ ප්‍රදේශයේ රටහුණු කර්මාන්ත ශාලාවක් ආරම්භ කළා. නමුත් ඒකෙන් පාඩුලු. දැන් ඒක පෞද්ගලික අංශයට දෙන්නට යනවා. රුපියල් ලක්ෂ ගණනක් වියදම් කොට කර්මාන්ත ශාලාවක් ආරම්භ කර පසුව එය පෞද්ගලික අංශයට දෙන්නට යනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආණ්ඩුව සංයුක්ත මණ්ඩලවලින් ලාභ පෙන්වන්නට කැමැති නැහැ. ඒවා හැම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එකෙන්ම පාඩුලු. ඒවායින් පාඩු පෙන්වා බඩ මහත මුදලාලිලාට ඒවා පවරා දෙන්නටයි, මේ ආණ්ඩුව උත්සාහ කරන්නේ. මේ විධියේ පිළිවෙතක් අනුගමනය කරන ගමන් කියන්නේ නම් දශරාජ ධර්මයෙන් රට පාලනය කරන බවයි. දශරාජ ධර්මයට නොව දශ අකුශලයට නම් දැන් මේ රජය වැටී සිටිනවා.

ගොවියන්ට සහනයක් සැලසීම සඳහා ණය පහසුකම් ඇති කර තිබෙන බව දැන් මේ රජය හැම තැනම ප්‍රචාරය කර තිබෙනවා. ණය ගැනීම සෙල්ලමක් නොවෙයි. ගොවීන්ට දෙන්නට යන මේ ණය මුදල් වල පොලිය කීයද ? සියයට 12 යි. " බ්ලැක් මාකට් " ගණනටයි, ආණ්ඩුව ගොවීන්ගෙන් පොළී අය කරන්නේ. මහජන බැංකුව අය කරන පොලියටත් වඩා වැඩි පොලියක් ගොවීන්ට දෙන ණය වෙනුවෙන් ආණ්ඩුව අය කරනවා. ඉතින් මේ විධියට ණය දීමෙන් ගොවීන්ට ප්‍රයෝජනයක් ලැබෙනවාද ? ගොවීන්ට ප්‍රයෝජනයක් ලැබෙන්නට නම් අඩු පොළියට ණය දෙන්නට ඕනෑ. එසේ නැත්නම් පොළියක් නොගෙන ණය දෙන්නට ඕනෑ. එසේත් නැත්නම් රබර් වතුකාරයන්ට තේ වතු කාරයන්ට දෙනවා වගේ ආධාර මුදලක් දෙන්නට ඕනෑ.

අද ගංවතුර නිසා අමාරුවේ වැටුණු ගොවියන්ට ඊළඟ කන්නයේ ගොවිතැන් වැඩ කරන තුරු ආධාර මුදල් ලබා ගන්නට බැරි තත්ත්වයක් තිබෙනවා. නමුත් මේ ආණ්ඩුව හැම විටම කථා කරන්නේ රට ස්වයංපෝෂිත කිරීම ගැනයි. රට ස්වයංපෝෂිත කරන්නට වුවමනා නම් ගොවීන්ගේ තත්ත්වය ආරක්ෂා කිරීමට විධිවිධාන යෙදිය යුතුයි.

නිවාස ගැන කියන්නට යෙදුණා. තව අවුරුදු දෙකක් යන විට රජයේ සේවක යන්ට ඕනෑ තැනකට මාරු වී යන්නට පහසු වන පරිදි හැම ප්‍රදේශයකම නිල නිවාස හදන්නට යනවාලු. තව්වු නිවාස හදනවාලු. ඔව්, නිවාස හදන හැටි නම් අප දන්නවා.

**ජෝර්ජ් රාජපක්ෂ මයා.** (මුල්කිරිගල)
*(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ—முல்கிரிகல)*
(Mr. George Rajapaksa—Mulkirigala)
අහසේ නිවාස හදනවා.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்கிரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

අද සාමාන්‍ය තැනැත්තකුට නිවාස දෙපාර්තමේන්තුවෙන් ණයක් ලබා ගන්නට නොයෙකුත් දුෂ්කරතාවලට මුහුණ දෙන්නට සිදු වී තිබෙනවා. නීතිඥ මහතුන් වෙතට යන්නට ඕනෑ ; ඔප්පු ඉදිරිපත් කරන්නට ඕනෑ ; ප්ලෑන් ඉදිරිපත් කරන්නට ඕනෑ ; තව නොයෙක් දේ කරන්නට ඕනෑ. සමහර විට මේ ඔක්කොම කළායින් පස්සෙ නිවාස දෙපාර්තමේන්තුවෙන් ලැබෙන පිළිතුර " සල්ලි නෑ " යන්නයි. එහෙම නැත්නම් ණය මුදල ලැබෙන විට එයින් භාගයක තරම් මුදලක් වෙනත් කටයුතුවලට වියදම් වෙලා. මහජන බැංකුවෙන් ණයක් ලබා ගන්නටත් " ගැරන්ටර් " කෙනකු ඉන්නට ඕනෑ. රුපියල් 500 ක මාසික වැටුපක් ඇති කෙනකු ගැරන්ටර් කෙනකු හැටියට අත්සන් කරන්නට ඕනෑ. ඉතින් ඒ අනුව ගොවියාට මහජන බැංකුවෙන් ණයක් ලබා ගන්නට පුළුවන්ද ? " ගොවියාට සෙතක් සලසනවා ; ගොවියා රජ කරවනවා ; රට ස්වයංපෝෂිත කිරීමට වැඩ පිළිවෙළක් ගෙන යනවා " යනුවෙන් මේ ආණ්ඩුව කියනත් ගොවියාට ලැබෙන ආරක්ෂාවක් නම් නැහැ. ගම්බද සිටින ගොවීන්ගේ නියම තත්ත්වය දන්නේ ගම්බද සිටින අපයි. ගොවියා ඔහුගෙ කුඹුර කොහොමහරි වගා කරනව මිස කුඹුරට විරුද්ධව ස්ට්‍රයික් කරන්න ඔහුට පුළුවන්කමක් තියෙනවයැ. එහෙත් ඒ වගාව කරන්න ගොවිය දහසක් දුක් ගැහැට විඳින්න ඕනෑ.

අවුරුදු 9 ක් තිස්සෙ අපේ ගරු ඉඩම් ඇමතිතුමා ඒ අමාත්‍යාංශය බාරව සිටිය. දනුත් ඒකම බාරව සිටිනව. එහෙත් හැමදාමත් ජල ගැලීම් ආදියෙන් නොයෙක් දුක් ගැහැට විඳින්න අද ගොවියට සිදුවී තිබෙනව. වාරිමාර්ග කිසිවක් හරියාකාරව යෙදී නැහැ. මාතර නිල්වලා ගඟ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට කිසිම වැඩ පිළිවෙළක් නැතිකම නිසා අද එය පොතට පමණක් සීමා වී තිබෙනව. ගංගාවල් හරවන්න ඉඩම් ඇමතිතුමා කථා කරනව. සමහර ගංගා උඩහට හරවන්නත් කථා කරනව. එහෙත් මාතර දිස්ත්‍රික්කයෙ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාරිමාර්ග කාර්යාලයක්වත් නැහැ. ඉඩම් අමාත්‍යාංශය ගැන කථා කරන්න ගියොත් දවස් ගණනක් කියලවත් කිය යුතුදේ ඉවර කරන්න බැරි නිසාත් අයවැය ලේඛන විවාදයෙදි ඒ සම්බන්ධව විස්තර සහිතව කථා කරන්නට අදහස් කරන නිසාත් මේ අවස්ථාවෙදි ඒ ගැන මීට වඩා කරුණු කියන්න මා බලාපොරොත්තු වන්නෙ නෑ.

වෛද්‍යවරුන් පාවිච්චි කරන "ඩ්රග්ස්" හෙවත් බෙහෙත් වර්ගවල මිළ පාලනය කිරීමට විධිවිධාන සලස්වන බවත් මේම රාජාසන කථාවෙහි කියා තිබෙනව. බොහොම හොඳයි. අද හෙටම පනතක් ඉදිරිපත් කරන්න. එය නරකයයි අපි කියන්නෙ නෑ. පෞද්ගලික දොස්තර මහත්වරුන් බෙහෙත් ද්‍රව්‍ය වැඩි මිළට විකුණන බව අද ප්‍රසිද්ධ වී තිබෙනව. එය දොස්තර මහත්වරුන් අතරම තිබෙන ප්‍රශ්නයක් නිසා ඒ ගැන වැඩි විස්තර අප දන්නෙ නෑ. "ඉන්ජෙක්ෂන්" එකක් ගහල මෙච්චර ගණනක් ගෙවන්න කිව්වහම අපි ඒ මුදල ගෙවනව. බෙහෙත් මිළ සම්බන්ධයෙන් වැදගත් කරුණු රාශියක් අකුරුස්සේ ගරු මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ) විසින් මේ ගරු සභාවට ඉදිරිපත් කළ බව මට මතකයි. ඇස්ප්‍රින් පෙත්තක් සාදා අවසාන කරන්නට යන වියදමත් අද එය විකුණන මිළත් එතුමා පෙන්වා දුන්න පැහැදිලි ලෙස. ඇපොතිකරි සමාගමත් බෙහෙත් ද්‍රව්‍ය විකුණන වෙනත් සමාගමුත් ඒවා විකුණනා මිළ ගණන් දැක්වෙන ලැයිස්තුවක් දවසක් එතුමා විසින් ඉදිරිපත් කළා. ආණ්ඩු පක්ෂයෙ ගරු මන්ත්‍රීවරුන් දවසක් විළි ලජ්ජා නැතිව "තමුසෙනෙ දොස්තර" යනුවෙන් අකුරුස්සෙ ගරු මන්ත්‍රීතුමාට කිව්වෙ එතරම් වැදගත් කරුණු මේ ගරු සභාවට එතුමා විසින් ඉදිරිපත් කරද්දියි. එහෙත්, තද වුණහම නම් ඒ පැත්තෙ සමහර අය යන්නෙත් ඒ කොම්පැනිස්ට් දොස්තර ළඟටමයි. බෙහෙත් ද්‍රව්‍යවල මිළ පාලනය කළ යුතු බවත් අඩු මිළට ජනතාවට බෙහෙත් ද්‍රව්‍ය ලබා දිය යුතු බවත් පෙන්වා දෙමින් පළමුවැනි වරට මේ බිත්ති හතර ඇතුළත කථා කෙළේ දොස්තර කෙනකු වන අකුරුස්සේ ගරු මන්ත්‍රීතුමා බව මම ඉතා



ආඩම්බරයෙන් ප්‍රකාශ කරනව. එවැනි තත්ත්වයක් තියෙද්දී, සමහර ගරු මන්ත්‍රීවරුන් කරුණු නොදැන, කට තිබෙන පළියට අපේ කථාවලට කට දමන්න ආවොත් අපෙන් පහර කන බවත් මා ප්‍රකාශ කරන්නට ඕනැ.

ඊළඟට, අධ්‍යාපන ඇමතිතුමාට බාර කටයුත්තක් සම්බන්ධයෙන් මෙසේ කියා තිබෙනව :

"It is proposed to set up an organization for the printing and publication of school text-books."

පාසල්වල බනිස් දීම නතර කොට ඒ වෙනුවට බිස්කට් දෙන්න යනව වගේ වෙයිද දන්නෙ නෑ මේකත්. බනිස් දීම නතර කර "විලියම්ස්" සමාගමේ බිස්කට් පමණක් ස්කෝලවල ළමයින්ට දෙන්න සූදානම් වෙනව. ලස්සණ වාක්‍යයකින් කියා තිබෙන මේ වැඩෙත් කෙරෙයිද නැද්ද, කෙරෙනවානම් ඒ කොයි ආකාරයටද යනා කරුණු විස්තර කර නැහැ. එම නිසා, මෙය මීට වඩා විස්තර සහිතව ඉදිරිපත් කළ යුතුව තිබුණා. මේ වගෙ කරුණු එකක් දෙකක් මේ රාජාසන කථාවෙහි තිබෙන නමුත් ඒවා කෙරෙයිද කියන එකයි ප්‍රශ්නය.

ඊළඟට පොලිස් කොමිසමක් පත්කිරීම ගැන සඳහන් වී තිබෙනව. මුළුමහත් පොලිස් දෙපාර්තමේන්තුවෙ සිටින පොලිස් භටයින්, සාජන්ට් මහත්වරුන් හා වෙනත් පොලිස් නිලධාරීන් සියලුදෙනාම ඉල්ලා සිටියෙ ඔවුන්ගෙ පඩි ප්‍රශ්නය විසඳන ලෙසයි. පොලිස් කොමිසමක් පත් කර තිබෙන නමුත් සාමාන්‍ය පොලිස් භටයින් පිළිබඳ කිසිම ප්‍රශ්නයක් ඊට ඇතුළත් කර නැහැ. සූට් එක කහපාට විය යුතුද, සුදු පාට විය යුතුද, කොළපාට විය යුතුද, බොත්තම් රිදී විය යුතුද, පිත්තල විය යුතුද, සැළියුට් එක දන්නෙ ඉස්සරහටද, පස්සටද යනාදී ප්‍රශ්න පමණයි මේ කොමිසමට ඉදිරිපත් වී තිබෙන්නෙ. පොලිස් දෙපාර්තමේන්තුවෙ සිටින බොහෝ අය සුළු පඩියක් ලබමින් ඉතාමත් දුක්ඛිත ජීවිත ගත කරන බව අප දන්නව. නොයෙක් දුක් ගැහැට මධ්‍යයෙ සේවය කරන්න ඔවුන්ට සිදුවී තිබෙන නිසා, ඔවුන්ට යම් මුදලක් හදලක් ඕනැ වුණහම, වේගය මණින මීටරයක් අරගෙන පාරට බැහැල ලොරියක් නතර කරනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කීයක් හරි හම්බ කර ගන්න එපායැ. නැත්නම් ඔවුන් ජීවත් වන්නෙ කොහොමද? ඒ අයගේ පඩිය මදි නිසා ඒ අය නොයෙක් දූෂණ වැඩ කරනව. අපි ඒ ගැන චෝදනා කරනව. නමුත් පඩිය වැඩි කිරීමට වැඩ පිළිවෙලක් නැහැ. පොලිස් කොමිෂන් සභාව එන තෙක් බලා ගෙන සිටියා. නමුත් ඒකෙ කිසිම දෙයක් නැහැ, පඩි වැඩි කිරීම ගැන. ඒ නිසා මූලික ප්‍රශ්නය විසඳෙන්නෙ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කථාව අවසාන කරන්න පෙර මම තව එක කාරණයක් ගැන කියන්න ඕනැ. අධිකරණ ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමා මේ අවසථාවේදී මෙහි සිටියා නම් හොඳයි. මා මුලින් සඳහන් කළා වගේ රාජාසන කථාව කොයි තරම් බංකොලොත් ද කියතොත්—මේ ආණ්ඩුව මොන විධියට නිදා ගන්නවද කියතොත්—මේ සභාවේ දැන් ඉන්නෙ රාජ්‍ය උප ඇමතිතුමත්, වත්තේගම මන්ත්‍රීතුමත් (වීරකෝන් මයා.) පමණයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව තිබෙන කාලයේදී අද අගමැති තුමත්, රාජ්‍ය ඇමතිතුමත්, කර්මාන්ත ඇමතිතුමත් මේ පැත්තෙ ඉඳගෙන අත දික් කර කර පෙන්නුවා, ඇමතිවරු නැත, පාලුය කියා. එසේ චෝදනා කළ අයට අද මොකක්ද වෙලා තියෙන්නෙ? ඒ දේමයි. ඔවුන් ඉදිරිපත් කළ වැදගත්ම රාජාසන කථාව විවාදයට භාජන කරන විට ඇමතිවරුන් තමන්ගෙ ආසනවල නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සාම මණ්ඩල ගැන බලන්න. සාම මණ්ඩල පත් කර තිබෙන්නෙ ගමේ ආරවුල් නැති කර සමගිය ඇති කරන්නයි. ඒවාට නියම පුද්ගලයන් පත් කර ගන්න ඕනැ. හිරේ වැටුණු උදවිය, දඩ කාපු උදවිය, ඇඟ බැඳපු උදවිය පත් කරනව, ඒවායෙ සභාපති වරුන් හැටියට. ඌරුබොක්කෙ මේධංකර හාමුදුරුවො සාම මණ්ඩලයක සභාපති. මුල්කිරිගල මන්ත්‍රීතුමා (ජෝර්ජ් රාජපක්ෂ මයා.) කියනව, උසාවියෙන් අච්චු කරල නඩු කොපියත් තියෙනවය කියා. බද්දේගම මන්ත්‍රීතුමා (නිල් ද අල්විස් මයා.) සමග තරඟ කළ නියෝජිතයගෙ ඇඟ බැඳල; ඊයේ පෙරෙයිද, එයත් සාම මණ්ඩලයේ. ඉතින් සාම මණ්ඩලවලින් නියම සේවයක් ඉෂ්ට වෙයිද?

අද මේ රජයේ නිලධාරීන්ට වැඩ කරන්න බැරි වී තිබෙන්නේ මන්ත්‍රීවරුන් නිසා නොවෙයි, පැරදුණු අපේක්ෂකයන් නිසයි. දිසාපතිතුමාට කාර්යාලයේ කිසිම වැඩක් කර ගන්න බැහැ, පැරදුණු අපේක්ෂකයා ගිහින් පැය ගණනක් එතන කථා කර කර සිටිනවා. නමුත්නාන්සේලා නිවේදනයක් නිකුත් කරල තියෙනවලු, පැරදුණු අපේක්ෂකයට ඇහුම්කන් දෙන්නය කියා. අධ්‍යාපන කන්තෝරුවට ඔවුන් ගිහින් පැය ගණන් කථා කර කර ඉන්නවා. ග්‍රාම සේවකයන් අමාරුවේ දමන්න, තවත් උදවියට ලියුම් යවනව, මේ විධියට ලියුම් ලියා ජස්ටින් විජේවර්ධන මහතා භාරයේ දිසාපතිතුමාට යවන්නය කියා. මේ ජස්ටින් විජේවර්ධන මහත්මයා කව්ද? [බාධා කිරීමක්] මළ ගෙවල්වල කථා කළ පලියට, දවස් 33 ක් පාර්ලිමේන්තුවේ සිටපු පලියට මොනවද මේ කරන්නෙ? මගේ කොට්ඨාශයේ පමණක් නොවෙයි, මේක සිදු වන්නෙ. මට ඇමතිවරුන්ගෙන් කරදරයක් නැහැ; මන්ත්‍රීවරුන්ගෙන් කරදරයක් නැහැ. මේ කිසිම වදගැම්මකට නැති කෙනෙකුගෙන් කරදරය තියෙන්නෙ. මාතර ආසනයෙන් ඇඟිලි ගහනව, අකුරැස්ස ආසනයෙන් ඇඟිලි ගහනව. මේ ලෝකෙ වැඩක් නැහැ. පරාජය වූ අපේක්ෂකයන්ගේ කරදරය නිසා තමයි, මේ ආණ්ඩුවේ වැඩ කටයුතු ඉදිරියට ගෙන යන්න බැරිවී තිබෙන්නෙ. මහජනයාගේ සහයෝගය ලැබෙන්නෙත් නැහැ; නිලධාරීන්ටත් කරදරයක්. මේක කරන්නෙ මොන කාරණයක් නිසාද කියා මම දන්නෙ නැහැ. මේගොල්ලො නිකම් මේවා කරනවය කියන එකත් සැකයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජය විවේචනය කිරීම අපේ යුතුකමක්. පරාජය වූ අපේක්ෂකයන්ගෙන් රජයට තිබෙන කරදරය නිමාවකට පත් කර ගැනීමට කටයුතු කරනවා ඇතැයි මම විශ්වාස කරනව. මා මුලින් සඳහන් කළා වගේ මේ රාජාසන කථාව අලියා ගිල්ල දිවුල් ගෙඩියක් වගෙයි. ඒ නිසා එවැනි දෙයකට පක්ෂව අපේ ඡන්දය පාවිච්චි කරන්න බැරි බව ප්‍රකාශ කරමින් වගේ වචන ස්වල්පය අවසාන කරනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පූ. භා. 10.57

**එම්. ඊ. එච්. මොහමඩ් අලි මයා.** (මුතූර් පළමුවන)

*(ஜனப் எம். ஈ. எச். முகம்மது அலி—மூதூர் முதல் அங்கத்தவர்)*

(Mr. M. E. H. Mohamed Ali—First Mutur)

கௌரவ உப சபாநாயகரவர்களே, ஒரு நேர்மையான, திறமைமிக்க, சனநாயகவாதியான பெரியாரொருவர் தேசிய அரசாங்கத்தை தலைமை தாங்கிக் கொண்டிருக்கிறார். அவரது அரசாங்கத்தின் மூன்றாவது சிம்மாசனப் பிரசங்க விவாதத்தில் பங்கு பற்றிச் சில குறிப்புக்கள் கூறுவதற்கு சந்தர்ப்பம் கிடைத்தமை குறித்து நான் மகிழ்ச்சியடைகிறேன். என்னுடைய பேச்சை ஆரம்பிப்பதற்கு முன், மகாதேசாதிபதி அவர்களுடைய சிம்மாசனப் பிரசங்கத்துக்கு நன்றி தெரிவித்த, ஆமோதித்த இரு கௌரவ அங்கத்தவர்களை நான் பாராட்ட விரும்புகிறேன். ஏனென்றால், இது ஒரு வழக்கமான முறையாக இச்சபையில் இருந்து வந்திருக்கிறது. கௌரவ கொத்மலே பிரதிநிதி (திரு. டீ. பி. ரணதுங்க) அவர்களும், கௌரவ ஹினிதும பிரதிநிதி (திரு. எம். எஸ். அமரசிறி) அவர்களும் ஆணித்தரமான பதிலுரை கொடுத்து நன்றியைத் தெரிவித்திருக்கிறார்கள். அவர்களை நான் திரும்பவும் பாராட்டுகின்றேன்.

இன்று இந்நாட்டிலுள்ள பெரும்பான்மையான மக்கள் விரும்புவது ஐக்கிய இலங்கையிலே அனைவரும் சமமாக, சமாதானமாக, சாந்தமாக வாழ வேண்டும் என்பதுதான். அந்த அடிப்படையிலேதான் சனநாயகத்தில் நம்பிக்கை கொண்ட பெருங்குடி மக்கள் ஒரு நல்ல அரசாங்கத்தை நிறுவும் ஒரு சந்தர்ப்பத்தை அளித்தார்கள். இந்தத் தேசிய அரசாங்கத்தில் அங்கம் வகிப்பவர்கள் பலதரப்பட்ட கருத்துக்கள் உள்ளவர்களாக இருந்த போதிலும் அவர்கள் அனைவரும் சனநாயகத்தில் நம்பிக்கை கொண்டவர்கள் என்ற அடிப்படையில் தேசிய அரசாங்கம் என்ற இணைப்புக் குழுவாகச் சேர்ந்து நாட்டுக்குச் சேவை செய்ய முன் வந்து கொண்டிருக்கிறார்கள். நாட்டு மக்களுக்கு மிகவும் அவசியமானவை உண்ண உணவு, உடுக்க உடை, செய்யத் தொழில், இருக்க வீடு என்பனவேயாகும். இந் நான்கு அத்தியாவசியமான தேவைகளையும் பூர்த்தி செய்ய தேசிய அரசாங்கம் மிக முயற்சி செய்து கொண்டிருக்கிறது. பற்பல நல்ல திட்டங்களை வகுத்து இந்தத் தேசிய அரசாங்கம் இப்பிரச்சினைகளைத் தீர்க்க முயற்சியெடுத்துக் கொண்டுவரும் வேளையில் எதிர்க் கட்சியைச் சார்ந்தவர்கள், எப்படியாவது இந்த அரசாங்கத்தை வீழ்த்திவிட வேண்டும் என்ற ஒரே நோக்கத்துடன் அரசாங்கம் நல்ல திட்டங்களைக் கொண்டு வந்தாலும்சரி, குறையுள்ள திட்டங்களைக் கொண்டு வந்தாலும் சரி அவற்றையெல்லாம் எதிர்த்துக் கொண்டிருக்கிறார்கள். அவர்களுடைய நோக்கம் எப்படியாவது இந்த அரசாங்கத்தை வீழ்த்தி தாங்கள் மீண்டும் ஆட்சிக்கு வர வேண்டும் என்பதே தவிர, சனநாயகவாதிகளால் தெரிவு செய்யப்பட்ட அரசாங்கத்தின் பூரண ஆயுட்காலமான ஐந்து வருட காலமும் பொறுத்துப் பார்ப்போம்; அந்தக் காலத்துள் திறமையான சேவையைச் செய்யாவிட்டால் திரும்பவும் சனநாயக அடிப்படையில் மக்கள் முன் சென்று அவர்களது தீர்ப்பைப் பெற்று ஆட்சிப் பொறுப்பைக் கைப்பற்றுவோம் என்பதல்ல.

கௌரவ உப சபாநாயகரவர்களே, இந்த வருட சிம்மாசனப் பிரசங்கத்தில் நல்ல அம்சங்கள் பல அடங்கியிருக்கின்றன. அவற்றில் சிலவற்றை நான் எடுத்துக் கூற விரும்புகிறேன். அதாவது, தேசிய அரசாங்கம் இன்று பொது மக்களுக்கு அத்தியாவசியமாக, மிகவும் முக்கியமாகத் தேவைப்பட்டுக் கொண்டிருக்கும் உணவு உற்பத்தியில் கூடிய ஆர்வம் செலுத்திக் கொண்டிருக்கிறது. எங்களுடைய பிரதமர் உணவு உற்பத்தியைப் பெருக்க வேண்டும் என்ற நோக்கத்துடன் இலங்கை முழுவதும் நேரில் சென்று விவசாயத்தில் ஈடுபட்டுள்ளவர்களுக்கு உற்சாகமூட்டி வருகிறார். உணவை உற்பத்தி செய்து எங்களுடைய சுய தேவையைப் பூர்த்தி செய்து கொண்டால் பிற நாடுகளை எதிர்பார்க்க வேண்டிய அவசியமில்லை; பிற நாடுகளிடம் அரிசிப் பிச்சை வாங்க வேண்டிய நிலை ஏற்படாது. இப்படியாக உணவு உற்பத்தியைப் பெருக்க அரசாங்கம் எடுக்கும் முயற்சிகளுக்கு எதிர்க் கட்சியினரும் தங்களுடைய பரிபூரண ஒத்துழைப்பைக் கொடுத்து எங்கள் நாட்டைச் செல்வமான, வளமான, பொன்கொழிக்கும் நாடாக ஆக்க வேண்டும் என்று கேட்டுக் கொள்கிறேன்.

எதிர்க் கட்சியினர் அரசாங்கத்தை முறியடிக்க எத்தனையோ சூழ்ச்சிகளை இன்று செய்து கொண்டிருக்கிறார்கள். உதாரணமாக

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

வகுப்புவாத கோஷங்களை அவர்கள் கிளப்புகிருர்கள். அவர்களுக்கு நான் கூறுவது என்ன வென்ருல் வகுப்புவாதம் என்பது ஒரு கொடிய விஷத்தைப் போன்றது; வகுப்பு வாத உணர்ச்சியைச் சுலபமாக மக்கள் மத்தியில் கிளப்பிவிட முடியும்; அப்படிக் கிளப்பப் பட்ட வகுப்புவாத உணர்ச்சியைத் தணிப்ப தென்பது மிகவும் கஷ்டமான ஒரு காரியம், மதத்தைப் பாவித்து, மொழியைப் பாவித்து மக்களின் உணர்ச்சிகளைக் கிளப்பி விடுவது நெருப்புடன் விளையாடுவதைப் போன்றது; இது மிகவும் அபாயகரமான ஒரு விஷயமாகும் என்பதுதான்.

எனது உரையின் ஆரம்பத்தில் நான் கூறியதைப்போல இலங்கையில் பெரும்பான்மை யான மக்கள் ஐக்கிய இலங்கையையே விரும்பு கிருர்கள். இலங்கையில் முஸ்லிம்களைப் பொறுத்த அளவில் அவர்கள் நூறுக்கு நூறு சதவிகிதம் ஐக்கிய இலங்கையையே விரும்பு கிருர்கள். இலங்கை பிரிக்கப்படுவதையோ துண்டுபோடப்படுவதையோ இலங்கையில் எந்த ஒரு முஸ்லிமும் விரும்பமாட்டார் என்று இச்சபையில் ஆணித்தரமாகக்கூற நான் ஆசைப்படுகிறேன்.

நம் நாட்டு மக்களைப் பொறுத்த அளவில் இன்னெரு விடயத்தையும் குறிப்பிடவேண்டியது அவசியம். அதாவது நம்நாட்டு மக்க ளிடையே தேசியப் பற்று மிகவும் குறைவாக இருக்கிறது. இன்றைய சூழ்நிலையில் நம் நாட்டு மக்களும் அவர்களது பிரதிநிதிகளும் தியாக உணர்வுடன் தேசப்பற்று உள்ளவர் களாகத் தங்கள் காரியங்களைச் செய்ய வேண்டும். ஆனல், இத்தகைய ஒரு பண்பு நம் மக்கள் மத்தியில் மிகவும் குறைவாகவே இருக் கின்றது. உதாரணமாக, இன்று நமக்கென ஒரு தேசிய கீதம் இருக்கிறது. "நமோ நமோ மாதா" என்று தொடங்கும் எமது தேசிய கீதம் சினிமாக் கொட்டகைகளில் இசைக்கப்படும்பொழுது நம் மக்களில் சிலர் சிரித்துக் கேலி செய்கிருர்கள். இதிலிருந்து நாம் அறிவது நம் மக்களில் சிலரிடையே நாட்டுப் பற்று கொஞ்சமும் இல்லை என்பது தான். நமது தாய் நாட்டுத் தேசிய கீதம் பாடப்படும் பொழுது நமது மக்களே அதைக் கிண்டல் செய்தால் அத்தகைய சந்தர்ப்பங் களில் வெளி நாடுகளில் இருந்து அங்கு வந்தி ருக்கக்கூடிய மக்கள் நம்மைப்பற்றி என்ன நினைப்பார்கள்? இந்த நிலை மாறவேண்டு மென்று இச்சபை மூலமாக நான் அனைவரை யும் கேட்டுக் கொள்ளுகிறேன்.

நான் ஆரம்பத்தில் கூறியதைப் போல நம் நாட்டு மக்கள் கஷ்டங்களையோ கொடுமை களையோ பிற நாட்டு மக்களைப் போல அனுப வித்துப் பழக்கப்படாதவர்கள். மற்றைய எத் தனையோ நாட்டு மக்கள் யுத்தங்களின் மத்தி யில் அகப்பட்டு எத்தனையோவிதமான கஷ்ட நஷ்டங்களை அனுபவித்து இருக்கிருர்கள். யுத் தங்களினல் உறவினர்களை மட்டுமல்ல தங்கள் உடைமைகளை மட்டுமல்ல சொந்த ஊர் தேசங் களைக்கூட இழந்து இருக்கிருர்கள். ஆனல் நம் மக்கள் இவ்வித கொடுமைகளைக் கடந்த காலங்களில் அனுபவித்தது கிடையாது. கடந்த இரண்டாவது உலக யுத்தத்தின் போது பலர் கஷ்டங்களை அனுபவிப்பதற்குப் பதிலாக திடீர் பணக்காரர்களாகவே மாறி இருக்கிருர்கள்.

நமக்குக் கிடைத்த சுதந்திரம் இரத்தம் சிந்தாமல் கிடைக்கப்பெற்றதொன்ருகும். இத ஞல் சுதந்திரத்தின் பெருமையை நாம் அதிகம் உணராதவர்களாக இருக்கிருேம். மற்ற நாட்டு மக்கள் எவ்வளவோ தியாகங் களைச் செய்து, இரத்தம் சிந்தித்தான் தங்கள் சுதந்திரத்தைப் பெற்ருர்கள். இதன் காரண மாக தாம் பெற்ற சுதந்திரத்தைப் பாதுகாக்க அவர்கள் பாடுபட்டுக் கொண்டிருக்கிருர்கள். நம்நாட்டு மக்கள் மிகவும் சுலபமாகச் சுதந் திரத்தைப் பெற்றதால் அதன் மகிமையை உணராமல் அதற்கு மதிப்புக் கொடுக்காமல் நடந்து கொண்டிருக்கிருர்கள். இதைச் சிந் தித்துப் பார்க்கும் பொழுது மிகவும் வருத்தப் பட வேண்டி இருக்கிறது. மக்கள் தாம்பெற்ற சுதந்திரத்தின் பெருமையை உணராத காரணத்தினல் மிகவும் சுலபமான முறையில் வாழ விரும்புகிருர்கள். எல்லோரும் சோம் பேறி வாழ்க்கை நடாத்தவே விரும்புகிருர் கள். மக்கள் எல்லோரும் அரசாங்க உத்தி யோகம் வேண்டும், சுலபமான உழைப்பு வேண்டுமென்றே விரும்புகிருர்கள். நம்முடைய நாட்டிலே நமக்குத் தேவையான உணவுப் பொருட்களை உற்பத்திசெய்ய வேண்டியிருக் கின்றது. நாம் இன்று எத்தனையோ கஷ்ட மான பிரச்சினைகள் மத்தியில் இருந்து கொண்டிருக்கின்ருேம். இப்படியான ஒரு நிலையில் நாம் ஒன்றுபட்டு நாட்டுக்காக

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මොහොමඩ් අලි මයා.]

உழைக்க வேண்டுமென்றாலோ நம்மிடம் நாட்டுப் பற்றுக் குறைவாக இருக்கின்றது. இதை நான் சுட்டிக்காட்ட வேண்டும்.

நமக்கு அத்தியாவசியமானது உணவு. நம் அத்தியாவசியப் பொருட்களில் முதலிடம் வகிப்பது உணவு. அதனைப் பெருக்க நாம் செயலில் மும்முரமாக இறங்க வேண்டும். உதாரணமாக என்னுடைய மாவட்டத்தை—திருகோணமலை மாவட்டத்தை — எடுத்துப் பார்த்தால், உணவுற்பத்திப் பெருக்கத்திலே அந்த மாவட்டம் மிகவும் உச்ச நிலையில் இருந்துகொண்டிருக்கின்றது. அந்த மாவட்ட மக்கள் தங்கள் கஷ்டங்களை உணர்ந்து, நாம் மற்றப் பகுதிகளிலிருந்து அரிசி எடுக்கக் கூடிய நிலையை ஏற்படுத்தக்கூடாது என்று உணர்ந்து, தங்களுக்குத் தேவையான உணவுத் தானியங்களைத் தங்கள் பகுதியிலேயே உற்பத்தி செய்ய அதிக ஆர்வமெடுத்துக் கொண்டு வருகின்றார்கள். இப்படி ஆர்வங் காட்டும் மக்களுக்கு நீர்ப்பாசன வசதிகளைச் செய்து கொடுத்து, சிரமதான முறையில் கூடுதலான ஆர்வமூட்டிக்கொண்டுபோனால், நான் பெருமையாகக் கூறுகிறேன், திருகோணமலை மாவட்டம் உணவுற்பத்தியில் இலங்கையில் முதல் ஸ்தானத்தை எடுக்கும். அதனை நான் சந்தோஷத்துடன் சொல்கின்றேன்.

இந்த சிம்மாசனப் பிரசங்கத்திலே நீர்ப்பாசனத் திட்டங்களைத் திருத்தியமைக்க அரசாங்கம் போதிய கவனம் எடுத்துக் கொண்டு வருவதாயும் அதற்கான வழிவகைகளை கையாள்வதாயும் கூறப்பட்டிருக்கின்றது. அது மிகவும் வரவேற்கத்தக்கது. இந்த விஷயத்திலே, மூதூர்த் தொகுதியிலுள்ள நீர்ப்பாசன வேலைகளைத் தாமதம் செய்யாமல் அமுல் செய்தால் அது நாட்டுக்கு அதிக நன்மையைக் கொடுக்குமென்பதை நான் அரசாங்கத்துக்கு ஞாபகமூட்ட விரும்புகிறேன். அரசாங்கம் எதிர்பார்ப்பதை விடக் கூடுதலான உணவுத் தானியங்களை, இவ்வாறு செய்வதனால் அப்பகுதி மக்கள் உற்பத்தி செய்து தருவார்கள்.

இந்த சிம்மாசனப் பிரசங்கத்திலே எத்தனையோ நன்மையான விஷயங்கள் கூறப்பட்டிருக்கின்றன. அவையனைத்தையும் ஒவ்வொன்றாக எடுத்து ஆராயப்போனால் எனக்குத் தரப்பட்டிருக்கும் நேரம் போதாது. அதனால் சில முக்கிய விஷயங்களை மட்டும் எடுத்துக் கூற விரும்புகிறேன். இம்முறை ஐந்து கனிஷ்ட பல்கலைக் கழகங்கள் ஆரம்பிக்கப் போவதாகக் குறிப்பிடப்பட்டிருக்கின்றது. இன்று கல்வித் துறையிலே பின்தங்கியிருக்கும் இந்நாட்டுக்கு அது மிகவும் வரவேற்கத் தக்க ஓர் அம்சமாகும். இந்த ஐந்து கனிஷ்ட பல்கலைக் கழகங்கள் அமைப்பதைத் தீர்மானிக்கும்போது அவைகளில் ஒன்றையாவது கிழக்கு மாகாணத்தில் ஒரு மத்திய இடத்தில் நிர்மாணிக்க வேண்டுமென்று நான் அரசாங்கத்துக்கு ஆலோசனை கூறுகின்றேன்.

அடுத்து, ஆசிரியர்கள் ஓய்வு பெற்றுச் செல்லும்போது அவர்களின் ஓய்வுப் பணத்தைப் பெற்றுக் கொள்வதில் உள்ள கஷ்டங்களை நிவிர்த்தி செய்யச் சட்டம் கொண்டுவருவதாகக் கூறப்பட்டிருக்கின்றது. அது மிகவும் வரவேற்கத் தக்கது. அத்துடன் ஆசிரியர்கள் அனைவருக்கும் சம சம்பளம் கொடுக்க வேண்டும். அவர்கள் எந்தப் பாஷையில் கல்வி புகட்டினாலும் எதிர்காலச் சந்ததியினரை இந்நாட்டுக்குத் தொண்டு புரிய உருவாக்கும் நோக்கத்திலேயே தங்கள் கடமையைச் செய்கின்றார்கள். எனவே அவர்களுக்குச் சம சம்பளம் கொடுக்க வேண்டுமென்றும் விரைவிலேயே அதனை அமுல் நடத்த வேண்டுமென்றும் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

அடுத்ததாக, ஹோமியோபதி வைத்திய முறைக்கும் அரசாங்கம் அங்கீகாரம் கொடுக்கப் போவதாகக் குறிப்பிடப்பட்டிருக்கின்றது. அது வரவேற்கத் தக்கது. இவ்வைத்திய முறை நம் நட்டில் மட்டுமல்ல, அகில உலகிலும் புகழ் பெற்ற ஒன்றாக இருக்கின்றது. அத்துடன் சித்த, ஆயுர்வேத வைத்தியத் துறைகளிலும் நல்ல சீர்திருத்தங்களைச் செய்து இந்நாட்டிலே அவைகளுக்குத் தக்க இடத்தைக் கொடுக்கப் போவதாயும், நாவின்னையிலுள்ள ஆயுர்வேத ஆராய்ச்சி நிலையத்துக்கு கூடிய தரங் கொடுத்து அத்துறையில் அதிக அபிவிருத்தி செய்யப் போவதாயும் இங்கு குறிப்பிடப்பட்டிருக்கின்றது.

ஆனால், நான் அதை வாசித்த பொழுது, யூனானி வைத்திய முறை அதில் சேர்க்கப்படாதது குறித்து மிகவும் மனவருத்தப்பட்டேன். இன்று மத்திய ஆயுர்வேதக் கல்லூரியை எடுத்துக்கொள்ளுங்கள். அங்கு 1929 ஆம் ஆண்டு தொடக்கம் ஆயுர்வேதம், சித்தம், யூனானி என்ற மூன்று வைத்திய முறைகள் கற்றுக் கொடுக்கப்பட்டன. அந்த ஆயுர்வேத வைத்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தியக் கல்லூரியில் இருந்து இம்மூன்று துறைகளிலும் பட்டம் பெற்று வெளியேறிய வைத்தியர்கள் பல பாகங்களிலும் நல்ல சேவைகளைச் செய்துகொண்டு வந்திருக்கிறார்கள். அப்படியாக இருக்கும் பொழுது, சித்த வைத்திய முறைக்கும் ஆயுர்வேத வைத்திய முறைக்கும் விசேஷ கவனம் செலுத்துகின்ற இந்தத் தேசிய அரசாங்கம் யூனானி வைத்திய முறையைப் பற்றிக் குறிப்பிடாதது மிகவும் வருந்தத் தக்கது. விசேஷமாக யூனானி வைத்திய முறை எங்களுடைய பெரும் வள்ளலான லுக்மான் ஹகீம் அவர்களால் அங்குரார்ப்பணம் செய்யப்பட்டு அகில உலகத்திற்கு நற்பெயரைக் கொடுத்த ஒரு வைத்திய முறை. அந்த வைத்திய முறை இன்று இலங்கையில் மட்டுமல்ல, இந்தியா, பாகிஸ்தான், ஈரான், ஈராக், சவூதி அரேபியா ஆகிய இடங்களிலும் புகழ் பெற்றுக்கொண்டு வருகிறது. அந்த வைத்திய முறை இன்றும் ஆயுர்வேத கல்லூரியிலே—சுதேச வைத்தியக் கல்லூரியிலே—கற்றுக்கொடுக்கப்பட்டு வருகிறது. யூனானி வைத்திய முறைக்குத் தகுந்த இடம் கொடுக்கப்பட வேண்டுமென்று நான் இந்தத் தேசிய அரசாங்கத்தை வற்புறுத்திக் கேட்டுக்கொள்ள விரும்புகிறேன்.

அடுத்ததாக, இந்தச் சிம்மாசனப் பிரசங்கத்திலே மாவட்ட சபைகள் சம்பந்தமாகவும் குறிப்பிடப்பட்டிருக்கின்றது. அதாவது "மத்திய அரசாங்கத்தின் கட்டுப்பாட்டின் கீழ் மாவட்ட சபைகள் விரைவில் அமைக்கப்படும்" என்று. அது சம்பந்தமாக இதற்கு முன்பு பேசிய பலர் பல அபிப்பிராயங்களைத் தெரிவித்திருக்கிறார்கள். நான் பத்திரிகையிலே அவற்றைப் படித்தேன். கௌரவ உடுவில் பிரதிநிதி (வீ. தர்மலிங்கம்) மாவட்ட சபை என்ற பிரச்சினையைத் தமிழரசுக் கட்சி கிளப்பவில்லை, அதை காலஞ்சென்ற திரு. எஸ். டபிள்யு. ஆர். டீ. பண்டாரநாயக்க அவர்கள் தான் கிளப்பினார்கள், அதையே நாங்களும் பின்பற்றிக்கொண்டிருக்கின்றோம் என்று பேசியிருக்கின்றார். மாவட்ட சபைகள் வந்தால் மக்களுக்குப் பல நன்மைகளைக் கொண்டுவரலாம் என்று அவர் பேசியிருக்கிறார். என்னைப் பொறுத்த அளவிலே நான் அதைப்பற்றித் தீவிரமாக ஒன்றையும் கூற விரும்பவில்லை. கௌரவ பிரதம அமைச்சர் அவர்களுக்கு நான் சொல்ல விரும்புவது, இந்த மாவட்ட சபை விடயம் இன்று மக்கள் மத்தியிலே பெரும் பரபரப்பை ஏற்படுத்திக் கொண்டிருக்கிறது என்பதைத்தான். விசேஷமாக முஸ்லிம் மக்கள் மத்தியிலே இது ஒரு சந்தேகத்தைக் கொடுத்துக்கொண்டிருக்கிறது. நான் சில நாட்களுக்கு முன்பு கௌரவ பிரதம மந்திரி அவர்களுக்கு ஒரு வேண்டுகோள் விடுத்தேன். அதாவது, மாவட்ட சபைகளை நீங்கள் அமைப்பதற்கு முன்பு, கிழக்கு மாகாணப் பாராளுமன்றப் பிரதிநிதிகளையும் விசேஷமாக முஸ்லிம் பாராளுமன்றப் பிரதிநிதிகளையும் நன்கு கலந்தாலோசிக்க வேண்டுமென்றும் பொதுமக்களுடைய அபிப்பிராயத்தை நீங்கள் பெற வேண்டும் என்றும் எழுதியிருந்தேன். அவர்கள் அதற்கு மறுமொழியாக இந்த மாவட்ட சபைகள் மசோதா தயாரிக்கப்படும்பொழுது கிழக்கு மாகாணப் பாராளுமன்றப் பிரதிநிதிகளுடைய அபிப்பிராயங்களையும் விசேஷமாக முஸ்லிம் பாராளுமன்றப் பிரதிநிதிகளுடைய அபிப்பிராயங்களையும் நிச்சயமாகக் கோருவேன் என்று உறுதிமொழி கூறியிருக்கிறார்கள். அதற்காக நான் நன்றி கூறி, இம்மாவட்ட சபை மசோதா இச்சபையிலே சமர்ப்பிக்கப்படுமுன் கிழக்கு மாகாணப் பாராளுமன்றப் பிரதிநிதிகளையும் மற்றைய முஸ்லிம் பிரதிநிதிகளையும் தலைவர்களையும் கலந்தாலோசிக்க வேண்டுமென்று மீண்டும் நான் ஆலோசனை கூறுகிறேன்.

கௌரவ பிரதம அமைச்சர் பத்திரிகையிலே விட்ட சில அறிக்கைகளில் மாவட்ட சபை சம்பந்தமாக மக்கள் பரபரப்படைய வேண்டியதில்லையென்றும், இது காலஞ்சென்ற பிரதமர் திரு. பண்டாரநாயக்கா அவர்களால்தான் கொண்டுவரப்பட இருந்ததென்றும், அவர் கடும் அதிகாரங்களோடு இம்மாவட்டசபை மசோதா தயாரிக்கப்படுமென்று விரும்பியிருந்தாரென்றும், தாம் நினைத்துக்கொண்டிருக்கின்ற இந்த மாவட்ட சபை மசோதா ஒரு கிராமசபைக்கோ அல்லது பட்டண சபைக்கோ உள்ள அதிகாரங்களிலும் பார்க்கக் குறைந்த அதிகாரங்களின் அடிப்படையிலேயே மத்திய அரசாங்கத்தின் கட்டுப்பாட்டின் ஊடே செயல்பட வேண்டியிருக்கும் என்றும் வணக்கத்துக்குரிய மகாநாயக்க தேரோவுக்கு எழுதிய கடிதத்தில் குறிப்பிட்டிருந்தவாறு, வெளியிட்டிருந்ததை நான் வாசித்தேன். மக்கள் மத்தியிலே இது விடயமாக பெரும் பரபரப்பு இருந்த போதிலும் இது

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මොහමඩ් අලි මයා.]

விடயமாக மிகவும் நிதானமாக, அவசரப்படாமல் மிகவும் சிந்தித்து நடந்துகொள்ள வேண்டுமென்று நான் கேட்டுக்கொள்ளுகிறேன்.

சில நாட்களுக்கு முன், அனைவருக்கும் தெரியும் கௌரவ உப சபாநாயகரவர்களே, இச் சபையிலே முஸ்லிம்களுக்குக் கலாசாரப் பல்கலைக் கழகம் ஒன்று வேண்டும் என்ற பிரேரணை கொண்டுவரப்பட்டது. அப் பிரேரணையைப் பாராளுமன்றமும் ஏற்றுக்கொண்டது. ஆனால், இந்தச் சிம்மாசனப் பிரசங்கத்திலே அதனைப் பற்றி எந்தவிதமான குறிப்பும் இல்லை. இது வருந்தத்தக்கது; விசனிக்கத்தக்கது. இதனை நான் அரசாங்கத்தின் கவனத்துக்குக் கொண்டுவர விரும்புகிறேன்.

அரசாங்கம் எத்தனையோ நல்ல சேவைகளைச் செய்ய எத்தனித்துக் கொண்டிருக்கிறது. எங்களுடைய பிரதமரது திட்டங்கள் எல்லாம் நீண்டகாலத் திட்டங்களாக இருக்கின்றன. எதிர்கால மக்களின் சுபிட்சத்தை, அபிவிருத்தியை, நலன்களை கருதித்தான் சில திட்டங்கள் வகுக்கப்பட்டிருக்கின்றன. ஆனால் மக்களோ உடனடியான சுபிட்சத்தை எதிர்பார்க்கிறார்கள். எதிர்க்கட்சியினரோ இந்தச் சந்தர்ப்பத்தைப் பயன்படுத்திக் கொண்டு பொது மக்களிடம் சென்று அவர்களை உணர்ச்சி வசப்படுத்திவிடுகிறார்கள். பிரதமரது திட்டங்கள் ஓரிரு வருடங்களில் அமுல் நடத்தப்பட்டால் இந்த நாட்டு மக்கள் விரைவில் பலன்களை அடையக் கூடியதாக இருக்கும் என்ற நம்பிக்கை எனக்குண்டு. இரண்டு மூன்று வருடங்களின் பின்தான் எங்களுடைய திட்டங்களின் பலன் கிடைக்கக் கூடியதாக இருக்கின்றது. "அந்த நேரத்தில் நாங்கள் விஷயம் விளங்காமல் கண்டித்தோம். இப்பொழுது இதனை வரவேற்கிறோம்" என்று இப்பொழுது இத் திட்டங்களை எதிர்க்கும் எதிர்க்கட்சியைச் சேர்ந்தவர்களில் சிலர் ஒரு நேரத்தில் கூறக்கூடும். எனவேதான் இப்படியான கஷ்டங்கள் இந்த நாட்டுக்கு ஏற்பட்டுக் கொண்டிருக்கும் பொழுது, விசேடமாக உணவுத் தட்டுப்பாடு ஏற்பட்டுக் கொண்டிருக்கும் பொழுது, இந்த நேரத்தில் ஆட்சி நடாத்தும் தேசிய அரசாங்கத்தின் உணவு உற்பத்தி விஷயத்திலும் நாட்டுக்கு நன்மையை ஏற்படுத்தும் இதர விஷயங்களிலும் எங்களை ஆதரிக்க வேண்டும் என்று எதிர்க்கட்சியினருக்கு வேண்டுகோள் விடுக்கிறேன்.

தேசிய அரசாங்கம் தற்பொழுது வகுத்துள்ள திட்டங்கள் வெற்றியடையாமற் போனால், எதிர்க் கட்சியினர் ஐந்து வருடங்களின் பின் மக்கள் மத்தியிற் சென்று அவர்களுடைய திறமையைக் காட்டலாம். 'தேசிய அரசாங்கம் அப்படிச் செய்தது, நாங்கள் இப்படிச் செய்தோம், ஆதலால் எங்களை ஆதரிக்க வேண்டும், எங்களுக்கு மீண்டுமொருமுறை சந்தர்ப்பம் தரவேண்டும்' என்று மக்களிடம் கேட்கலாம். இது தான் சனநாயக தர்மம். இதை நான் எதிர்க்கட்சினருக்கு நினைவூட்ட விரும்புகிறேன்.

அடுத்ததாக, எங்களுடைய அரசாங்கத்தின் வெளிநாட்டுக் கொள்கையை எடுத்துக்கொண்டால், அது ஒரு மத்திய நடுநிலைமைப் போக்கைத்தான் கையாண்டு வந்திருக்கிறது என்பதைக் காணலாம். அதைச் சிம்மாசனப் பிரசங்கத்திலும் குறிப்பிட்டிருக்கிறார்கள். சமீபத்தில் நடைபெற்ற மத்திய கிழக்கு யுத்தம் சம்பந்தமாக தேசிய அரசாங்கம் நடந்துகொண்ட விதத்தை பத்திரிகை மூலமாக அறிந்திருப்பீர்கள். ஐக்கிய நாடுகள் சபையில் இஸ்ரேலிய ஆக்கிரமிப்பைக் கண்டித்து, சுமுகமான முறையில், அரபு நாடுகளிடமிருந்து கைப்பற்றிய நாடுகளைத் திரும்பக் கொடுக்க வேண்டும் என்ற விடயத்தில் எங்களுடைய நாடு ரஷியாவுடன் ஒத்துழைத்ததை நாம் மறுக்க முடியாது. இந்த நாட்டிலுள்ள முஸ்லிம்களை எடுத்துக் கொண்டால் அவர்களது நூற்றுக்கு நூறு வீத அனுதாபம் அரபு நாடுகளிடம்தான் இருக்கிறது. இஸ்ரேலிய ஆக்கிரமிப்பை, மிருகத்தனமான தாக்குதலை அவர்கள் கண்டித்துக் கொண்டுதான் இருக்கிறார்கள்.

**පී. ජී. බී. කෙනමන් මයා.** (මැද කොළඹ තුන්වන මන්ත්‍රී)

*(திரு. பீ. ஜீ. பி. கெனமன்—கொழும்பு மத்தி மூன்றும் அங்கத்தவர்)*

(Mr. P. G. B. Keuneman—Third Colombo Central)

But not the Hon. Minister of Labour, Employment and Housing.

**මොහමඩ් අලි මයා.**

*(ஜனாப் முகம்மது அலி)*

(Mr. Mohamed Ali)

He is also for the Arabs. He attended a special prayer at the Gampola Mosque and prayed for the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Arabs. I think my hon. Friend is not aware of that. The only thing the Hon. Minister has not done is to make a public statement. In this country all the Muslims are for the Arabs.

වෛද්‍යාචාර්ය ඊ. එම්. වී. නාගනාතන් (නල්ලූර්)
(டொக்டர் ஈ. எம். வி. நாகநாதன்—நல்லூர்)
(Dr. E. M. V. Naganathan—Nallur)

It is a very dastardly attack on the Hon. Minister. He is not for the Israelites—

මොහමඩ් අලි මයා.
(ஜனுப் முகம்மது அலி)
(Mr. Mohamed Ali)

மத்திய கிழக்கு விஷயத்தில் முஸ்லிம்கள் அனைவரின் அனுதாபமும் அரபு நாட்டு மக்களிடம் இருக்கிறது என்பதை நான் ஆணித்தரமாகக் கூற வேண்டியிருக்கிறது. இந்த விஷயம் பற்றி நான் அதிகம் பேச விரும்பவில்லை.

இந்தச் சிம்மாசனப் பிரசங்கத்தில் அடங்கியுள்ள நல்ல காரியங்களையெல்லாம் அமுல் நடத்த எதிர்க்கட்சியினர் இந்த அரசாங்கத்துக்கு பூரண ஒத்துழைப்பைக் கொடுப்பதுடன், இந்த அரசாங்கம் முழு ஆயுட் காலத்தையும் நல்ல முறையில் கொண்டு செல்ல எல்லாரும் ஒத்துழைக்க வேண்டும் என்று நான் இச்சந்தர்ப்பத்தில் கேட்டுக்கொள்ளுகிறேன்.

அரசாங்கத்திடம் நான் வேண்டுகோள் ஒன்றை விடுக்க விரும்புகிறேன்: பிரதமர் அவர்கள் அமைச்சர் சபையில் சில மாற்றங்களைக் கொண்டுவர வேண்டுமென்பதுதான் எனது அந்த வேண்டுகோளாகும். அமைச்சர் சபையில் உள்ள சிலர் பழைய காலத்தவர்களாக இருக்கிறார்கள். அவர்கள் பழைய காலப் போக்குகளையே இன்னமும் பின்பற்றிக் கொண்டிருக்கிறார்கள். எனவே அமைச்சர் சபையில் இளம் இரத்தங்களையும் புகுத்தி சில மாற்றங்களைச் செய்து நல்ல திட்டங்களை வகுத்து நாட்டிற்குச் சேவை செய்ய வேண்டும். நாடு மறுமலர்ச்சியடைய அமைச்சர் சபையில் இளைஞர்களுக்குச் சந்தர்ப்பங்கள் கொடுக்கப்பட வேண்டும்.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

Who are the Ministers you have in mind ? Name them.

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி சொய்சா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)

There are no Ministers now.

මොහමඩ් අලි මයා.
(ஜனுப் முகம்மது அலி)
(Mr. Mohamed Ali)

They can read it in HANSARD or hear about it from Members who listened to my speech.—

எனவே, நான் திரும்பவும் பிரதமர் அவர்களை வேண்டிக் கொள்வது மிக விரைவில் அமைச்சர் சபையில் சில மாற்றங்களைக் கொண்டுவந்து பேச்சளவில் நாட்டிற்குச் சேவை செய்யும் அமைச்சர்களைப் பார்த்து "நீங்கள் கடந்த இரண்டரை வருட காலம் நாட்டிற்குச் சேவை செய்து விட்டீர்கள். இனி நீங்கள் இரண்டாம் மூன்றும் வரிசையில் போய் இருங்கள். மற்றவர்களுக்கும் இடங்கள் கொடுங்கள்" என்று சொல்ல வேண்டும் என்பதுதான்.

இச்சந்தர்ப்பத்தில் நான் எதிர்க் கட்சியினரைக் கேட்டுக் கொள்வது என்னவென்றால் உணவு உற்பத்தி விஷயங்களிலும் சிரமதான வேலைகளிலும் தேசிய அரசாங்கத்திற்கு உங்களுடைய பூரண ஆதரவைக் கொடுங்கள் என்பதுதான். திருமலை மாவட்டத்தைப் பொறுத்த அளவில் அங்கே கட்சி வேறுபாடுகளுக்கு அப்பாற்பட்ட முறையில் உணவு உற்பத்தி வேலைகள் நடைபெறுகின்றது. இவ்விடயத்தில் எதிர்க்கட்சியைச் சேர்ந்தவர்களும் அரசாங்கக் கட்சியைச் சேர்ந்தவர்களும் அங்கு ஒத்துழைத்து ஒற்றுமையாகக் கருமங்களைச் செய்துகொண்டிருக்கிறார்கள். என்னுடைய மாவட்டத்தில் உணவு உற்பத்தியிலும் சிரமதான வேலைகளிலும் அதிக ஆக்கமும் ஊக்கமும் காட்டிக் கொண்டிருக்கும் இருவருக்கு எனது நன்றியை இச்சபையில் கூற வேண்டி இருக்கிறது. இந்த இருவரில் ஒருவர் எமது அரசாங்க அதிபர். இவர் உணவு உற்பத்தியில் அதிக ஊக்கம் காட்டிக்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මොහමඩ් අලි මයා.]

கொண்டிருக்கிறார். நாம் எமது உணவுக்காகப் பிற நாட்டவர்களை எதிர்நோக்கக்கூடாது என்ற அடிப்படையில் மாணவர்களைத் தட்டியெழுப்பி அவர்களை உணவு உற்பத்தி வேலைகளிலும் சிரமதான வேலைகளிலும் ஊக்குவித்துக் கொண்டிருக்கும் திருமலை மாவட்டப் பிரதம கல்வி அதிகாரி திருமதி ஆர். எஸ். பாமர் அவர்களையும் நான் இச்சபையில் இச் சந்தர்ப்பத்தில் பாராட்டாமல் இருக்க முடியாது. இவ்விரு அதிகாரிகளும் செய்யும் சேவையை இங்கு பாராட்ட வேண்டியது எனது கடமையாகின்றது.

இறுதியாக இவ்வருட சிம்மாசனப் பிரசங்கம் வரவேற்கத்தக்கதொன்று என்பதைக் குறிப்பிட்டு, இங்கே நான் குறிப்பிட்ட அம்சங்களை அரசாங்கமும் அமைச்சர்களும் மிகவும் நிதானமான முறையில் பரிசீலனைசெய்து, ஒரு சமுதாயம் மற்றொரு சமுதாயத்தைச் சந்தேகக் கண்கொண்டு பாராமல் இந்த நாட்டில் அனைவரும் பயமின்றி வாழத்தக்க வழிவகைகளைக் கையாளவேண்டுமென்று கேட்டு இந்தத் தேசிய அரசாங்கம் அதனுடைய பூரண காலத்திற்கு சேவை செய்யப் பொது மக்களுடைய ஒத்துழைப்பையும் அன்பையும் பெற வேண்டுமென்று கூறி எனக்குப் பேசச் சந்தர்ப்பமளித்த உங்களுக்கு எனது நன்றியைத் தெரிவித்து எனது பேச்சை முடித்துக்கொள்ளுகிறேன்.

පූ. භා. 11.26

**එස්. ඩී. බණ්ඩාරනායක මයා.** (ගම්පහ)

*(திரு. எஸ். டீ. பண்டாரநாயக்க—கம்பஹா)*

(Mr. S. D. Bandaranayake—Gampaha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ විවාදයට භාජන වන මේ ආණ්ඩුවේ තුන්වැනි රාජාසන කථාවෙන් අපට අවබෝධ වන්නේ මේ ආණ්ඩුවේ තිබෙන දේශපාලන බංකොලොත් භාවයයි. අද පවතින දේශපාලන වාතාවරණය අනුව බලන විට මේ රටේ දේශපාලන පක්ෂ දේශපාලන වශයෙන් මංසන්ධියකට පැමිණ තිබෙන බව අපට පෙනෙනවා. ඒ නිසා අධිරාජ්‍ය විරෝධි දේශප්‍රේමී සියලුම දේශපාලන පක්ෂ සහ කොටස් නැවත වරක් මේ ප්‍රශ්නය ගැන සලකා බැලිය යුතුව තිබෙන බව මේ අවස්ථාවේදී මතක් කරන්න සතුටුයි.

එක ආණ්ඩුවක වැරදි නිසා තවත් ආණ්ඩුවක් ඇති වෙනවා. ඒ ආණ්ඩුවෙ වැරදි නිසා ටිකක් කල් ගත වන විට වෙනත් ආණ්ඩුවක් ඇති වෙනවා. අද පවතින තත්ත්වය අනුව සිදු වන්නෙ එයයි. ඒ කොයි හැටි වෙතත් මේ රටේ ප්‍රශ්න නම් එන්න එන්න උග්‍ර වේගන එන බව කාටත් පැහැදිලි කරුණක් බව කියන්න පුළුවනි.

සභාපති මාඕ සේතුං විසින් කරන ලද ප්‍රකාශයක් මට මේ අවස්ථාවෙ මතක් වෙනවා. රටක ජීවත් වන විවිධ ජාතීන් අතර පවතින බලවත් සමඟිය ඒ රටේ සටන් වලදී විශේෂයෙන්ම බලවත්ම—ප්‍රබලම—ආයුධයක් වශයෙන් සැලකිය යුතුය යන්නයි එතුමගෙ කියමන. විශේෂයෙන්ම අධිරාජ්‍ය විරෝධි සටන්වලදී එය එසේ විය යුතුමයි. ඒ අනුව සලකන විට අපේ රටේ ජනතාවගේ ඉදිරි ගමන ගැන අප කල්පනා කළ යුතුයි. අපේ පොදු සතුරා වූ ඇමෙරිකන් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් සහ ඔවුන්ට ගැතිකම් කරන දේශීය ප්‍රතිගාමී ධනපති පංක්තියට විරුද්ධව කරන අපේ සටනේදී මේ රටේ සිංහල ජනතාව මේ රටේ ප්‍රධානම මිතුරන් වශයෙන් දෙමළ ජනතාව, මුස්ලිම්, ජනතාව, මලයාලි ජනතාව සහ බර්ගර් ජනතාව සැලකිය යුතු බව අපි අවබෝධ කර ගත යුතුයි. ඒ එක්කම දෙමළ භාෂාව කථා කරන සුළු ජාතීනුත් මේ රටේ ප්‍රධාන මිතුරා වශයෙන් ගණන් ගනු ලැබිය යුතුව සිටින්නේ සිංහල ජනතාව බව අවබෝධ කර ගත යුතුයි. එය ප්‍රධාන කාරණයක් බව මතක් කරන්න කැමතියි.

මේ රටේ සමාජවාදය සිංහල ජනතාවට පමණක් සීමා වූවක් නොවෙයි. සමාජවාදය යන්න සිංහල ජනතාවට මෙන්ම දෙමළ ජනතාවටත්, මුස්ලිම් ජනතාවටත්, මලයාලි ජනතාවටත්, බර්ගර් ජනතාවටත්, බෞද්ධ හින්දු කතෝලික මුස්ලිම් ක්‍රිස්තියානි ආදි නොයෙක් ආගම් අදහන කොටස් වලට අයත් සියලු දෙනාටමත් උරුම දෙයක් සහ අයිතිවාසිකමක් බව අප විසින් අවබෝධ කර ගනු ලැබිය යුතුව තිබෙනවා. එම නිසා තමයි සභාපති මාඕ සේතුංගෙ කියමන වැදගත් වන්නෙ. ඒ අනුව විවිධ ජාතීන්, විවිධ කුල, විවිධ ආගමික අංශ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යනාදියට අයත් සියලු කොටස්ම සමාජ වාදය උදෙසා කරනු ලබන සටනේදී එක්සත්වීම අවශ්‍යයි. ඒ අනුව සලකා බලන විට මේ රටේ සිංහල බෞද්ධයන්ට නියමිත අයිතිවාසිකම් ලැබෙන්නේ සුළු ජාතීන් සමග අත්වැල් බැඳ ගැනීමෙනුයි. ඒ වගේම මේ රටේ සුළු ජාතීන්ටත් තමන්ට නියමිත අයිතිවාසිකම්—නියමිත මනුෂ්‍ය අයිතිවාසිකම්—ලැබෙන්නෙ සිංහල ජනතාවත් සමග අත්වැල් බැඳ ගැනීමෙන් බව අප විසින් අවබෝධ කර ගත යුතුයි.

එදා වාරියපොළ හාමුදුරුවෝ, කැප්පෙටිපොළ නිළමෙ, පුරන් අප්පු, ගොංගාලේ ගොඩ බණ්ඩා ආදි ජාතික වීරයන් ගෙන ගිය සටන අනුව, 1953 අගෝස්තු මාසයේ ඇතිවූ හර්තාලයේදී එදා පැවති ආණ්ඩුව කිසිම තොරතෝංචියක් නැතුව ජනතාවට වෙඩි තැබීම නිසා බලසම්පන්න බලවේග යක් ඇතිවූ අවස්ථාවේදී විද්‍යාත්මක සමාජ වාදී දර්ශනයක් අනුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, ලංකා සමසමාජ පක්ෂය, ලංකා කොමියුනිස්ට් පක්ෂය ආදි පක්ෂ සහ ගොවි, කම්කරු, සඟ, වෙද, ගුරු නමැති පංච මහා බල මණ්ඩලය වැනි අධිරාජ්‍ය විරෝධී සියළුම කොටස් ඒකරාශි වූ විට දිවංගත ගරු එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැතිතුමා ඊට මාගී දේශකත්වය දුන් බව අප විසින් අමතක නොකළයුතු කාරණයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උතුරේ සහ නැගෙනහිර ප්‍රදේශවල දෙමළ කථා කරන ජනතාවත් එදා 1956 දී මේ සටනම කරගෙන ගිය බව අප දන්න කාරණයක්. ඒ අවස්ථාවේදී එක්සත් ජාතික පක්ෂයේ ආසන සංඛ්‍යාව 8 ට බැස්සූ දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමා විසින් විශේෂයෙන්ම එංගලන්තයේ එලිසබෙත් රැජින ගෙ සහ අධිරාජ්‍යවාදීන්ගේ ස්වාධීනත්වය ආරක්ෂා වන අයුරු අද මේ රටේ අටවා තිබෙන යටත් විජිත ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව අහෝසි කිරීම උදෙසා දෙමළ කථා කරන සුළු ජාතීන්ගේ සහයෝගය ලබා ගැනීම පිණිස ගත් පියවර කුමක්ද ? " බණ්ඩාරනායක-චෙල්වනායගම් " නමැති ගිවිසුම ඇති කර ගැනීමට එදා එතුමා ක්‍රියා කළා. ඒ ගිවිසුමට විරුද්ධව එක්සත් ජාතික පක්ෂය නුවර පයින් ගමනක් ආරම්භ කළ අවස්ථාවේදී බණ්ඩාරනායක අගමැතිතුමා අපෙන් කරන ලද බලවත් ඉල්ලීම අනුව 1957 ඔක්තෝබර් මාසයේ 4 වැනිදා අපට ඒ පයින් ගමන ඉඹුල්ගොඩදී නතර කරන්න පුළුවන් වූ බව අපට මතකයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1961 පෙබරවාරි මාසයේදී අපි දැක්ක, උතුරු සහ නැගෙනහිර පළාත්වල පැවති දෙමළ භාෂාව කථා කරන ජනතාවගේ ජාතික නිදහස් සටන. විශේෂයෙන්ම දවස් 56ක් ඔවුන්ගේම ආණ්ඩුවක් ඒ ප්‍රදේශවල තිබුණු අවධියක එදා සිටි අගමැතිනිය වන සිරිමා බණ්ඩාරනායක මැතිනියගේ ඉල්ලීම අනුව මට ඒ ප්‍රදේශයට යන්ට පුළුවන් වුණා. දෙමළ භාෂාව කථා කරන උදවියගේ සටන කොයි ආකාරයට ඉදිරියට යනවාද කියන කාරණය අපි ඒ අවස්ථාවෙදි දැක්ක. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙත් අද අපට පෙනී යනව, මේ රටේ දෙමළ භාෂාව කථා කරන ජනතාව උසස් ජාතියක් ලෙස නඟා සිටුවීමට ක්‍රියා කිරීමට ෆෙඩරල් පක්ෂය සහ ද්‍රවිඩ සංගමයත් අතර තරඟයක් ඇතිවේගෙන යන බව. මා මෙහිදී ෆෙඩරල් පක්ෂයෙන් සහ ද්‍රවිඩ සංගමයෙන් ඉල්ලා සිටින්නෙ, අද උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල වාසය කරන දෙමළ ජනතාවගෙන් සියයට 30 ක් පමණ වූ කුල හීන යයි සම්මත කොටස් ගැන ෆෙඩරල් පක්ෂයේත්, ද්‍රවිඩ සංගමයේත් ප්‍රතිපත්තිය කුමක්දැයි පැහැදිලිව ප්‍රකාශ කරන ලෙසයි. අද දක්වා එවැනි ප්‍රකාශයක් කර නැහැ. අද මේ කුල හීන යයි කියන කොටස්වලට ඒ ප්‍රදේශවල කෝවිලකට තම ආගම අදහාගන්ට යාමේ මනුෂ්‍ය අයිතිවාසිකම පවා නැහැ. බොන්න වතුර ටිකක් ලබා ගන්න ළිඳකට යාමේ අයිතිවාසිකමක් අද ඔවුන්ට නැහැ. ෆෙඩරල් පක්ෂයත්, ද්‍රවිඩ සංගමයත් මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් කියන්නෙ, " මේය දේශපාලන ප්‍රශ්නයක් නොවෙයි ; ආගමික ප්‍රශ්නයක් " කියායි. නමුත් අද යාපනේ ප්‍රදේශයට ගිහින් බැලුවොත් පෙනෙනව, ළිං පවා කුල අනුව වෙන් කර තිබෙන බව. කුල හීනයන්ට සමහර බාබර් සාප්පුවලට ඇතුල් වන්නට ඉඩ නොදුන් අවස්ථා, ඒ සම්බන්ධයෙන් උසාවියට ගොස් දඩ ගසා ඇති අවස්ථා පවා තිබෙනව. කුල හීනයන්ට කෝවිල්වලට පවා ඇතුල් වන්නට අවසර දෙන්නෙ නැහැ. මේ රදළ ක්‍රමය නිසා පීඩනයට පත් ඒ ප්‍රදේශවල ඉන්නා කුල හීනයයි කියනු


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ඩී. බණ්ඩාරනායක මයා.]

ලබන සාමාන්‍ය ජනතාව—රා මදින සහෝදරවරු, කම්කරු සහෝදරවරු—අද තීරණය කර තිබෙනව, මාක්ස් ලෙනින් වාදී විප්ලවකාරී ආකල්පයකින් තොරව මේ රටේ ජනතාව සතු මිනිස් අයිතිවාසිකම් පවා ලබා ගන්නට බැරිය කියා.

දැනට ඉතා ඉහළ නැඟ ඇති ජීවන වියදම උසුලන්නට බැරිව, උද්ගත වී ඇති තත්ත්වයට මුහුණ දීම සඳහා මේ රටේ වෘත්තීය සමිති සියල්ලක්ම පාහේ අද ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනව, දවසක පඩිය රුපියලකින්වත් වැඩි කරන හැටියට. මේ ප්‍රශ්නය හෝ වේවා අද තැපැල් දෙපාර්තමේන්තුවේ ලියුම් තෝරන නිලධාරීන්ගෙ වැඩ වර්ජනයට තුඩු දී ඇති ප්‍රශ්නය හෝ වේවා වෙනත් කම්කරු අරගල හෝ වේවා සමථයකට පත් කර ගැනීමට කරන සටන් අද විප්ලවකාරී ආකල්පයකින් තොරව සාර්ථක කර ගැනීමට බැරි බව පැහැදිලි වී තිබෙනව.

අද මහජන චීනය දෙස බැලුවොත් අපට පැහැදිලි ලෙස පෙනෙනව, සභාපති මාඕ සේතුං සහ චීනයේ කොමියුනිස්ට් පක්ෂය ජාතික නිදහස උදෙසා සටන් කරන යටත් විජිතවාදී රටවලට විප්ලවකාරී නායකත්වයක් දී තිබෙන බව. මහජන චීනය මේ ළඟදී ඉතාමත් සාර්ථක ලෙස ජලකර බෝම්බයක් පුපුරවා අත්හදාබැලීමක් කළා. එය අද නිදහස උදෙසා සටන් කරන ආසියාවේ, අප්‍රිකාවේ, දකුණු අමෙරිකාවේ විමුක්තිකාමී බලවේගයන්ට විශාල ධෛර්යයක් වී ඇති බව අපට පැහැදිලිවම පෙනෙන කරුණක්.

මධ්‍යස්ථ විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කරනවාය කියා අද මේ ආණ්ඩුව පුරසාරම් දොඩනව. නමුත් බලන්න, වියට්නාම් ප්‍රශ්නය නැත්නම් මැද පෙරදිග අවුල දෙස. එහෙමත් නැත්නම් අප්‍රිකාවේ උද්ගත වී ඇති තත්ත්වය දිහා බලන්න. අද එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇමෙරිකන් අධිරාජ්‍යවාදීන්ගේ අතකොලුවක් වී ඇති බව පැහැදිලිවම පෙනෙන කරුණක්. වියට්නාම් ප්‍රශ්නය සම්බන්ධයෙන් අපි විශේෂයෙන් පැහැදිලි ලෙස කල්පනාවට ගත යුතු දෙයක්, කවුද ආක්‍රමණය ආරම්භ කළේ යන්න. අමෙරිකන් අධිරාජ්‍යවාදීන් තම සොල්දාදුවන් 4,20,000 ක්, යුද්ධ ටැංකි 32,000 ක්, ගගන යාත්‍රා 25,000 ක් සහ "නාපාම්" බෝම්බ වැනි විෂ බෝම්බත් පාවිච්චි කර අද වියට්නාමයේ අහිංසක ළමයින් පවා මරා දමනව. ඇමරිකන් අධිරාජ්‍ය වාදයට විරුද්ධව අද උතුරු ඇමරිකාවේ පවා තරුණ තරුණියන් ලක්ෂ ගණනින් පෙළපාළි යනව. මේ ආකාරයට අද උතුරු ඇමරිකාවේ සියයට 6 ක් වූ ජනගහණයක් ලෝකයේ සියයට 60 ක ධනස්කන්ධය මංකොල්ල කාගෙන, ආක්‍රමණය කරගෙන ජීවත් වෙනව. ඇමරිකන් අධිරාජ්‍යවාදීන්ට අද යුද කඳවුරු 3,300 ක් තිබෙනව. ඊශ්‍රායලය, දකුණු වියට්නාමය, කියුබාවේ ග්වෝන්ටනාමෝ ආදී රටවල ඒ යුද කඳවුරු තබාගෙන ලෝකයේ සියයට 6 ක ජනගහණයක් ලෝකයේ සියයට 60 ක ධනස්කන්ධයක් ආක්‍රමණය කරගෙන අද ජීවත් වෙනව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මැද පෙරදිග ප්‍රශ්නය දෙස බලන්න. මිසරය එදා සූවස් ඇල ජනසතු කිරීමට තීරණය කළ අවස්ථාවේදී දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමා ගත් පියවර ගැන මා මේ ආණ්ඩුවට මතක් කරන්ට සතුටුයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එදා මධ්‍යස්ථ ප්‍රතිපත්තිය අනුව පියවරක් ගත්තා. සූවස් ඇළ ජනසතු කිරීමට නසාර් මහත්මය තීරණය කළ අවස්ථාවේදී දිවංගත එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැතිතුමා තමන් සමග ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයෙ එක පංතියෙ සිටි එවකට බ්‍රිතාන්‍යයේ අගමැතිතුමා වූ ඇන්තනි ඊඩන් මහත්මයට කිව්ව සූවස් ඇල ප්‍රශ්නයට අත ගසන්ට එපාය කියා. සූවස් ඇල ප්‍රශ්නය එක්සත් අරාබි ජනරජයට, නසාර් ජනාධිපතිතුමාට අයිති ප්‍රශ්නයක්ය කියා මුළු ලෝකයෙන්ම පළමුව පියවරක් ගත්තෙ එදා සිටි එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැතිතුමායි. එමනිසා මධ්‍යස්ථ ප්‍රතිපත්තිය කියන්නෙ වැට උඩ සිටීමය කියා එක්සත් ජාතික පක්ෂය කල්පනා කරන්ට එපා. මධ්‍යස්ථ ප්‍රතිපත්තිය කියන්නෙ වැට උඩ සිටීම නොවෙයි. අධිරාජ්‍ය වාදීන්ට විරුද්ධව ලෝකයේ යටත් විජිත රටවල් ජාතික සටනක් ගෙන යනවා නම් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඒ අධිරාජ්‍යවාදීන්ට විරුද්ධව සටන් කරන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රටේ පැත්තයි ගන්නෙ. ඒ කාරණය අවබෝධ කර ගත යුතුයි.

නොබෝදා මැද පෙරදිග ඇතිවූ අරගලය දෙස බලන්න. දවස් හයක් තුළ ඊශ්රායෙලය තමන්ට තිබුණු ප්‍රමාණය මෙන් හතර ගුණයක් විශාල ප්‍රදේශයක් ඇමරිකානු බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ගේ යුද්ධ සහයෝගය ඇතිව ආක්‍රමණය කළා. නමුත් එක්සත් ජාතීන්ගේ සංගමය සහජීවනයෙන් ජීවත් වෙන්නය කියා මැද පෙරදිග අරාබි රටවල්වලට කියනව. යුද්ධය නවත්වන්නය කියා අරාබි රටවල්වලට කියනව. ඇමරිකන් අධිරාජ්‍යවාදීන් අද එක්සත් ජාතීන්ගේ සංවිධානය අතකොලුවක් වශයෙන් පාවිච්චි කරන බවයි පෙනෙන්නෙ. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මුවාවෙන් අද ඇමරිකානු අධිරාජ්‍යවාදීන් ලෝකයේ සෑම තැනම, ආසියාව, අප්‍රිකාව, දකුණු ඇමරිකාව ආදී රටවල ආක්‍රමණ කර ගෙන යනව. එක්සත් ජාතීන්ගේ සංගමයේ මුවාවෙන් අප්‍රිකාවේ කොන්ගෝව, නයිජීරියාව, රොඩේෂියාව ආදී රටවලට ඇමරිකානු බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් කුලියට ගත් සොල්දාදුවන් යොදමින් ආක්‍රමණයක් ආරම්භ කර තිබෙනව. ලතින් ඇමරිකාවේ ඩොමිනිකන් සමූහාණ්ඩුවේ එසේම ව්‍යාපාරයක් ඇමරිකන් අධිරාජ්‍යවාදීන් ආරම්භ කර තිබෙනව. මධ්‍යස්ථ ප්‍රතිපත්තිය අනුව මේ ප්‍රශ්න පිළිබඳව කුමන පියවරක් ගත යුතුද යන්න තමුන්නාන්සේලා පැහැදිලි වශයෙන් අවබෝධ කර ගන්න ඕනෑ. වියට්නාමය ගැන මා නැවත වරක් මතක් කරනවා. වියට්නාමයේ ආක්‍රමණය ආරම්භ කළේ ඇමරිකානු බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් විසිනුයි. එමනිසා ඇමරිකානු බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ගේ සොල්දාදුවන්, නැව්, තුවක්කු ආදී සියල්ලම වියට්නාමයෙන්, ආසියාවෙන් ඉවත් කරන තුරු ඒ රටේ සාමයක් ඇතිවෙන්නෙ නැහැ; සාමයක් ඇති කරන්ටත් බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාත්‍යන්තර ප්‍රශ්න ගැන අද කථා කරන විට සෝවියට් දේශයේ සංශෝධනවාදීන්ගේ නායකත්වය දරන කොසිජින් අගමැතිතුමාත් ඇමරිකන් අධිරාජ්‍යවාදීන්ගේ ජොන්සන් ජනාධිපතිතුමාත් අත්වැල් බැඳගෙන ක්‍රියා කරන බව අපට පෙනෙනවා. විශේෂයෙන්ම මේ දෙදෙනා, එනම්, සෝවියට් දේශයේ කොසිජින් අගමැතිතුමාත් එහි අනෙකුත් නායකයිනුත් ඇමරිකාවේ ජොන්සන්ලාත් එකතු වී මේ ආකාරයට ක්‍රියා කිරීම අද ආසියානු අප්‍රිකානු ලතින් ඇමරිකානු රටවල ජාතික නිදහස උදෙසා යටත් විජිත වාදයට විරුද්ධව සටන් කරන රටවලට විශාල ප්‍රශ්නයක් වී තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආණ්ඩුව විශෙෂයෙන්ම පුරසාරම් දොඩනව, ආහාර වගා කිරීම ගැන. ගරු අගමැතිතුමා ලඟදී ගම්පහට පැමිණ කාගෙනුත් ආධාර ඉල්ලුව, එම ව්‍යාපාරවලට. මේ රටේ ගොවීන් පනස් ලක්ෂයක් පමණ සිටිනව. ඒ උදවිය, ගොවිතැන් කරන්ට අඟලකවත් ඉඩමක් කඩමක් නැති, නමින් පමණක් ගොවීන් හැටියට හඳුන්වන අයයි. එදා පරාක්‍රමබාහු රජතුමා මේ රට සංවර්ධනය කළේ කොහොමද ? මේ රටේ සෑම වැසි බිඳක්ම මහ පොළොවට උරා ගන්නා ආකාරයට කඳුකර ප්‍රදේශවල උස්බිම්හි කැලෑ වගා කෙරුව. එනිසා එම ප්‍රදේශවල පිහිටි දිය උල්පත්, ඇල දෙල යනාදිය ආරක්ෂා වෙන තැනට කටයුතු යෙදුණ. විශෙෂයෙන්ම වියලි ප්‍රදේශවල නියඟයන් ඇති වීම වැලැක්වීමටත්, මේ රටේ ජලගැල්ම වැලැක්වීමටත් එය උපයෝගි වුණා. එදා ගමන් පහසුව යනාදිය ඇති කිරීම උදෙසා ගංගාවල් හරියාකාර සකස් කළ බව අපි දන්නව. එදා මේ රට ආහාරයෙන් ස්වයංපෝෂිත කළා පමණක් නොවෙයි, පිටරටවලට පවා සහල් යවන්ටත් අපට පුළුවන් වුණා.

නමුත් ඒ උස් බිම්, ඒ කඳුකර ප්‍රදේශ, සුදු අධිරාජ්‍යවාදීන් විසින් මංකොල්ල කා, මුඩුබිම් පනත අනුව එම විශාල කැලෑ කපා දමා, පහලවී තිබුණු උල්පත් සහ ඇල දොල යනාදිය අහෝසි කර දමන්ට යෙදුණ. ඒ උදවියගෙ ක්‍රියා මාර්ග නිසා වියලි ප්‍රදේශවල විශාල නියඟවල් හට ගන්ට පටන් ගත්ත. ඊළඟට ඒ ප්‍රදේශවල තෝ වවන්ට පටන් ගත්ත. ඒ ප්‍රදේශවල පස වීදුරුවකට වතුර වත්කළ ආකාරයට සෝදාගෙන යාම නිසා ගංගා යනාදිය පසින් පිරී ගියා. මේ හේතුකොටගෙන ජලගැලීම් යනාදිය සිදු වන්ට පටන් ගත්ත. ඇතැම් ප්‍රදේශවලට දවසක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ඩී. බණ්ඩාරනායක මයා.]

දෙකක් වැස්සොත් ජල ගැල්මක් ඇති වෙනව. ඒවගෙම වියලි ප්‍රදේශවල විශාල නියඟ ඇති වෙනව. ඔය ආකාරයටයි, අද තත්ත්වය හැඩ ගැසී තිබෙන්නෙ. එම නිසා අපි මේ ආණ්ඩුවට මතක් කර සිටිනව, උඩරට ප්‍රදේශවල තිබෙන විදේශීය කොම්පැනිවලට අයත් තේ වතු යායවල් ජනසතු කිරීම අවශ්‍ය බව. එම තේ වතු ජනසතු කොට නැවත වරක් උස් බිම්වල, කඳුකර ප්‍රදේශවල කැලෑ වගා කරන්න. ඒ ප්‍රදේශවල කැලෑ වගා කිරීමෙන් සෑම වතුර බිංදුවක්ම ආරක්ෂා වෙන තැනට කටයුතු යොදන්ට පුළුවනි. ගොවීන්ට නැවත වරක් පෙර තිබුණු අන්දමට උල්පත්, ඇලදොළ ඇති කර දෙන්ට පුළුවනි. වියලි ප්‍රදේශවල නියඟ වලක්වාලන්ට පුළුවනි. ජලගැලීම් වලක්වන්ට පුළුවනි. ගංගා නිසියාකාර ක්‍රියාත්මක කරවන්ට පුළුවනි. මේ සඳහා කළයුත්තෙ, විදේශීය සුදු කොම්පැනිවලට අයිති කඳුකරයේ විශාල තේ වතු යායවල් ජනසතු කිරීමයි. නමුත් විදේශීය කොම්පැණිකාරයන්ගෙ අයිතිවාසිකම් ආරක්ෂා කරන්ට වුවමනා නිසා එවැනි පියවරක් ගන්ට මේ ආණ්ඩුව ලෑස්ති නැහැ. මා විශෙෂයෙන් ඔය කාරණය මතක් කළේ, මේ ආණ්ඩුවෙ සෑම මන්ත්‍රීවරයෙක්ම වාගෙ ආහාර වගා කිරීම ගැන කතා කරන නිසයි.

පසු ගිය මීගමුව අතුරු මැතිවරණයේදී මේ රටේ කොමියුනිස්ට් කාරයන්, වාමාංශිකයන් කතෝලික ආගමේ ආරක්ෂකයන් හැටියට අගමැතිතුමා විසින් සමච්චලයට භාජන කර තිබුණ බව අපි දැක්ක. අපි ගරු අගමැතිතුමාටත් මේ රජයටත් මතක් කරන්න කැමතියි, පෝය දිනය ආණ්ඩුවේ නිවාඩු දිනයක් කිරීමේදී ඉරිදා දිනය වැඩ කරන දිනයක් කරන්නය කියා බෞද්ධ කොමිෂන් සභා වාර්තාවේ කොහේවත් සඳහන් වී තිබුණෙ නැති බව. වෙනෙකක් තබා දිවංගත අගමැති එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මැතිතුමාගේ ප්‍රකාශනයෙන් පවා එය පැහැදිලිය. අවුරුදු හාර සිය පනහකට පස්සෙ මේ රටේ සිංහල බෞද්ධයාගෙ භාෂාවට හා ආගමට හිමි තැන ලබා දෙන අතර, දෙමළ කථා කරන ජනතාවගේ භාෂාවට සහ වෙනත් ආගම්වලට සාධාරණ තැනක් දෙන්නට එතුමා අදහස් කළා. නමුත් මේ ආණ්ඩුව කෙළේ කුමක්ද? මාක්ස්වාදීන්ගෙන් ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කර ගැනීමට ආධාර දෙන්නය, ආගම ආරක්ෂා කර ගැනීමට ආධාර දෙන්නය, කියා මේ රටේ කතෝලික ජනතාවගෙනුත්, මුස්ලිම් ජනතාවගෙනුත් ඉල්ලා බලයට පත් වුණා. මගේ මව්ගේ ගම වන මාතර මහමන්තින්ද පිරිවෙනේ ඉගෙනගත් බෞඩයෙක් වශයෙනුත් පොදුවේ වාමාංශිකයින් වශයෙනුත් අපි තමුන්නාන්සේට මතක් කරන්නේ, අපි බලයට පැමිණියොත් පැය 24 කින් ඉරිදා දිනය නිවාඩු දිනයක් කිරීමට අපි සූදානම් බවයි. මේ රටේ කොමියුනිස්ට්කාරයන්, වාමාංශිකයන් කතෝලික ජනතාවගේ ආරක්‍ෂකයන් හැටියට පෙනී සිටිනවාය කියා මීගමු මැතිවරණයේ දී අප සමච්චලයට භාජනය කළ අගමැතිතුමාට අපි ඒ බව මතක් කර දෙන්න කැමතියි.

නියෝජ්‍ය කථානායකතුමනි, චීනය සියයට 80ක්ම බෞද්ධයන් සිටින රටක්. චීනයේ පන්සිල් පද පහෙන් 4ක්ම එදිනෙදා ජීවිතයෙ ක්‍රියාත්මක වෙනව. එක පන්සිල් පදයක්—ඒ කියන්නෙ සතුන් මැරීමේ පන්සිල් පදය—පමණයි, ක්‍රියාත්මක වෙන්නෙ නැත්තෙ. සතුන් මරන්නෙ කෑමටයි. ඒ නිසා ඒ පන්සිල් පදය ක්‍රියාත්මක වෙන්නෙ නැහැ. එමෙන්ම අනික් කතෝලික සමාජවාදී රටවල—පෝලන්තය, නැගෙනහිර ජර්මනිය, චෙකොස්ලොවෙකියාව, කියුබාව ආදී සියයට සියයක්ම කතෝලික රටවල—දස පනතම එදිනෙදා ජීවිතයෙ සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වෙනව. ඒ නිසා ආගම ආරක්ෂා කර ගැනීමට නම් මාක්ස් ලෙනින්වාදය අනුව සමාජවාදී ආණ්ඩුවක් පිහිටුවිය යුතු බව තමුන්නාන්සේලා අවබෝධ කරගන්න.

අද රැකී රක්ෂා නැතිව මේ රටේ තරුණ උදවිය දස ලක්‍ෂයක් ඉන්නව. සෑම ගෙදරකම බලන විට ජ්‍යෙෂ්ඨ විභාගය සමත් වූ අය අඩු වශයෙන් එක්කෙනෙක්වත් ඉන්නව. ඒ වාගේම අද උපාධිධාරීන් දහස් ගණනක් ඉන්නව රක්ෂා නැතිව. එසේ තිබියදීත් අද මේ ආණ්ඩුව ජාතික සමගිය නාමයෙන් සිංහල බෞද්ධයන්, බෞද්ධ ප්‍රදේශවලින් හා සිංහල ප්‍රදේශවලින් එන කම්කරුවන්, උසස් නිලධාරීන් අස් කරගෙන යනව. ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවලින්, පොලිස් දෙපාර්තමේන්තුවෙන්, යුද්ධ හමුදාවෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඔය ආකාරයට සිංහල බෞද්ධයන් ජාතික සමගියේ නාමයෙන් අස් කරගෙන යනව. දෙමළ කථා කරන උතුරු නැගෙනහිර ප්‍රදේශවල සියයට තිහක් පමණ අහිංසක කම්කරු සහෝදරවරුන්ට කුලහීනයන්ය කියා කෝවිලකට යන්න අයිතිවාසිකමක් නැහැ. ඒ වාගේම ජාතික සමගියේ නාමයෙන්, දසපනතෙහි වූ ඉරිදා දිනය, කතෝලික දිනය, අහෝසි කර තිබෙනව. ඔය සැම දෙයක්ම මේ ආණ්ඩුව කරන්නෙ ජාතික සමගියේ නාමයෙන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම නිසා මේ රටේ සියලුම අධිරාජ්‍ය විරෝධී කොටස්, විවිධ ජාතීන්, කුල, ආගම්වලට අයත් සියලුම කොටස් එකතු වී එකම ධජයක් යටතේ මාක්ස්-ලෙනින් වාදය අනුව සමගි වී විද්‍යාත්මක සමාජවාදය අනුව, විප්ලවකාරී ආකල්පයක් අනුව, කටයුතු කළොත් පමණයි අපට නියම්ත දේශපාලන නිදහසත් මනුෂ්‍ය අයිතිවාසිකමත් ලැබෙන්නෙ කියා මතක් කරමින් මගේ වචන සවල්පය මෙයින් අවසන් කරනව.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Order, please! The Sitting is suspended till 2 P.M. On resumption the Hon. Deputy Chairman of Committees will take the Chair.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින් අ. භා. 2ට කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමාගේ [ශ්‍රීමත් රසීක් ෆරීඩ්, ඕ.බී.ඊ.] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදි.**

*இதன்படி அமர்வு பிற்பகல் 2 மணிவரை இடைநிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று. குழுக்களின் உப அக்கிராசனர் [ஸ்ரீமான் ரூசிக் பரீத், ஓ. பி. ஈ.] தலைமை தாங்கினார்.*

*Sitting accordingly suspended till 2 P.M. and then resumed,* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [SIR RAZIK FAREED, O.B.E.], *in the Chair.*

**ජෝර්ජ් අබයගුණසේකර මයා.** (හඟුරන්කෙත)
*(திரு. ஜோர்ஜ் அபயகுணசேக்கர—ஹங்குரங்கெத்த)*
(Mr. George Abeyagoonasekera—Hanguranketa)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජාතික රජයෙ දෙවන පාර්ලිමේන්තු සභාවාරය ආරම්භ කරමින් ගරුතර අග්‍රාණ්ඩුකාරතුමා විසින් කළ දේශනය සඳහා ඉදිරිපත් කරන ලද ස්තුති යෝජනාව විවාදයට ලක් වී තිබෙන මේ වැදගත් අවසථාවේදී මට දී තිබෙන සීමිත කාලය තුළදී අදහස් සවල්පයක් ප්‍රකාශ කරන්නටයි මා නැගී සිටියෙ.

පසුගිය වර්ෂ දෙක තුළ අසල්වැසි ඉන්දියාව වැනි රටවලට සහ සාමාන්‍යයෙන් අපේ මේ කුඩා දිවයිනටත් හොඳ නොහොඳ, සුභ අසුභ සම්මිශ්‍රණ වූ කාල සීමාවක් බලපෑ බව අප කවුරුත් දන්නා කාරණයක්. වියට්නාම් යුද්ධය, ඉන්දියාවෙ දුර්භික්ෂය, බුරුම, තායිලන්ත ආදී රටවල ආහාර නිෂ්පාදනය අඩුවීම, නැගෙනහිර පකිස්ථානයෙහි සුලි සුළංවලින් ඇති වූ අස්වැන්න විනාශය, ඉන්දුනීසියාව වැනි රටවල අභ්‍යන්තර කරදර හා නොසන්සුන් භාවය, මේ ආදී හේතූන් නිසා මුළු ලොවම යම්බඳු හෙල්ලීමක් ඇති වූ බව නතු දන්නා උදවිය අවබෝධ කර ගෙන ඇති කාරණයක්.

ලෝක වෙළඳපොලේ ආහාර හිඟය ගැන, විශේෂයෙන්ම හාල් හිඟය ගැන, බලපෑම් ඇති වූ නිසා එයින් උද්ගත වුණු ප්‍රතිඵලවලින් අපේ මේ කුඩා දිවයිනෙත් හාල් සලාකය අඩු කරන්න සිද්ධ වූ බව අප දන්නා කාරණයක්. එම නිසා හාල් සලාකය අඩු කරමින් ආහාර සුලභ කිරීමේ ව්‍යාපාරය යහපත් සංවිධානයක් අනුව ජාතික රජයට කරන්න සිද්ධ වුණා. මෙය, මෑත යුගයේදී මේ රටේ ශුභසිද්ධිය සඳහා ඉදිරිපත් කළ යම් යම් යෝජනා ආදියත්, ව්‍යාපාර ආදියත් තිබුණා නම්—බස් ජනසතු කිරීම, ජීවිත සංරක්ෂණ ක්‍රමය ජනසතු කිරීම, ඔය ආදී නොයෙක් දේවල් මේ රටේ ශුභසිද්ධිය සඳහා කළත්, ඒවා කවුරුන් කළත්—මේ රටේ ශුභසිද්ධිය පිණිස කළ ඒ වැඩවලින් ඉතාම වැදගත් ස්ථානයක් දරන්නෙ හාල් සලාකය අඩු කිරීම බව සඳහන් කරන්න කැමතියි. හාල් සලාකය අඩු කිරීමෙන් අපේ වැසී තිබුණු ඇස් පෑදීමක් සහිතව ඇස් ඇරගෙන අපට අපේ කටයුතු කරන්න අවස්ථාවක් ලැබුණා. හාල් සේරුව කැපීමෙන්, හිඟාකෑම නවත්වා නිදහස් නිවහල් ජාතියක් හැටියට රට සවයංපෝෂිත කරන්න අවසථාව එදා උදා වුණු බව අපට අවබෝධ වුණා. එපමණක් නොව කාලෝචිතව හාල් සලාකය කැපීමේ මේ නිර්භීත ක්‍රියාව, අප උඩඟු ලෙස කියාපාන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජෝර්ජ් අභයගුණසේකර මයා.]

අතීත සෞභාග්‍ය ඇති කිරීමට, නැවතත් ඒ පෙරදිග ධාන්‍යාගාරය මේ රටේ ඇති කිරීමට, අපේ ජාතික ආත්ම ගෞරවය යළිත් ඇති කිරීමට දමන ලද අත්තිවාරමක් හැටියට සැලකිය හැකියි. මා නියෝජනය කරන හඟුරන්කෙත ප්‍රදේශයේ ජනතාව රට සවයංපෝෂිත කිරීමේ සටනට, සාගිනි නිවාරණය කිරීමේ සටනට, සියයට සියයක්ම සහයෝගය දෙමින් කටයුතු කරන්නට එඩිතරව ඉදිරිපත් වී සිටින බව මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වර රාජාසන කථාව පටන් ගෙන තිබෙන්නේ රට ආහාර අතින් ස්වයංපෝෂිත කරන බව කියමිනුයි. මේ කර්තව්‍යය සාර්ථක කර ගැනීම සඳහා උභය පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් ප්‍රධාන කොට රජයේ සේවකයන්ද, පෞද්ගලික අංශයද, මහ ජනතාවද සිය සහයෝගය, ආධාරය දිය යුතුයි. එම සහයෝගය-ආධාරය-නියම විධියට නොලැබෙතොත් ඒ කර්තව්‍යය සාර්ථක කර ගන්නට පුළුවන් වන්නේ නැහැ. එසේ හෙයින් අප අතර මොන තරම් වාද භේද තිබුණත් මොන තරම් වෙනස්කම් ඇතිව මේ රටේ ජීවත් වුණත් අද ලෝක තත්ත්වය අවබෝධ කරගෙන, ඒ වගේම ලෝක සමාජය දෙස බලා ඔළුව උස්සාගෙන නිර්භීතව ඉදිරි ගමනෙහි යෙදෙන්නට නම් අප සියලු දෙනාම අපේ රට ස්වයංපෝෂිත කිරීමේ ව්‍යාපාරයට අනුබල දිය යුතුයි. ඒ ව්‍යාපාරයෙහි පුරෝගාමීව කටයුතු කළ යුතුයි. මේ කාර්යයෙහිදී නොයෙකුත් බාධා අවහිර ඇති වෙනවා. රජයේ සේවකයන්ගේ ආධාරය සහ සහයෝගය අප බලාපොරොත්තු වන අන්දමට නොලැබී ගියහොත් මෙම ව්‍යාපාරය සාර්ථක කර ගනන්ට බැහැ. කොහේ වුණත් කොතැන වුණත් කඩාකප්පල්කාරී ක්‍රියා ඇති වුණොත් මේවා රජයට කරන්නට බැරී යයි අද "දිනමිණ" පත්‍රය සවකීය කර්තෘවාක්‍යයෙහි කෘෂිකර්ම ව්‍යාපාර ගැන සඳහන් කොට තිබෙනවා. එසේ හෙයින් කෘෂිකර්ම සංවර්ධන ව්‍යාපාර සඳහා සියලු දෙනාගේම සම්පූර්ණ සහයෝගය ඉල්ලන ගමන් නොමිළයේ දෙන හාල් සලාකය ගැනත් වචනයක් දෙකක් කියන්නට



මා කැමතියි. අද බොහොම දෙනකු නොමිළයේ දෙන මෙම හාල් සලාකය ලබා ගන්නවා. ඒ වගේම හාල් අතින් ස්වයංපෝෂිතව සිටින සැහෙන පිරිසක් හා තවත් යම් යම් පිරිස් ස්වකීය හාල් සලාක පොත් රජයට පරිත්‍යාග කර තිබෙනවා. ඒ අයට අපේ කෘතඥතාව හිමි විය යුතුයි. මේ අතර සැහෙන තරම් හාල් තිබෙන සමහර උදවිය තවමත් ස්වකීය හාල් පොත් රජයට පරිත්‍යාග කර නැහැ. අප ඒ අයට අනුකම්පා කරනවා. ඒ වගේම හාල් පොත් රජයට දෙන්නට එපා යයි අන්‍යයන්ට කියන ප්‍රභූන් සිටිනවා නම් අප ඒ පින්වතුන්ටත් අනුකම්පා කරනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
සාධු! සාධු !!

**ජෝර්ජ් අබයගුණසේකර මයා.**
*(திரு. ஜோர்ஜ் அபயகுணசேக்கர)*
(Mr. George Abeyagoonasekera)

සාධු කියන්නට වටිනවා. මේ සම්බන්ධයෙන් කරුණු කියන ගමන්ම මෙම ජාතික රජය පෝය දින නිවාඩු දීමෙන් බෞද්ධයන්ට කරන ලද ගෞරවය ගැනත් සඳහන් කරන්නට කැමතියි. ඒ සමගම සබත් දිනය ගැනත් මා අදහසක් ප්‍රකාශ කරන්න කැමතියි. කලින් මා බත් ගැන කථා කළා. දැන් සබත් ගැන කථා කරනව. මේ ආණ්ඩුව විසින් පෝය දින නිවාඩුව දීම ගැන අද නොයෙක් විධියේ විවේචන ඇති වී තිබුණත් මේ රටේ බහුතර ජනතාව එදත් අදත් කවදත් සෑම පක්ෂයකටම සෑම ලබ්ධියකටම සාධාරණව ඔවුන්ගේ කටයුතු කර ගන්නට අවකාශ දුන් පිරිසක්. ගරු සභාපතිතුමත් හොඳ හැටි දන්න කරුණක් ඒ. මේ රටේ බෞද්ධයින් සතුව බොහෝ ඈත කාලයකදී තිබුණු අයිතිවාසිකමක් වරප්‍රසාදයක් නැවතත් අපට ලබා දෙමින් පෝය දින නිවාඩු කිරීම ගැන මේ ආණ්ඩුවට ස්තුති කරන අතරම අපේ ප්‍රතිපත්ති අනුව, ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක් වෙත පැවරී තිබෙන යුතුකමක් වශයෙන්, අපට හැකියාවක් ලැබෙන අවස්ථාවකදී, අනෙක් ආගම්වල උදවියටත් ඒ අයගේ අයිතිවාසිකම් වරප්‍රසාද ලබා දිය යුතුයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලෝකය දිනෙන් දින සංවර්ධනය වීමෙන් නොයෙක් ජාතීන් ඉතා කිට්ටු සම්බන්ධ කමක් අතිව වාසය කරන මේ කාලයේ සෑම දේශපාලනඥයෙක්ම, සෑම පණ්ඩිත පුරෝහිතයෙක්ම, සෑම විශෙෂඥයෙක්ම කල්පනා කරන්නෙ කථා කරන්නෙ ලෝක ආණ්ඩුවක් පවත්වා ලෝක සාමය ඇති කිරීම සම්බන්ධවයි. වැඩ කරන දවස් 5 ක සීමාවක් ඇති සතියක් ඇති කරන්නට අදහස් කර තිබෙන මේ අවස්ථාවේදී අපේ ආර්ථික අංශය හා වෙළෙඳාම් ගැන කල්පනා කර බලන විට, සබත් දිනය වන ඉරිදා දිනයත් නිවාඩු දවසක් කිරීමට පුළුවන් වන බව අපට පෙනී යනව. එසේ කිරීමෙන් රටට අමාරුවක් ඇති වේයයි මා හිතන්නෙ නෑ. මේ කාරණය අපගේ ආණ්ඩුවෙ කල්පනාවට භාජන කරන්නට මම කැමැතියි. මේ අවසථාවෙදි කිසිවෙක් අන්තවාදීව කල්පනා නොකර ආත්මාර්ථ කාමීව කල්පනා නොකර පටු අදහසින් මිදී මුළු ලෝකයෙ ජාත්‍යන්තර නිවාඩු දිනය වන ඉරිදා දවස නිවාඩු දවසක් කිරීමෙන් අපට හොඳක් මිස නොහොඳක් නොවන බවයි මගේ කල්පනාව.

අද බොහෝ දෙනෙක් ඥාති සංග්‍රහය හෙවත් "නෙපොටිසම්" ගැන මේ ආණ්ඩුවට දෝෂාරෝපණය කරනව. මනුෂ්‍ය සමාජයේ වාසය කරන අපට නොනෑයින් වන කිසිවෙක් මේ ලෝකයෙ සිටිනවද ? අප හැම දෙනාම නෑයින්වෙනව. නොනෑකමක් මේ මනුෂ්‍ය සමාජයෙ තිබෙනවායයි මා හිතන්නෙ නෑ. ඒ නිසා යම් යම් තනතුරු ප්‍රදනය කරන අවස්ථාවලදී ඥාති සංග්‍රහය ගැන කල්පනා කරන්න පුළුවනි. නමුත් දේශපාලන වශයෙන් කල්පනා කරනවා නම් ඥාති සංග්‍රහය කෙසේ වුනාද යන්න, පසුගිය රජය කාලයේදී සතොසේ කටයුතු සිදු වී ඇති පිළිවෙළ සම්බන්ධව ඇති කොමිෂන් සභා වාර්තාවෙනුත්, මැතිවරණ ඡන්ද පෙත්සම් විභාගවලිනුත් අනාවරණය වුනා. ඥාති සංග්‍රහය ගැන දෝෂාරෝපණයට ලක් වී තිබෙන්නේ කව්ද යන්න ඒ අනුව කාටත් තේරෙනවා ඇති. පසුගිය රජය කාලයේදී රජයේ නොයෙකුත් සංස්ථාවල තනතුරු දුන් හැටි අවස්ථාවක් පැමුණුනු විට අපට කියා දෙන්න පුළුවන්.

බොහොම දෙනෙක් භාෂාව ගැන නොයෙක් විධියේ ප්‍රශ්න ඉදිරිපත් කරනව. මේ අවස්ථාවේදී මම රජයේ අදහස් වලට පටහැණිව යමක් කියනවාය කියා මම හිතන්නෙ නැහැ. මේ රටේ එකම රාජ්‍ය භාෂාව සිංහල බව අප පිළිගෙන අවසානයි. අප සෑම ප්‍රයත්නයක්ම දරන්නේ සිංහල භාෂාවට නියම තැන දෙන්නයි. [බාධා කිරීමක්] ඇඳුමෙන් කවදාවත් අපේ භාෂාව පෙන්වන්න බැහැ. තමුන්නාන්සේලා කෙසේ කල්පනා කළත් කලිසම සහ කබාය පෙරදිග අපට අයිති වස්ත්‍රයක් බව නොකියා බැහැ. [බාධා කිරීමක්] සිංහල භාෂාවට නියම තැන දෙන අතර ද්‍රවිඩ භාෂාවට සාධාරණ තැනක් දීමට අප නීති සම්පාදනය කර තිබෙන බව තමුන්නාන්සේ දන්න කරුණක්. සිංහලය රාජ්‍ය භාෂාව වශයෙන් ක්‍රියාත්මක කිරීමට මේ රටේ වාසය කරන සෑම ලාංකිකයාගේම සහයෝගය අපට වුවමනා කරනව. මේ අවස්ථාවේදී අප විශෙෂයෙන්ම බලාපොරොත්තු වන්නේ ද්‍රවිඩ සහෝදරයන්ගේ සහයෝගයයි. බහුතර ජනතාවගේ භාෂාව වන සිංහල භාෂාව මේ ලංකාවේ රාජ්‍ය භාෂාව හැටියට සම්මත කර තිබෙන අවස්ථාවේදී ඒ අනුව ක්‍රියා කරන්නත්, ද්‍රවිඩ භාෂාවේ සාධාරණ භාවිතයට අවස්ථාව සලසා දෙන්නත් අප දෙපක්ෂයේම සහයෝගය අවශ්‍ය වෙනව.

බොහොම දෙනෙක් ඉංග්‍රීසි භාෂාව ඉගෙන ගැනීම ගැන නොයෙක් කරුණු කිව්වා. අප අපේ ළමයින්ට ඉංග්‍රීසි භාෂාව ඉගෙන ගැනීමට හැකි තරම් අවස්ථාව ලබා දිය යුතුයි. ඉංග්‍රීසි පමණක් නොවෙයි, මළ හෝ නොමළ, ප්‍රාචීන හෝ ප්‍රතිචීන සෑම භාෂාවක්ම හැදෑරීමට අවසථාව දිය යුතුයි. අපට කවදාවත් වලේ සිටින මැඩියන් වගේ කටයුතු කරන්න පුළුවන්කමක් නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉන්දු—ලංකා ගිවිසුම ගැන නොයෙක් විධියේ විවේචන ඇති වුනා. ඉන්දියාව අප හා මිත්‍ර, අපේ අසල්වැසි, අපට නෑ සම්බන්ධකම් ඇති රටක් බව අපි දන්නව. එවැනි රටක් සමග සහයෝගයෙන් හා සම්බන්ධත්වයෙන් යුතුව අපේ ප්‍රශ්න නිරාකරණය කර ගත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජෝර්ජ් අබයගුණසේකර මයා.]

යුතුයි. ඒ අනුව නීති සම්මත කර ඒවා ක්‍රියාත්මක කරන්න දැරූ ප්‍රයත්නය සම්බන්ධව අපේ අගමැතිතුමාට අනාගතයේදී යම් කිසි ස්ථානයක් ලැබෙනවද, ඒ හා සමාන ස්ථානයක්—කව්රු මොනවා කිව්වත්, හිතුවත්—විරුද්ධ පාර්ශ්වයේ නායිකාවටත් ලැබෙන බව නොකියා බැහැ. ඉන්දියාවට නොයෙකුත් රටවලින් ආක්‍රමණ ඇති වී නොයෙකුත් විධියේ කරදර විඳින්න සිදු වුනා. නමුත් විශාල රටක් වූ ඉන්දියාව අපට කිසි කරදරයක් කෙළේ නැහැ. බුදුන් උපන් රට වූ ඉන්දියාව අපේ රටට බෞද්ධාගම ගෙන ආ මිහිඳු මහ රහතන් වහන්සේගෙත්, සංඝමිත්තා මෙහෙණින් වහන්සේගෙත් උපන් රටයි. අපේ රටට විජයරජතුමා පැමුණුනෙත් ඒ රටිනුයි. ඉන්දියාව කවදත් අප සම්බන්ධයෙන් අනුකම්පා සහගතව ක්‍රියා කළ රටක්. මේ බලවත් ප්‍රශ්නය විසඳීම ඒ රටේ සහයෝගතාවය සහ සුහදතාවය ඇතිව කරන්න අපට පුළුවන් වුනොත් මේ ප්‍රශ්නය පමණක් නොව තවත් ආර්ථික ප්‍රශ්න නිරාකරණය කර ගන්න අපට පුළුවන් වෙනව.

මගේ කථාව අවසාන කරන්ට මත්තෙන් කියයුතු තවත් කාරණයක් තිබෙනව. අපේ රාජාසන කථාවේ කෘෂිකර්මාන්ත සහ කර්මාන්ත සංවර්ධනයට උච්ඡස්ථානයක් දී තිබෙනව. ඒ සමගම නව අධ්‍යාපන යෝජනා ඇති කර මේ රටේ තරුණ තරුණියන් පාසල් සම්යෙන් පසුව ප්‍රයෝජනවත් පුරවැසියන් බවට පත් කිරීමේ ක්‍රම ඇති කර තිබෙනව. මේ සියලු කරුණුත්, ඒ වගේම සෑම අමාත්‍යාංශයක් මගින්ම ඉදිරිපත් කර තිබෙන සංවර්ධන කටයුතුත් නියම විධියට ක්‍රියාත්මක කර මේ රටේ සුබසිද්ධිය ඇති කිරීම පිණිස මා කලින් කීවාක් මෙන් මේ ගරු සභාවේ උභය පාර්ශ්වයේම මන්ත්‍රීවරුන්ගේත්, මේ රටේ මහජනයාගේත්, විශේෂයෙන්ම රජයේ සේවකයන්ගේත් සහයෝගතාවය අත්‍යාවශ්‍යයි. එය ලැබේවායි ප්‍රාර්ථනය කරමින් මේ කථාව කිරීමට අවස්ථාව ලබාදුන් ගරු සභාවටත් තමුන්නාන්සේටත් මගේ ස්තුතිය පුද කරනව.

අ. භා. 2.23

**ලෙස්ලි ගුණවර්ධන මයා.** (පානදුර)
*(திரு. லெஸ்லி குணவர்தன—பாணந்துறை)*
(Mr. Leslie Goonewardene—Panadura)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට පෙර කථා කළ හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමාගේ (අබේගුණසේකර මයා.) කථාවට මා ඉතා ඕනෑකමින් ඇහුම්කන් දීගෙන සිටිය. එතුමාගේ එක්තරා ප්‍රකාශයක් ගැන මා පුදුම වුණා යයි කියන්ට සිදු වී තිබෙනව. මේ ආණ්ඩුව කර තිබෙන කටයුතු ගණනාවක් අතුරින් හාල් සලාකය කැපීම මේ ආණ්ඩුව විසින් කර තිබෙන ඉතාමත්ම අගනා කටයුත්ත හැටියට ඒ මන්ත්‍රීතුමා සලකන බව එතුමා කියන්ට යෙදුණා. ඒ මතය දරන්නේ ඒ මන්ත්‍රීතුමා පමණක් නොවන බව කියන්ට සිදු වී තිබෙනව. එතුමා පමණක් නොව කොළඹ හතේ පදිංචි ධනපති මහත්වරු හා නෝනා මහත්වරුත් ඒ වාගේම ලෝක බැංකුව පසු පස සිටින ඇමෙරිකන් අධිරාජ්‍යවාදීනුත් ඒ මතයම දරනවා යයි දැනගන්ට ඒ මන්ත්‍රීතුමා සන්තෝෂ වෙනවා ඇතැයි මා කල්පනා කරනව. කෙසේ වෙතත් මම ඒ මතය නොදරන බව කියන්ට සිදුවී තිබෙනව. හාල් සලාකය කැපීම වගේ එතුමා අගනා යයි සඳහන් කරන්ට යෙදුණු තව පියවර දෙක-තුනක් මේ ආණ්ඩුව ගත්තොත් මේ රටේ දුප්පත්කම නැති වෙනවා කියා මා පිළිගන්නව. හැබැයි, දුප්පතුන් එක්කම දුප්පත්කම නැති වෙනවා කියා මට අනාවැකියක් කියන්ට පුළුවනි. නියෝජ්‍ය සභාපතිතුමනි, මේ හාල් සලාක ප්‍රශ්නය ගැන කථා කරන්ට නොවෙයි, මා අදහස් කරන්නෙ.

මේ රාජාසන කථාවේ දෙවෙනි පිටුවේ අවසාන ඡේදය දෙස ප්‍රථම කොට මා තමුන්නාන්සේගේ නෙත් යොමු කිරීමට අදහස් කරනව. ඒ කොටසින් කියන්නෙ අපේ රටේ සමුපකාර ව්‍යාපාරය ගැනයි. ඒ මෙසේයි :

"රජයේ සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම හා අත්‍යාවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය බෙදා හැරීම සම්බන්ධයෙන් වැදගත් කාර්යයක් සමුපකාර ව්‍යාපාරය මත පැවරී ඇති බැවින් මාගේ ආණ්ඩුව එහි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වර්තමාන තත්ත්වය පිළිබඳව සොයා බලා එය ශක්තිමත් කිරීමට හා දියුණු කිරීමට උපයෝගිවන මාර්ග යෝජනා කිරීම සඳහා — "

මොනවද කරන්ට යන්නෙ ?

"—කොමිෂන් සභාවක් පත් කිරීමට අදහස් කරයි."

මම සතුටුයි ; බොහොම හොඳ දෙයක් මේ කොමිසන් සභා පත් කිරීම. හැබැයි, ඒ කොමිසන් සභාවේ සභාපති හැටියට අර වෙලිපෝන් කොමිසමට පත් කළ මහත්මයා වගේ මහත්මයෙකුවත්, එසේ නැත්නම් විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයන්ගේ පන්ති වර්ජනය කිරීම සම්බන්ධයෙන් පරීක්‍ෂා කිරීමට පත් කළ මහත්මයා වගේ මහත්මයෙකුවත්, සී. ඩබ්ලිව්. ඊ. කොමිසන් එකට පත් කළා වගේ—පුළුවන් තරම් අනුන්ට මඩ ගැසීම්ට කලින්ම අදහස් කර පත් කළ මහත්මයා වගේ—මහත්මයෙකුවත් පත් නොකර අපක්ෂපාත මහත්මයෙක් පත් කරනවා නම් ඒක බොහොම වැදගත්. කාරණා රාශියක් ඒ මාර්ගයෙන් අපට දැනගන්නට ලැබෙනවා ඇතැයි මා විශ්වාස කරණව. ඒ කොමිෂන් සභාව පත්කිරීමේ අරමුණු රාශියක් තිබෙනවා වෙන්නට පුළුවනි. නමුත් එක අරමුණක් නම් තිබෙන්නටම ඕනැ. ඒ අනෙකක් නොව, ඇමතිතුමාගෙ ක්‍රියාවන් පරීක්ෂා කිරීමයි. ඒ කොමිෂන් සභාව පත් කිරීමේ අරමුණුවලට ඒ අරමුණත් අඩංගු කරනවා නම්, ඒ කොමිෂන් සභාව පත් කිරීම ගැන විරුඬ පාර්ශ්වයේ අනුමැතිය සියයට සියයක්ම ලැබෙනවා ඇති. ඇයි අපි එහෙම කියන්නෙ ? කණගාටුවෙන් වුණත් මෙන්න මේ දේ කිව යුතුයි :

පසුගිය කාලය තුළ ඇමතිතුමා තමාගේ බලතල පාවිච්චි කර තිබෙන්නෙ සමුපකාර ව්‍යාපාරය දියුණු කිරීමට නොව, යම්කිසි ස්ථානයක සමුපකාර ව්‍යාපාරයේ පාලක තනතුරුවල විරුද්ධ පාර්ශ්වයෙ උදවිය කට යුතු කරනව නම්, ඒ සමුපකාර ආයතනය කොපමණ දක්ෂ විධියට කටයුතු කරගන ගියත් එය විසුරුවා හැර එය ආණ්ඩු පක්‍ෂයට හිතවත් උදවියට දෙන්නටයි. අනික් අතින්, ආණ්ඩු පක්ෂයෙ උදවිය තනතුරු දරන කොතෙකුත් දූෂණ යන් කරන සමිති තිබුණත්, ඒවා ගැන ක්‍රියා නොකර සිටීමේ ප්‍රතිපත්තියකුයි ඒ ඇමතිතුමා අනුගමනය කරන්නෙ. මාතර ගරු මන්ත්‍රීතුමා (බී. වයි. තුඩාවෙ මයා.) තම කථාවෙදි ඒ පිළිබඳ උදාහරණ කීපයක් ගෙන හැර පාමින් කරුණු දැක්වූවා. වැලිගම් කෝරළේ, මොරවක් කෝරළේ, ගම්දොරුව පත්තුවේ විවිධ සේවා සමුපකාර සමිති සංගම් කිසිම හේතුවක් නැතිව ඇමතිතුමාගෙ පාලනයට ගෙන තිබෙන බව අපි දන්නව. විශේෂයෙන් වැලිගම් කෝරළේ සමුපකාර සමිති සංගමය හොඳින් වැඩ කරන බවට ප්‍රදේශයේ සහකාර සමුපකාර සංවර්ධන කොමසාරිස්තුමාත් වාර්තා කර තිබෙද්දී, ඒ සමිතිය ඇමතිතුමාගෙ පාලනයට ගෙන තිබෙන බව අපට දැන ගන්නට ලැබී තිබෙනව. මහජන ආරක්ෂක ආඥපනත යටතේ 1966 දෙසැම්බරය දක්වා පනවා නොතිබුණු රෙගුලාසි වගයක් 1967 ජනවාරි මාසයේ සිට වෙනස් කර අළුතින් ඇතුල් කර, ඇමතිතුමාගෙ හිතු මතයට මේ සමිති සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට බලය ලබා ගෙන තිබෙනව. 1966 දෙසැම්බර් මාසය වන තුරු මහජන ආරක්ෂක ආඥපනත යටතේ නියෝග 56 යි පළ කර තිබුණේ. නමුත් 1967 ජනවාරි මාසෙ සිට 57, 58, 59 යන නියෝග තුනත් පනවා තිබෙනව. 57 වැනි නියෝගය තිබෙන්නෙ රත්නපුර නගර සභාව සම්බන්ධයෙන් නිසා අපි එය පැත්තකින් තබමු. 58 වැනි නියෝගයේ මෙසේ සඳහන් වෙනව :

"58. සමුපකාර සමිති ආඥපනතෙහි 43 වන වගන්තිය පහත දැක්වෙන වෙනස් කිරීම්වලට යටත්ව, එනම් :—

(1) ඒ වගන්තියෙහි (1) වන උප වගන්තිය සඳහා '(1) ලියාපදිංචි කළ යම් සමිතියක කාරක සභාව විසින් එහි යුතුකම් නිසි ආකාරයෙන් ඉටු නොකරන බව ඇමතිවරයාගේ මතය වුව හොත්, ඔහු විසින් ලියවිල්ලකින් වූ ආඥාවකින්—

(අ) කාරක සභාව විසුරුවා හැරිය හැකිය ; තවද

(ආ) මෙහි මින් මතු විධිවිධාන සලසනු ලබන පරිදි පත් කරනු ලබන තැනැත්තකු හෝ තැනැත්තන් විසින් සමිතියේ කටයුතු පාලනය කිරීම හා පරිපාලනය කිරීම කළ යුතුයයි විධාන කළ හැකිය.' "

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

ඒ අනුව, කාරක සභාව යුතුකම් ඉටු නොකරනවාය කියා ඇමතිතුමා කල්පනා කිරීම පමණක් ප්‍රමාණවත්, එය විසුරුවා හරින්නට. එසේ විසුරුවා හැර තමන් සතුටු කෙනකු එය පාලනය කිරීම සඳහා පත් කරන්නට මෙයින් ඉඩකඩ සලසා තිබෙනව. සමිති කීපයක් සම්බන්ධයෙන් මේ අනුව ක්‍රියා කර තිබෙන බව මට ආරංචියි. එයින් එක සංගමයක් ගැන මම දන්නව. මා දන්න ඒ සමිතිය ගැන පමණක් මේ ගරු සභාව මාර්ගයෙන් රටේ මහජනතාවට ඒ කාරණය දන්වන්නටයි මා බලාපොරොත්තු වන්නෙ.

පානදුරේ විවිධ සේවා සමුපකාර සමිති සංගමයක් තිබෙනව. ඇමතිතුමා ජූනි මාසයේ 28 වැනිදා තමන් විසින් පිට කරන ලද නියෝගයක් මගින් මේ සමිති සංගමයේ කාරක සභාව ස්වකීය යුතුකම් හරියාකාර ඉෂ්ට නොකරතැයි අදහස් කරන බැවින් එය විසුරුවා හැර තමන්ට විශේෂයෙන් වුවමනා කරන කාරක සභාවක් ඒ කාරක සභාව වෙනුවට පත් කර තිබෙනව. මෙය පුදුම කාරණයක්. විශේෂයෙන්ම පානදුරා විවිධ සේවා සමුපකාර සමිති සංගමයේ වැඩ කටයුතු ගැන හොඳාකාර දන්න පානදුර ප්‍රදේශයේ ජනතාවට මෙය ලොකු ප්‍රහේලිකාවක් වී තිබෙනව. මෙහිදී එක් කාරණයක් තමුන්නාන්සෙට කියන්න කැමතියි. මේ සමුපකාර සමිති සංගමයේ වැඩ කටයුතු නරක නම් ඒ කාරක සභාව විසුරුවා හැරියාට මගේ කිසිම විරුද්ධත්වයක් ඇති වන්නෙ නැහැ. වැඩ නරක කාරක සභාවක් විසුරුවා හැරීමට මා කිසිසේත් විරුද්ධ වන්නෙ නැහැ. මා විරුඩ නොවන්නෙ වරදක් තිබෙන කාරක සභාවක් විසුරුවා හැරීම ගැනයි. කාගෙන් හෝ වැරද්දක් සිදු වුණු බවට සැකයක් ඇති වුණොත්—ඇමතිවරයෙකු හෝ වේවා, වෙන කවරෙකු හෝ වේවා—ඒ සම්බන්ධයෙන් වග උත්තරයක් දෙන්නැයි කියන්න තිබුණා. ඒ විධියෙ කිසිවක් කර නැහැ, මේ සමුපකාර සමිති සංගමය සම්බන්ධයෙන්. මේ සංගමය කිසිම වරදක් කර නැහැ. එසේ තිබියදීයි කාරක සභාව විසුරුවා හැර තිබෙන්නෙ.

**එච්. ජී. ඒ. කාරියවසම් මයා.** (බෙන්තර-ඇල්පිටිය)

*(திரு. எச். ஜீ. ஏ. காரியவசம்—பெந்தர-எல்பிற்றிய)*

(Mr. H. G. A. Kariyawasam—Bentara-Elpitiya)

වරදක් තිබුණා නම් විසුරුවා හරින් නෙත් නැහැ.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**

*(திரு. லெஸ்லி குணவர்தன)*

(Mr. Leslie Goonewardene)

මේ සංගමය ගැන කියන්න කිසිම වැරද්දක් නැහැ. ඇත්ත වශයෙන්ම මාත් මේ සමුපකාර සමිති සංගමය ගැන ටිකක් සොයා බැලුවා. පසුගිය අවුරුදු ගණනක් තුළම බොහොම හොඳට වැඩ කර ගෙන එන සමිති සංගමයක් පමණක් නොව අවුරුද්දක් පාසාම ලාභයත් වැඩි වන ආකාරයට වැඩ කටයුතු කරගෙන ඇවිල්ලා තිබෙන්නක්. පසුගිය අවුරුදු තුන සම්බන්ධයෙන් මා විශේෂයෙන් තොරතුරු දැනගෙන තිබෙනව. 1963-64 අවුරුද්දෙ රුපියල් 30,188.58 ක ලාභයක් තිබුණු අතර 1964-65 අවුරුද්දෙ ලැබුණු ලාභය රුපියල් 1,38,276.57ක් බව මට දැන ගන්න ලැබුණා. 1965-66 අවුරුද්දෙ රුපියල් 1,51,260.33 ක ලාභයක් තිබෙනව. මේ වර්ෂය තුළත් වැඩ කරගෙන ගියා නම් සමහර විට ඒ අනුව බලන විට මීටත් වඩා විශාල ලාභයක් ඇති වන ආකාරයට වැඩ කරගෙන යන්ට පුළුවන්කම තිබුණාය කියන්න පුළුවනි.

**ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල** (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති)

*(கௌரவ ஐ. எம். ஆர். ஏ. ஈரியகொல்ல—கல்வி, கலாசார விவகார அமைச்சர்)*

(The Hon. I. M. R. A. Iriyagolle—Minister of Education and Cultural Affairs)

අපේ කාලයෙදී ඒ ගණන තවත් වැඩි වෙනව.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**

*(திரு. லெஸ்லி குணவர்தன)*

(Mr. Leslie Goonewardene)

ගරු අධ්‍යාපන ඇමතිතුමා කියනව එතුමගෙ කාලයෙදී මෙය වැඩි වුණාය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කියල. එහෙම නම් ඒ ගැන එතුමට සතුටු වෙන්න පුළුවනි. එතුමා ඒ ගැන සතුටු නම්—ගරු ඇමතිතුමා ඒ ගැන සතුටු වුණා නම්—තව දුරටත් වැඩ කරගෙන යාමට ඒ කාරක සභාවට ඉඩ දෙන්නයි තිබුණේ. ප්‍රශ්නයක්වත් අහන්නෙ නැතිව සංගමයේ කාරක සභාව විසුරුවා හැර තිබෙනව. ගණන් පරීක්ෂණයෙදි—ඔඩිට් එකේදි—මේ කාරක සභාවෙ තව දුරටත් කෙරෙන හොඳ වැඩ ගැන ප්‍රසංශා කර තිබෙනව. මක්නිසාද ඊට පෙර කිසිම ලාභයක් නැතිව වැඩ කරගෙන ගියේ වී නමුත් මේ කාරක සභාව පත් කර ගැනී මෙන් පසු මනාව ප්‍රතිසංවිධානය වී ලාභයක් ලැබෙන විධියට වැඩ කටයුතු කරගෙන ගොස් තිබෙන නිසයි.

පසුගිය වෂී තුන ඇතුළත මේ සමිති සංගමයෙන් සෑහෙන වැඩ කොටසක් කෙරී තිබෙනව. සිරිල් ජැන්ස් විද්‍යාලයට රුපියල් අනූ දහක ඉඩමක් අරන් තිබෙනව. විශාල පාරක් සෑදීම සඳහා රුපියල් හැට දහක් වැය කර තිබෙනව. සේවකයන්ටත් රුපියල් 17.50 විශේෂ දීමනාව—අතිරේක ජීවනාධාර දීමනාව—ගෙවා තිබෙනව. ඒ අතර රුපියල් 75,000 ක් වියදම් කර මහජනයාගෙ පහසුකම් සඳහා අවශ්‍ය දේ සලසා දී තිබෙනව. මේ කොමිටිය දෙවරක්ම ඡන්ද යෙන් තේරී පත් වූවක් බවත් මතක තබා ගත යුතුව තිබෙනව. සමිතිවල මහා සභා රැස්වීමක් පවත්වා දෙවරක්ම පත් වුණා. අන්තිමේදී පත් වුණේ 1965 දීයි. 1967 වෂීයේ මාර්තු මාසයේ 10 වැනිදා නැවතත් මෙම සමිතිවල නියෝජිතයන් රැස්වී මහා සභා රැස්වීමක් පවත්වා අලුත් කොමිටියක් තෝරා පත් කර ගැනීමටයි තිබුණේ. මාර්තු මාසයේ 10 වැනිදටයි එය කරන්නට තිබුණේ. ඒ අතර මාර්තු 8 වැනිදා කොමසාරිස්වරයගෙ නියෝගයක් අනුව ඒ සභා රැස්වීම කල් දමා ජූනි මාසයෙ අග හරිය වන විට විසුරුවා හැරියා. ඇත්ත වශයෙන්ම මේකට හේතුව කුමක්ද කියා කණගාටුවෙන් නමුත් මට කියන්නට සිද්ධ වී තිබෙනවා. මේකට හේතුව පානදුරේ ජනතාව නම් හොඳට දන්නව. මේ සමුපකාර සංගමයෙ කලින් බොහොම අක්‍රමිකතාවයක් තිබුණා. ඒ කාලෙ මේ සංගමයෙ සභාපති හැටියට හිටියෙ—ඇත්ත වශයෙන්ම මා කණගාටු වෙනව මෙය කියන්ට සිදුවීම ගැන—1960 අවුරුද්දෙ දෙවරක් මා සමග පානදුර කොට්ඨාශයට තරග කර පරාජය වූ එක්සත් ජාතික පක්ෂයෙ අපේක්ෂකයයි. ඔහු තමයි සභාපති හැටියට හිටියෙ. උප සභාපති හැටියට හිටියෙ පානදුර ප්‍රදේශයෙ එක්සත් ජාතික පක්ෂයෙ බල කණුවක් වන හිටපු මුලාදෑනි මහත්මයෙක් ; කොන්ත්‍රාත්කාරයෙක්. මොවුන් මේ සංගමය පාලනය කරන කාලයේදී හදිසි යෙන් කඩා පැනීමක් කර විභාගයක් පැවැත්වූවා. ඒ විභාගයේදී අක්‍රමිකතා වයන් රැසක් අහුවුණා. ඊට පසු කොමසාරිස්තුමාට එතුමාගේ බලතල පාවිච්චි කරන්ට සිද්ධ වුණා. හැබැයි, ඒ විභාගයෙන් පසු කාරක සභාවෙන් සභිකයින් හතර දෙනෙකු අස් කර දැමුවා. විභාගය අවසාන කර තීන්දුවක් කරන්ට ප්‍රථමයෙන් සභාපතිත් උප සභාපතිත් තම පදවිවලින් ඉල්ලා අස් වුණා. මාර්තු මාසයෙ මේ රැස්වීම පැවැත්වූවා නම් මේ අයට බලය ලැබෙන්නෙ නැහැ. සමුපකාර ව්‍යාපාරය දියුණු කරනවාය කියන මේ ඇමතිතුමා මේ පුද්ගලයින්ගෙ කීමට තමයි ගිතුවක්කාර අන්දමට, අයුතු අන්දමට, මහජනතාවටත් සමුපකාර ව්‍යාපාරයටත් පහර වදින අන්දමට ක්‍රියා කරමින් හොඳට වැඩ කරගෙන ගිය ඒ සමුපකාර සංගමයෙ කාරක සභාව විසුරුවා හැර නිලධාරි කට්ටියක් පත් කර තිබෙන්නෙ. මේකෙ තේරුම කුමක්ද කියා මා ප්‍රශ්න කරනව. සමුපකාර ව්‍යාපාරය ගැන කථා කර කර මේ විධියට ක්‍රියා කිරීමේ තේරුම කුමක්ද කියා මා ප්‍රශ්න කරනව. මේ විධියට ක්‍රියා කිරීමෙන් සමුපකාර ව්‍යාපාරය දියුණු වෙනව නොවෙයි අවසාන වෙනව. ඇත්ත වශයෙන්ම සමුපකාර ව්‍යාපාරය අවසාන කරන්ට තමයි මේ අන්දමට ක්‍රියා කරන්නෙ. හොඳට වැඩ කරන සමුපකාර සංගම් ගැන ඒ අන්දමටයි ක්‍රියා කරන්නෙ.

ඊළඟට යම්කිසි සමුපකාර සමිතියක දූෂණ කටයුතු කෙරෙනවා නම්, ඒ දූෂණ ගැන ප්‍රදේශයෙ විරුද්ධ පක්ෂයෙ මන්ත්‍රී වරයකු පෙත්සම් ඉදිරිපත් කරනවා නම්, විභාග ඉල්ලනවා නම්, එවැනි සමුපකාර සංගමයක් ගැන මේ ආණ්ඩුව කොයි විධි යට ක්‍රියා කරනවාද කියා බලමු. මා එක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

නිදර්ශනයක් පමණක් ඉදිරිපත් කරනව. පානදුරේ වලාන විවිධ සේවා සමුපකාර සංගමය තිබෙනව. ඒ සංගමය සම්බන්ධව මාර්තු 21 වන දින මා ලියුමක් ඉදිරිපත් කළා. ඇත්ත වශයෙන්ම ඒක ඒ සමුපකාර සංගමයෙ කාරක සභික පදවි දරණ කීප දෙනෙකු විසින් ඉදිරිපත් කරන ලද පෙත්සමක්. ඒ සංගමයෙ කළමනාකරුට විරුද්ධව බොහොම බරපතළ චෝදනා තිබෙනවාය, එක වරක් නොව දෙවරක් සමුපකාර පරීක්ෂක මහත්මය විභාග කර ඒ කළමනාකාර මහත්මය වැරදි කර තිබෙනවාය කියා තීන්දු කර තිබෙනවාය, ඒ කළමනාකාර මහත්මය අස් කරන ලෙස පරීක්ෂක මහත්මය ඉල්ලා තිබෙනවාය, නමුත් ඒ කාරක සභාව සමුපකාර පරීක්ෂක මහතාගේ ඉල්ලීම පරිදි ඒ කළමනාකරු අස් නොකර තවදුරටත් තබාගෙන සිටිනවාය, ඊට විරෝධය පළ කිරීමක් වශයෙන් ඒ කාරක සභාවෙ සභාපති ඉල්ලා අස් වුණාය, ඒවාගේම මහා සභා රැස්වීමක් කැඳවන මෙන් ඉල්ලීමක් කර තිබෙන මුත් දැනට අවුරුදු තුනකට වැඩි කාලයක් තුළ මහා සභා රැස්වීමක් පවත්වා නැත, මහා සභා රැස්වීමක් පවත්වන්න බලාපොරොත්තුවකුත් නැත, එම නිසා මේ කරුණු සම්බන්ධව් වහාම පරීක්ෂණයක් කරන්නටය කියා ඉල්ලීමක් කරන පෙත්සමක් ප්‍රදේශයේ මන්ත්‍රීවරයා හැටියට මම ඉදිරිපත් කළා. ඒ පෙත්සම ලැබුණාය කියා පිළිතුරක් ලැබුණා. ඊටපසු ඒ පෙත්සම ගැන ඉක්මණින් ක්‍රියා කරන්නටය කියා මා තවත් ලිපියක් යැව්වා. නමුත් මේ දක්වා ඒ පෙත්සම ගැන කිසිම වග විභාගයක් කර නැහැ. නමුත් කිසිම වරදක් නොකළ, හොඳ ලාභයකුත් ලබා ගනිමින් ප්‍රදේශයට විශාල සේවයක් කර ගෙන ගිය සමුපකාර සංගමය මේ ඇමතිතුමාගේ විශේෂ බලතල පාවිච්චි කර අහෝසි කර ඇමුව. එමනිසා තමයි මේ රාජාසන කථාවෙ සමුපකාර ව්‍යාපාරය ගැන කොමිසමක් පත් කිරීමට බලාපොරොත්තු වෙනවාය කියා සඳහන් කර තිබීම ගැන මා සතුටු වෙන්නෙ. මේ ආණ්ඩුව් සමුපකාර ව්‍යාපාරය ඉදිරියට ගෙන යාමට බලාපොරොත්තු වෙනව නම් හොඳ අපක්ෂපාත කෙනෙක් ඊට පත් කරන්ටය කියා මා ඉල්ලා සිටිනව. ඒ කොමිසමේ විභාග පවත්වන අවස්ථාවෙදි ඇමතිවරයාගේ ක්‍රියා මාර්ග පිළිබඳවත් පරීක්ෂා කරන ලෙස මා ඉල්ලනව.

ඊයෙ මා මෙම ගරු සභාවෙ සිටියෙ නැති අවස්ථාවක දෙහිවල-ගල්කිස්සෙ ගරු මන්ත්‍රීතුමා (එස්. ද එස්. ජයසිංහ මයා.) කථා කරමින් විරුද්ධ පාර්ශ්වයෙ වලපනේ ගරු මන්ත්‍රීතුමාගෙ (ටී. බී. එම්. හේරත් මයා.) එක්තරා චෝදනාවකට පිළිතුරු දීමට ගොස් තව හරස් චෝදනාවක් කර තිබෙන බව පේනව. වලපනේ ගරු මන්ත්‍රීතුමා කියා තිබෙනව, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීන් දෙපොලකට අළුත් කාර් ලැබී තිබෙන බවත්, ඒ කාර් ලැබුණේ කොහොමද කියා දැනගන්ට කැමති බවත්. එම ප්‍රශ්නයට පිළිතුරු දීමට ගොස් කෝපයට පත් වීම නිසා වෙන්ට ඕනැ, යටියන්තොට ගරු මන්ත්‍රීතුමාට (ආචාර්ය එන්. එම්. පෙරේරා) විරුද්ධව එතුම හරස් චෝදනාවක් එල්ල කළේ. "කාර් ගැන අහන්ට වුවමනා නැත ; යටියන්තොට ගරු මන්ත්‍රීතුමා පිටරටින් අච්චු කන්තෝරුවක්—මුද්‍රණාලයක්—මෙරටට ගෙන්වා ගැනීමට විදේශ විනිමය ලබා ගත්තෙ කොහොමද ?" යන අන්දමට ලොකු ප්‍රශ්නයක් එතුමා ඉදිරිපත් කර තිබෙනවා. ඒ පිළිබඳව මා උත්තර දෙන්ට කැමතියි. යටියන්තොට ගරු මන්ත්‍රීතුමාට මුද්‍රණාලයක් ලැබී නැහැ. නමුත් එතුම සභාපති ධුරය දරන ලංකා කම්කරු සම්මේලනයට නම් ඊයෙ පෙරේද අච්චු කන්තෝරුවක් පිටරටින් ලබා ගත්ත. එය ලැබුණේ, පිටරට වෘත්තීය සමිති ආයතනයකින් ලංකා කම්කරු සම්මේලනයට කරනු ලබන ත්‍යාගයක් වශයෙනුයි. මීට පෙරත් නෝර්වේ රටේ සමාජවාදී පක්ෂයෙන් එහෙම ත්‍යාගයක් ලැබී තිබෙනව්. හැබැයි ඊට කිසි විදේශ විනිමයක් ගියෙ නැහැ. ඒ සඳහා මේ රටින් ශතයක්වත් වියදම් වුණේ නැහැ. මේ කරුණු රාජ්‍ය අමැතිතුමා ඉදිරිපිට තබා, මෙය වැරදි වැඩක් නොවන බවට එතුම පිළිගත්තට පස්සෙ, ඒ සඳහා වුවමනා කරන ආනයන අවසර පත්‍රය ලබාගෙන තමයි එම යන්ත්‍රාලය ගොඩ බාල තියෙන්නෙ.

හරි හෝ වැරදි හෝ වේවා විරුද්ධ පාර්ශ්වයෙන් ආණ්ඩු පක්ෂයට විරුද්ධව යම් කිසි චෝදනාවක් එල්ල කළ විට එම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

චෝදනාවට පිළිතුරු දෙනවා වෙනුවට, "ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙ ආණ්ඩුව පැවති කාලෙත් බොහොම ඒවා වෙලා තියෙනවා ; ඊටත් වඩා නරක විධියටත් කටයුතු සිදු වෙලා තියෙනවා" යන අන්දමට හරස් චෝදනා ඉදිරිපත් කිරීම ඒ උදවියගෙ සිරිතක් වී තිබෙනව. ඒ ගැන මා කනගාටු වෙනව. එහෙම කළත් කමක් නැහැ. නමුත් බොහෝ විට එම හරස් චෝදනා අසත්‍ය ඒවායි.

මට මේ අවස්ථාවෙදි එක්තරා කාරණයක් මතක් කරන්ට සිදු වී තිබෙනව. එය කියන්ට අවස්ථාව ලැබීම ගැන මා සන්තෝෂ වෙනව. එම සිද්ධිය මෙම ගරු සභාවෙදි වුණු එකක් නොවෙයි. පසුගිය සභාග ආණ්ඩුව පැවති කාලෙදි යටියන්තොට ගරු මන්ත්‍රීතුමයි, මුදල් ඇමතිවරයා වශයෙන් කටයුතු කළේ. එතුම ඒ කාලෙ ගෙවල් සම්බන්ධ එක්තරා බදු අය කිරීමේ යෝජනාවක් ගෙනාව. යමෙකුට තමන් පදිංචි ගෙයත් තවත් ලක්ෂයක වටිනාකම් ඇති ගෙවලුත් හැර තවත් ගෙවල් තිබෙනව නම් ඒවායින් බොහොම තද බද්දක් අය කරන්ට යනවාය කියා ඒ මුදල් ඇමතිතුමා විසින් ඉදිරිපත් කළ අය වැය කථාවෙ සඳහන් කර තිබෙනව. මෙම කාරණය ධනපති පත්‍ර මගින් වැරදි විදියට තේරුම් කර දුන්න. මා එසේ කියන්නෙ ඇයි ? එතුම ඒකෙන් අදහස් කළේ, හැම ළමයකුටම ගෙයක් දුන්නට පස්සෙ ඊටත් එහා ගෙවල් තිබෙනව නම් මේ විධියෙ බද්දක් අය කරන්ටයි. පත්‍රවල එම කාරණය සඳහන් කළේ වැරදි ආකාරයටයි. එපමණක් නොවෙයි ; බොහොම ලොකු බොරු ආරංචි ඒ කාලෙ මේ රට පුරා පතුරුවා ගෙන ගියා. ඒ කාලෙ මා ලංකාවෙ සිටියෙ නැහැ. මම ඒ කාලෙ කියුබාවෙයි සිටියෙ. කියුබාවේ උත්සවයකට සහභාගි වීම සඳහා මා ඒ රටට ගොස් සිටියා. මා ලංකාවට ආපසු පැමිණියෙ එම අයවැය ලේඛනය සම්මත වූවාට පසුවයි. මම ලංකාවට පැමිණි අවස්ථාවේ සෙනෙට් සභාවෙ තේ පැන් ශාලාවෙදි මට එක්තරා ආරංචියක් ලැබුණා. එවකට සිටි සෙනෙට් මන්ත්‍රීවරයකුගෙ නෝන මහත්මයෙක් සමග තේ බොමින් සිටියදි එතුමිය මට කීවෙ මොකක්ද ? එන්. එම්. පෙරේරා මෙහෙම පනතක් ගෙනැවිත් තිබෙන නිසා කොල්වින් ආර්. ද සිල්වාගේ ගෙවල් ටික බේරා ගන්න ඒව කොම්පැනි කරන්න අදහස් කරනවාය කියන කථාවයි මට කිව්වෙ. මම කිව්ව මට ඒක විශ්වාස කරන්න බැහැ කියා. පස්සෙ මම කොල්වින් ආර්. ද සිල්වා මහතාගෙන් ඇසුව. එය සම්පූර්ණයෙන්ම අමූලික බොරුවක්ය කියා ඒ මහතා මට කිව්ව. මා සමග උදේට ගෝල්ෆේස් පිටියේ ඇවිදින මහත්මයෙක් මේ ඊයෙ පෙරේදා ටිකක් අදිමදි කර මගෙන් ප්‍රශ්නයක් ඇසුව. ඒ මහත්මය කිව්වා, මම තමුසෙගෙන් ප්‍රශ්නයක් අහන්න කැමතියි, තමුසේ ඒ ගැන තරහ වෙනවාද කියා. මම කිව්ව නැහැ නැහැ, ඕනෑ එකක් අහන්නය කියා. ඒ පාර කිව්වා, මෙය පෞද්ගලික ප්‍රශ්නයක්ය කියා. මම කිව්වා කමක් නැහැ අහන්නය කියා. ඊ ළඟට ඒ මහතා මගෙන් ඇසුවා, 1964 අය වැය ලේඛනය ඉදිරිපත් කරන විට ගෙවල් බද්ද අය කිරීමේ යෝජනාවක් තිබුණය, දැන් තමුසෙ පදිංචි ගෙයත් තවත් ගෙවල් තුනකුත් වශයෙන් තමුසෙට ගෙවල් 4ක් තිබෙන බව මම දන්නවය, එතකොට ඒ අය වැය ලේඛනයෙන් පැනවුණ බද්දෙන් ඒවා නිදහස් කර ගැනීමට තමුසෙ ඒවා කොම්පැනි කරන්න බලාපොරොත්තු වෙනවද කියා. මම කිව්ව මම එහෙම එකක් හිතුවෙත් නැහැ ; දන්නෙත් නැහැ ; එහෙම දෙයක් කරන්නෙත් නැහැ කියා. ඔන්න ඔය විධියේ බොරු ආරංචි පතුරුවා හරින බවයි මම කියන්නෙ. මේවා කරන්නෙ මේ මැති ඇමතිවරුන්ය කියා මම කියන්නෙ නැහැ. නමුත් ඒ මහත්වරුන්ට ආධාර දෙන්න ඉන්න මහත්වරුන් මේ විධියෙ වැඩවලට ඉතාමත් දක්ෂ බවයි මෙයින් පෙනී යන්නෙ. හැබැයි මෙහෙම දෙයක් කියන විට එළිපිට කියා, කථා කර, සිත් පිරිසිදු කරගන්නට ඉඩ ප්‍රස්ථාව ලැබෙනවා නම් වඩාත් හොඳ බව මම කියන්න කැමතියි.

යම් කිසි චෝදනාවක් ඉදිරිපත් කරන විට ඒ පැත්තෙ තිබෙන රොඩු ගොඩක් මේ පැත්තට දමා ගැසීම සඳහා නිකරුණේ චෝදනා ඉදිරිපත් කිරීමෙන් වැඩක් වෙනවාය කියා මම හිතන්නෙ නැහැ. ඒ නිසා එසේ හිස් චෝදනා ඉදිරිපත් කරන්නෙ නැතිව, තමන්ගෙ පැත්තෙන් යම් කිසි චෝදනාවක් ඉදිරිපත් කරනවා නම් ඒකට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]
පිළිතුරුත් දෙන්න අවස්ථාව සැලසෙන පරිදි ඉදිරිපත් කරනවා නම් එය වඩා යෝග්‍යය කියා මම අදහස් කරනව.

පසු ගිය මහා මැතිවරණයේදී මාක්ස් වාදී පක්ෂ වන අපට විරුද්ධව ඉදිරිපත් කළ තවත් චෝදනාවක් නම් අපි ප්‍රජාතන්ත්‍රවාදයට විරුද්ධයි කියන එකයි. එය ඊයෙ පෙරේදත් මීගමුව අතුරු මැතිවරණයේදී කියවුණා. අගමැතිතුමා එහාට ගිහින් මාක්ස්වාදීන්ගෙන් සමාජවාදය බේරාගත්තාය කියා නැවත නැවතත් කියා තිබෙන බව අපට පුවත් පත් මාර්ගයෙන් දකින්න ලැබුණා. සමහර විට එහෙමත් වෙන්න ඇති. ප්‍රජාතන්ත්‍රවාදයට විරුද්ධයි කියා අපට පහර ගහනව. මාක්ස්වාදීන් මෙහෙමයි, රුසියාවෙ අරෙහෙමයි, චීනය ගැන තවත් එකක්, ඇල්බේනියාව ගැන තවත් එකක් ආදී වශයෙන් නොයෙක් විධියට කියනවා. ඒව ගැන සභාපතිතුමනි, මට නම් වගකියන්න බැහැ. නමුත් සාමාන්‍යයෙන් ලංකාව ගැන කල්පනා කර බලනවා නම්, ප්‍රජාතන්ත්‍රවාදය කියන එක ලංකාවෙ ක්‍රියාත්මක කර තිබෙන්නෙ කොහොමද කියා බලනවා නම්, වඩා හොඳ බවයි මම කල්පනා කරන්නෙ. අපේ අගමැතිතුමා අවංකව තමන්ගේ හෘදය සාක්ෂියට අනුව තමාගේ ආණ්ඩුව ප්‍රජාතන්ත්‍රවාදීවද ගෙන යන්නෙ කියා සොයා බලනවා නම් වඩා හොඳයි.

විශේෂයෙන් "ජනදින" පත්‍රය සහ ජනදින පත්‍රය මුද්‍රණය කරන ස්ටාර් මුද්‍රණාලයත් වසා තැබීම පිළිබඳව මම මීට පෙර මේ ගරු සභාවෙදි විස්තරයක් කළා. නමුත් ඒ විස්තරයෙන් එක වචනයක් වත් ධනපති දිනපතා පත්‍රවල පළ වුණේ නැහැ. එක පත්‍රයක පමණක් මම හිතන්නෙ "ඩේලි නිවුස්" පත්‍රයෙ මිනිත්තු 20ක් තිස්සෙ මම ඉදිරිපත් කළ ඒ කාරණය ගැන රාජ්‍ය ඇමතිතුමා දුන් පිළිතුර පමණක් පළ වුණා. ඒ නිසා අප ප්‍රජාතන්ත්‍රවාදයට විරුද්ධයි කියන මේ ආණ්ඩුව ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරනවාද කියා මහජනතාවට පෙන්නුම් කිරීම පිණිස මම නැවත වරක් ඒ කාරණය මේ සභාවේදී ඉදිරිපත් කරනව. මම හිතනවා සභාපතිතුමනි, ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව මම කියන මේ කාරණා එකම දිනපතා ප්‍රවෘත්ති පත්‍රයකවත් පළ කිරීමට තරම් ඒ පත්‍රවලට ධෛර්යයක් හා නිර්භීතකමක් නැත කියා. පෙබරවාරි මාසයෙ 8 වනදා 'ජනදින' පත්‍රයෙ—මෙය ස්ටාර් මුද්‍රණාලයෙන් මුද්‍රණය කරන පත්‍රයක්—කථාවක් පළ කර තිබුණා, අපේ අගමැතිතුමා කුරුදුවත්තෙ බංගලාවක එක්තරා භෝජන සංග්‍රහයකට ගිහින් වයින් වර්ගයක් බී—පෝය දවසක—නටලා, ඌරකු කපා ගෙන කෑවාය කියා. මම ඒ කථාව කියවල හිනහ වුණා. මම හිතුව මේක හොඳ විහිළුවක් කියා. මම ඒ කථාව එදා කොහෙත්ම විශ්වාස කළේ නැහැ; කියවල හිනහ වෙලා පත්‍රය පැත්තකට දැම්ම. නමුත් දවස් දෙකක් යන විට මෙම පත්‍රය මුද්‍රණය කිරීම තහනම් කර, මුද්‍රණාලයත් වසා දමා තිබෙනව. එවිට මට කල්පනා වුණා, එහෙම නම් මෙම කථාවෙහි යම්කිසි ඇත්තක් තිබෙන්න ඕනැ නොවෙද පත්‍රය තහනම් කරන්න කියා. කෙසේ වෙතත් මේ ප්‍රශ්නය මම පාර්ලිමේන්තුවෙදි ඉදිරිපත් කළා. පළමු වරට මම ඉදිරිපත් කළේ පෙබරවාරි මාසයෙ 22 වනදායි. මම ඇසුවා අගමැතිතුමාගෙන් මෙවැනි පියවරක් ගත්තෙ මොකද කියා. අගමැතිතුමා පිළිතුරු දෙකක් දුන්න. පළමුවෙන්ම කීව, පත්‍රය තහනම් කරන්න හේතුව කියන්න තවම කාලය පැමිණ නැත කියා. දෙවනුව කීවා උපදේශක මණ්ඩලයක් පත් කර තිබෙනවාය, ගිහින් තමන්ගෙ පැමිණිල්ල කරන්න පුළුවනිය කියා. මම බලාගෙන සිටිය; බලාගෙන සිට නැවත වරක් මාර්තු 7 වනදා පාර්ලිමේන්තුවෙදි මේ ගැන ප්‍රශ්න කළා. මම ඇසුවා, දැන්වත් ඊට පිළිතුරු දෙන්න කාලය පැමිණ තිබෙනවද, පත්‍රය මුද්‍රණය කරන්න ඉඩ නොදෙන්නෙ මන්ද කියා. නැවත වරක් අගමැතිතුමා කියන්න යෙදුණා, යමක් දැනගන්න ඕනැ නම් කරුණාකර උපදේශක මණ්ඩලයෙන් ඒ ගැන විමසන්නය කියා. එම නිසා ලංකා සමසමාජ පක්ෂයෙ ලේකම් හැටියට මම අපේ "ස්ටාර්" මුද්‍රණාලයෙ කළමනාකාරතැනට කිව්වා, උපදේශක මණ්ඩලයට මේ ගැන ලියන්නටය කියා. ඒ මහතා උපදේශක මණ්ඩලයට ලියා දැන්නුව, අසුවල් පත්‍රය මුද්‍රණය කරපු එක නම් ඇත්ත, නමුත් අච්චු කන්තෝරුව තහනම් කර තිබෙන්නෙ මොන කාරණයක් නිසාද කියා දන්නෙ නැත,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කියා. එවිට උපදේශක මණ්ඩලයෙන් පැමිණෙන්නටය කියා ආරාධනයක් ලැබුණා. ඒ අවස්ථාවේදී මමත් ගියා. එසේ ගියවිට අපට දකින්න ලැබුණ, උපදේශක මණ්ඩලයෙ සාමාජික මහත්වරුන් තුන් දෙනාත්, බලය ලත් නිලධාරියා වන ආනන්ද තිස්ස ද අල්විස් මහත්මයාත් එතැන සිටින බව. මම සන්තෝෂ වුණා බලයලත් නිලධාරි ආනන්ද තිස්ස ද අල්විස් මහතාත් පැමිණ සිටීම ගැන. මම හිතුව මුද්‍රණාලය වැසීම ගැන දන්වත් කාරණය දැනගන්න පුළුවන්කම ලැබේවිය කියා. කෙසේ වුණත් ඔය කාරණා දෙක ඉදිරිපත් කළාම, බලය ලත් නිලධාරිතුමා කියන්න යෙදුණ, ප්‍රශ්නයට පිළිතුරක් දෙන්න පෙර නීතිඥයකුගෙන් අහන්න ඕනෑ බව. ඊට හේතුව විමසූවාම කීවෙ "ජනදින" පත්‍රයට විරුද්ධව නඩු දෙකක් පවරා තිබෙන නිසා ඊට පිළිතුරක් දෙන්නට පෙර නීතිඥයාගෙන් විමසිය යුතු බවයි. එසේ කියමින් ඊට පිළිතුරු දීම කල් දැම්මා. ඊළඟට මැයි මාසයෙ 22 වනදාත් මම ගියා. එදිනත්, මැයි මස 30 වනදා නැවත වරක් රැස්වනවාය කියා කල් දැම්මා. මැයි මාසයෙ 30 වනදා නැවත වරක් රැස් වුණා. ඒ අවස්ථාවේදීත් උපදේශක මණ්ඩලයෙ සිටි මහත්වරුන් තුන් දෙනෙක් සිටිය, බලය ලත් නිලධාරියා වන ආනන්ද තිස්ස ද අල්විස් මහත්මයත් සිටිය. නැවත වරක් ඒ ප්‍රශ්නයම ඇසුව, දන්වත් අපට හේතුව කියන්නට කියා. ඒ අවස්ථාව වනතුරු අපේ සැකයක් තිබුණෙ, ඌරු කතාවක් පත්‍රයෙ පළවුණාය කියා පත්‍රය තහනම් කර තිබෙනවාය කියායි. නමුත් ඒ ගැනත් හිතන්න අමාරුයි. මන්ද ඒ ගැන නඩුවකුත් පවරා තිබෙන අතර එය රට කළඹන කතාවකුත් නොවන නිසයි. සමහර විට අගමැතිතුමාට ඒ කථාව නිසා කේන්ති ගියා වෙන්න පුළුවනි. නමුත් මේ ඌරු කතාව නිසා අගමැතිතුමාට ඇති වුණොත් ඇති වෙන්නෙ කුකුල් කේන්තියක්. කොහොම වුණත් බලය ලත් නිලධාරියා ඒ අවස්ථාවේදී අපට කියන්න යෙදුණෙ, දැනට නඩු දෙකක් දමා තිබෙන්නෙත් "ජනදින" පත්‍රය තහනම් කර මුද්‍රණාලය වසා තිබෙන්නෙත් "ජනදින" පත්‍රයෙ ඒ කලාප දෙකේ පළ වුණු කාරණා නිසා නොවන බවයි. කෙසේ වුණත් එම තහනමෙන්, නඩු දමා තිබීමෙන් කළ ක්‍රියාව හරි බව කල්පනා කරන්න ඉඩ තිබුණත් ඒ තහනම කළේ ඒ කලාප දෙකේ පළවුණු කාරණා නිසා නොවන බව කීවා. එහෙම නම්, කොයි කලාප නිසාද, කොයි කලාපයෙ පළවුණු කොයි ලිපිය නිසාද මේ පත්‍රය තහනම් කළෙත් මුද්‍රණාලය වසා දැමූවෙත් කියා මම ප්‍රශ්න කළ විට කියන්න යෙදුණෙ ඊට පිළිතුරක් දෙන්න බැරි බවයි. එතකොට මට පමණක් නොව උපදේශක මණ්ඩලයේ සිටි තවත් මහතකුටත් ටිකක් තරහ ආවා. තහනම් කළ කාරණය කියන්නේ නැත්නම් උපදෙස් දෙන්නේ කෙසේදැයි ප්‍රශ්න කරමින් බලය ලත් නිලධාරි මහතා දෙසට හැරුණු ඔහු "බලය ලත් නිලධාරිතුමනි, මේක නුවණට හුරු ක්‍රියාවක්දැයි තමුන්නාන්සේ කරුණාකර කල්පනා කර බලන්න. අද තමුන්නාන්සේ සුළු මුද්‍රණාලයක් පිළිබඳව මේ විධියට ක්‍රියා කරනවා ඇති. නමුත් විශාල මුද්‍රණාල මේ රටේ තිබෙනවා. දිනපතා පත්‍ර ගණනාවක් මුද්‍රණය කරන බේරේගෙදර යන්ත්‍රාලය තිබෙනවා. අද තමුන්නාන්සේ කරන ක්‍රියාව සම්ප්‍රදායයකට ගොස් හෙට වෙන ආණ්ඩුවක් බලයට පැමිණියාම බේරෙ ගෙදර යන්ත්‍රාලය සීල් තැබුවහොත් ඒ වගේම ඊට පසුව බේරේගෙදර අයිතිකාරයින් අවුත් තම යන්ත්‍රාලය සීල් කරන්නට හේතුව කුමක්ද කියා ඇසුවහොත්, ඊට දෙන උත්තරය 'හේතු උඹලට කියන්නෙ නැහැ' යන්න වුවහොත් තත්වය කෙසේ වේද?" යනුවෙන් ඇසූ විට බලය ලත් නිලධාරි මහතා නිහඬ වුණා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
කවුද බලය ලත් නිලධාරියා ?

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)
ආනන්ද තිස්ස ද අල්විස්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද දක්වා මේ මුද්‍රණාලය වසා දමා තිබෙනවා. මුද්‍රණාලයෙ යන්ත්‍ර මළකඩ කන්න ඇවිත් තිබෙන බව එතැනට ගිය අවස්ථා දෙකේදීම මා කීවා. මුද්‍රණාලය ශුද්ධ කරන්නට අවසරයක් නැහැ. පොලිස්කාරයන් දෙදෙනකු නිතර මුර කරනවා. මට ලැබුණු පිළිතුර මොකක්ද? "මුද්‍රණාලය ශුද්ධකරන්නට පුළුවනි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

'ගවර්මන්ට් ප්‍රෙස්' එකෙන් එක් කෙනකු ගෙනත් දමන් නම්. පොලිස් කාරයන් දෙදෙනකුත් සිටිනවා. ඒ අය ඉදිරිපිට ශුද්ධ කරන්නට පුළුවනි." මේ විධියට කීවේ පළමුවැනි අවස්ථාවේදීයි. දෙවැනි අවස්ථාවේදී කීවේ කුමක් ද? "මට බලයක් නෑ. අගමැතිතුමාගෙන්ම අවසරයක් ලබා ගන්නට ඕන" කියායි. මෙවිට උපදේශක මණ්ඩලයේ සභාපති තුමා, "මම අගමැතිතුමාට දන්වා මේකට අවසර ලබා දෙන්නම්" යනුවෙන් ප්‍රකාශ කළා. මෙය සිදු වුණේ මැයි මාසයේ 30 වැනිදායි. අද ජූලි මාසයේ 17 වැනිදායි. තවම නම් අපට අවසරයක් ලැබුණේ නැහැ. මුද්‍රණාලයේ යන්ත්‍රවලට තෙල් ටිකක් දමා මළකඩ කෑම නැවැත්වීමට තවම නම් ඉඩක් ලැබුණේ නැහැ. මට නම් පෙනෙන්නේ මේ ප්‍රජාතන්ත්‍රවාදී යයි කියන අගමැතිතුමාට වුවමනා කරන් නේ "ජනදින" පත්‍රය මුද්‍රණය කරන, එක නවත්වන්නට හා සමසමාජ පත්‍රය මුද්‍රණය කරන එක නවත්වන්නට පම ණක් නොව මෙම මුද්‍රණාලයත් නැති කර දමන එකයි. ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන අගමැතිතුමා තම ප්‍රජාතන්ත්‍රවාද යෙන් අදහස් කරන්නේ මැතිවරණ පැවැත්වීම පමණක් ද? ඔව්, එපමණයි.

මැතිවරණයක් පැවැත් වූ පමණින් එතැන ප්‍රජාතන්ත්‍රවාදයක් තිබෙනවාද? එහෙම නම් පසුගියදා දකුණු වියට්නාම යෙත් මැතිවරණයක් තැබුවා නොවැ. එහෙත් ඒ රට ප්‍රජාතන්ත්‍රවාදී යයි කිසි වකු කියන්නේ නැහැ. මැතිවරණයක් තබන්නට පෙර විවිධ දේශපාලන පක්ෂ වල මත ප්‍රචාරය කිරීමට නිදහසක් තිබෙන්නට ඕනෑ. එහෙම නැත්නම් මැතිවරණවලින් වැඩක් නැහැ. මේ ආණ්ඩුවේ ප්‍රජාතන්ත්‍රවාදය තමන්ගේ මතය පම ණක් ප්‍රකාශ කරන්නට නිදහස දීම හා විරුද්ධ මත ප්‍රකාශ කරන්නට බැරි තත්ත්වයක් ක්‍රමානුකූලව ඇති කිරීමයි. අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසක් විරුද්ධ පක්ෂවලට දුන්නොත් මැතිවරණවලින් නම් බලයට පත් වන්නට බැරි වෙතැයි මේ ආණ්ඩුවට පෙනී යන්නට ඇති. එහෙම වුණොත් ලොකු පාඩුවක් ඇති වෙනවා. මේ රටේ අධිරාජ්‍යවාදීන්ගේ අයිතිවාසිකම් රැක ගන්නට බැරි තත්ත් වයක් ඇති වෙනවා. මේ රජය විසින් ඒ කොටස්වලට දීගෙන ආ ආධාර ඉදිරියටත් ඒ විධියටම දෙන්න අවස්ථාව නැති වෙනව.

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

Order, please! Will the hon. Member take very long to finish his speech?

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

I would probably take about ten or fifteen minutes more.

අපේ ගරු මුදල් ඇමතිතුමා පළමුවැනි අයවැය ලේඛනයෙන්ම ලොකු ධන පතීන්ට කෝටි හයහමාරක සහනයක් වර්ෂයක් පාසා දෙන්නට කටයුතු යෙදුව. ඒ වගේම කෝටි පහමාරක අනවශ්‍ය වන්දි මුදලක් තෙල් කොම්පැනිවලට ගෙව්ව. ලොකු ආධාර මුදල් ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් හොඳ අදහසින් ඒ වන්දි මුදල් දුන්නත්, බලාපොරොත්තු වුණු අන්දමේ ආධාර ලැබුණෙ නැහැ. එය අනවශ්‍ය වන්දි මුදලක්යයි මා කිව්වෙ ඒ නිසයි.

කෘෂිකර්මය දියුණු කිරීමටය කියා අද ලොකු ධනපති කොම්පැනිවලට බදු සහන දී තිබෙනව. එයින් සිදු වන්නෙ, ධනපති යන්ගෙන් සාමාන්‍ය වශයෙන් රටට ලැබිය යුතු බදු මුදල් නොලැබී යාමයි. ලොකු කෘෂිකාර්මික වැඩ සැලැස්මක් මේ රජය විසින් සකස් කර තිබෙන බව අද ආණ්ඩුව ප්‍රකාශ කරනව. එහෙත් මා ඒ ගැන කථා කරන්න අදහස් කරන්නෙ නෑ. මැද කොළඹ තුන්වැනි ගරු මන්ත්‍රී තුමා ඒ ගැන විස්තර සහිතව කථා කර නව ඇති. එහෙත්, මේ කෘෂිකර්ම ව්‍යා පාරය පිළිබඳ කරුණු දෙකක් පමණක් ඉදිරිපත් කරන්න මම බලාපොරොත්තු වෙනව. ඉන් පළමුවැන්න මෙයයි: හාල් වලත් වෙනත් ආහාර ද්‍රව්‍යවලත් මිළ වැඩි කිරීමෙන් පමණක් ආහාර නිෂ් පාදනය දියුණු කරන්නට මේ රජය බලා පොරොත්තු වෙනව නම් කවදාවත් ඒ බලාපොරොත්තුව ඉෂ්ට වන්නෙ නෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නිෂ්පාදකයට වැඩි මිළක් ලබා ගැනීමට සැලැස්වීම ආහාර නිෂ්පාදනය දියුණු කිරිමට උපකාරී වන එක් හේතුවක් පමණයි. තවත් හේතු කීපයක් තිබිය යුතුයි. නිෂ්පාදනය කරනු ලබන ද්‍රව්‍ය විකුණා ගැනීමට පහසුකම් තිබෙන්න ඕනෑ; අස්වැන්න වැඩි වීමට වුවමනා කරන සුදුසු පෝර වර්ග එක් එක් ද්‍රව්‍යයට සරිලනාකාරයෙන් සපයන්න ඕනෑ; නිෂ්පාදකයින්ට ණය මුදල් ලබා දෙන්න ඕනෑ; ජලය සපයන්න ඕනෑ. එවැනි සැලැස්මක් ඇති නොකර මිළ ඉහල නැංවීමෙන් පමණක් ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය වැඩි කොට රටේ සැහෙන වෙනසක් ඇති කරන්නට පුළුවන්යයි රජය අදහස් කරතොත් එය මෝඩ අදහසක් බව මා ප්‍රකාශ කරනව.

ධනපතියන් ලවා මේ වැඩේ කරවගන්න පුළුවන් වේයයි ආණ්ඩුව කල්පනා කරනව නම් ඒකත් වැරදියි. තමන්ගෙ අදහස හරියයි රජය අවංකව කල්පනා කරනව ඇති. එහෙත් එය කවදාවත් හරි යන්නෙ නෑ. එක්සත් ජාතික පක්ෂය අනුගමනය කරමින් ඊට කිට්ටු වී සිටින්නෙ මේ රට දියුණු කරන ධනපතීන් නොවෙයි. ඔවුන්ගෙ බලාපොරොත්තුව, හැකි තරම් සුළු කාලයක් තුළදී හැකි තරම් විශාල ලාභයක් ලබා ගැනීමයි. අද මේ ආණ්ඩුව විසින් ඉඩම් අක්කර දහස් ගණන් දී තිබෙන්නෙ එවැනි ධනපතියන්ටයි. ඔවුන් මුලින්ම කරන්නෙ, ඒ ඉඩම්වල තිබෙන වටිනා ගස් ටික කපා ලී විකුණා ලාභ ගැනීමයි. රටක ධනපතියන්ගෙන් ඒ රටට සේවයක් ලබා ගන්න කොහෙත්ම බැරියයි මම කියන්නෙ නෑ. සමාජවාදී සැලැස්මක් අනුව, ධනපතියන්ට අයුතු ලාභ ලබන්නට ඉඩ නොදී නියම ක්‍රමයට වැඩ කළොත් ධනපතියන්ගෙන් සේවයක් සලසා ගන්න පුළුවනි. එහෙත් මේ ආණ්ඩුව කරන විධියට, තමන්ට ඕනෑ හැටියට ක්‍රියා කරන්නත්, ඕනෑ තරම් අයුතු ලාභ ලබන්නත් ධනපතියන්ට ඉඩ දුන්නොත්, ඔවුන් රට ගැන වගකීමක් ඇතිව කටයුතු කරන්න සූදානම් වන්නෙ නෑ. එවිට ඔවුන් කරන්නෙ රට නැති කර හෝ ඔවුන්ගෙ වාසි ලබා ගැනීම පමණයි. සමාජවාදී මාර්ගයෙන් පමණයි මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන් වන්නෙ.

එහෙත් මෙවර රාජාසන කථාවෙ සමාජවාදය ගැන වචනයක්වත් සඳහන් වී නැහැ. සමාජවාදය යන වචනයවත් නැහැ. "අපේ අරමුණ සමාජවාදී ප්‍රජාතන්ත්‍රවාදයයි" කියා වෙනදා නම් වචනයෙන් පමණක්වත් කියනව. මේ වතාවෙ එහෙමවත් නෑ. ඇත්ත කීම හොඳ දෙයක් නිසා මා ඒ ගැන ආණ්ඩුවට කෘතඥ වෙනව. බොරු කීම සුදුසු නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම එක්තරා විධියකට කල්පනා කරන මන්ත්‍රීවරයෙක්. තමන් කරන දෙය හරි හෝ වේවා, වැරදි හෝ වේවා ඇත්ත පැහැදිලි කිරීමයි, කළ යුත්තෙ. බොරු නොකියා ඇත්ත කියන්න ඕනෑ. එවිට මහජනයාට තමන් කැමති දේ පිළිගන්න පුළුවන්. ඒ නිසා මේ වර රාජාසන කථාවෙන් මේ රජය සමාජවාදී ප්‍රජාතන්ත්‍රවාදය අනුගමනය කරන්න යනවාය කියා ප්‍රකාශ නොකිරීම ගැන මම ස්තුතිවන්ත වෙනව.

මේ වර රාජාසන කථාවෙන් තව එක්තරා කාරණයක් හොඳට පැහැදිලි වෙනව. එනම් මේ රජය අඩියක් අඩියක් පාසාම ආපසු ගමන් කිරීමට පටන්ගෙන තිබෙන බවයි. මැතිවරණයට පෙර විශේෂයෙන් රාජ්‍ය ඇමතිතුමා කිව්වා, දැන් තිබෙන එක්සත් ජාතික පක්ෂය පැරණි එක්සත් ජාතික පක්ෂය නොවේය, 1956 ට පෙර තිබුණු එක්සත් ජාතික පක්ෂය නොවේය, අපි ඒ කාලයේ වැරදි කරල තියෙනවය, නමුත් දැන් අපි ඒවා හරි ගස්සාගෙන ප්‍රගතිශීලී අතට හැරිලා තියෙනවාය, සමාජවාදී ප්‍රගතිශීලී වැඩපිළිවෙළක් අනුගමනය කිරීමට අප සූදානම් වී සිටිනවය කියා. නමුත් 1965 මාර්තු මැතිවරණයට පසු ගත වී තිබෙන අවුරුදු දෙකහමාරේ කාලය තුළ එය එසේ නොවන බව පෙන්වන්නට කරුණු රාශියක් සිදු වෙලා තියෙනව.

පළමු කොටම ගරු අධ්‍යාපන ඇමතිතුමා ගුරුවරුන්ගෙන් පලි ගන්නට පටන් ගත්තා. ඊ ළඟට දෙසැම්බර් මාසය වන විට පැරණි එක්සත් ජාතික පක්ෂයේ නියම විලාශය හෙළි කරමින් පේරාදෙනියේ විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ වැඩ වර්ජනයක් තිබුනාය කියා ඒ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට බැටන් පොලුවලින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

ගසා කඩුළු ගැස් දැම්මා. එපමණක් නොවෙයි. මේ ආණ්ඩුව ලංකා ඉතිහාසයේ පළමු වැනි වරට පොලිසිය ලවා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට වෙඩි තැබුවා. මගේ කොට්ඨාශයේ නාරංපිටියේ ළමයකුට වෙඩි පහරක් වැදී කකුලත් සිදුරු වුනා. ඊ ළඟට ජනවාරි 8 වැනිදා හාමුදුරු නමකට වෙඩි තබා මරා දැම්මා. එය අගමැතිතුමා කියා කරවූ දෙයක්ය කියා මම කියන්නෙ නැහැ. නමුත් ඒ ක්‍රියාව අගමැතිතුමා අනුමත කළා. ඇයි මම අනුමත කළාය කියන්නෙ? එවැනි වෙඩි තැබීමකට අවශ්‍යතාවයක් තිබුනාද නැද්ද කියා පරීක්ෂා කිරීමට කොමිෂන් සභාවක් තබා නිලධාරියකුවත් පත් කෙළේ නැහැ. වෙඩි තැබීම පොල්ලෙන් ගහනව වගේ වැඩක් නොවෙයි. පපුවට වැදුනොත් මැරෙනව. සාමාන්‍ය කෙනකුට වෙඩි තැබුවත් අපි ඒ ගැන තදින් බලනව. ඒ නිසා තුවක්කු පාවිච්චි කිරීම අවශ්‍යව තිබුනාද කියා සොයා බැලිය යුතුව තිබුනා. 1848 සිට අපේ රටේ හාමුදුරු නමක් ඔය විධියට මරණයට පත් වුනේ නැහැ, ස්වදේශිය ආණ්ඩුවක් යටතේ හෝ විදේශිය ආණ්ඩුවක් යටතේ. නමුත් මේ ආණ්ඩුව යටතේ අවාසනාවකට හෝ ඒ දෙය සිදු වුනා. නමුත් එවැනි වෙඩි තැබීමක් අවශ්‍යව තිබුනාද නැද්ද කියා සොයා බැලීමට පරීක්ෂණයක්වත් ඇති කෙළේ නැහැ. එසේ පරීක්ෂණයක් නොපැවැත්වීමෙන් ඒ වෙඩි තැබීම මේ ආණ්ඩුවත් අගමැතිතුමත් අනුමත කරනවාය යන්නයි, අපට බසින්නට තිබෙන එකම නිගමනය. පරණ එක්සත් ජාතික පක්ෂයේ නියම විලාශය එයින් හෙළි වුනා. කරුණු රාශියක් තිබුනත් ඒවා කියන්නට වුවමනා නැහැ.

ග්‍රාම සේවකයන් විභාගයෙන් තෝරා ගන්නවා වෙනුවට සම්මුඛ පරීක්ෂණයෙන් තමන්ට පක්ෂ උදවිය තෝරා ගැනීමට ඉඩ තබාගෙන වැඩ පිළිවෙළක් සකස් කර තිබෙන බව මාතර මන්ත්‍රීතුමා (තුඩාවේ මයා.) විසින් කියන්නට යෙදුනා. එක්සත් ජාතික පක්ෂයේ හා ෆේඩරල් පක්ෂයේ මේ ආණ්ඩුව හැම අතින්ම ප්‍රතිගාමී අන්දමට කටයුතු කරගෙන යන බව ඉතාම පැහැදිලිව පෙනෙනව. මේ රාජාසන කථාවේ වැඩිපුරම තිබෙන්නේ අනවශ්‍ය දේ—බොරු දේ. ඒවා අයින් කර අළුත් රාජාසන කථාවක් සකස් කර ඉදිරිපත් කරනවා නම් හොඳය කියා මම අදහස් කරනව. අප කරන්න යන්නේ මේවාය, අපේ රටේ ඉතා බරපතළ ආර්ථික ප්‍රශ්න තියෙනවාය, මේ ආර්ථික ප්‍රශ්න විසඳන්නට යන්නේ අපව මෙතැනට පත් කර එවූ ධනපතියන්ගේ කර උඩ බර පටවා නොවේය, සාමාන්‍ය ජනතාවගේ කර උඩ බර පටවාය, අප ගහන්න යන්නේ සාමාන්‍ය ජනතාවගේ බඩටය, ඒ සාමාන්‍ය ජනතාවගේ බඩට ගසා අපි ඒ අයගේ ඡන්දයත් ලබා ගන්නවාය කියන්න. ඡන්දය ගන්නෙ කොහොමද? අන්තිම අවුරුදු එකහමාර වන විට අපේ විදේශික අධිරාජ්‍යවාදි මිත්‍රයන්ගෙන් අපි හොඳට ණය මුදල් හා ආධාර ලබාගෙන පාරිභෝගික භාණ්ඩ සියල්ලක්ම මේ රටට ගෙන්වා මී ළඟ මැතිවරණය තෙක් නොමිළයේ හෝ ඒවා බෙදා හැර අපි ලබන ඡන්දයත් දිනනවාය කියා මේ රාජාසන කථාවේම සඳහන් කළා නම් වඩාත් හොඳය කියා ප්‍රකාශ කරමින් මගේ කථාව අවසාන කරනව.

අ. භා. 3.11

**ඩී. පී. අතපත්තු මයා. (රාජ්‍ය ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. டீ. பீ. அத்தபத்து—இராஜாங்க அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. D. P. Atapattu—Parliamentary Secretary to the Minister of State)

ගරු සභාපතිතුමනි, රාජාසන කථාව සම්බන්ධයෙන් ඇතිවූ විවේචනවලට පිළිතුරු දීමට පෙර, ඊට අතිරේකව කරන ලද කථා ගැන වචනයක් දෙකක් කිය යුතු යයි මට හැඟුණා. අද මේ ලංකාවේ පවතින දේශපාලන භේදයන් ගැන කල්පනා කර බලන විට අද පමණක් නොව රාජාසන කථා යම් කාලයක මේ රටේ ඉදිරිපත් වුණාද, එදා සිටම මේ වගේ විවාද ඇති වී තිබෙනවා යයි මා හිතනව. හැන්සාඩ් වාර්තාවල ඇතුළත්ව තිබෙන ඒ විවාද ගැන මොහොතකට කල්පනා කර බැලුවොත්, එදත් මේ කථා එහෙමයි; අදත් මේ කථා එහෙමයි කියා පෙනෙනව. ඒ පක්ෂය රජ කෙරුවොත් අනික් පක්ෂය ඒ රාජාසන කථාවලදී මේ වගේම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දේවල් ඉදිරිපත් කරනව. මේ පක්ෂය රජ කෙරුවොත් අනික් පක්ෂය ඒ වගේම දේශනා හැම අවුරුද්දේම කරනව. පොඩි පොඩි වෙනස්කම් එහෙන් මෙහෙන් ඇතිවන්ට පුළුවන්. අපි මෙවැනි අවස්ථා වලදී රටට ප්‍රයෝජනයක් ඇති, ජාතියට ප්‍රයෝජනයක් ඇති අපේ රටේ අභිවෘද්ධියට අදාළ දේවල් ඉදිරිපත් කරන බවක් මට නම් පෙනෙන්නෙ නැහැ.

පානදුරයේ ගරු මන්ත්‍රීතුමා (ලෙස්ලි ගුණවර්ධන මයා.) දැන් කළ කථාවේදී කියාගෙන ගියා මේ ආණ්ඩුවේ සමුපකාර ප්‍රතිපත්තිය සම්බන්ධව. සමුපකාරය භාර ඇමතිතුමා නොයෙක් විධියේ වැරදි ක්‍රියා කර තිබෙනවාය, තනි බලය පාවිච්චි කර සමුපකාර සමිති කීපයක් විසුරුවා හැර ඒවාට රජයේ නිලධාරීන් පත් කර සිටින වාය, යනුවෙන් එතුමා චෝදනා කළා. එහි ඇත්ත යුත්ත මට මේ අවස්ථාවේදී කිය න්ට පුළුවන්කමක් නැහැ. ඒ ගැන ආහාර ඇමතිතුමා තමන්ගේ වාරය පැමිණි විට උත්තර දෙනවා ඇති. මේ ගැන කථා කරන විට වුවමනා නම් අපටත් පැරණි ඉතිහාසය ගැන කල්පනා කර මෙවැනි කරුණු ඉදිරි පත් කරන්ට පුළුවනි. මමත් එවැනි අවස් ථාවකට මුහුණපෑ කෙනෙක්. මමත් සභා පති වශයෙන් සිටිද්දි අපේ සමුපකාර සංගමය විසුරුවා හැර අපේ තත්ත්වය නැති කළ හැටි වුවමනා නම් කියන්ට පුළු වනි. මමත් සමුපකාර ව්‍යාපාරයේ ඒ විධි යට දුක් වින්ද කෙනෙක්. කවදාවත් සත බාගයක්වත් වංචාවක් කරලවත්, වෙනත් වරදක් කරලවත් නොවෙයි. මේව කීමෙන් අපට ප්‍රයෝජනයක් නැහැ. සමහරවිට වැරදි හැම පැත්තෙන්ම සිදු වන්ට පුළු වනි. අපෙන් පමණක් නොව ඒ පැත්තෙ නුත් වැරදි සිදු වන්ට පුළුවනි. අපෙනුත් වැරදි සිදු වන්ට පුළුවනි. එහෙත් සාමාන්‍ය යෙන් මේ රජය ඉදිරිපත් වී සිටින්නේ හොඳ සමුපකාර නැති කරල නරක සමුප කාරවලට අත දෙන්ට යයි යමෙක් කියනව නම් ඒක මේ ගරු සභාවේ සැහෙන වග කියයුතු මන්ත්‍රී කෙනකුගේ කීමක් වන්ට බැහැ. අවංකවම එහෙම වෙන්න බැහැ. දෙපාර්තමේන්තුවෙන් යම්කිසි වරදක් සිදුවුණු නිසාම, විරුද්ධ පාර්ශ්වයට හිත වත්කම් දක්වන උදවියගේ පාලනය යටතේ පවතින හොඳ අන්දමට පාලනය වන සමුපකාර සමිති නැති කර දැමීම රජයේ පරමාර්ථය යයි කියනව නම් ඒක අවංක කීමක් හැටියට මා සලකන්නෙ නැහැ.

මම එක කාරණයක් මේ අවස්ථාවේදී මතක් කරන්ට කැමතියි. එක පළාතක දිසාපතිතුමකුගේ බලපෑමක් පරිදි, දිසා පතිතුමාගේ රපෝර්තුවක් පරිදි, මෑතදී ආණ්ඩුවේ පාලනයට භාර ගත් එක්තරා විවිධ සේවා සමුපකාර සමිති සංගමයක පැවති වංචාවක් ඒ සංගමය රජයට භාර ගෙන සුමානයකින් සොයා ගන්නට පුළු වන් වුණා. එවැනි දේවල් සිදු වෙනව. එවැනි අවස්ථාවලදී සමුපකාර සමිති සංගම් විසුරුවා හරින්ට සිදු වෙනව. හොඳහැටි පාලනය කරගෙන යන සමුපකාර සමිති සංගම් ගැනත් මා දන්නව. ඒවාට තවම කිසිවෙකු අත ගැසුවෙ නැහැ. ඔය අතර තුර යම් වරදක් සිදු වුණාම, එහෙම කරන්නේ ප්‍රතිපත්තියක් හැටියට යයි කීමේ සාධාරණකමක් නැහැ. අපේ කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ඉලංග රත්න මයා.) ඉස්සරහ සිටිනව. එක් අවස්ථාවක මටත් එවැනි දෙයක් කර තිබෙනව. මම කවදාවත් බලාපොරොත්තු වුණේ නැහැ, ඒ සම්බන්ධයෙන් කථා කරන්නට.

**ටී. බී. ඉලංගරත්න මයා.** (කොලොන් නාව)
*(திரு. ரீ. பி. இலங்கரத்ன—கொலொன்னாவ)*
(Mr. T. B. Ilangaratne—Kolonnawa)
හදිසි නීති යටතෙ නොවෙයි.

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)
හදිසි නීති යටතෙ නම් තව කමක් නැහැ. කිසිම නීතියක් නැතිවයි කළේ. එකම නීතිය වශයෙන් "ගිය අවුරුද්දෙ 1,60,000 ක් වූ ලාභය මේ අවුරුද්දෙ 1,40,000 ට බැහැල තියෙනව" කියායි එය කරගත්තෙ. එසේ ක්‍රියා කළේ හදිසි නීතිය යටතෙ නොවෙයි, අවනීතිය යටතෙයි. නමුත් අපට ඒවා වුවමනා නැහැ. වර්ත මාන කොළොන්නාවෙ ගරු මන්ත්‍රීතුමාට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අතපත්තු මයා.]

(ටී. බී. ඉලංගරත්න මයා.) ඒ අවස්ථාවෙ නියම අවබෝධයක් නොතිබුණා වන්නට පුළුවනි. එය කාගේවත් කීමට කළාය කියා අපට හිතන්නට පුළුවන්. නමුත් එතුමා මගේ ප්‍රතිපත්තිය මොකක්ද කියා දන්නෙ නැහැ. මම ඒ සම්බන්ධයෙන් ක්‍රෝධයක් ඇති කරගෙන කථා කරනවා නොවෙයි. මේ වගේ දේවලුත් සිදු වන බව මතක් කිරීම කුයි, මා කරන්නෙ. මා විතර ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් අස්ථානයේ බැට කෑ පුද්ගලයෙක් ඒ පළාතෙ නැහැ. නමුත් මම ඒවාට ක්‍රෝධ කරන මනුෂ්‍යයෙක් නොවෙයි. මම ඒවා ගැන කල්පනා කරන්නෙ වත් නැහැ. ඒ වගේම මම කවදාවත් මට එසේ ක්‍රියා කළ පක්ෂයේ අයට ක්‍රෝධ කරන්නෙත් නැහැ.

අපේ සමහර අය දේශපාලන වේදිකා වලදිත්, මේ ගරු සභාව තුළදිත් ආගම වෙනුවෙන් පණ දෙන්නට හදනව. මේ විවාදයේදි සමහරු අපෙන් ඇහුව, "තමුන්නාන්සේලා බුද්ධාගමට මොනවද කළේ, අපි නොවෙයි ද, කෙරුම්කාරයො" කියා. මම හිතනව මා මිත්‍ර කොලොන්නාවෙ ගරු මන්ත්‍රීතුමා පිළිගන්නව ඇති, රජයෙන් බුද්ධාගමට කරන්නට දෙයක් නැති බව. බුද්ධාගමට රජයෙන් තැනක් දෙනවා කියා යම් පහසුකමක් යොදනවා විනා ලංකාවෙ බෞද්ධයන් ඇති කරන්නට මේ රජයටවත් අන් කිසි රජයකටවත් පුළුවන්කමක් නැහැ. සමහරු දස පණත ගැන කථා කළා. මේ ගරු සභාවෙ ඉන්නා ගරු මන්ත්‍රීවරුන්ගෙන් කී දෙනෙක් පස් පවින් වැළැකී සිටිනවාද කියා ම අහන්නට කැමතියි. මෙතැනදිත් වේදිකාවලදිත් එක් දෙයක් කියනව. නමුත් හැත්දෑවට කරන්නෙ වෙනත් දෙයක්. රෙදි කෑල්ලක් අඳින නිසා සමහරු කලිසමට අගෞරව කරනව. සවස් වන විට ඒ ජාතික ඇල්ම, ආගමික ලැදියාව, භාෂා ප්‍රේමය, ඇත්තෙ නැහැ. යම් දෙයක් නැත්නම්, ප්‍රතිපත්තියක් ගැන කථා කර නවා නම්, ඒ ප්‍රතිපත්තියෙහි පිහිටා සිට කථා කරන්නට ඕනැ අනික් මනුෂ්‍යයනුත් හරිගස්සන්නට වුවමනා නම්. අවුරුදු 30ක් 40ක් තුළ ප්‍රතිපත්තියක පිහිටා ඒ ගැන කථා කළ මිනිසුන් අද සමාජයේ බොහොම හිඟයි.

"බෞද්ධාගමට තමුන්නාන්සේලා මොනවද කළේ" කියා අද මේ ආණ්ඩුවට දොස් කියනව. බුද්ධාගම මතක නැති ආකාරයට පසුගිය ආණ්ඩුව කටයුතු කර තිබෙනව. මගේ හැඟීමේ හැටියට අවංකව කියනව නම් 1956 න් පස්සෙ තමයි භික්ෂූන් වහන්සේලා නොමඟ යවන්නට කටයුතු කෙරුණේ. ඊට කලින් නම් දේශපාලනයට හේත්තු වන්නට භික්ෂූන් වහන්සේලා ටිකක් චකිතයක් දැක්වුවා. නමුත් 1956 ට පස්සෙ ඇති වුණු තත්ත්වය මොකක් ද? භික්ෂූන් වහන්සේලාගෙන් කොටසක් ඒ පක්ෂය අල්ලා ගත්තා; තවත් කොටසක් මේ පක්ෂය අල්ලා ගත්තා. දෙපක්ෂයට බෙදී දෙගොල්ල ගුටි කෙළ ගත්ත. ඉතින් කොහොමද, බෞද්ධාගම දියුණු වන්නෙ? බෞද්ධාගම දියුණු කරන්නෙ, සංඝයා වහන්සේලාට තැනක් දෙන්නෙ, ලෞකික ප්‍රයෝජන තකාගෙන ද? අපේ ආධ්‍යාත්මික ගුණ වගාව දියුණු කර ගැනීම සඳහා සංඝයා වහන්සේලාගේ ප්‍රයෝජනය ලබා ගන්නට අප කල්පනා කරනව නම් අන්න ඒක තමයි, බෞද්ධාගමට තැන දීම. නමුත් අද මොනවද කෙරෙන්නෙ? එදා කළේ මොනවද? ලෞකික ප්‍රයෝජන ගැනීමේ, දේශපාලන ප්‍රයෝජන ගැනීමේ, නැත්නම් වෙනත් දෙයක් කර ගැනීමේ අරමුණ ඇතිව භික්ෂූන් වහන්සේලා දේශපාලනයට ඇදා ගත්ත. අපි බුද්ධාගමට තැනක් දෙන්නෙ නැතිලු. උගුර කඩාගන කථා කළ මන්ත්‍රීවරුන්ගෙ දැන ගැනීම සඳහා මම නැවත වරක් කියන්නම්, බුද්ධාගමට තැන දීම පුද්ගලයන් විසින් කළ යුතු දෙයක් බව. බුද්ධාගම ගැන බොහෝ දෙනකුට හොඳ අවබෝධයක් තිබෙනව. ආගමික හැඟීමක් නැතිව, ආගමික ප්‍රතිපත්තිවල නො පිහිටා අනෙක් අයට දොස් කියන්නෙ ඇයි?

මේ තත්ත්වයේ හැටියට අද කොහොමද බුද්ධාගමට තැනක් දෙන්නෙ? මේ ආණ්ඩුව බලයට පත් වුණේ 1965 පැවැත්වුණු මහා මැතිවරණයේ දී මහජන ඡන්දයෙන්. විරුද්ධ පාර්ශ්වයෙ සමහර උදවිය මේ ගරු සභාව තුළදීත්, පිටතදීත් නොයෙක් අවස්ථාවල කියා තිබෙනව, "හිට පල්ලකො, උඹලට කරන හැටි පෙන්වන් නම් අපි බලයට ආවොත්" කියා. මහා මැතිවරණයක් පවත්වන්නටත් නව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කොපමණ කල් තිබෙනව ද? මේ විධියෙ ක්‍රෝධ සහගත ප්‍රකාශ කරමින්, මෙවැනි පළිගැනීම් කරන්නට බලා සිටින පුද්ගලයන් බෞද්ධාගමට තැන දෙන්නට කථා කරනව. බෞද්ධාගමේ එවැනි පළිගැනීම් නැහැ. ක්‍රිස්තියානි ධර්මයෙ වගේම බෞඩ ධර්මයෙත් මෛත්‍රී කරන්නට උගන්වනව. මේ විධියෙ ප්‍රකාශ කරන විට කොහොමද, මෛත්‍රී කරන්නෙ? මෙවැනි දේශපාලනමය තත්ත්වයක් යටතේ කවදාවත් මේ රටේ මෛත්‍රී කෙරෙන්නෙ නැහැ. ඒකයි, අපේ කණගාටුවට හේතුව. බෞද්ධාගමට තැනක් දෙනවාය කියමින් ඒවා තමන්ගෙ ප්‍රයෝජනයට යොදා ගන්නව. කොළඹ වැනි තැනකදි බෞද්ධාගමට තැන දෙන්නට යනව. නමුත් මීගමුවට ගියාම වෙනත් තැනක් දෙනව.

කොයි කවුරුන් වුණත් තමන්ගෙ හිතට විරුද්ධව කථා කිරීම කොහෙත්ම හොඳ නැහැ. සමහර ගරු මන්ත්‍රීවරුන්ට බෞද්ධාගම සම්පූර්ණයෙන්ම වාගේ මතක නැති වුණු අවස්ථාවල් මාත් දැකල තියෙනව. හතර වැනි ශික්ෂාපදය යම් කෙනෙක් කැඩුවොත් ඒ එක්කෙනා බෞද්ධාගම අමතක කළ කෙනකු වෙනව. නොයෙක් අවස්ථාවල හතර වැනි සිකපදය කඩන පුද්ගලයන් ඔය උදවිය අතරේ ඉන්නව.

අප කා ළඟත් යම් යම් දොස් තිබෙනව. ඒක නැතෙයි කියන්න පුළුවන්කමක් නැහැ. ඒ කොයි හැටි වෙතත් අපේ වැරදි අපට දකින්න ඉඩ ලැබුණු විට ඒවා කොයි විධියකින් නමුත් හරිගස්සාගෙන අනුන් සමග සම්බන්ධ වී රටටත් ජාතියටත් සෙතක් වන ආකාරයට යමක් කරන්න බලාපොරොත්තු වෙනවා විනා ආගමට තැනක් දෙනවාය කිය කියා වැරදි කිරීම සුදුසුද? ඒ විධියට වැඩ කරමින් බෞද්ධාගමට තැන දෙනවාය කියන එක කාටවත් කියන්න පුළුවන් දෙයක්ද?

මේ රාජාසන කථා විවාදයට සහභාගි වූ ගරු මන්ත්‍රීන් කිහිප දෙනෙක් හාල් නැත, මිරිස් නැත, උම්බලකඩ නැත, පරිප්පු නැත, වෙනත් බොහෝ දේ නැත යනුවෙන් කියා තිබෙනව. මාතර ගරු මන්ත්‍රීතුමා (තුඩාවේ මයා.) පරිප්පු හිඟය ගැන කථා කරමින් වෙදකමටවත් ගන්න පරිප්පු ටිකක් හොයා ගන්න නැතෙයි කිව්වා. ඒ විධියට කථා කිරීම වැරදියි. බෙහෙතකට ගන්නවත් පරිප්පු ටිකක් හොයා ගන්න නැතෙයි කීම වැරදියි. සලාක ක්‍රමයක් අනුව පරිප්පු ස්වල්පයක් බැගින් නමුත් බෙදා දීම තවමත් කෙරෙනව. පිටිසර ප්‍රදේශවල නම් ඒ සලාකය ලැබෙන බව මට කියන්න පුළුවනි. හැම දෙයක්ම සලාක ක්‍රමයට ලැබෙන්නෙ නැහැ. ඒක මාත් පිළිගන්නව. සුළු ප්‍රමාණයක් වුවත් අපේ පිටිසර පළාත්වල නම් බෙදා දෙන බව තමුන්නාන්සෙට කියන්න කැමතියි. එහෙම තිබියදී, මාතරට පමණක් එය නොලැබෙනවය කියන්නෙ කොහොමද? එය අපට පිළිගන්න පුළුවන් දෙයක් නොවෙයි. අද මේ රටේ ඉන්න ජනතාවට වුවමනා කරන හැම දෙයක්ම වුවමනා ප්‍රමාණයටම ලබා ගන්න බැරි තත්ත්වයක් පවතිනවය කීවොත් ඒ කතාව පිළිගන්න මාත් ලෑස්තියි; අපේ ආණ්ඩුවත් ලෑස්තියි. මේ රටේ හිඟ දේවල් හුඟක් තිබෙනව.

හාල් හිඟයක් තිබෙන බව කවුරුත් පිළිගන්නව. අපට වුවමනා කරන තරම් හාල් අපේ රටේ නැහැ. එය මුළු ලෝකයෙම තිබෙන තත්ත්වයක් බව නොදන්නා කෙනෙක් නැති තරමයි. ඒ බව කොලොන්නාවෙ ගරු මන්ත්‍රීතුමා (ඉලංගරත්න මයා.) පිළිගන්නවා ඇති. ඒ නිසා අද තිබෙන තත්ත්වය හොඳාකාර අවබෝධ කරගෙන කථා කරන එක වඩා හොඳ බව කියන්න පුළුවනි.

සමහර ගරු මන්ත්‍රීතුමන්ලා යම් යම් දේවල් සම්බන්ධයෙන් හිඟයක් ඇති වුණාම ඒ හිඟය තිබෙන්නෙ තම තමන් නියෝජනය කරන කොට්ඨාශවල පමණකැයි කල්පනා කරනව. හැම දෙයක් සම්බන්ධයෙන්ම පවතින තත්ත්වය එසේ නොවෙයි. ලෝකයේ යම් යම් ප්‍රදේශවල දුර්භික්ෂ පවතිනව, ඇතැම් කාලවල. ඉතිහාසය දෙස බැලුවොත් අපට ඒ බව පෙනී යනවා ඇති. හාල් හිඟය අවුරුදු දහයක් පහළොවක් තිස්සේ මුළු ලෝකයේම පවතින්නක්. මේ අවදානම් තත්ත්වය අද ඊයෙ වුණු දෙයක් නොවෙයි. මගේ කල්පනාවෙ හැටියට 1950 සිටම—දෙවැනි ලෝක මහා සංග්‍රාමය අවසන් වී ටික කාලයක් ගත වූ තැන සිටම—නොයෙක් දුෂ්කරතාවලට ලෝකය අනුක්‍රමයෙන් වැටීගෙන ආවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අතපත්තු මයා.]
නොයෙක් නොයෙක් දේවල් ගැන කල්පනා කර බලන විට අපට ඒ බව හොඳාකාර අවබෝධ වෙනව. මුළු ලෝකයෙම හාල් හිඟයක් දැනට තිබෙනව. මැද පෙරදිග රටවල මෑතදී ඇති වුණු භයානක තත්ත්වය ගැන තමුන්නාන්සෙ දන්නව. ඒ තත්ත්වයත් එකැවරම ඇති වූ දෙයක් නොවෙයි. 1950 සිටම වාගේ ටිකින් ටික ඇති වූ ප්‍රශ්න උග්‍ර වීමෙනුයි අද පත්වෙලා තිබෙන තත්ත්වයට පත් වුණේ. වියට්නාම් යුද්ධයත් ඒ විධියටම ඉතිහාසයක් ඇති දෙයක්. ඔය විධියේ නොයෙක් කාරණාවල් නිසා ලෝකයේ ආහාර දුර්ලභ වෙන්න පටන් ගත්තා.

මැද කොළඹ තුන්වැනි ගරු මන්ත්‍රීතුමා (කෙනමන් මයා.) 1965 අවුරුද්දෙ නවසීලන්තයට ගියා. මාත් ඒ අවුරුද්දේ නවසීලන්තයට ගියා. එතුමා ඒ රටේ එදා පැවති තත්ත්වය ගැන හොඳාකාර දන්නවා. ආහාර පාන අදියෙන් අඩුවක් කිසිසේත් කියන්න නැති, සෞභාග්‍ය සම්පන්න තත්ත්වයකයි එදා ඒ රට තිබුණෙ. ඉතාමත් හොඳ ප්‍රබෝධමත් මුහුණුවලින්—සිනා රැල්ලෙන් ඔප් නැංවුණු මුහුණුවලින්—යුක්ත මිනිසුන් පිරිසක් තමයි අපට ඒ රටේදී දකින්නට ලැබුණෙ. ජීවන තත්ත්වය ඒ තරම් උසස් ස්ථානයකයි එදා ඒ රටේ තිබුණෙ. අද මගේ මිත්‍රයෙකු විසින් මට එවා තිබෙන ලියමනක මට කියවන්නට ලැබුණු හැටියට නම් දැන් ඒ රටේ තත්ත්වය ඊට වඩා හුඟක් කනගාටුදායක බව කියන්න පුළුවනි. ඒ මහත්මයා දේශපාලනයේ යෙදී සිටින කෙනෙක්. කම්කරු පක්ෂයේ කෙනකු වන ඒ මහත්මයා ජාතික පක්ෂය හෙවත් "නැෂනල් පාටි" නැමැති පක්ෂය සමග මැතිවරණවලදී සටන් කළා. ඒ මහත්මයාගෙ පාටියට ජය ගන්න බැරි වුණු බවක් කියන ඒ මහත්මයා, එසේ තමන්ගේ පක්ෂය පරාජය වීම ගැන සන්තෝෂය ප්‍රකාශ කර තිබෙනව. ඒ රට දැන් කලින් තිබුණු උසස් තත්ත්වයෙන් පහළ වැටී තිබෙන බවයි ඒ මහත්මයා කියන්නෙ. ලෝක වෙළඳ පොළේ වූල් මිළ පහත වැටී තිබෙනවාය, අප දැන් ඉතාම අමාරු තත්ත්වයකට පත් වී සිටිනවාය, මේ තත්ත්වයට දැන් කුමක් කරනවාද කියා ආණ්ඩුව කල්පනා කරනවාය කියා ඒ ලියුමෙ සඳහන්ව තිබෙනව. මෙයින් දැන් ඒ රටේ මොන විධියෙ තත්ත්වයක් තිබෙනවාද කියා අපට අවබෝධ වෙනව. ඒ අනුව බලාගෙන යන විට, ලංකාව වැනි රටවල් පමණක් නොවෙයි, ලෝකයේ ඔය ධනපතිය කියන රටවලුත් අර නිව්සීලන්තෙ තත්ත්වයට වැටෙන්න පුළුවන්. නිව්සීලන්තයෙ එවැනි තත්ත්වයක් ඇති වුණේ කාරණා කීපයක් නිසයි. යුරෝපයේ ඇති වූ අළුත් වෙළඳ ක්‍රියා මාර්ගත් ඒකට හේතුවක් වෙන්න පුළුවන්.

දැන් අපේ ලංකාව ගැන වුණත් බලන්න. ලංකාවට පිටරටවලින් ගෙන්වන ද්‍රව්‍ය පුළුවන් තරම් ලංකාවෙම නිෂ්පාදනය කරන්ට අපි බොහොම මහන්සි ගන්නව. අපේ මේ තැත කවදා හෝ සාර්ථක වෙන්ට පුළුවනි. අද පිටරටවලින් ගෙන්වන ද්‍රව්‍ය සම්පූර්ණයෙන්ම ලංකාවේම නිෂ්පාදනය කරන්නට අවස්ථාවක් ලැබුණොත් අපට බඩු එවූ රටවලට එය බල පානවා නොවේද? එම නිසා තමුන්නාන්සේලා නිකම්, දුරු ගණන් ගියා, අරක ගණන් ගියා, මේක ගණන් ගියා, කිය කියා කෑගැසීම ප්‍රයෝජනයක් ඇති දෙයක් නොවෙයි. මේක අද ඊයේ ඇති වූ තත්ත්වයක් නොවෙයි.

බද්දේගම ගරු මන්ත්‍රීතුමා (නිල් ද අල්විස් මයා.) ඊයේ කථා කරමින් ජීවන වියදම ඉහළ ගිය හැටි පෙන්නුව. හොඳයි, ඒක ඇත්ත. නමුත් ඒක අද ඊයෙ පටන් ගත් දෙයක් නොවෙයි. මා දැන් සඳහන් කළ කාල සීමාව තුළ ජීවන වියදම ක්‍රමයෙන් නැගිගෙන නැගිගෙන ඇවිත් දැන් එය 113 ට නැග තිබෙනව. කරුණු කීපයක් නිසා එය නවත්වන්න අපට බැරි වුණා. ජීවන වියදම ඉහළ ගියේ හදිසියෙන් නොවෙයි. දීර්ඝ කාල සීමාවක් තුළ එය ක්‍රමයෙන් ඉහළ ගියෙ. ජීවන වියදම ඉහළ යාම එක වරම නවත්වන්ට නම් අපට ආර්ථික තත්ත්වයෙන් බලසම්පන්න කමක් ඇති වෙන්න ඕනැ. යම් විධියකින් අපේ ආර්ථික තත්ත්වය දියුණු වුණා නම් ඊට වග කිව යුත්තේ අප පමණක් නොවෙයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එවැනි තත්ත්වයක් ඇති වුණා නම් එදා සිටි පාලකයනුත් ඊට වගකිවයුත්තන් වෙනව. මා කිසි කෙනෙකුගෙ වරදක් කියන්නෙ නැහැ. සමහර විට පසුගිය ආණ්ඩුව අප මේ මේ කර්මාන්තවලට මේ තරම් ප්‍රමාණයක් යොදවනවාය, මේ කර්මාන්ත දියුණු වුණොත් මේ රට ස්වයංපෝෂිත වී හරි යනවාය කියා කල්පනා කරන්ට ඇති. නමුත් එකම අංශයක් දියුණු කිරීමට පමණක් මා එකඟ වෙන්නෙ නැහැ. සමහර විට පසුගිය ආණ්ඩුව ඒ කාල සීමාව තුළ දී මේ රටේ ආහාර නිෂ්පාදනය ගැන මීට වඩා උනන්දුවකින් ක්‍රියා කළා නම් මේ අද තිබෙන ප්‍රශ්න රාශියකින් ගැළවෙන්ට තිබුණා. පානදුරේ ගරු මන්ත්‍රීතුමා නම් මා කියන දෙයට එකඟ වේවිද කියා මා දන්නෙ නැහැ. ඒකට නම් අපි විරුද්ධය කියා එතුමා කිව්ව. නමුත් මගේ පෞද්ගලික හැඟීම් නම් යම් අවස්ථාවක අපට මේ රට ආහාරයෙන් ස්වයංපෝෂිත කරන්ට පුළුවන් වුණොත්, අද මේ පැනනැගී තිබෙන ප්‍රශ්න බොහොමයක්ම ඉබේම නිරාකරණය වෙනවාය යන්නයි. එම නිසා තමයි අපේ රජය යුධ හමුදාවේ හෝ වේවා, පොලීසියේ හෝ වේවා, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ වේවා, ඒ සියලු දෙනාගේම සම්පූර්ණ සහයෝගය ලබාගෙන වැඩියෙන් තව අඟලක්වත් වගා කරන්ට බලාපොරොත්තු වෙන්නෙ. රට ආහාරයෙන් ස්වයංපෝෂිත කළොත් මේ දැනට තිබෙන කරදර රාශියකින් නිදහස් වෙන්ට පුළුවන් වෙනවාය කියා අපි කල්පනා කරනව.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සමහරුන් කියනව අපට සැලැස්මවල් නැත කියා. අපට සැලැස්මවල් නැත කියන ඔය මහත්වරුන් කරුණාකර කියන්නකො මෙන්න මේ විධියට කරන්නටය කියා. නිකම්ම සැලැස්මවල් නැත කියනව.

**ලීලාරත්න විජේසිංහ මයා.**
*(திரு. லீலாரத்ன விஜேசிங்ஹ)*
(Mr. Leelaratne Wijesinghe)
කිව්වට අහන්නෙ නැහැ නොවැ.

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)
මෙහෙම තැන්වලදි එපායැ කියන්න. අනේ, අපට මේකට ප්ලෑනක් හදා දෙන්නය කියා බුලත් අරගෙන තමුන්නාන්සෙල පස්සෙ යන්න අපට බැහැ. ඒක අපට මදිකමක් නොවැ. අපි තමුන්නාන්සේලාගෙ පක්ෂයෙ නම් අපි කියනව, ඔය මාර්ගය වැරදියි, මෙන්න හරි මාර්ගය, මේ මාර්ගයෙ යන්නය කියා. ඒක භාර ගන්න එක හෝ භාර නොගන්න එක වෙනම කාරණයක්. තමුන්නාන්සෙල නිකම්ම කියනව අපට සැලැස්මක් නැත කියා. ඒක හරි කථාවක් නොවැ. හැබැයි, තවත් කාරණයක් තිබෙනව. අපි යන මාර්ගය නිවැරදිය කියා අප තුළ හැඟීමක් තිබෙනව.

**ලීලාරත්න විජේසිංහ මයා.**
*(திரு. லீலாரத்ன விஜேசிங்ஹ)*
(Mr. Leelaratne Wijesinghe)
වැරද්ද එතැනයි.

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)
ඒක හරි සෙල්ලමක් නොවැ. වැරදිය කියා දැන දැනත් අපි වැරදි කරන්නෙ නැහැ නොවැ. අප කරන දේ හොඳය කියා හිතාගෙනයි අපි වැඩ කරන්නෙ. ඒක වැරදිය කියා තමුන්නාන්සේලාට පෙනෙනවා නම්, පෙන්වා දෙන්න. මෙන්න මේ මේ අත්හදාබැලීම් කරන්නය කියන්න. නමුත් තමුන්නාන්සේලා එහෙම කියන්නෙ නැහැ. තමුන්නාන්සේලා නිකම් ඉඳගෙන ලුණු නැත, මිරිස් කරලක් නැත, අරක නැත, මේක නැත, කියනව. යටියන්තොට ගරු මන්ත්‍රීතුමත් අපූරු ප්‍රකාශයක් කළා. හාල් පොත් එහෙම ආණ්ඩුවට දුන්නොත් උඹල බලාගෙනයි, අපි බලයට ආවොත් උඹලට හාල් පොත් නැහැ, කියා එතුමා කිව්ව. ඕව සෑහෙන කථාවල්ද ? මෙවැනි අවස්ථාවකදී, උග්‍ර ජාතික ප්‍රශ්නයක් පැන නැගී තිබෙන මෙවැනි අවස්ථාවකදී, අපි කවුරුත් එකතු වී මේ ප්‍රශ්නය නිරාකරණය කර ගැනීමට මහන්සි ගන්නෙ නැත්නම් මොකද වෙන්නෙ ? කවදාද මේ ප්‍රශ්නය නිරාකරණය වෙන්නෙ ? හොඳයි, තමුන්නාන්සේලට බලය ලැබුණය කියමු. ඒත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අතපත්තු මයා.]

ප්‍රශ්නය නිරාකරණය වෙනවද? නැහැ. දැන් මැද කොළඹ තුන්වන ගරු මන්ත්‍රීතුමා (කෙනමන් මයා.) කියාවි ඔව්, අපට බලය ලැබුණොත් කරන හැටි අප දන්න වාය කියා. ඒ අය කරන හැටි අපි දන්නෙ නැහැ. සමහර විට උන්නැහෙලට කරන්ට අමාරු වෙන්නත් පුළුවනි. අපට කරන්ට අමාරු වෙන්නත් පුළුවනි. එය අපි පිළිගන්නවා. ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයක් හැටියට කතා කරන තමුන්නාන්සෙලට මම එකක් කියන්න කැමතියි. මෙම තත්ත්වය යම් විදියකින් පහත බැහැගෙන බැහැගෙන ගොස් අන්තිමට බංකොලොත් වුණාට පසුව තමුන්නාන්සෙලට බාර දුන්නොත් කිසිම අඩමානයක් නැතුව අපටත් වඩා අමාරු තත්ත්වයට පත් වෙනව ඇති.

මා තව කරුණක් දෙකක් ප්‍රකාශ කර මගෙ කතාව අවසාන කරන්ට බලාපොරොත්තු වෙනවා. මුල්කිරිගල ගරු මන්ත්‍රීතුමා (ජෝර්ජ් රාජපක්ෂ මයා.) දැන් පෙනෙන්ට නැතුව වගෙයි. එතුමා හිටියත් නොහිටියත් මම කාටවත් පුද්ගලික චෝදනා ඉදිරිපත් කරන මිනිහෙක් නොවෙයි. මට එහෙම කරන්ට වුවමනාවක් නැහැ. පැඟිරි තෙල් සම්බන්ධයෙන් එතුමා කරුණු ඉදිරිපත් කළා. ඒ සම්බන්ධයෙන් මේ ආණ්ඩුව කිසිම පියවරක් අරගෙන නැති බව කීව. පැඟිරි තෙල් වලට තැනක් ලබා දෙන්ට පුළුවන්ද කියා එතුමා ප්‍රශ්න කළා. පැඟිරි තෙල් ප්‍රශ්නය හම්බන්තොට දිස්ත්‍රික්කයේ මුල්කිරිගල ආසනයට, තිස්සමහාරාම ආසනයට, බෙලිඅත්ත ආසනයට එහෙම සීමාවුණු ප්‍රශ්නයක්. දඹදෙනියෙ ගරු මන්ත්‍රීතුමා (ආර්. ජී. සේනානායක මයා.) 1957 පමණ වෙළඳ ඇමති ධුරය දරද්දී, මේ පැඟිරි වගාවට මොනම ක්‍රමයකින්වත් නියම විධියෙ මිලක් ලබා ගන්ට බැරිය කියා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් තීරණය කොට අයින්කර දමා තිබුණ. නමුත් මේ ආණ්ඩුව ආවට පස්සෙ ප්‍රථම වතාවට මුල්කිරිගල ගරු මන්ත්‍රීතුමා කරුණු ඉදිරිපත් කළ බව මට මතකයි. මාත් ඒ ගැන කථා කළා. අපි දැන් අවුරුදු එක හමාරක පමණ කාලයක සිට මේ ගැන ක්‍රියා මාර්ග අරගෙන තියෙනවා. පැඟිරිතෙල්වලටත් මෙරටින් පිට කරන පුවක් ආදී යම් යම් දේටත් තත්ත්වයක් ලබා දීම පිණිස අපි කල්පනා කරගෙන යනව. ඒ පිළිබඳව කටයුතු කරන වෙළෙන්දන්ට විදේශ විනිමය අතින් ප්‍රමාණවත් සහනයක් ආධාරයක් දී මෙවැනි සුළු කර්මාන්ත නගාලන්නට හැකිද කියා සොයා බලන්ට අපි කල්පනා කර ගෙන සිටිනව. ඒක එක පාරටම කරන්ට පුළුවන් දෙයක් නොවෙයි. ඒ පිළිබඳව කටයුතු කරන වෙළෙන්දන් සමග සාකච්ඡා පවත්වා, මෙම ද්‍රව්‍ය ලබා ගන්නා රටවල් පිළිබඳව කල්පනා කර බලා, සුදුසු පරිදි ක්‍රියා කරන්ට අපි බලාපොරොත්තු වෙනවා. මා සිතනව දැන් ඒ කරුණු කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් වෙලා තිබෙනවාය කියා. අපි සිතනව යම් විධියක සහනයක් ලබා දෙන්ට පුළුවන් වේවිය කියා. නමුත් මට ඒ ගැන පොරොන්දු වෙන්ට බැහැ. අද ලෝක වෙළඳ පොලේ පැඟිරි තෙල් වලට තත්ත්වයක් තිබෙන බවක් පෙනෙන්නට නැති බව කනගාටුවෙන් ප්‍රකාශ කරන්ට සිදු වී තිබෙනව.

මෙම රජය නොයෙකුත් දේ ගැන කතා කරන නමුත් ගොවි කර්මාන්තයෙහි යෙදී සිටින ගොවි මහතුන්ට කිසිම විධියක සහනයක් දෙන්ට බලාපොරොත්තු වන්නේ නැති බව කීප දෙනෙක්ම ප්‍රකාශ කරන්ට යෙදුණ. රබර්වලට මෙහෙම කියනව, තේවලට මෙහෙම කියනව, කුඹුරුවලට මෙහෙම කියනව, අනිකුත් වැවිලිවලට මෙහෙම කියනව, යනාදි වශයෙන් කරුණු ඉදිරිපත් කළා. ඉදිරියෙදී ගෙන යාමට බලාපොරොත්තු වන ණය දීමෙ ක්‍රමය සම්බන්ධයෙනුත් කථා කළා. එහෙත් පසු ගිය අවුරුදු කීපය තුළ සමුපකාර සමිති මගින් ගොවීන්ට දී තිබෙන ණය මුදල් ප්‍රමාණය ඉතා විශාලයි. යම්කිසි ගොවියෙක් සමුපකාර රෙගුලාසිවලට අනුව කලින් ලබා ගෙන තිබෙන ණය මුදල්වලින් කොටසක්වත් ආපසු ගෙවා නැතිනම් නැවත වරක් එම ගොවියාට ණය ලබා ගන්ට බැරි බව තමුන්නාන්සෙල දන්නවා. ඒ අනුව මෙම රජයට මුහුණ දෙන්ට සිදු වුණා ඉතා භයානක තත්ත්වයකට. එම නිසා තමයි, මහජන බැංකුව මගින් ණය දීමට ක්‍රමයක් යෙදුවෙ. සියයට 12ක පොළියක් ගන්නවය කියා බොහොම හයියෙන් කතා කළා. පොළිය බොහොම වැඩියි කීව. සියයට 12 ක් පොළී ගෙවනවය කියන්නෙ, රුපියල් සියයක් ලබා ගත්තොත් මාසෙකට පොළී වශයෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රුපියල් එකක් ගෙවීමයි. මහජන බැංකුවෙ වගකීම පිටයි, දැන් මේක දෙන්නෙ. බැංකුවෙ සල්ලි ආණ්ඩුවෙ සල්ලි වාගෙ නොවෙයි. ආණ්ඩුවෙ සල්ලි ඕනෑ තරම් ආපසු ගන්ට බැරි තත්ත්වයට දී තිබෙන බව පේනව. බැංකුව නීතිවලට එකඟව කටයුතු කරන්ට ඕනෑ. කුමන ක්‍රමයකින් හෝ එතරම් අලාභ විද නොගෙන ටිකක් ප්‍රවේසම් සහිතව කටයුතු කරන්ටයි බලන්නෙ. ඒ ණය මුදල් ලබා ගැනීම සඳහා ඇපකාරයන් ඕනෑ බවක්ද කීව. ඒ ඇප කාරයින් ආදායම් බදු ගෙවන අය වියයුතු බව කීව. එහෙම දෙයක් නැහැ. මේ සල්ලි ඔක්කොම දෙන්නෙ පළාතෙ ඇති සමුපකාර සමිතියටයි. ඒ පළාතේ තිබෙන විවිධ සේවා සමුපකාර සමිතිවලින් තමයි ඒ මුදල් දෙන්නෙ. විවිධ සේවා සමුපකාර සමිතිවල වග කීම උඩයි දෙන්නෙ. ඒ නිසා නියම විධියට කොටස් මුදල් ගෙවූ විවිධ සේවා සමුපකාර සමිතිවල සාමාජික මහතුන්ට ඒ ණය මුදල් ලබා ගැනීමට පුළුවන් වෙනවාට කිසිම අඩමානයක් නැහැ. තමුන්නාන්සේලාට එය සැප්තැම්බර් 1 වෙනිදා පටන් පුළුවන් වේවි. ලබන සැප්තැම්බර් මාසෙ 1 වෙනිදා සිට තමයි ඒ අලුත් ණය දීමේ ක්‍රමය ක්‍රියාත්මක කරන්නෙ. සමුපකාරවලට බැඳී අවුරුදු ගණනක් ණය වී තිබුණත්, ඒ ණය ගැන කල්පනා නොකර අලුතෙන් ණය ගන්නා ක්‍රමයකුයි අපි ඉදිරිපත් කරන්නෙ. අපි කියන්නෙ නැහැ කලින් ණය සම්පූර්ණයෙන්ම කපා දමනවාය කියා. පුළුවන් කමක් තිබෙනවා නම් මහජනයාගෙන් ඒවා අය කර ගැනීමට අපි බලාපොරොත්තු වෙනව. නමුත් බැරි වුණොත් කරන්න දෙයක් නැහැ. කෙසේ වුවත් ඒ ගැන කල්පනා නොකර අලුතෙන් ණය දෙන මේ ක්‍රමය සැප්තැම්බර් 1 වෙනිදා සිට බිහි කිරීමට අපි බලාපොරොත්තු වෙනව.

මම මීට වඩා කථා කිරීමට බලාපොරොත්තු වන්නෙ නැහැ. මම මුලින් කිව්ව වාගේ සියලු දෙනාටම සතුටු වෙන්න පුළුවන් කාරණා රාජාසන කථාවෙ ඇතුළත් වී තිබෙනව. විශේෂයෙන් ආහාර වගාව ගැන වැඩි සැලකිල්ලක් දක්වා තිබෙනව. යටියන්තොට ගරු මන්ත්‍රීතුමා කථාව පටන් ගත්තෙ මේක පුස්සක්ය, කථා කරන්න දෙයක් නැත කියමිනුයි. උන්නැහේ වැඩිය කථා කෙළෙත් නැහැ; මම හිතන්නෙ පුස්සක් නිසා වෙන්න ඇති. එහෙත් මේ ගැන ගුණදොස් විවේචන කීපයක්ම ඉදිරිපත් වී තිබෙනව. කල්පනාවට ගත යුතු කාරණාත් තිබෙනව. ඒ ඇරෙන්න අතිරේක දේවල් බොහෝම කියවුණා. පානදුරේ ගරු මන්ත්‍රීතුමාත් යම් යම් කරුණු ඉදිරිපත් කළා. ඒ සියල්ලටම උත්තර දෙන්න පුළුවන් කමක් නැහැ. මම ඒව ගැන දන්නෙත් නැහැ. විශේෂයෙන් මම එතුමාට එක් කාරණයක් කියන්න කැමතියි. දෙහිවල-ගල්කිස්සෙ ගරු මන්ත්‍රීතුමා කළ කථාව සම්බන්ධයෙන් එතුමාට නියම අවබෝධයක් ලැබී නැහැ. තිස්සමහාරාමෙ මන්ත්‍රීතුමාට කාර් එකක් ලැබුණෙ කොහොමද කියා පැන නැඟී තිබුණ ප්‍රශ්නයකට අවධානය යොමු කළ දෙහිවල-ගල්කිස්සෙ මන්ත්‍රීතුමා තමන්ගෙ කථාවෙදි කිව්ව, මමත් රාජ්‍ය ඇමතිතුමාට අභියෝගයක් කරනවාය, අන්න ඒකටත් උත්තර දෙන්නය කියා. මමත් ඒ අවස්ථාවෙදි ළඟ සිටි නිසා මම දන්නව. එසේ නැතිව දෙහිවල-ගල්කිස්සෙ ගරු මන්ත්‍රීතුමා මෙන්න මේ විධියේ ප්‍රශ්නයක් ඇසුවාය කියන අදහස පානදුරේ මන්ත්‍රීතුමාට ලැබී තිබෙන්නෙ වැරදි ආරංචියකින්. කාරණය සිද්ධ වුණේ මෙහෙමයි. තිස්සමහාරාමෙ මන්ත්‍රීතුමාට කාර් එකක් දුන්නෙ කොහොමද කියන එක ගැන දෙහිවල-ගල්කිස්සෙ මන්ත්‍රීතුමාට උත්තර දෙන්න බැහැ. ඒ නිසා උන්නැහේ කිව්වා, මමත් අභියෝගයක් කරනවාය, අහවල් මන්ත්‍රීතුමාට මුද්‍රණ යන්ත්‍රයක් ලැබුණෙ කොහොමද කියන්නය කියා. එතකොට මම කිව්ව ඒ දෙකම ගැන ප්‍රශ්න කරන්න දෙයක් නැත, මුද්‍රණ යන්ත්‍රයක් ලබා ගැනීමට යටියන්තොට ගරු මන්ත්‍රීතුමාට බලය දුන්නෙත් අපේ අමාත්‍යාංශයෙන්ය, කාර් එකක් ලබා ගැනීමට තිස්සමහාරාමෙ ගරු මන්ත්‍රීතුමාට බලය දුන්නෙත් අපේ අමාත්‍යාංශයෙන්ය කියා. එම නිසා චෝදනාවක් සඳහා චෝදනාවක් ඉදිරිපත් කළා නොවෙයි. සාමාන්‍ය වශයෙන් ඒ මන්ත්‍රීතුමා කථා කරගෙන යන අවස්ථාවෙදි කිව්ව, අර ඇසූ ප්‍රශ්නය අනුව මමත් රාජ්‍ය ඇමතිතුමාගෙන් එවැනිම ප්‍රශ්නයක් අසනවාය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අතපත්තු මයා.]

කියා. මම හිතන්නෙ නැහැ, ඒක වැරද් දක්ය කියා. පානදුරේ මන්ත්‍රීතුමා ඒ ගැන ඒ තරම් උරණ වෙන්න ඕනෑය කියා මම කල්පනා කරන්නෙ නැහැ.

මගේ කථාවට සවන් දී සිටි තමුන් නාන්සේලාට මගේ අවංක ආදර ස්තු තිය පුදකරමින් මම නවතිනව.

අ. භා. 3.39

කෙනමන් මයා.

(திரு. கெனமன்)

(Mr. Keuneman)

Mr. Deputy Chairman, the hon. Parliamentary Secretary to the Minister of State has just given us an impassioned lecture on Buddhism, the Buddhist virtues and what he considers to be the Buddhist code of conduct. I do not intend to discuss all these matters, nor do I consider myself competent to do so. All I can say is that I deeply regret that so much eloquence should have been wasted on a Throne Speech which is so significantly lacking in the very virtues which the hon. Parliamentary Secretary extolled. The other matters to which the hon. Parliamentary Secretary referred, namely, the more mundane matters such as food shortages and the iniquitous 12 per cent. charge from peasants in the matter of Government loans, I shall deal with at the appropriate stage of my speech.

Mr. Deputy Chairman, as time is limited, I shall confine my remarks to the first and second Opposition amendments. And even in the matter of the first amendment I shall only deal with one or two main questions that are referred to in that omnibus amendment.

First of all, I should like to say a few words about our second amendment. You will see that our second amendment " calls on the Government to suspend diplomatic and other relations between Ceylon and Israel until such time as the Government of Israel withdraws its armed forces from the territories in the U.A.R., Syria and Jordan which they occupied by force after 4th June 1967. "

I do not think there is any point in a lengthy analysis of the causes and results of the recent War in the Middle East. There is no doubt whatsoever in the mind of any impartial person that Israel was the aggressor who started this war. In fact, Israel itself does not pretend otherwise. It does not hide the fact that it struck the first, sudden, treacherous blow. Israel's leaders boast about, and gloat over, this revolting fact. The United Nations has now imposed a tenuous ceasefire. But as a result of its aggression Israeli troops continue to occupy territories in the U.A.R., Jordan and Syria that are four times the size of Israel itself. The Israeli Foreign Minister, Mr. Eban, has arrogantly declared that even if all the member-states of the United Nations call upon Israel to withdraw from the territories that it has occupied by force, Israel will not do so. Israel continues to defy even the Resolution on Jerusalem that was adopted by the United Nations with the required two-thirds majority of votes.

In view of all this, the question arises, what should and can we, that is, the Government and the people of Ceylon, do in such a situation ? We of the Opposition have made a concrete proposal to the Government in our second amendment.

We are glad, Sir, that at the recent special emergency session of the United Nations General Assembly the Government adopted the position that the Opposition urged it to take up, and supported a resolution demanding that Israel should unconditionally withdraw its armed forces to the June 4th armistice line.

Of course, the Government lacked the courage to call Israel the aggressor. I remember the present Prime Minister, when he was Leader of the Opposition, declaring proudly that the United National Party was never afraid to brand anybody as an aggressor if they felt that that was the case. He branded China as an

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

aggressor and the U.S.S.R. as an aggressor and a number of other similar countries too. But in the matter of the Israeli-Arab conflict, we do not know from the Government who the aggressor is. Apparently, since they changed sides in this House they have lost the capacity to detect an aggressor. Anyway, I do not know how they can call on Israel to withdraw from the territories they have occupied by force and yet say that Israel is not the aggressor. Nevertheless, I am not going into that argument because we do not intend in this matter to try and score points off the Government. We are trying to urge a certain course of action bilaterally on behalf of both sides of this House, so that Ceylon can give such moral and political support as is possible to the Arab nations in the plight in which they are today as a result of the Israeli aggression.

As the voting at the United Nations showed, although the resolution demanding the unconditional withdrawal of Israeli armed forces to the June 4th armistice line did not get a two-thirds majority, it nevertheless commanded the support of the majority of the member states of the United Nations. In other words, the opinion of a vast majority of states, including apparently the opinion of the Government of Ceylon, is that Israel's armed forces should vacate the territory of the Arab states occupied by them before any other questions of a settlement of the Middle-East problem can be considered. We agree with that position. In fact, Mr. Maithripala Senanayeke who was then acting as Leader of the S.L.F.P., and Dr. Colvin R. de Silva and myself addressed a letter to the Hon. Prime Minister before he went abroad asking him to instruct our representative in the United Nations to take up such a position, and we are glad that the Hon. Prime Minister did take up that position.

But our responsibility to act in this matter does not cease merely because a resolution which we supported in the United Nations did not get the necessary two-thirds majority. The resolution we supported was sabotaged by the United States of America. But it is wrong to think that we have done our duty and there is no more that we or countries like ours can do in this situation. It would be wrong to think that this is a matter in which only the United Nations and the big powers can act. It is the duty of countries which belong to the so-called Third World to do whatever is possible to assist the Arab nations in their plight and to see that Israel does not profit from its aggression. It is particularly necessary for all states which supported the resolution in the United Nations calling upon Israel to withdraw to the June 4th armistice lines to take whatever concrete action lies in their power, both individually and collectively, to bring pressure to bear on the Government of Israel to vacate its aggression and to withdraw its armed forces.

If this Government is serious and sincere about what it spoke and voted for in the United Nations General Assembly, then it should follow this up with the suspension of all relations with Israel until that Government bows to world opinion and vacates its aggression.

This action on our part can serve as an example to other governments. That is why we of the Opposition ask the Government to take such a course of action. We do not lightly call for the suspension of diplomatic relations with other nations. We know that this is a serious matter. But in this case, where there has been a serious aggression by Israel against friendly Arab States, an aggression designed to further the aims of Anglo-American imperialism, to suppress the national liberation movement in the Arab countries and to continue keeping the Arab world as an area of exploitation of foreign oil monopolies, when such a situation exists, then there is need for us fearlessly to take the step of suspending all

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කෙනමන් මයා.]

relations between Ceylon and Israel until Israel is prepared to bow to world opinion.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.** (දොම්පෙ)

*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க—தொம்பே)*

(Mr. F. R. Dias Bandaranaike—Dompe)

And until Mr. A. C. S. Hameed goes as our representative to that country!

**ඩී. පී. ආර්. වීරසේකර මයා.** (දෙහිඕවිට)

*(திரு. டீ. பீ. ஆர். வீரசேக்கர—தெகியோவிற்ற)*

(Mr. D. P. R. Weerasekera—Dehiowita)

Hope it is not Mr. Ameer.

**කෙනමන් මයා.**

*(திரு. கெனமன்)*

(Mr. Keuneman)

Israel has done things to deserve even that misfortune being inflicted on it!

The need for action such as we propose is both general and specific. In general Israel must not be allowed to profit either territorially or otherwise from her aggression. It is within our power to take this step. Let us do so.

Secondly, it is in our own interests that a just and stable situation should prevail in the Middle-East, and this can only be brought about if the Government of Israel is taught that it should cease to act as a gendarme of Anglo-American imperialism in the Middle-East.

The continued closure of the Suez Canal is a case in point. Our economic position is undoubtedly affected and will be affected more in the future with the increase in freight rates and the re-routing of ships round the Cape as a result of the closure of the Suez Canal. But how can we reasonably expect the U.A.R. Government to re-open the Suez Canal as long as Israeli troops are allowed to continue to occupy U.A.R. territory along one side of this canal?

I see that certain of our newspapers are appealing to the Government of the U.A.R. to open the Suez Canal. They should demand that the Government of Israel get out of U.A.R. territory and restore the sovereign rights of the Government of the U.A.R. over the Suez Canal.

It is for all these reasons that we ask the House to adopt, and the Government to act upon, the second amendment and to suspend diplomatic and other relations between Ceylon and Israel until such time as the Government of Israel withdraws its armed forces to the 4th of June 1967 armistice lines. We ask Members on the other side of the House to join us in this matter. We have deliberately not made this a party matter or a matter of confidence.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**

*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*

(Mr. F. R. Dias Bandaranaike)

Especially the hon. Second Member for Akurana and the Hon. Miniter of Labour, Employment and Housing.

**කෙනමන් මයා.**

*(திரு. கெனமன்)*

(Mr. Keuneman)

We have our differences with the Hon. Minister of Labour, Employment and Housing over his attitude to the whole Arab world. But I am glad to see that some back-benchers of the Government, including you, Sir, expressed in a forthright manner their support for the Arab countries.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**

*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*

(Mr. F. R. Dias Bandaranaike)

Let us have a *Jehad*.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කෙනමන් මයා.
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)

We would like this amendment of ours to be carried as a bi-partisan matter. Incidentally, the Government is appealing to us for our co-operation. We appeal to them for their co-operation on this amendment.

Having dealt with the second amendment, let me spend a few moments on our first and main amendment.

Mr. Deputy Chairman, it is not uncommon for Governments in this country to run out of gas in mid-term. But this Government is more truly, firmly and permanently stuck in the mud than any of its predecessors. This unfortunate fact is most strikingly illustrated in the empty and incoherent Throne Speech that we had to listen to this year.

Even the friends of the Government, the monopoly press, have not been able to hide their alarm and dismay over this apology for a Throne Speech. All of them have asked how they can appeal to the people to have confidence in the Government when the Government makes it so obvious that it has no confidence in itself.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

They are having their afternoon nap.

කෙනමන් මයා.
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)

Some of them have even told the Government bluntly that it is on its way out unless it can do better than this.

ලෙස්ලි ගුණවර්ධන මයා.
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

It looks as if it has already gone out.

කෙනමන් මයා.
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)

I notice that most of the Government have no interest in this Throne Speech. If the Government has no interest in its own Speech, how on earth can it ask us to be interested in it ? We are only interested in the catastrophe that faces the country as a result of the policy of the hon. Gentlemen opposite.

It is to the lasting credit of the Hon. Prime Minister that he has been able to bring about an understanding among all the communities living in this country. Today we are proud to have a Prime Minister who was bold enough to state at a meeting of thousands of harbour workers that his happiest days will be the day on which every member of every community in this country could call Ceylon his country with a sense of pride and happiness. That understanding was something that was denied to certain communities during the S. L. F. P. regime.

The hon. Members of the Opposition are complaining about the rice cut. They strike a new low in irresponsibility when they so complain. It was not a new problem that suddenly cropped up after the National Government came into being. When the U. N. P. Government handed over the reins of office to the late Mr. S. W. R. D. Bandaranaike's Government in 1956 there were foreign exchange reserves to the tune of about Rs. 1,200 million, but today what is the position? Or, what was the position in 1965 when they handed over the reins of office to the National Government? We had only Rs. 300 million by way of foreign reserves. This situation was brought about due to the senseless spending by a set of senseless people. In fact, if the S. L. F. P. Government did not inform the people of the true state of affairs as far as the economy of the country was concerned, they cannot now blame the National Government. It was entirely the fault of the S. L. F. P. Government if they did not take corrective measures, if they did not take suitable steps to arrest or prevent the drain of foreign exchange out of this country.

The one man among the S. L. F. Pers who understood the problem was Mr. Felix Dias Bandaranaike. As Minister of Finance, he sought to introduce this same measure in 1962 but it was vehemently resisted by most of the Members of the S. L. F. P. Why? Not because they had the interest of the Government at heart but because they wanted to safeguard their seats at the next elections. And the Finance Minister had to quit office, and he vowed that he would never return even to plant grass. As if, to meet the challenge of her young nephew never to come back even to plant grass, Mrs. Bandaranaike made Mr. Felix Dias Bandaranaike the Minister of Agriculture later.

The hon. Third Member for Colombo Central says that this measure was introduced by the National Government at the dictation of the World Bank. I must tell my hon. Friend that if there was anything that dictated the introduction

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

of this measure to the National Government it was our conscience and nothing else. I must tell him that we, the National Government, take full responsibility for the step that we took last year to cut the rice ration by one measure. It was a step taken to conserve our foreign exchange position. But this Government is not unmindful of the difficulties that the people will have to face and that is why it took the other bold step of giving one measure of rice free to every citizen of this country.

In South India, just across the Palk Strait, Members of the Indian Parliament are asking their Prime Minister and their Government, "If Ceylon can give a free measure of rice to every citizen of Ceylon, why cannot the Indian Government and the Indian Prime Minister do it ?" Ceylon, in other words, is being held out as an example to the rest of the world as a country which gives a free measure of rice to every citizen.

ගරු මන්ත්‍රීවරයෙක්
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

At the point of the gun ?

මුස්තාෆා මයා.
*(ஜனாப் முஸ்தபா)*
(Mr. Mustapha)

That is a question that is often being repeated. I shall explain to you clearly and categorically. I will not run away. I have sufficient time to answer that question. Hon. Members by asking this question are not going to fool anybody. In fact, they have asked this question at every by-election, on every conceivable platform, not in the manner they are asking it today here but in the presence of the real umpires of this issue, in front of the people, and they have listened to the *pros* and *cons* of this measure and they have given their verdict. Really that is why so soon after the Throne Speech the people of Negombo returned their verdict, as recently as the 13th of this month. So, there is no need for this debate on the Throne Speech a second time.

What was the verdict of the people of Negombo ? This was one question that the Opposition was hinting at on every platform. Mr. Maithripala Senanayake has asked this question a thousand times from the voters of Negombo, but all the people cannot be fooled all the time. The people know the real reason why this measure had been introduced. The Government must take pride in the fact that it has prevented a situation whereby hundreds of people might have died of starvation in this country. It is not something that is impossible. It is happening in other parts of the world. It is happening in South India. The Government took every responsibility, it takes full responsibility for the step that it had taken.

My hon. Friends opposite are boasting about the industrial development that their Government was responsible for. In fact, the Fair Leader of the Opposition had stated at election meetings in Negombo that the United National Party Government is opening the industrial ventures for which their Government was responsible. In fact, I would like to state what this industrial development had been. Is it not time that we reviewed the industrial policy in this country ? To drive home my point I would just refer to one or two examples.

For example, people are now saying that table fans and pedestal fans are being manufactured in Ceylon. Every screw and every blade in that fan is being imported into this country from other countries. Now all that we are doing is to import all the component parts and assemble the article here. But what is the price of this industrial development ? A fan which can be bought in any other country for Rs. 125 is being sold today in Ceylon for Rs. 550. That is the price that we are paying for the industrial development which was most senselessly and most foolishly started by the previous Government. We have no business in a country like ours to start an industry for which raw materials are not available. If you start a paper factory it

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

will pay dividends. We can reach self-sufficiency in Ceylon and we can export and earn foreign exchange. You can start another cement factory for which any amount of raw material is available. And we are happy that a second cement factory had been started in Galle.

Let us for instance take our sugar industry, a subject on which I have spoken a number of times because I happen to come from an area where there is a sugar factory, that is in the Gal Oya Valley. We did get a sugar factory not because we wanted to manufacture sugar—we are growing sugar-cane merely to feed the factory—but only because some country had been able to give as aid to this country an unwanted sugar factory. It is said that in Hingurana they have to grow sugar-cane on 16,000 acres to feed this factory. What is happening as a result? Every year from 1961 the Government has been losing seven to eight million rupees on the manufacture of sugar, and in addition about ten thousand acres of fertile land which is most suitable for paddy production is being wasted in growing sugar-cane. In fact, it is the opinion of the experts that this land is not suitable for sugar-cane but still the Government persists in growing it because at all costs it must keep feeding this factory.

The recent report of the Manager on the Sugar Industry states that they have lost fifty million rupees for the last seven years. How long can this Government or this country bear this burden? Our Government will not rush in to start this kind of industry.

They are asking, what has this Government been doing in the field of industries? I must tell them that our intention is to reach self-sufficiency in the matter of clothing. Sir, the hon. Members were profuse in their praise for the Hon. Minister of Home Affairs for the seven hand-looms each electorate got and every-one of them is producing thousands of yards of cloth.

I feel it is high time that some restriction is imposed on the importation of cloth, and on people going across to India and bringing in large numbers of sarees. In fact, unless we give incentives to the local textile producers we cannot expect much achievement from this industry. Under the guise of developing this industry what are some of these private businessmen doing in Colombo? There is a great deal of racketeering in the matter of exchange quotas given to them. We are giving all sorts of concessions today to some of these so-called industrialists in order that they may develop industries, but with what result? Look at the razor blades that are manufactured locally! We can in fact import better quality blades from other countries at half the price that we pay for them today. Surely, this is not the way to develop industries!

I must now refer to certain other points raised by the hon. Members of the Opposition. One matter that was raised is the place that this Government is going to give to English in the educational curriculum of this country. There were two virulent critics on the question of English being given a place in the educational curriculum of this country—the hon. Member for Dambulla (Mr. T. B. Tennekoon) and the hon. Member for Walapane (Mr. T. B. M. Herath). They spoke on this question at length and said that the National Government is going to perpetuate something that is unholy to the people of this country. I would like to tell them that it is well and good if we are going to confine ourselves within the shores of Ceylon. The moment you get into a plane to go even to India people who do not know English will not be able to fill the embarkation form given to them in the plane. Today the whole world has shrunk, and no country can live in splendid isolation. My hon. Friends from Dambulla and Walapane—I have the greatest regard for

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මුස්තාෆ්පා මයා.]

them ; I have nothing against them ; in fact, I admire the fervour with which they make their speeches in Sinhalese. But can we in the twentieth century manage without a knowledge of English ? When I say that, I am not saying that we must all speak English. What I mean is, can we manage without a knowledge of an international language like English—a language spoken throughout the world ? If we do not like English because at one stage we were dominated by the English, by all means get our future generations to study French or German. It is only when we have a knowledge of such an international language that we can make a useful contribution in any international debate. Those of us who have been abroad know the extent to which we can use our national languages. Therefore, it is not something to feel ashamed that we should study English, and for that purpose make English compulsory in the educational curriculum. I must on this occasion congratulate the Hon. Minister of Education for the bold step he has taken to give English its correct place in the scheme of things.

I must say a word also about the co-operative movement and the police force. I have read speeches made by the hon. Third Member for Colombo Central as far back as 1961 where he has persistently demanded the appointment of a commision to go into the activities of the police. They have been complaining of assaults by police, citing instance after instance in this House and demanding a commission. Today this Government has appointed a commission, but the hon. Third Member for Colombo Central did not utter a word of praise on that matter.

The hon. Member for Panadura suggested the appointment of a commission to go into the working of the co-operative movement in this country. Nobody will deny that the co-operative movement is sick. It has to be rid of its ailments if it is to become a virile medium for the economic development of this country. Today, if there are 1000 co-operative societies, 999 of them are corrupt, because the Co-operative Ordinance under which these societies are registered and function is outmoded. It is a piece of legislation that was passed 50 years ago, and was really not intended to cover the sphere of work which the co-operative movement or the co-operative societies are today called upon to cover. With the law as it is these co-operative societies cannot be reformed, and that is why when a society is corrupt, when the committee is corrupt, when there are all sorts of malpractices, it is impossible to take any steps against the manager or the committee. Anybody who has read the Ordinance will agree with me that that is so. And that is the reason why at the unanimous request of the Government Parliamentary Group, the Minister of Agriculture and Food has been asked to dissolve the co-operative societies that are corrupt and are not fulfilling the functions which they were intended to serve.

I myself requested the Hon. Minister of Agriculture and Food to dissolve the co-operative union at Kalmunai. No doubt, they were elected by certain societies, but those societies themselves are corrupt. Here is a society whose committee bought a lorry for Rs. 40,000. Within two months they sent it to a garage and spent Rs. 10,000 on repairs, and in the third month they sold it for Rs. 25,000. Nobody, not even the hon. Member for Panadura (Mr. Leslie Goonewardene), not even the hon. Third Member for Colombo Central, would say that the Minister was wrong in seeing to it that such a society was dissolved.

Soon after the Kalmunai Town Council election, the co-operative store which was housed in one building was shifted to the other store. The goods which were housed in one

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

building were put into two, and double rent was paid because the new man happened to be a supporter of the president. These are matters which cannot be corrected under the provisions of the Co-operative Ordinance and that is why the Hon. Minister of Agriculture, with the Hon. Prime Minister's approval, has acceded to the request of the Government Group that corrupt societies be dissolved. I do not think responsible Members of the Opposition would grouse that. In fact, as was stated in the national press a few days ago, this is one of the reasons why the Emergency is being continued. If the Emergency is lifted, the order for dissolution of these co-operative unions which had been made at the request of various Members of Parliament, various organizations, rural development societies and responsible citizens of various areas, would become null and void. Until legislation is introduced and until the Bill becomes law, the Emergency will be continued.

But I would like to ask hon. Members of the Opposition what they mean by saying that there is peace at the point of the gun. Are they serious as to what they are talking about ? Can any hon. Member of this House say that there is any form of harassment, that anything extraordinary is happening because of the Emergency being in force ? Nobody can say that. In fact, if the Emergency is in force, it is only nominally so. The Emergency is there to make valid some of the orders that have been passed by the various Ministers under the Emergency and hon. Members can rest assured that this Government can go on as peacefully as it is going on now even without an Emergency. The day the necessary legislation is introduced, the Government will not hesitate to lift the Emergency.

I do not want to take much of the time of the House, but in conclusion I must say this : I said at the commencement of my speech that a Throne Speech is somewhat redundant in the scheme of things in Ceylon. I said that the tree that is in full bloom on English soil is withering away an our soil. Everybody is agreed that we must have a new Constutution, that we must modify the present constitution. I am not saying that the form of parliamentary democracy we are following in this country is wrong. All that I am saying is that parliamentary democracy must be modified in such a manner as to suit local conditions, to suit the genius of our people. This is an additional reason why the National Government has appointed a Committee consisting of Members of both Houses, experienced parliamentarians, to revise the Constitution. The terms of reference have been given to them. But what happened ? The late Mr. Bandaranaike in 1956 tried to achieve the same purpose, some said. For the sake of arguing, for the sake of putting in an obstacle, what is the attitude of the Opposition ? They are saying that a new Constitution is needed. If you look at the terms of reference of the Select Committee and the provisions they wanted incorporated in a new Constitution, you will find that there is hardly a difference. If they all get together they can modify the present Constitution in such a manner that it would look like an entirely new Constitution. But what do they seek to do ? They want to put obstacles in the way. They are not serious about the scrapping of the present Constitution. They want the same old thing to continue. Otherwise they should have been very happy to join in the Select Committee to modify the present Constitution. That is why in Ceylon the party system has become an absolute farce. The parties criticize each other depending on the side on which they are sitting. In fact that the hon. Third Member for Colombo Central is an example in point. In 1961 he criticized the S. L. F. P. Government for the language policy it adopted. He had said that the S. L. F. P. was only concerned about the Sinhala

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

only Act. But the policy of the late Mr. Bandaranaike had been, "not only Sinhala but Tamil also." And that is why the late Mr. Bandaranaike, within one year of the introduction of the Official Language Act introduced also the Tamil Language (Special Provisions) Act. The hon. Member was criticizing the S. L. F. P. in 1962 precisely because they did not introduce the regulations contemplated under the Tamil Language (Special Provision) Act. But this Government wanted to honour the language policy of the country, because they wanted to fulfil the promise contained in their own manifesto—it is also in accord with the policy of the S. L. F. P., because this Government has done what the S. L. F. P. had failed to do and for which that hon. Member criticized the S. L. F. P. Government—he is making a regular attack on the United National Party and is trying to drive a wedge between this party and the other parties of the National Government because he feels this combination very inconvenient to them.

My Friends on the other side must realize that in the final analysis what we all want is peace and prosperity for our people. We may speak from this side today. We have sat on that side too. That is why I appeal to hon. Members in the Opposition not to view some of these questions with just one motive, that is, to score a debating point.

The hon. Member who preceded me was saying that we must restore the cut in the rice ration. Did he understand the implications of what he was saying? What is the point in repeating like a parrot or mouthing these meaningless requests? This Government is fully conscious of its obligations to the people of this country. Never in the history of this country has a Prime Minister gone to every nook and corner of this country listening for himself and asking the peasants what their difficulties are. The Prime Minister of the present Government is doing that, and can any member conscientiously say that this Government or the Prime Minister of this Government is not serious or sincere about producing more food? Why is he doing that? It is because we must expand production and produce more food so that we shall have plenty of food-stuffs to go round. The hon. Members must be happy that there is a marked increase in the production of paddy. I am not saying that everything is all right. After all the Hon. Minister of Land is a human being. My honest feeling is that he has been saddled with far too many responsibilities which are a bit too much for a single individual. Actually in areas such as in the Amparai district the people are very greateful that the Prime Minister had gone to that district to listen to the grievances of the poor farmers. I am not as optimistic as the hon. new Member for Negombo (Mr. Denzil Fernando). I do not say that we will be self-sufficient in food by 1970 or that we will be exporting food to other countries by then. But if, by this determined effort on the part of this Government and its leader, we produce more food and achieve a doegree of self-sufficiency in food, it will surely inure to the benefit of the people of this country. Consider the saving in foreign exchange as a result of being able to discontinue all imports of food. Foreign exchange that is expended on the import of food today is in the region of Rs. 500 million. Can we not utilize that money for the economic development of our country?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නියෝජ්‍ය කථානායකතුමා**

*(உப சபாநாயகர் அவர்கள்)*

(Mr. Deputy Speaker)

The hon. Parliamentary Secretary, in his enthusiasm, has taken 15 minutes more than the time allotted to him.

**මුස්තාෆා මයා.**

*(ஜனாப் முஸ்தபா)*

(Mr. Mustapha)

I will be taking only a few minutes more, Sir.

I am not casting aspersions on previous governments. I am personally aware that the S.L.F.P. Government in its own way tried its best to tackle this problem. They put out the Ten-Year Plan, introduced in this House, I believe, by the then Minister of Finance, Mr. Stanley de Zoysa, with a lot of fanfare. He broke it up into several short-term programmes. But we must realize that plans alone never produced food. Along with plans, the people must be enthused into launching on a determined effort to produce more and more food, and that is what this Government is hoping to do.

And if our efforts are crowned with success I can give this assurance on behalf of the Government: this Government will not hesitate to give free not one measure, but both measures.

I may tell this House that this step of giving only one measure, and that free, on the ration, was not taken by this Government against the people of this country as such. It was a step taken with the greatest reluctance and after long hours of discussion and debate by the Government Group.

And the Prime Minister himself made it quite clear that if the rice distributed on the ration is to be reduced to one measure, then that measure must be given free to the people. We in the Government feel for the masses just as you in the Opposition feel for them.



I do not intend to take your time any longer, Sir. I am sorry I have taken a little more than the time allotted to me. I am thankful to the hon. Members and you, Sir, for giving me a patient hearing.

අ. භා. 6.47

**රාජා වෙලේගම මයා.**

*(திரு. ராஜா வெலேகம)*

(Mr. Raja Welegama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ මිත්‍ර සමාජ සේවා කටයුතු පිළිබඳ ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගේ කථාවට පසුව මට කථා කරන්ට අවසථාවක් ලැබීම සම්බන්ධයෙන් මා ඉතා සන්තෝෂ වෙනව. මම විශේෂයෙන් මේ අවස්ථාවේදී එතුමා විසින් ඉදිරිපත්කරන ලද කරුණු කීපයකට පිළිතුරු වශයෙන් වචනයක් දෙකක් කථා කිරීමටයි, අදහස් කරන්නෙ. එතුමා කිව්ව, ආණ්ඩු පක්ෂයෙනුත් විරුද්ධ පාර්ශ්වයෙනුත් මේ විවාදය ගැන කළ කථාවලින් පිළිබිඹු වෙන්නෙ ඉතාම ඇලි මැලි දුර්වල ගතියක්ය කියා. ඊට හේතුව ආණ්ඩු පක්ෂයේවත්, විරුද්ධ පාර්ශ්වයේවත් වරද නොව මේ රාජාසන කථාවම හිස් බොළඳ ප්‍රකාශනයක් වීමය කියන ඒකයි, මගේ අදහස. අළුත් අදහස් ඇති ප්‍රාණවත් රාජාසන කථාවක් ඉදිරිපත් වුණා නම් මේ විවාදය බොහොම ප්‍රාණවත් හා රසවත් එකක් වෙනවාට කිසිම සැකයක් නැහැ. මේ විවාදයේදී දැක්වෙන හිස් ගතිය, බොල් ගතිය, අද රජය ලබා තිබෙන දේශපාලන බංකොලොත් භාවය නිසා ඇති වී තිබෙන්නක් බව මා මතක් කරනව.

ඊළඟට එතුමා කිව්ව, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මාක්ස්වාදී පක්ෂ සමග සහයෝගයෙන් කටයුතු කිරීම ලොකුම වරදක්ය, අද ලොකුම හිසරදයක්ව තිබෙන්නේ ඒ කාරණයය කියා. එතුමා තව දුරටත් කිව්ව, වාමාංශික පක්ෂ, විශේෂයෙන් කොමියුනිස්ට් පක්ෂය වැනි පක්ෂ දැනට අවුරුදු ගණනකට පෙර දැරූ අදහස් නොවේය අද දරන්නෙ කියා. ඒ සම්බන්ධයෙන් මට කියන්ට තිබෙන්නෙ, මේ හැම දේශපාලන පක්ෂයක්ම රටක පවතින්නෙ මහජනයා වෙනුවෙන් නිසා ඕනෑම දේශපාලන පක්ෂයක් හෝ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රාජා වෙලේගම මයා.]

දේශපාලනඥයෙක් හෝ කලින් කලට තමන් හෝ තම පක්ෂය යම් යම් කරුණු සම්බන්ධයෙන් දක්වන අදහස් මත ආදිය සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඕනෑම රටක පවතින න්‍යායයක් බවයි. මේ සම්බන්ධයෙන් නිදර්ශන සොයන්ට මා වැඩි දුර යන්ට ඕනෑ නැහැ. ඒ කථාව පැවැත්වූ ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා ගැනම කල්පනා කර බැලුවත් පෙනී යනවා, නොයෙක් නොයෙක් අවස්ථාවලදී එතුමාගේ දේශපාලන අදහස් මත ආදිය වෙනස් වී සංශෝධනය වී තිබෙන බව. ඒ නිසා මා හිතන්නෙ නැහැ, යම්කිසි දේශපාලනඥයෙක් හෝ යම්කිසි දේශපාලන පක්ෂයක් හෝ හැමදාම එකම අදහසක් දරා සිටින්න ඕනෑ කියන එතුමාගේ අදහස හරි කියා. කලින් කලට පක්ෂ වශයෙනුත් පුද්ගලයන් වශයෙනුත් තම දේශපාලන මත වෙනස් කරන්ට සිද්ධ වෙනව.

එතුමා තවත් පුදුම උත්තරයක් දුන්න, හදිසි අවස්ථාව පවත්වාගෙන යාම සම්බන්ධයෙන්. එතුමා සඳහන් කළා, මේ හදිසි අවස්ථාව පවත්වාගෙන යන්නෙ සමුපකාර සමිති විසුරුවා හැරීම ආදි කටයුතුවලටය කියා. මේ වගේ වගකිය යුතු පාර්ලිමේන්තු ලේකම්වරයෙකු මේ ගරු සභාවේදී එබඳු ප්‍රකාශයක් කිරීම සම්බන්ධයෙන් මා පුදුම වෙනව. එබඳු වැඩ පිළිවෙළක් ක්‍රියාවේ යෙදීමේ අවශ්‍යතාවක් රජයට තිබෙනව නම් හදිසි අවස්ථාව පවත්වාගෙන යමින් ඒවා ක්‍රියාත්මක කිරීම නොවෙයි කරන්ට තිබෙන්නෙ. එතුමන්ලා දන්න පරිදි, සමුපකාර ආඥා පනත සංශෝධනය කිරීමට විශේෂ සංශෝධන පනතක් ගෙනැවිත් සම්මත කරගෙන ඒ කටයුත්ත කිරීමයි, කළ යුතුව තිබෙන්නෙ. ඒ විධියේ පසුබිමක් නැති පිළිතුරක් සමාජසේවා කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමා විසින් දීම සම්බන්ධයෙන් මා කනගාටු වෙනව. මේ රජය අද දේශපාලන අදහස් අතින් ඔය තරම් බංකොලොත් භාවයට පත් වී සිටිනව නම් ඒ සම්බන්ධයෙන් විරුද්ධ පාර්ශ්වයේ අපගේ කනගාටුව ප්‍රකාශ කරන්ට සිදු වී තිබෙනව.

**මුස්තාෆා මයා.**
*(ஜனாப் முஸ்தபா)*
(Mr. Mustapha)

On a matter of personal explanation, Sir; I did not say that the Emergency is being continued in order to dissolve co-operative societies. What I said was that according to the existing law, if the Emergency is lifted, all orders made by the Hon. Minister of Agriculture would become null and void. Until the necessary legislation is brought the Emergency has to continue. But I can assure the hon. Member that it will be only for a very short time.

**රාජා වෙලේගම මයා.**
*(திரு. ராஜா வெலேகம)*
(Mr. Raja Welegama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තු ලේකම්තුමාගෙ ප්‍රකාශය සුදුසු විධියට භාර ගැනීම මේ ගරු සභාවට භාර කරනව. නමුත් එතුමා කලින් ප්‍රකාශ කළේ, සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති ආදි සමිති පිළිබඳව සංශෝධනයක් ඇති කිරීමට හදිසි අවස්ථාව පවත්වාගන යනවාය කියායි.

ඊළඟට විවාදයට භාජන වී තිබෙන රාජාසන කථාව පිළිබඳව මගේ අදහස් කීපයක් මේ ගරු සභාව හමුවේ තැබීමට මා බලාපොරොත්තු වෙනව. මට කලින් කථා කළ පාර්ලිමේන්තු ලේකම්තුමා කීවා වගෙ, අපි රාජාසන කථාවට වුවමනාවට වඩා ආටෝපයක්, සැලකිල්ලක් දැක්වීමේ සිරිතක් තිබෙනව. විශේෂයෙන් බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේත් එය කෙරෙන නිසා අපි එය සම්ප්‍රදායයක් වශයෙන් අනුගමනය කරනව. බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ බල පරාක්‍රමය, ශ්‍රී විභූතිය සිය යටත් විජිත රාජ්‍යයන්ට හැඟවීම සඳහා අවුරුද්දකට වරක් බොහොම ගරු ගම්භීරාකාරයෙන් උත්සවයක් සංවිධානය කර රාජාසන කථාව පවත්වනව. බ්‍රිතාන්‍ය ආණ්ඩු ක්‍රමයේ—බ්‍රිතාන්‍යය විසින් අනුගමනය කරන ආණ්ඩු ක්‍රමයේ—අනුවාදයක් අපේ ආණ්ඩු ක්‍රමය වශයෙන් පිළිගෙන තිබෙන නිසා, වැනි වැනී නැඟී සිටින්නට උත්සාහ දරන ජාතියක් වශයෙන් අපත් මහ ලොකු අටෝපයකින් රාජාසන කථා පවත්වනව. එංගලන්තයෙ පාර්ලිමේන්තුව ඒ විධියෙ උත්සවයක් පැවැත්වූ පළියටම, ආර්ථික

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තත්ත්වයෙන් පිරිහී තිබෙන මෙවැනි අවස්ථාවක අපත් ඒ විධියෙ උත්සවයක් පැවැත්වීම අවශ්‍යය කියා මා හිතන්නෙ නැහැ.

එපමණක් නොවෙයි. සම්ප්‍රදායයක් වශයෙන් එවැනි බොරු ආටෝපයකින් යුක්ත උත්සවයක් සමඟ රාජාසන කථා පැවැත්වීම නිසා, ඒ කථා අසා සිටින අමුත්තන්ටත්, ගරු මන්ත්‍රීවරුන්ටත්, රටටත් ඇහෙන්නට බොල් යෝජනා ලස්සන වචනවලින් සකස් කර තිබෙන බව නිදර්ශනයක් වශයෙන් මේ රාජාසන කථාව දැක්වීමෙන් පෙන්නුම් කරන්නට පුළුවන්.

මෙවර රාජාසන කථාවෙ එක් ස්ථානයක ගමනාගමනය සම්බන්ධයෙන් මෙසේ සඳහන් වී තිබෙනව :

"අභ්‍යන්තර ගුවන් සේවා ක්‍රමය යටතේ කොග්ගලට හා වීරවිලට අහස් යානා දිවවීමට යෝජනා කර ඇත."

ඒ වගේම, තවත් තැනෙක මෙසේ සඳහන් වී තිබෙනව :

"දුම්රිය දෙපාර්තමේන්තුවේ වාෂ්ප ඇන්ජින් වෙනුවට ඩීසල් ඇන්ජින් 87 ක් මිළ දී ගැනීමට ඉක්මණින් ඇණවුම් යවනු ලැබේ."

සමහර විට මේ රටේ තත්ත්වය පිළිබඳ හරියාකාර අවබෝධයක් නැති විදේශිකයෙක් මේ රාජාසන කථාව ඇහුවොත් හිතාවි, "මේ රටේ ගමනාගමන ප්‍රශ්නයක් නැහැ, දැන් තිබෙන්නේ අහස්යානා පිළිබඳ ගමනාගමනය දියුණු කිරීම පමණය" කියා. නමුත් අපේ ගමනාගමන තත්ත්වය ගැන කියන්නට කණගාටුයි. විශේෂයෙන් මේ රටේ දුප්පත් මහජනයා පාවිච්චි කරන ගමනාගමන ක්‍රමය වන ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් සේවය අද ඇත්තේ ඉතා කණගාටුදායක තත්ත්වයකයි. නමුත් දුප්පත් මහජනතාවගෙ ගමනාගමනය සඳහා පාවිච්චි කරන එම බස් සේවය ගැන මේ රාජාසන කථාවේ වචනයක්වත් සඳහන් වී නැති බව කණගාටුවෙන් වුනත් සඳහන් කරන්නට සිදු වී තිබෙනව. ඇත්ත වශයෙන්ම ලංකා ගමනාගමන මණ්ඩලය සම්පූර්ණයෙන්ම ප්‍රතිසංවිධානය කළ යුතු තත්ත්වයක තිබෙන බව පෙනී යනව.

අද ලංගමයේ බස් සේවය ප්‍රමාණවත් නැහැ. අපේ ප්‍රදේශය නිදර්ශනයක් වශයෙන් පෙන්නුම් කරන්නට පුළුවන් වුනත්, ලංකාවෙ බොහෝ පළාත්වල තත්ත්වය ඒකයි. අළුතින් පාරවල් හදා අළුත් බස් සේවා ආරම්භ කරන්නය කියා ලංගමයෙන් ඉල්ලා සිටියාම කියනව ඒ සඳහා දෙන්නට බස් නැහැ කියා. ලංගමය ක්‍රියා කරන්නේ අත්තනෝමතික විධියට බව මේ අවස්ථාවෙදී මා ප්‍රකාශ කරන්නට කැමතියි. සමහර විට, බස් සේවා ආරම්භ කරද්දී ඒ ප්‍රදේශයෙ මන්ත්‍රීවරයාගෙන් විමසීමක් කරන්නෙ නැහැ. ඒ වගේම, දිස්ත්‍රික් සම්බන්ධතා කාරක සභාවල යෝජනා සලකා බලන්නෙ නැහැ. ලංගමයේ නිලධාරීන්ගෙ හිතුමතය අනුවත් වෙනත් දේශපාලන බලපෑම් අනුවත් බස් සේවාවන් ආරම්භ කරනව. අතුරු මැතිවරණ කාලෙදී දොඩම්ගස්ලන්දෙ බොරලු පාරවල පවා තට්ටු දෙකේ බස් දිව්ව. නමුත් උඩරට ගැමි පුනරුත්ථාපන කොමිෂන් සභාවෙ මුදල්වලින් හැතැප්ම ගණන් තාර දමා සකස් කළ අපේ ප්‍රදේශයේ පාරවල අළුතින් බස් සේවා ආරම්භ කරන්නැයි ඉල්ලුවාම නොයෙකුත් ප්‍රශ්න ඉදිරිපත් කරනව.

දුම්රිය සම්බන්ධයෙන් මම ඊයේ දුටු සිද්ධියක් කියන්න කැමතියි. මම ඊයේ දුම්රියෙන් පාර්ලිමේන්තුවට පැමිණෙද්දී හපුතලේදී ඉතා කණගාටුදායක සිද්ධියක් දැක්කා. ඒ දුම්රිය හපුතලේ දුම්රිය පොළේ නවත්වන අවස්ථාවෙ ද්‍රවිඩ සහෝදරයන් 500 ක් 600 ක් පමණ කතරගම වන්දනාවෙ යාම සඳහා දුම්රිය පොළේ වේදිකාවේ හිටිය. ඒ දුර ගමනක යෙදෙන සීඝ්‍රගාමී හෙවත් එක්ස්ප්‍රස් දුම්රියක් නිසා වැඩි වේලාවක් එක දුම්රියපොළක නතර කරන්නෙ නැහැ. දුම්රිය දැන් දැන් එතැයි බලාපොරොත්තුවෙන් රැස් කකා සිටි විශාල ජනකාය, දුම්රිය වේදිකාවට ළඟා වන විට වඩ වඩාත් උනන්දුවක් දක්වා දුම්රිය දෙසට දුවන්නට පටන් ගත්ත. මගීන්ගේ උනන්දුව ඇඩි වුණේ කෙසේ හෝ දුම්රියට ගොඩ වීම අවශ්‍ය වූ නිසයි. මාත් එහි සිටිය. ඔය දුම්රියට ඈඳා තිබුණේ තුන්වැනි කැලැසියේ රිය මැදිරි හෙවත් රේල් පෙට්ටි තුනක් නැත්නම් හතරක් පමණයි. දුම්රියට ගොඩ වීමේ බලාපොරොත්තුවෙන් හාර සියයකට පන් සියයකට වැඩි පිරිසක් සිටි බව මට පෙනී ගියා. ඇතැම් අය අත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රාජා වෙලේගම මයා.]

දරුවන් වඩාගෙන දුම්රියට ගොඩ වෙන්න උත්සාහ කරන ආකාරය මට දකින්නට ලැබුණා. කුඩා ළමයින් එක්ක දුම්රියට ඇතුළු වීමට උත්සාහ කරන මගීන් විශාල පිරිසක් එකිනෙකාගේ ඇඟේ හැපෙමින් ඉතාමත් අමාරුවෙන් සටනකට සැරසෙන ආකාරයට පොර කන හැටි මට දකින්නට ලැබුණා. එතැන මගීන් හසුරුවන්න හෝ මගීන්ට උදව් කරන්න හෝ කිසිම සංවිධානයක් තිබුණු බවක් පෙනුනෙ නැහැ. ඒ කොයි හැටි වෙතත් පොලීසියෙන් නම් ඉන්නවා දකින්න ලැබුණා. වේදනාවෙන් මිරිකී කෑ ගහන ළමයෙකුගෙ ශබ්දයක් ඇසුණු නිසා ඒ ගැන සොයා බලන්නට මට සිදු වුණා. පොලීසියෙන් සාමාන්‍යයෙන් බලාපොරොත්තු වන සහායක් මගීන්ට කොහෙත්ම ලැබුණෙ නැහැ. එතන පොලීසිය කුමක් කරනවාදැයි දැනගන්න විධියක් නැහැ තිබුණෙ. අතේ බැටන් පොලු සහ වේවැල් කෑලි තබාගෙන මගීන්ට එහාට මෙහාට අනිනවා තළනවා තමයි අපට දකින්න ලැබුණෙ. මොකක්ද මේකෙ තේරුම? ඔන්න ඔය විධියටයි දැන් අපේ රටේ ගමනාගමන සේවය තිබෙන්නෙ.

මේ සිද්ධිය සියැසින් දැකීමෙන් මට බොහොම කණගාටු හිතුනා. මම ඒ වෙලාවෙම මා සිටි රිය මැදිරියෙන් බැහැලා තුන් වැනි කැලෑසියෙ රිය මැදිරි තිබුණු දිහාවට ගියා. ඒ රිය මැදිරිවල තත්ත්වය මට දකින්නට ලැබුණා. සමහර තැන්වල ඒ රිය මැදිරිවල කුඩා ළමයින් නිදි කරවා සිටි අන්දම දකින ඕනෑම කෙනකුට කනගාටු හිතෙනවා. දුප්පත් මගීන්ට එම රිය මැදිරිවල හිටගෙන ඉන්නවත් සෑහෙන තරම් ඉඩකඩ තිබුණේ නැහැ. ඒ නිසා එකට මිරිකී මිරිකී හුඟ දෙනෙක් සිටියා. බොහොම දෙනෙක් ආසන යට ඉන්න හැටිත් දකින්න ලැබුණා. කොයි විධියෙන් හරි ගමන යන්න ඕනෑ නිසා ඔය තරම් දුක් කරදර විඳ දරාගෙන මේ තරම් විශාල පිරිසක් ඔය රිය මැදිරි හතර නැත්නම් පහ තුළ ගමන් කරනවා. ඔන්න ඔහොමයි අපේ ගමනාගමන සේවය පවතින්නෙ. ඒ කොයි හැටි වෙතත් ටිකට් පරීක්ෂකයින් නම් හිටියා. නිල ඇඳුම් හෙවත් යුනිෆෝම් ගහගෙන හිටපු ඔය පරීක්ෂකවරු ඔය තද බදයේ හිටගෙන ටිකට් පරීක්ෂා කරනවා දකින්න ලැබුණා.

කොයි තරම් අසාධාරණද අද දවසේ මේ රටේ දුප්පත් මගීන්ට—දුප්පත් මනුෂ්‍යයින්ට—දුර බැහැර ගමන් බිමන් යාමේදී මේ තරම් ගිරිහැරවලට කරදරවලට මුහුණ පාන්නට ඉඩ තැබීම? ආසන යට ඉන්න මිනිසුන්, ආසන මත ඉන්න මිනිසුන්ට පෑගෙනව. ඔය හැම දෙනාම ගෙවන්නෙ එකම මුදලක්. ඔය තරම් දුක් කරදර විඳ ගෙනයි ගමන් යන්නෙ. මේ ගැන ටිකක් කල්පනා කර බැලුවා නම්, තව රේල් පෙට්ටි කිහිපයක් අඩුම ගණනේ මෙවැනි උත්සව සමයකදීවත් දුම්රියට ඈඳන්න පුළුවන් කමක් තිබුණේ නැද්දැයි අහන්න ඕනෑ. එකම මුදල් ප්‍රමාණයක් ගෙවා යන මගීන්ට මීට වඩා සැප පහසුවෙන් ගමන් කිරීමට පුළුවන් වන විධියට වැඩ පිළිවෙළ සකස් කරන්න ඕනෑ. ඔන්න ඔය විධියටයි අද අපේ රටේ ගමනාගමන සේවය තිබෙන්නෙ.

අද අපේ රටේ ගමනාගමනය—දුම්රියෙන් හෝ වේවා, බස් රියෙන් හෝ වේවා—ඉතාමත් පහත් තත්ත්වයක තිබෙන බව කල්පනාවට ගන්න ඕනෑ. තත්ත්වය ඒ තරම් පහතට වැටී තිබියදී ලොකුවට සම්ප්‍රදායානුකූලව ගරු ගම්භීරාකාරයෙන් රාජාසන කථා පවත්වන්නට ඕනෑ නිසා, ඒවට ඇතුළත් කරන්නට ඕනෑ නිසා අභ්‍යන්තර ගුවන් සේවා ක්‍රමය යටතේ මේ මේ දේවල් කිරීමට ආරම්භ කරනු ලැබේ යනුවෙන් කීමෙහි ඇති ප්‍රයෝජනය කුමක්දැයි මේ අවස්ථාවේ මම අහනව. අභ්‍යන්තර ගුවන් සේවා ක්‍රමය යටතේ කොග්ගලට හා වීරවිලට අහස්යානා දිව වීමට යෝජනා කර ඇතැයි කියනව. විශේෂ ගුවන් සේවා ඇති කිරීමෙන් ප්‍රයෝජනයක් වන්නෙ කාට ද? වීරවිලට යන්න කැමති අයට, කතරගම වන්දනාවෙ යන්න කැමති අයට ප්‍රයෝජන වෙනවය කිව්වට, අපේ සාමාන්‍ය ජනයාගෙන් කී දෙනෙක් අහස් යාත්‍රාවලින් ඔය ගමන් යාවිද? සමහර විට විදේශවලින් පැමිණෙන සංචාරකයින් හෙවත් "ටුවරිස්ට්ලා" නම් මේවායින් නියම ප්‍රයෝජනය ගන්නවා ඇති. ඒ ගැන සැකයක් නැහැ. විදේශියයන්ගේ සැප පහසුකම් සඳහාද, එසේ නැත්නම් දුප්පත් ස්වදේශියයන්ගේ සැප පහසුකම් සඳහා ද අප විසින් අපේ මුදල් හදල් වැය කළ යුත්තේ කියා මා අහනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රාජාසන කථාවේ සඳහන් වන තවත් දෙයක් තමයි පාරවල්. පාරවල් අපේ රටට බෙහෙවින් අවශ්‍යයි. ඒ ගැන සැකයක් නැහැ. ඇල්ල-වැල්ලවාය පාර තැනීම මේ ආණ්ඩුවේ නව වැඩ පිළිවෙලට ඇතුළත් වන බව කියනව. ඒ ගැන මේ රාජාසන කථා විවාදයෙදි යමක් කියන්නට විශේෂ යුතුකමක් මට තිබෙනව. මේ පාර දුවන්නෙ මා නියෝජනය කරන කොට්ඨාශය මැදින් නිසා ඒ ප්‍රදේශයේ නමත් මේ රාජාසන කථාවට අඩංගු වීම ගැන මා සන්තෝෂ වෙනව. රජය මගින් ඒ ප්‍රදේශයේ පාරක් හැදීම සඳහා මුදල් වෙන් කිරීම සම්බන්ධයෙන් යෝජනා කර තිබීම ගැන මා සන්තෝෂ වෙනව. එය දිග පාරක්. ඒ ගැන සොයා බලාගෙන යන විට මේ පාර සම්බන්ධයෙන් මේ විධියේ උනන්දුවක් දක්වා තිබෙන්නේ මොන කාරණයක් නිසාදැයි මට තේරුම් ගන්න පුළුවන් වුණා. මෙය අලුත් පාරක් නොවෙයි. පී. ඩබ්ලිව්. ඩී. හෙවත් රජයේ වැඩ දෙපාර්තමේන්තුව මගින් අඩි පාරක් හැටියට නඩත්තු කරගෙන ගිය එකක්. මේ පාර හැදීම ගැන යම් උනන්දුවක් දක්වන්නට පටන් ගත්තේ බණ්ඩාරවෙල අතුරු මැතිවරණය තිබුණු කාලේ. ඒ පාර කපන්න පටන් අරන් ටික කාලයකදී—පටන් ගත් ළඟදීම—නැවැත්තුවා. ඇල්ල-වැල්ලවාය පාර කපන්නෙ නැද්දැයි විශාල උද්ඝෝෂණයක් ඒ වෙලාවෙ ඇති වුණා. එවිට නැවතත් එය කපන්න තීරණය කළා. හැබැයි, කපන්න තීරණය කළේ වෙන මාර්ගයකින්—වෙන පැත්තකින්—යන්නටයි. මුලින් අදහස් කළ මාර්ගය පළල් කරන්නට නොවෙයි දෙවනුව තීරණය කළේ. ඊට හේතුවක් තිබිය යුතුයයි කල්පනා කළ නිසා ඒ ගැන මා සොයා බැලුවා. වාමාංශික දේශපාලන මත දරන්නන් වැඩිපුර ඉන්න ප්‍රදේශයක් හැටියට මේ ආණ්ඩුවට ඒත්තු ගිය ප්‍රදේශයක්—වාමාංශික දේශපාලනය අදහන අය ඉන්න ගම් ප්‍රදේශයක්—මැදින් යාමට පටන් ගත් පාරක් ඒ ආකාරයට හදන්න ඉඩ දීම අමාරු නිසයි එසේ කර තිබෙන්නෙ. මේ පාර වෙනස් කිරීමට සැලැස්මවල් හතරක්ම හැදුවා. ඒ එකක්වත් සුදුසු නැති බව අසා මේ ආණ්ඩුවේ අය කෝපයට පත් වුණා. යෝජිත අලුත් පාර නොව පරණ පාරම සුදුසුයයි කී නිලධාරීන්ට කඩා පැන්නා. මේ පාර නම් වෙන පැත්තකින් යන්න ඉඩ දෙන්න බැහැයි කී නිලධාරීන්ට විරුද්ධ වුණා. ඒ අතර එක් නිලධාරියෙක් කියා සිටියා, මේ පාර මේ ගම් මැදින් යන්නෙ නැත්නම් මේ තරම් විශාල මුදලක් වියදම් කර හැදීමෙන් ප්‍රයෝජනයක් නැති බව. ඒ අවස්ථාවෙදී ඒ නිලධාරියට අසභ්‍ය විධියට බැණ වැදුණු බවත් අපි දන්නව. ඔය විධියෙ තත්ත්වයකුයි තියෙන්නෙ. මෙම පාර සම්බන්ධයෙන් ගරු ඇමතිතුමා හතර වතාවක් එම ප්‍රදේශයෙ නිල ගමන්වල යෙදී තිබෙනව. ඒ එකම නිල ගමනකදිවත් පළාතෙ මන්ත්‍රීවරයා වශයෙන් මා වෙත දන්වා යැව්වෙ නැහැ. එපමණක් නොව, පළාතෙ මන්ත්‍රීවරයා වශයෙන් මා වෙතින් අදහස් විමසා බැලුවෙත් නැහැ. ඒ හැම අවස්ථාවකදීම ඒ වෙනුවෙන් ආරාධනය කර තිබුණෙ එක්සත් ජාතික පක්ෂයෙ පරාජිත අපේක්ෂකයාටයි. ඕකයි, තමුන්නාන්සෙලාගෙ සාධාරණ ප්‍රතිපත්තිය! දශරාජ ධර්මය !

රාජාසන කතාවෙ එක් තැනෙක මෙසේ සඳහන් වෙනව :

" මාගේ ආණ්ඩුව සිය ප්‍රතිපත්ති ක්‍රියාවේ යෙදීමේ කටයුතු කර ගෙන යැමේදී ජාතික සමගිය වැඩි දියුණු කිරීමද, මහජනයා අතර සිටින සෑම පාර්ශ්වයක් කෙරෙහිම යුක්ති සහගතව සහ සාධාරණව කටයුතු කිරීමද යන ගුණධර්ම අනුගමනය කර ඇත. "

නමුත් එම ප්‍රශ්නයෙදී ගුණධර්ම අනුගමනය කළේ කොහොමද ? මෙවැනි කරුණකදී පළාතෙ මන්ත්‍රීවරයාගෙන් කරුණු විමසන්ට යුතුකමක් තිබුණ. නමුත් එසේ කළේ නැහැ. පත්‍ර මාර්ගයෙන් එහෙම සමහරවිට ලොකුවට ප්‍රචාරය කරනව ඇති රාජාසන කතාවෙන් මේ ඇල්ල පාර සම්බන්ධයෙන් සඳහන් කර තිබෙනවය කියා. මේ පාර මෙන්න මේ ගම් මැදින් යන්ට ඕනැ කියා මහජනය කියා සිටි නමුත්, ඒතුමට පුළුවන් වුණේ නැහැ එය කරන්ට. නමුත් දැන් තීරණය කරගෙන තිබෙන පිළිවෙළට, පාර හදන්ට යන මාර්ගය හොඳයි. මා මෙම කරුණු විවේචනයට පත් කළ නිසා මින් පසු එම පාර හදන්ට යන මාර්ගය වෙනස් කරන්ටත් පුළුවනි. නමුත් කරන්ට දෙයක් නැහැ ; ඇත්ත කියන්ට ඕනැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රාජ වෙලේගම මයා.]

ගුවන් විදුලිය සම්බන්ධයෙන්ද වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්ට තිබෙනව. රාජාසන කථාවෙහි ගුවන් විදුලිය පිළිබඳව සඳහන් වන්නෙ මෙසේයි :

"මේ වර්ෂය මුලදී ගුවන් විදුලිය සංස්ථාවක් පිහිටුවන ලදී. දිවයිනෙහි විසිරීගිය ප්‍රමුඛස්ථාන නවයක මධ්‍යතරංග විකාශනාගාර පිහිටුවාගෙන යනු ලැබේ."

ගුවන් විදුලිය සංස්ථාවක් බවට පත් කිරීමේදී ලොකු උත්සවයක් පැවැත් වූ බව අපට පෙනී ගියා. එම උත්සවයට අග මැතිතුමා, තානාපතිවරු සහ මැති ඇමතිවරු එහෙම සහභාගි වුණා. නමුත් මහ ජනයාට අදත් කන් දෙන්ට සිදු වෙලා තියෙන්නෙ එදා කන් දුන් ගුවන් විදුලි සේවාවටමයි. ගුවන් විදුලියෙ තත්ත්වය එහෙමමයි.

අද උදය වරුවෙ කතා කළ කම්කරු රැකීරක්ෂා හා නිවාස ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්තුමා ප්‍රකාශ කළා, දිස්ත්‍රික් සභා පිහිටුවීමේදී ආණ්ඩුව ගන්න ප්‍රතිපත්තිය පිළිබඳව. කච්චේරිවලට ගසා තිබෙන බෝඩ් වෙනස් කර දිස්ත්‍රික් සභා යනුවෙන් නම් කරන බවත් ඒකට ඔය තරම් බය වෙන්ට දෙයක් නැති බවත් එතුමා කීව. දිස්ත්‍රික් සභා කෙසේ වෙතත් අනිකුත් සංස්ථා ආදිය සම්බන්ධයෙන් නම්, මේ රජය අනුගමනය කරන්නෙ බෝඩ් ලැලි මාරු කිරීම පමණකැයි කියන්ට පුළුවනි. අනිකුත් සංස්ථා ආදිය සම්බන්ධයෙන් නම් ඒ වැඩ පිළිවෙළ අකුරටම ක්‍රියාත්මක වෙලා තියෙනව. ගුවන් විදුලිය ගැනත් කියන්ට තිබෙන්නෙ ඒකයි. එය සංස්ථාවක් වශයෙන් සංවිධානය වුණාට මොකද කිසිම දියුණුවක් හෝ අමුත්තක් සිදු වුණාය කියා පිළිගන්ට බැරි තත්ත්වයකුයි අද තිබෙන්නෙ.

දැන් මෙම ස්ථානයෙ අධ්‍යාපන ඇමතිතුමා සිටින නිසා විශෙෂයෙන් අධ්‍යාපනය සම්බන්ධව වචනයක් කියන්ට ඕනැ. නව අධ්‍යාපන පනත යටතේ පාඨශාලා වර්ග කරන්ට යනවාය කියා අද රටේ ලොකු රාවයක් පැතිර යනව. මේ අවස්ථාවෙදී කනගාටුවෙන් නමුත් ප්‍රකාශ කරන්ට දෙයක් තිබෙනව. මගේ කොට්ඨාශයේ සමහර ගුරුවරුන් සහ සමහර දෙමව්පියන් මා හමු වීමට ඇවිත් පැමිණිලි කර සිටිය. "මන්ත්‍රීතුමනි, අපේ ස්කෝලෙ මහා විද්‍යාල තත්ත්වයෙන් අස් කරන්ට යනවාය ; අපේ ස්කෝලෙ ප්‍රාථමික පාඨශාලාවක් කරන්ට යනවාය" යනාදි වශයෙන්. මේ පාඨශාලා වර්ග කිරීම සම්බන්ධව ගරු අධ්‍යාපන ඇමතිතුමා නිල වශයෙන් ප්‍රකාශයක් කර තිබෙනව මා දුටුවෙ නැහැ. නමුත් දෙපාර්තමේන්තුව ඒ සම්බන්ධව කටයුතු කරගෙන යන බවයි, පෙනෙන්නෙ. එම නිසා මම විශෙෂයෙන් ගරු අධ්‍යාපන ඇමතිතුමාට මෙම ආයාචනය කරන්ට කැමතියි : " ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේ පාඨශාලා වර්ග කිරීමේ වැඩ පිළිවෙළක් අනුගමනය කරනවා නම් කරුණා කර ඒ ඒ ප්‍රදේශවල සිටින නිලධාරීන්ගෙන් පමණක් නොව මන්ත්‍රීවරුන්ගෙනුත් අනිකුත් සභාවලිනුත් මේ පිළිබඳව ප්‍රශ්න කර බලන්ට'. සමහරවිට කොළඹ, මහනුවර, ගාල්ල සහ යාපනේ යනාදී සෑහෙන ප්‍රමාණයක් දියුණු අධ්‍යාපන ආයතන තිබෙන ප්‍රදේශවලට නම් මේ වර්ග කිරීම ගැළපෙන්ට පුළුවනි. නමුත් අනික් ප්‍රදේශ සම්බන්ධයෙන් තමුන්නාන්සෙ හොඳාකාර දන්න නිසා මා කියා සිටිනව, එම ප්‍රදේශවල පාඨශාලා ඔය විධියට වර්ග කළොත් අපේ දුප්පත් ළමයින්ට ලොකු අසීරු තත්ත්වයකට, අමාරු තත්ත්වයකට, ඒකාන්ත වශයෙන්ම මුහුණ පාන්ට සිදු වන බව.

කණිෂ්ඨ විශ්ව විද්‍යාල පිළිබඳව රාජාසන කතාවෙහි මෙසේ සඳහන් වෙනව :

"වෘත්තිය මුහුණුවරකින් යුත් උසස් අධ්‍යාපනයක් ලබා දෙනු පිණිස කණිෂ්ඨ විශ්ව විද්‍යාල 5 ක් දිවයිනේ ස්ථාන කීපයක පිහිටුවාගෙන යනු ලැබේ."

සන්තෝෂයි අහන්න, වෘත්තීය මුහුණුවරකින් යුත් උසස් අධ්‍යාපනයක් ලබා දෙනු පිණිස කණිෂ්ඨ විශ්ව විද්‍යාල 5 ක් පිහිටුවාගෙන යාම පිළිබඳව. නමුත් දැනටමත් සෑහෙන ප්‍රමාණයක කාර්මික ආයතන, විශ්ව විද්‍යාල, යනාදිය පිහිටුවා තිබෙන ප්‍රදේශවලමයි, මෙම කණිෂ්ඨ විශ්ව විද්‍යාල පිහිටුවීමට වැඩ පිළිවෙළ යොදා තිබෙන්නෙ. කුලියාපිටිය ප්‍රදේශය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගම්බද ප්‍රදේශයක්. එනිසා එම ප්‍රදේශයෙ එකක් පිහිටුවනවාට අපේ විරුද්ධයක් නැහැ. නමුත් මම මේ ගැන විශෙෂ ඉල්ලීමක් කරන්න කැමතියි. මහනුවර සෑහෙන සංඛ්‍යාවක් අධ්‍යාපන ආයතන තිබෙනව. දෙහිවල සෑහෙන සංඛ්‍යාවක් අධ්‍යාපන ආයතන තිබෙනව. යාපනේත් තිබෙනව. ඒවාගේ පිහිටුවන්නට එපාය කියා මම කියන්නෙ නැහැ. එහෙත් විශේෂයෙන්ම දියුණුවෙන් අඩු අධ්‍යාපන අතින් ඉතාමත් කනගාටුදායක තත්ත්වයක් පවතින ඌව ප්‍රදේශයේ අඩුම ගණනේ නව විශ්ව විද්‍යාලවලින් එකක් වත් පිහිටුවීමට පියවර ගන්නා ලෙස මම ඇමතිතුමාගෙන් ඉතාමත් ගෞරවයෙන් ඉල්ලනව.

ඊ ළඟට ශ්‍රමදාන ව්‍යාපාරය ගැන මෙහි සඳහන් කර තිබෙනව.

"පාඨශාලා ශිෂ්‍ය ශිෂ්‍යාවන් කුඹුරුවල වල් පැළෑටි නෙලීමේ ශ්‍රමදාන ව්‍යාපාරයට දහස් ගණනින් සහභාගි වී එම කුඹුරුවල අස්වැන්න වැඩි කර ඇත. මෙම ව්‍යාපාරය ශිෂ්‍යයින්ගේ සිත්වල ජාත්‍යාලය හා ශ්‍රමගරුත්ව හැඟීම් ඇති කිරීමට හේතු වී ඇත."

මේ ශ්‍රමදාන කටයුතු සම්බන්ධයෙන්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ අවස්ථාවේදී එක්තරා අදහසක් ඉදිරිපත් කරන්න කැමතියි. අපි නොයෙක් අවස්ථාවලදී පාඨශාලා මඟින් පවත්වනු ලබන ශ්‍රමදාන උත්සවවලට සහභාගි වී තිබෙනව. ඒවාගේම ගම්වැසියන් විසින් පවත්වනු ලබන ශ්‍රමදාන උත්සවවලට සහභාගි වී තිබෙනව. මන්ත්‍රීවරු වශයෙන් අපි ඒ උත්සවවලට ගිහින් කරන්නෙ මොකක්ද? උදැල්ලක් අල්ලා නිකම්ම ඒකට සහභාගි වී කථාවක් පවත්වන එක විතරයි. ඒ නිසා ඒ සම්බන්ධයෙන් මම ඊට වඩා වෙනස් ක්‍රමයක් යෝජනා කරන්න කැමතියි. එනම් උභය මන්ත්‍රී මණ්ඩලයේම සිටින මන්ත්‍රීවරුත්, ඇමතිවරුත්, අගමැතිතුමාත්, විරුද්ධ පක්ෂයේ නායිකාවත් යන සියලු දෙනාම එකතු වී, සහභාගි වී, නියම විධියට වැඩ කිරීම සඳහා ශ්‍රමදාන කඳවුරක් පවත්වන්න. එතකොට එය අප විසින් රටට දෙන ආදර්ශයක් වෙනවා ඇති. විශාල උත්සව පවත්වා මල් මාලා පැළඳගෙන බොරුවට උදැල්ලක් අල්ලා කථාවක් පවත්වා එනවාට වඩා මහජන මන්ත්‍රීවරු, ඇමතිවරු සියලු දෙනාම එකතු වී නියම විධියේ වැඩක් කිරීම පිණිස දවසක හෝ දෙකක ශ්‍රමදාන කඳවුරක් අධ්‍යාපන ඇමතිතුමාගේ කොට්ඨාශයේ හෝ කමක් නැහැ පිළියෙළ කරන්න. ඒ අනුව නියම විධියේ ආදර්ශයක් රටට දෙන්නට පුළුවන් වෙනවාට කිසිම අනුමානයක් නැහැ. මම හිතනවා ගරු අධ්‍යාපන ඇමතිතුමාට වුණත් එය සංවිධානය කරන්න පුළුවන්ය කියා. අපි අපිම එය කිරීමෙන් ආදර්ශයක් දක්වන එක වඩා සුදුසුයි.

අවසාන වශයෙන් මම තවත් කාරණයක් මතක් කරන්න කැමතියි. ග්‍රාමීය වාරි මාර්ග ගැන රාජාසන කථාවේ මෙලෙස සඳහන් වී තිබෙනවා :

"ග්‍රාමීය වාරිමාර්ග ශීඝ්‍රයෙන් නැගීම පිළිබඳ විශෙෂ සැලකිලි දක්වන ලදී. දැනට ඇති වාරිමාර්ග යෝජනා ක්‍රමයන්හි ඇති අඩුපාඩුකම් හරිගැස්වීමට දැඩි උත්සාහයක් දරනු ලැබේ."

මම විශෙෂයෙන්ම සන්තෝෂ වෙනවා ග්‍රාමීය වාරිමාර්ග ක්‍රමය ගැන උනන්දුවක් දැක්වීම පිළිබඳව රාජාසන කථාවෙහි සඳහන් කර තිබීම ගැන. මෙතෙක් කල් තිබුණ ආණ්ඩු—ඒ කියන්නෙ මේ ආණ්ඩුවත් මීට කලින් ආණ්ඩුවත්—ග්‍රාමීය වාරි මාර්ග ක්‍රම ගැන දැක්වූයේ වෙනස් ප්‍රතිපත්තියක්. සම්පූර්ණයෙන්ම නටබුන් වී ඇති ග්‍රාමීය වැව් අමුණු පිළිබඳව උනන්දුවක් දැක්වූයේ නැහැ. ඒ නිසා මෙය සුභලකුණක් වශයෙන් සඳහන් කරන්න පුළුවනි. මෙතෙක් ප්‍රතිපත්තිය වූයේ විශාල ලෙස මුදල් වියදම් කර ගංගා හරස් කර විශාල වැව් අමුණු බැඳීමයි. ගල්ඔය, මින්නේරිය ආදී නොයෙක් ප්‍රදේශවල විශාල වශයෙන් මුදල් වියදම් කර ඇති කළ විශාල වාරිමාර්ග ක්‍රමවලින් රජය බලාපොරොත්තු වූ තරම් ප්‍රයෝජනයක් ඇති වී නැති බව අපට පෙනී යනව. ඒ විධියේ විශාල වාරි මාර්ග ක්‍රමවලට සැලකිල්ලක් දක්වන අතරම සුළු වාරිමාර්ග ක්‍රමවලටත් යම් කිසි සැලකිල්ලක් උනන්දුවක් තිබුණා නම් ආහාර අතින් අපට ස්වයංපෝෂිත තත්ත්වයක් ඇති කර ගැනීමට හොඳටම අවස්ථාව තිබුණ බව මම මේ ගරු සභාවෙදි ප්‍රකාශ කරන්න කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රාජ වෙලේගම මයා.]

අද නොයෙකුත් ගම්වල නොයෙක් විධියේ වාරි මාර්ග ක්‍රම පිළිබඳව උනන්දුවක් ඇතිවීමට හේතු කීපයක් තිබෙනව. මෙහි දී එක්තරා පුද්ගලයෙක් සම්බන්ධව විශෙෂයෙන් මතක් කරන්න සිද්ධ වෙනව. ඒ කවුද? හිටපු අග්‍ර විනිශ්චයකාර රාජ නීතිඥ හේම බස්නායක මහතායි. ලංකාවේ සෑම ගමකටම වාගේ ගිහින් සෑම පළාතකටම ගිහින් මහජනයා තුළ එතුමා ඇති කළ උනන්දුව අප කවුරුත් පිළිගත යුතු සත්‍යයක්. ඒ උනන්දුව උඩ, විශෙෂයෙන්ම මහජනයා විසින් ඇති කරන ලද මහජන මතයක් නිසා ඒ ග්‍රාමීය වාරි මාර්ග කෙරෙහි අද රජයේ සැලකිල්ල යොමු වී තිබෙනව. එම නිසා මේ වැඩේ තවදුරටත් සාර්ථක වීම පිණිස මම මේ ගරු සභාව ඉදිරියෙහි අදහසක් තබන්න ලැහැස්තියි.

අපි තේ කර්මාන්තය ගැන ටිකක් කල්පනා කර බලමු. විශාල වතු වෙනුවෙන්, ධනපතීන් විසින් කරන ඒ වගාව වෙනුවෙන්, කොයි තරම් දුරට සහන සලස්වා තිබෙනවාද කියා බලන්න. තේ වගාව සම්බන්ධයෙන් අද ආධාර ක්‍රමයක් තිබෙනව. අළුතෙන් තේ වගා කිරීමට අක්කරයට රුපියල් තුන් දහසකට අධික මුදලක් සහනාධාර වශයෙන් දෙනව. සම්පූර්ණයෙන්ම ඒ මුදල තේ වගාවටම වියදම් කිරීමටයි දෙන්නෙ. රබර් වගාවටත් ඒ විධියටම අක්කරයකට රුපියල් එක් දහස් පන්සියයක සහනාධාරයක් දෙනව. නමුත් අපට ඉතාම අවශ්‍ය ආහාරය වන වී වගාවට දෙන සහනාධාරය කුමක්ද කියා මා ප්‍රශ්න කරනව. වී වගාවට ණය දෙනවාය කියන්ට පුළුවනි. ඔව් ණය දෙනව. නමුත් ඒ ණය පොළියත් සමග ආපසු අය කර ගන්නව. මුලින් සියයට දෙකේ පොළියට ණය දුන්න. ඊට පසු සියයට හයේ පොළියට ණය දුන්න. දැන් ඒ පොළී ප්‍රමාණය සියයට දොළහක් කර තිබෙනව. තේ හා රබර් වගාවලට ආධාර දෙන්නාක් මෙන් වී වගාවට ආධාර දෙන්න බැරි මක්නිසාද? ශතයක්වත් ආපසු අය කර නොගැනීමේ ප්‍රතිපත්තියක් උඩයි තේ හා රබර් වගාවලට ආධාර දෙන්නෙ. තේ හා රබර් වගාවලට ඒ විධියට ආධාර කිරීම වැරදිය කියා මා කියන්නෙ නැහැ. තේ හා රබර් වගාවලට ඒ අන්දමට ආධාර දීම ගැන මා සතුටු වෙනව. නමුත් බහුතර ජනතාවගේ වී වගාවට ඒ අන්දමට ආධාර දීමේ වැඩ පිළිවෙළක් යොදන්නෙ නැත්තෙ මක්නිසාද?

අළුතෙන් අස්වද්දන කුඹුරු අක්කරයකට රුපියල් 500 බැගින්වත් සහනාධාර දීමේ ක්‍රමයක් ප්‍රතිපත්තියක් වශයෙන් පිළිගත්තොත් සමහර විට ගම්වාසීන් ඉතා උනන්දුවෙන් ඉදිරිපත් වී ආණ්ඩුව කරන තෙක් බලා නොසිට මේ සුළු වාරි මාර්ගවල වැඩවලට ඒ මුදල යොදාවිය කියා මා විශ්වාස කරනවා. අද සුළු වාරි මාර්ග දියුණු කිරීමට දිසාපති කාර්යාලවලටත් වාරිමාර්ග අංශයටත් ලැබෙන්නෙ ඉතාම සුළු මුදලක්. සුළු වාරිමාර්ග ක්‍රම තිබෙන ප්‍රදේශ ගැන පරීක්ෂා කර බලා ඒ අවටින් ජනතාවට ඉඩම් දී අළුතෙන් අස්වද්දන සෑම කුඹුරු අක්කරයකටම අපි රුපියල් 500 ක නැත්නම් රුපියල් 1000 ක සහන ආධාරයක් දෙනවාය, ඒ මුදල වැව් අමුණු ඇල වේලි දියුණු කිරීමටයි අපි දෙන්නෙ, ඒ මුදල ආපසු අය කර ගැනීමේ අදහසින් දෙන මුදලක් නොවේය, කියා කිව්වොත් අපේ ගොවි ජනතාව ඉතාමත් උනන්දුවෙන් වැඩි වැඩියෙන් කුඹුරු අස්වද්දා මේ සුළු වාරි මාර්ග ක්‍රම දියුණු කරනවාට මා තුළ කිසිම සැකයක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නින්දගම් සම්බන්ධවත් මා කෙටියෙන් වචනයක් දෙකක් සඳහන් කරන්නට බලාපොරොත්තු වෙනව. නින්දගම් පිළිබඳව මේ රජය ඇඩි පියවරක් ගනීවිය කියා අපි බලාපොරොතු වෙනව. පසුගිය වාරයේ මේ රජය නින්දගම් පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළා. නමුත් ඒ පනත් කෙටුම්පත අහෝසි වුණා. මේ රජයේ හැම රාජාසන කථාවකම මේ නින්දගම් ගැන සඳහන් කර තිබෙනව. විශේෂයෙන්ම උඩරට ප්‍රදේශයක් නියෝජනය කරන මන්ත්‍රීවරයකු හැටියට මේ නින්දගම් ප්‍රශ්නය නිසා අද උඩරට ප්‍රදේශවල ගොවීන්ට තම වැඩ කටයුතු කරගෙන යන්ට නොහැකි තත්ත්වයක් ඇති වී තිබෙන බව මට කියන්ට සිද්ධ වී තිබෙනව. විශේෂයෙන්ම මේ රජය නින්දගම් පනත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කෙටුම්පත ඉදිරිපත් කළාට පසු නින්දගම් හිමියන් ඒ නින්දගම් ඉඩම්වල වැඩ කළ ගොවීන්ට තර්ජන ගර්ජන කරනව. එපමණක් නොවෙයි. සමහර නින්දගම් හිමියන් ඒ නින්දගම් විකිණීමට පවා වැඩ පිළිවෙළවල් සකස් කර තිබෙනව. නින්දගම් සම්බන්ධව රජය නැවත වරක් වහාම පියවරක් ගන්නවා ඇත කියා මා බලාපොරොත්තු වෙනව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා දීර්ඝ වශයෙන් කථා කරන්ට අදහස් කරන්නෙ නැහැ. විරුද්ධ පක්ෂයේ පසු පස මන්ත්‍රීවරයකු වුවත් මා මේ යෝජනා ඉදිරිපත් කළේ ඉතා හොඳ චේතනාව කිනුයි. තමුන්නාන්සේලා මේ යෝජනා පිළිඅරගෙන මේවායින් කීපයක් හෝ ක්‍රියාත්මක කිරීමට උනන්දු වනු ඇතැයි මා බලාපොරොත්තු වෙනව.

අ. භා. 7.15

**ගරු ඊරියගොල්ල**

*(கௌரவ ஈரியகொல்ல)*

(The Hon. Iriyagolle)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උච්චාරණයෙන් වේගවත් වුවත්, ලීලාවෙන් කථා චාතුර්යය විදහා දැක්වුවත්, චේතනාවෙන් වංචනික වූ, ද්වේෂසහගත වූ මැද කොළඹ තුන්වන ගරු මන්ත්‍රීතුමාගේ (කෙනමන් මයා.) කථාවට පසු, නුපුරුදුකමින් හෝ නොදන්නාකමින් වැරදි සහගත අදහස් දැක්වුවත් චේතනාවෙන් අවංක වූ මොනරාගල තරුණ මන්ත්‍රීවරයාගේ කථාවෙන් පසු මට කථා කරන්ට ලැබීම ගැන ඇත්ත වශයෙන්ම මා ප්‍රීති වෙනවා. රාජාසන කථාව පිළිබඳව මොනරාගල ගරු මන්ත්‍රීතුමා තම කථාව අවසානයේදී සඳහන් කළාක් මෙන්ම අවංක චේතනාවෙන් විචාරණයක් ඔහු කළ බව මා පිළිගන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගරු සභාවේ පාර්ලිමේන්තු හයක රාජාසන කථා විවාද කර තිබෙනවා. ලංකාවේ පාර්ලිමේන්තු ක්‍රමය ආරම්භ වූවාට පසු 1947, 1952, 1956, 1960 —දෙවරක්—, 1965, යන වර්ෂවල ආරම්භ වූ පාර්ලිමේන්තු හයක රාජාසන කථා විවාද කර තිබෙනවා. මේ හයවන පාර්ලිමේන්තුවේ තුන්වන රාජාසන කථා විවාදයයි. එක වාරයකදී හැර අන් සෑම වාරයකදීම මෙම විවාදයට සම්බන්ධ වූ මන්ත්‍රීවරයකු වශයෙන් මට පෙනී ගියේ, බොහෝ දෙනා කරන්නෙ, යටගිය පිළුණු වුණු අදහස්ම නැවත නැවතත් පුනපුනා ප්‍රකාශ කිරීම බවයි. මම හිතන්නෙ, හැන්සාඩ් වාර්තා අර ගෙන බැලුවොත්—කථා එකිනෙකට සංසන්දනය කර බැලුවොත්—අප ඒ පැත්තෙ සිටියත්, මේ පැත්තෙ සිටියත් විරුද්ධ පැත්තෙන් කරන කථා බොහෝ විට සමානම දෝෂදර්ශනයන් බව මේ පිළිබඳව පළපුරුද්දක් ඇති මන්ත්‍රීවරයකු වශයෙන් තමුන්නාන්සේටත් පෙනී යනවාට කිසිම සැකයක් නැහැ. මා ඉතාම කනගාටු වුණා, මැද කොළඹ තුන්වන මන්ත්‍රීතුමාගෙ කථාව ඇසීමෙන්. බොහොම වේගයෙන් මහජනතාව පිළිබඳව හදපත්ලෙන් නැගී අවංක සංවේගයෙන් මෙන් කරන ලද එම කථාවෙහි හැම තැනකම වාගෙ පෙනුණෙ ද්වේෂයයි. කළ දේ යටපත් කොට, නොකළ දේ හුවා දක්වමින්, රට විනාශ මුඛයට ලංවූවාක් මෙන් පෙන්වමින් එතුමා කථා කරද්දි කෙනෙකුට පෙනුණෙ, රජය හෙට අනිද්දා නැති නම් දැන් මේ මොහොතෙ, කොයි වෙලේ කඩා වැටෙයිද කියන තත්ත්වයක් ඇති බවයි. මැද කොළඹ තුන්වන ගරු මන්ත්‍රීතුමා ඇතුළු ද්වේෂසහගත, බලාපොරොත්තු සුන් වූ පුද්ගලයනට මා කියන්නේ, 1970 වනතුරු මේ රජය දිගටම පවතින බවයි. ඒ කාලය තුළදී මහජනයාගේ සිත් දිනා ගැනීම පිණිස, වංචනික භාවයෙන් තොරව, අර්ථයෙන් ධර්මයෙන් රටේ යහපත සලසාලීම අපේ පරමාර්ථයයි. දැනට අවුරුදු දෙක හමාරකට පෙර බලයට පත් වූ මේ රජය විසින් මේ රටේ ආර්ථික පරිහාණිය හා අධ්‍යාපන අවුල් හා ඇති කරන ලද බව පෙන්වා දීමට ඒ උදවිය උත්සාහ කළත් මේ රටේ සිටින මිනිසුන් දිගටම රැවටෙන්නන් නොවන බව විරුද්ධ පාර්ශ්වයේ පරණ මන්ත්‍රීවරුනට දන්වන්නට කැමතියි. අප බලයට පත් වෙද්දී තුබුණු තත්ත්වයත් දැන් තිබෙන තත්ත්වයත් සසඳා බලන විට සතුටු නොවිය හැකි මධ්‍යස්ථ පුද්ගලයෙක් ලංකා සමාජයේ ඇතැයි මා හිතන්නේ නැහැ. විනය විනාශ වී, සංවරය වැළලී, ජාති භේදයෙන් ආගම් භේදයෙන් කුලමල භේදයෙන් හතරකට පහකට බිඳුණු රටක බලයටයි, අප පැමිණියේ. කාගේ ව්‍යාපාර නිසාද, මේ රට තුළ එවැනි තත්ත්වයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඊරියගොල්ල]

ඇති වී තිබුණේ? අවුරුදු නවයක් මුළුල්ලේ රට කළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවේත්, අන්තිම තුන් මාසයේදී ඔවුනට දෙබල් ගැසූ සමසමාජ කොමියුනිස්ට් යන දෙපක්ෂයේ සම්බන්ධය ඇතිව පැවතුණු හවුල් ආණ්ඩුවේත් ක්‍රියා මාර්ගයේ අසුභ ප්‍රතිඵලවලින් පෙළී සිටි සමාජයකයි අප බලයට පැමිණියේ. අප බලයට පත්ව සිටි ඉකුත් කාලය තුළදී මේ රටේ සාමය සෑහෙන ප්‍රමාණයකටවත් තහවුරු කිරීමට, විනය සෑහෙන ප්‍රමාණයකටවත් තහවුරු කිරීමට, සංවරය සෑහෙන ප්‍රමාණයකටවත් තහවුරු කිරීමට ලැබීමම සුබ නිමිති නොවේදැයි මා මේ මන්ත්‍රීවරුන්ගෙන් අසන්නට කැමතියි.

අප බලයට එද්දී මේ රට ආර්ථික අතින් පරිහාණි ප්‍රපාතයේ අන්තිම පතුළට වැටී සිටි බව මුළු රටටම අවබෝධ වී තුබුණා. පිටරටින් ගෙන්විය යුතු අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය හා වෙනත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ගෙන්වන්නට දවස් කීපයකට වඩා ප්‍රමාණවත් වන විදේශ විනිමයක් අපට නොතුබුණු බව මේ මන්ත්‍රීවරුන් දනිතත් මොනරාගල මන්ත්‍රීතුමා (රාජා වෙලේගම මයා.) වැනි තරුණ අහිංසක මන්ත්‍රීවරු නම් එය දැන සිටියාහුදැයි මා දන්නේ නැහැ. වැඩිහිටි පරණ පළපුරුදු සියලුම මන්ත්‍රීවරුන් නම් ඒ කාරණය දැන සිටි බව නිසැකයි. එදා ආභ්‍යන්තරික හා බාහිර මුදල් තත්ත්වය, ආහාර තත්ත්වය හා ආර්ථික තත්ත්වය ඒ තරමටම පහත වැටී තුබුණා. එවැනි අවස්ථාවක බලයට පැමිණි අපට අවුරුදු දෙක හමාරක් ඇතුළත මේ පොළොව මත සුර ලොවක් මවා පෙන්වන්නට නොහැකි බව සමහරුනට නොතේරෙන්නේ නොදන්නාකම නිසාම නොව කෛරාටිකකම නිසයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද තත්ත්වය කුමක්ද? කෙසේ හෝ ඒ දුෂ්කරතා මැඩගෙන, කෑමෙන් බීමෙන් ඉඳුමෙන් හිටුමෙන් කලින් පැවැති දුෂ්කරතාවලට මුහුණ පාන්නට මහජනතාවට ඉඩ නොදී ඩඩ්ලි සේනානායක ආණ්ඩුව මෙතෙක් කලක් රට කරගෙන ගියා පමණක් නොව, මුළු ලෝකයේම ආහාර තත්ත්වය අවදානම් අවස්ථාවෙක පවතින අද වැනි සමයකදී පවා අනෙක් බොහෝ රටවල මෙන් අපහසුකම් නොවිඳ ජීවත් වීමට තරම් අපේ තත්ත්වය නංවාලීමට ජාතික ආණ්ඩුව සමත් වුණු බව ඇත්තක්. අද මේ පවත්නා කරදර හිරිහැර, පිරිහීම්, විනය විනාශවීම්, සංවරය නැතිවීම්, රටේ පුරවැසියන් අතර සිටින ජාතීන්-ජාතීන් අතර විරුද්ධකම්, කුලමළ, සිංහල භේද, ආගම් භේද යනාදී සියල්ලම විරුද්ධ පක්ෂයෙ ප්‍රතිපත්තිවල ප්‍රතිඵල බව ඉතිහාසය දෙස බැලුවොත් පෙනෙනවා නේද? අවුරුදු 35 කට පමණ ඈතදී මේ රටේ පැවතුණු සාමය, මේ රටේ පැවතුන සමගිය, මේ රටේ පැවතුණු විනය, ශීලාචාරකම අද නැ. ඒක ඇත්තක්. ඒ කාලය පොත පත කියවන උගතුන් සියයට 20 ක් වත් නොසිටි යුගයක්; ඒ කාලය මෙතරම් ගමන් පහසුකම් හා වෙනත් පහසුකම් නොතිබුණු යුගයක්; ඒ කාලය ස්වාධීනත්වය නොතිබුණු යුගයක්. එහෙත් මිනිසා හා මිනිසා අතර සම්බන්ධතාව, සහෝදරත්වය, කරුණාව, මෛත්‍රිය, ප්‍රේමය ඒ කාලයෙ මීට වඩා තහවුරුව පැවතුණු බව ඔබට මතක ඇති. එසේ නම් අවුරුදු 35 කට පසුව ඒ තත්ත්වය මෙසේ පිරිහී සමාජය හැම අතින්ම විනාශ මුඛයට ළංකිරීමට උපකාරී වූවෝ කවුරුද? මක්බලි ගෝසලයෝ.

1934 දී ජාතියේ පියා—ඩී. එස්. සේනානායක මැතිතුමා—ගල්ඔය, අල්ලෙයි, කන්තලේ, ආදී පෙදෙස්වල වන සතුනටත් විෂඝෝර සර්පයනටත් වාස භූමි වූ ඝන වනාන්තර හෙළිපෙහෙළි කරවා, වැව් බන්දවා, ගෙවල් සාදවා, වාරිමාර්ග සකස් කොට, දහස් ගණන් දුප්පත් ගොවීන් එහි පදිංචි කරවා, වී වපුරවා, රට ස්වයංපෝෂිත කිරීමේ ව්‍යාපාරය ආරම්භ කළ සමයේදී, දැන් මෙහි අපට බණ දෙසන මැද කොළඹ තුන්වැනි ගරු මන්ත්‍රීතුමා (කෙනමන් මයා.) වැනි අය, යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) වැනි අය කෙළේ මොකක්ද? මිනිසුන් අතර භේදය ඇති කොට, එකිනෙකා කොටවා, ඒ ඒ වර්ගයා ඒ ඒ වර්ගයාට කොටවා, අසමගිය ඇති කොට, වෛරය ඊර්ෂ්‍යාව ක්‍රෝධය වගා කළා. සේනානායක—ජාතියේ පියාගේ—ව්‍යාපාර අවුල් කළා. බුද්ධාගම ක්‍රිස්තියානියට කොටවා—ඒ වැඩය ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඊටත් වඩා හොඳට කළා—ද්‍රවිඩයා සිංහලයාට කොටවා, උස් එකා මිටි එකාට කොටවා, කලිසම රෙද්දට කොටවා, කළු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එකා සුදු එකාට කොටවා, රට අවුලෙන් අවුලට ගෙන ගොස් එයින් ඇති වන පිරිහීමෙන් මතු වන විනාශයෙන් ජයග්‍රහණය කොට බලය ලබා ගැනීමට ගෙන ගිය ව්‍යාපාරය නිසා අද මේ විපතට අප වැටී සිටිනවා. ඕකයි, මෙහි ඉතිහාසය. අද අපේ අර්ථ පරිහාණියට, ධර්ම පරිහාණියට මූලික හේතුව ඕකයි, මොණරාගල මන්ත්‍රීතුමනි. අප උත්සාහ කරන්නේ ඒ විපතින් රට මුදාගැනීමටයි.

අධ්‍යාපනය ගැන මෙතැන මොනවාද, මොනවාද කියවුණා. අනික් ඇමතිතුමන්ලාගේ දෙපාර්තමේන්තු පිළිබඳව කළ විවේචනවලට සම්පූර්ණයෙන් උත්තර දීමට මා බලාපොරොත්තු නොවෙතත් අධ්‍යාපනය පිළිබඳව කළ යම් යම් විචාරණවලට පිළිතුරු දීමට මම සූදානම්. අවුරුදු 9 ක් තිස්සේ සම්පූර්ණ බලය තමන් අත තිබියදී, අධ්‍යාපනය පිළිබඳව නව සකැසුමක් නිරවශෙෂයෙන්ම පිළියෙල කළ යුතු කාලය ඒ කාලය බව දැන දැන, එහෙම එකක් කළාද? දැන් කියනවා, අධ්‍යාපනය අවුල්ලු. මොනවාද, මොනවාද වෙලා තියෙනවාලු. අවුල් තේන්නම්. දැන් නම් අවුල් නැහැ. දැන් අවුල් ලිහීගෙන යනවා. අප එන විට තිබුණේ එකම අවුල් ජාලාවක්. රටේ අනාගත පරම්පරාවේ චරිතය සකස් කරන ගුරුවරුන් දඩ මීමුන් කරගෙන, තමනට දේශපාලන වාසි ලැබුණොත් අනාගත පරම්පරාවට හෙන ගැහුණත් කමක් නැත යන අදහසින් ක්‍රියා කළ මේ මිනිසුන් අපෙන් අහනවා, අධ්‍යාපනයට මොකද වුණේ කියා. මම දෙන්නම් උත්තරය. ප්‍රකෘති වශයෙන් ගන්නා විට හොඳ පුද්ගලයන් වශයෙන්, සමාජ සේවකයන් වශයෙන් සිටි ගුරුවරුන්, දුර්දාන්ත මක්කලි ගෝසාලයන් විසින් මෙහෙයවා නොමඟ යවා තාවකාලිකව බලයේ සිටීම සඳහා බල තණ්හාවෙන් කරන ලද ව්‍යාපාරය නිසා අධ්‍යාපනය සම්පූර්ණයෙන් විනාශවුණ බව ඇත්තයි. උගත්කම වැඩි වුණත් හැදිච්චකම නැතිව ගිය බව ඇත්තයි. අද අපේ රටේ සියයට 84 ක් ලියන්නට කියන්නට දන්නවා. ආසියා ලෝකයේ ඒ අතින්—ලියන්නට, කියන්නට දැනීම අතින්—තුන් වැනි රට වුත්, ලෝකයෙන්ම උසස් රටක් වුත් ලංකාවේ අධ්‍යාපනයේ නියම පරමාර්ථය නැති වූ බව ඇත්තයි. අධ්‍යාපනයේ නියම පරමාර්ථය ගුරුවරුන් ලවා උසස් පන්තිවල ළමයින් නරක් කරවා ඔවුන් තමන්ගේ දේශපාලන පරමාර්ථවලට මෙහෙයවීම නොවෙයි. මිනිහා හා මිනිහා අතර සහෝදරත්වය තේරුම් ගෙන, තමන්ගේ ජීවිත මාර්ගය නිසා අසල් වැසියාගේ ජීවිත මාර්ගයට හානියක් නොවන පරිද්දෙන් ජීවත් විය හැකි නියම පුරවැසියන් ඇති කිරීමයි, අධ්‍යාපනයේ පරමාර්ථය. ඒක කළාද? එසේ නොකර පීටර් සිල්වලා ආරියදාසලා ගැන කඳුලු සලමින් අධ්‍යාපන ආකූලත්වයක් ගැන කථා කිරීම නොවෙද ලොකුම හිනාව? දැන් ඒ ආකූලත්වය ක්‍රමයෙන් නැතිවී යාම දුකට හේතුවක්ලු. අද අපේ ගුරුවරු සියයට 95ක් හොඳයි. ඔවුන්ගේ උදාර සේවය පිළිබඳව අවබෝධයක් ඔවුනට ලැබුණා, මේ අවුරුදු 2½ ඇතුළතදී. ඔවුනට විනා කරමින් සිටි මක්ඛලිගෝසාලයනට නියම තැන් ලැබුණා. ඒක විශාල අපරාධයක්ලු. 1,08,000 ක් පමණ ගුරුවරුන්ගේ ආරක්ෂාව සඳහා, ඒ ගුරුවරුන් නොමග යැවූ කාලකණ්ණි ස්වල්ප දෙනකු ඔවුනට නිසි තැන්වලට යවා, 30,00,000ක් ළමයින්ගේ ආරක්ෂාව හා ශිෂ්ටාචාරය සැලසීම වරදක් නම් අපේ ආණ්ඩුව කළේ අපරාධයක්.

ගරු සභාපතිතුමනි, අද අපේ පාඨශාලා සියයට 95 ක් ආදර්ශමත් බව තමුන්නාන්සේත් දන්නවා ඇති. ගුරුවරුන් කවර දේශපාලන මතයක් දැරුවත් අපේ තහනමක් නැහැ. ඒ බවත් අද ගුරුවරුන් දන්නවා. මේ ලෝකයේ ග්‍රන්ථාරූඪ ඉතිහාසයේ පෙනෙන තෙක් බැලුවත් සර්වතෝභද්‍ර සර්ව සුන්දර දේශපාලන න්‍යායයක් පිහිටි තැනක් ඇත්තේ නැහැ. කෝකෙත් අඩුපාඩු තිබෙනවා. සමහරවිට හුඟක් අඩුපාඩු තිබෙනවා; සමහරවිට ටිකක් අඩුපාඩු තිබෙනවා. ඒ නිසා සර්වතෝභද්‍ර නොවූ න්‍යායයන්ගෙන් කොයි න්‍යායය තමන්ගේ මතය වශයෙන් ගත්තත් අපෙන් දෝෂයක් නැහැ. එහෙත් තමන් අනුගමනය කරන දේශපාලන මතය අනාගත සමාජයේ ඉරණම අතේ දැරීමට සකස් වන බාල පරම්පරාවට කාවැද්දීමයි, වරද. ඒක කෙරෙව්වේ මොන රජය හෝ වේවා පසුගිය 1965න් ඉහත තිබුණු රජයයන්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඊරියගොල්ල]

දේශපාලන මත දැරීම ගැන ගුරුවරුන්ගෙන් අපි පලිගත්තෙ නැහැ. පලි ගන්නෙත් නැහැ. අපේ අගමැතිතුමාගේ අනුශාසනය දේශපාලන මත දැරීම ප්‍රජාතන්ත්‍රවාදයේ අංගයක්ය යනු නිසා විවිධ මතධාරීන් කවර තැනක හිටියත් අපට කමක් නැහැ. විශේෂයෙන් අනාගත පරම්පරාව සකස් කරන ගුරුවරයා පාඨශාලාවට ඇතුළු වන විට, පන්සලට ඇතුළුවන උපාසකයා වන්දනාකාරයා තම පාවහන් පන්සලේ පඩිපෙළ උඩ තබා ඇතුළු වන්නා සේ, තම දේශපාලන මතය කුමක් හෝ වේවා—එක්සත් ජාතික පක්ෂයේ මතය හෝ වේවා, ෆෙඩරල් පක්ෂයේ මතය හෝ වේවා, සමසමාජ පක්ෂයේ මතය හෝ වේවා, කොමියුනිස්ට් පක්ෂයේ මතය හෝ වේවා—එය පාඨශාලාවේ පඩිය උඩ තබා ඇතුළු විය යුතුයි. අද ගුරුවරයා කරන්නේ ඒකයි. අද පාඨශාලා ඇතුළේ දේශපාලන මත නැහැ. තවමත් ටික තැනෙක ඇති. 1,08,000 ක් ගුරුවරුන්ගෙන් 1,07,000 ක් ගුරුවරුන් හොඳයි කියා මා කියනවා. අප ඔවුන්ගෙන් දේශපාලන වාසි බලා පොරොත්තු වෙන්නේ නැහැ. අපි ඔවුන්ගෙන් අපේක්ෂා කරන්නේ අපේ දරුවන්, අහිංසක දරුවන්, නොඉඳුල් අදහස් ඇති දරුවන්, මෘදු හදවත් ඇති දරුවන්, ගුරුවරුන්ට ඕනෑ නම් ඕනෑ විධියට අඹා ගත හැකි සිත් ඇති දරුවන් තුළට තමන්ගේ පෞද්ගලික දේශපාලන මත කාවද්දන්නේ නැතුව පොදුවේ මධ්‍යස්ථව ඔවුන් වැඩි වියට පත්වී තමන් කැමති දේශපාලන මතයක් ඔස්සේ යාමට ඉඩ තබා නිදහස් අධ්‍යාපනය ලබා දීමයි. ඒක අද ක්‍රමයෙන් සිදු වීගෙන යන බව කියන්නේ ජාතික රජයේ අමාත්‍යවරයකු හැටියට මහත් ආඩම්බරයෙන්. අපේ ගුරුවරුන් නරක් කිරීමට ඉතින් නම් ඉඩක් ලැබෙනැයි කියා මා සිතන්නේ නැහැ. හැමදාම පෙළපාලි ගිය, ගුරු වෘත්තියට නින්දා කළ, රෙදි කෑලි සම් උස්සාගෙන පාරේ සටන් පාඨ කියමින් ගිය මක්ඛලිගෝසාලයන් ටික දෙනකුගේ වැඩ තහනම් කළා, අස් කළා, කියා කිඹුල් කඳුලු හෙළීම විගඩමක්. ඒ අය පාඩමක් ඉගෙනගන හරියට හැදුණොත් නැවතත් සේවයට ගැනීම ගැන අප කල්පනා කර බලනවා. එහෙත් ඒ සෙල්ලම නැවතත් පාඨශාලාවල කරන්න ට ඉඩ නොතබන බව පමණක් කියන්නට කැමතියි. එයයි, අද පාඨශාලා පිළිබඳ ප්‍රතිපත්තිය.

නියෝජ්‍ය කථානායකතුමනි, අනෙක් කාරණය මෙයයි : පාඨශාලා වෙන අතිනුත් අවුල් ජාලාවක් බවට පත් වී තිබුණා. අප සංඛ්‍යා ලේඛන ගනිද්දී පෙනී ගියා, පුහුණු ගුරුවරුන් 3 දෙනෙක් හිටිය යුතු තැන 13 දෙනකුත්, 13 දෙනෙක් හිටිය යුතු තැන 3 දෙනකුත් යන මේ විධියට ඉන්නා බව. උපාධිධාරීන් පිළිබඳ තත්ත්වයත් එහෙමයි. විශේෂඥ ගුරුවරුන් පිළිබඳ තත්ත්වයත් එහෙමයි. ඔන්න ඔහොමයි, පැවැති තත්ත්වය. විරුද්ධ පක්ෂයේ ඇතැම් ගරු මන්ත්‍රීවරුන් අධ්‍යාපනය ගැන නාහෙන් අඬනවා. අළුත් ගරු මන්ත්‍රීවරු නම් තවමත් හොඳයි, අහිංසකයි. මට කණගාටුයි, ඒ අය ගැන. මොණරාගල ගරු මන්ත්‍රීතුමා (රාජා වෙලේගම මයා.) තම හද පත්ලෙන් නැඟුණු අවංක අදහස් මතු වුණු ස්වරූපයෙනුයි, කථා කළේ. ඒ නිසයි මා කියන්නෙ, නරක් වන්නට එපාය කියා.

ඒ මේ අවුල් තත්ත්වයෙන් පාඨශාලා මුදා ගැනීම, මුල් අවුරුද්දේ අපේ ප්‍රධාන කාර්යය වුණා. වික්ටෝරියා මහා රාජිණිය ගේ කාලේ එංගලන්තයේ තිබුණු යල් පිනූ අධ්‍යාපන ක්‍රමය පිළිබඳ නිර්දේශ පත්‍ර හොයන්නට එංගලන්තයට ගිහින් බැහැ, මේ ලංකාවට එන්නට ඕනෑ. පැළැස්තර දමමින්, අණ්ඩ දමමින් ඒ යල් පිනූ අධ්‍යාපන ක්‍රමය එසේම ගෙන යාම නිසා, ජාතියේ වවුමනාවන් සඳහා කිසි සේත් සකස් නොවුණු අධ්‍යාපන ක්‍රමයක් සකස් කළ යුතුව තිබූ කාලෙ—මීට අවුරුදු 10 කට පමණ පෙර—සකස් නොකිරීම නිසා මොකක්ද වුණේ ? උගත් අය රැකියා නැති වීම නිසා අඬනවා. ඒකයි, වුණේ. ජ්‍යෙෂ්ඨ සමතුනට පමණක් නොව ඒ අධ්‍යාපන ක්‍රමය යටතේ සකස් වුණු උපාධිධරයන ටත් අද රැකියා නැහැ. කාගෙද වරද ? අවුරුදු 9 ක් පල් වුණු අධ්‍යාපන ක්‍රමයක් අවුරුදු 2 1/2 කින් සකස් කළ හැකි සමතුන් මෙහි නැති බව ඇත්ත.

දැන් පාඨශාලා සකස් වේගන යනවා. ගුරුවරුන්ගේ නැති වුණු ගෞරවය දැන් ආරක්ෂා වේගන යනවා. ශිෂ්‍යයන් ගුරුවරුනට දැක්වූ ගෞරවය දැන් නැවතත් ඇති වේගන යනවා. ගුරු—ශිෂ්‍ය සම්බන්ධය තහවුරු වේගන යනවා. ඒ අතර අපේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අගමැතිතුමාගේ නියමය අනුව, මේ රටට තබා වෙන රටකටවත් දැන් නොගැලපෙන, උගතුන් අතරමං කරන, යල් පිනූ කබල් අධ්‍යාපන ක්‍රමය සම්පූර්ණයෙන්ම වළලා දමා, රටේ හා ජාතියේ වුවමනාවන් අනුව සකස් වන, පාඨශාලාවෙන් ඉගෙන ආපසු සමාජය කරා යන තරුණයා හෝ තරුණිය අතරමං නොවී, දෙමාපියන්ට බරක් නොවී, සමාජයට කරදරයක් නොවී, මොකක් හෝ රැකියාවකට සකස් වන අධ්‍යාපන ක්‍රමයක් ඒ වළ මත ගොඩනැංවීමට දැන් වැඩ සූදානම් කර ඉවරයි. ආඥා පනත—කාර්මික හා සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ඒ නව ආඥා පනත—දැන් කැබිනට් මණ්ඩලය ඉදිරියේ තබා තිබෙනවා. මා බලාපොරොත්තු වෙනවා එය මේ ගරු සභාව ඉදිරියට ගෙනෙන්නට, නව සති කීපයකින් පමණ—ඔක්තෝබර් මාසයෙන් පෙර. දැන් ඒ පිළිබඳ වැඩ සකස් වේගන යනවා. මා දන්නවා, එය ස්ථිර වන බව. ප්‍රසිද්ධියේ විරුද්ධ වුවත් විරුද්ධ පාර්ශ්වයේ අයත් එයට කැමති ඇති. ඒ නිසා සමහර අය ඡන්දය දෙන දවසට ඊට පක්ෂව ඡන්දය දෙන්නට බැරි නිසා—පක්ෂ විනයානුකූලව එවැන්නක් නොකළ හැකි නිසා—සමහර විට නැවිත් ඉන්නටත් පුළුවනි. ඒ පණත් කෙටුම්පත සම්මත වුණු දාට අධ්‍යාපනය සම්බන්ධයෙන් මේ රටේ නව යුගයක් ආරම්භ වෙතැයි මා කල්පනා කරනවා. එහිත් අඩුපාඩු ඇති. සර්වසම්පූර්ණ ක්‍රමයක් එකැවරම සකස් කරන්නට පුළුවන්කමක් ඇති විශ්වකර්මයෙක් අද මේ ලෝකයේ කොතැනකවත් නැහැ. ඒ නිසා එහි යම් යම් අඩුපාඩු තිබෙන්නට පුළුවනැයි මා කියනවා. ගරු මන්ත්‍රීතුමන්ගේ විවේචන අනුව ඒ අඩුපාඩු හැකි තාක් දුරට පිරිමසාගෙන ක්‍රියාත්මක කරන්නට බලාපොරොත්තුයි.

අප බලයට එන විට මේ රටේ එක් පාඨශාලාවක උගන්වන තත්ත්වය අනෙක් පාඨශාලාවේ තිබුණේ නැහැ. ගමේ පාසලේ එක් විධියකටත්, නගරයේ පාසලේ තවත් විධියකටත් උගන්වන ක්‍රමයක් ඒ වකවාණුවේ තිබුණේ. තවමත් ඒ තත්ත්වය හුඟක් තැන්වල සම්පූර්ණයෙන්ම නැති වී ගොස් නැහැ. සවල්ප තැනෙක තවමත් ඒ තත්ත්වය තිබිය හැකියි. ඒ සම්බන්ධයෙන් අප කළේ කුමක් ද? ගම්වල විද්‍යාව උගන්වන පාඨශාලාවල ඉගෙනීම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවනටත්, විද්‍යාව උගන්වන නගරයේ පාඨශාලාවල ඉගෙනීම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවනටත් නගරයේ පාඨශාලාවල ඉගෙනීම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවනට උගන්වන තත්ත්වයට අනුවම ඉගැන්වීම සඳහා මහා විද්‍යාල සියල්ලකම හැකි තාක් දුරට ගුරු මණ්ඩල සකස් කළා. එහි ප්‍රතිඵලයක් වශයෙන් මේ අවුරුද්දේ සිදු වූ දේ තමුන්නාන්සෙ දකින්නට ඇති. නගරයේ මහා විද්‍යාල පසු බා ගම්වල මහා විද්‍යාලවලින් විද්‍යාව උගත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් විශාල පිරිසක් මෙදා විශ්ව විද්‍යාලයයට ඇතුළු වුණා. මේ කාරණය තමුන්නාන්සේ මීට පෙර දැනගෙන සිටින්නට ඇති. අවුරුද්දක් තුළම මේ ප්‍රතිඵල ලැබුණා.

ඉගැන්වීම සම්බන්ධයෙනුත් යම් යම් වෙනස්කම් ඇති කරන්නට අපට පුළුවන් වුණා. සමහර විට ගුරුවරයා හෝ දෙන්නා සිටින සමහරක් පාඨශාලා හැරුණු විට මුළු ලංකාවේ පාඨශාලා අට දාස් ගනණේක පළමුවැනි ශ්‍රේණියට උගන්වන ගුරුවරු සියල්ලම පුහුණු අය.

විරුද්ධ පාර්ශ්වයේ ඇතැම් ගරු මන්ත්‍රීතුමන් අපට එරෙහිව තවත් ලොකු චෝදනාවක් එල්ල කර තිබෙනවා. ඒ ඉංගිරිසිය ගැනයි. සමහර උදවිය ඉංගිරිසියට හැබෑම තරහයි. වලපනේටයි, දඹුල්ලටයි ඉංග්‍රීසි විහ. අපත් ඔය ඉංගිරිසියට තිබෙන වැඩි ආදරයක් නිසා නොවෙයි එසේ කළේ. අපේ ජනතාවට ලෝකයේ විද්‍යා ද්වාරය ඇර ගැනීමේ—විවෘත කර දීමේ—එකම මාර්ගය වශයෙන් කුමක් හෝ ජාත්‍යන්තර භාෂාවක්—ජගත් භාෂාවක් උගැන්විය යුතු නිසා අපට හුරු පුරුදු භාෂාවක් වන ජගත් භාෂාව, ඉංගිරිසි නිසා, ඉංගිරිසි එක වචනයක්වත් නොදන්නා කෙනකු මේ මුළු රටේම නැති නිසා—හුරු පුරුදු ඒ ජගත් භාෂාව විධිමත්ව උගැන්වීමට කටයුතු පිළියෙල කරගෙන යනවා. විශේෂයෙන් පශ්චාත් උපාධි පර්යේෂණවලට පෙනී සිටින්නන් සම්බන්ධයෙන් එය ඉතා වැදගත් වෙනවා. අපට වුවමනා කරන විද්‍යාඥයින්, දොස්තරවරුන්, ඉංජිනේරුවන්, ගුරුවරුන්, පිට රට යවා විශේෂඥ දැනුම ලබා ගැනීමට ඉංගිරිසි උපකාර වන නිසයි එසේ කරන්නේ. එසේ නැතිව ඉංගිරිසියට තිබෙන වැඩි ලැදියාවක් නිසා නොවෙයි. එය අපරාධයක් ද? තමන්ගේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඊරියගොල්ල]

ළමයකුට ඔහුගේ බොක්කේ පිළිකාවක් හැදුණු විට මා හිතනවා දඹුල්ලේ, වල පනේ කවදාවත් ඉංගිරිසි වෙදකම් නම් නොකරනවා ඇති. සිංහල බෙහෙත්ම ගන්නවා ඇති. ලෙඩා මළත් සිංහල බෙහෙත්ම ගන්නවා ඇති. ඒ තරම උදුර ජාතික හැඟීමක් ඒ අයට තිබෙනවා. මෙසේ නන් දොඩවා අහිංසක ජනතාව රවටා තවමත් රජ කරන්න පුළුවන් උදවිය මේ ආණ්ඩුවෙ කාල සීමාව තුළදී ඉවර කරන බව මතක් කරන්න කැමතියි. දැන් මිනිසුන් ඒ තරම් මෝඩ නැහැ.

කවුදෝ කතා කර තිබුණා, විශ්ව විද්‍යාලය වල විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, වෛද්‍ය විද්‍යාව යන විෂයයන් ඉංගිරිසියෙන් උගන්වන්ට තීන්දු කළාය කියා. නැහැ, එහෙම තීන්දුවක් නැහැ. 1968 වර්ෂයේ පටන් වෛද්‍ය, ඉංජිනේරු, විද්‍යා යන විෂයයන් හැකි තරමින් සිංහලයෙන් (ස්වභාෂායෙන්) ඉගැන්වීමට විධිවිධාන යොදා තිබෙන අතර, පරණ යල් පැනපු වික්ටෝරියා කාලේ ඇතැම් විද්‍යා මත දැන් පිළි නොගන්නා නිසා සිංහලෙන් උගන්වන්ට පොත පත නැති නම් අපි කළයුත්තේ කුමක්ද? නවීන විද්‍යාව, වෛද්‍ය විද්‍යාව සහ ඉංජිනේරු විද්‍යාව යනාදී විද්‍යාවන් පිළිබඳ මත පළවන පොත් පළ වී තිබෙන්නේ ජගත් භාෂාවලින් පමණක් නිසා අපි කළ යුත්තෙ මෙයයි : මෙම විෂයයන් ඉංගිරිසි පොත්පත්වලින් ඉගැන්වීමයි. අපට වුව මනා කරන්නෙ එම විෂයයන් ඉගැන්වීමයි. ඉංගිරිසි පොත් බලාගෙන සිංහලෙන් ඉගැන්විය හැකි ගුරුවරු ඒ එසේ කිරීමේ වරද කුමක්ද? ශිෂ්‍යයන්ගේ පහසුව සඳහා ඉංගිරිසි ඉගෙනීමේ වරද කුමක්ද?

අපේ පරිවර්තන පොත් ටිකක් තිබුණත් ඒවා ප්‍රමාණවත් නැහැ. මට මේ පිළිබඳව හොඳ පළපුරුද්දක් තිබෙනවා. අපි එක විද්‍යා පොතක් පරිවර්තනය කර මුද්‍රණය කොට අවසාන වන විට එහි මුල් පොත 22 වන වාරයටත් ප්‍රතිසංස්කරණය වී තුබුණා. අපි එවැනි පොතක් පරිවර්තනය කර ප්‍රකාශයට පත් කරන විට එහි මුල් පොතේ එතරම් වෙනසක් ඇති වෙලා. මාස යෙන් මාසය, දවසින් දවස, වෙනස් වන විද්‍යාව ඉගැන්වීමට තරම් පොත් පත් ගොඩක් සිංහලයේ නැහැ. සිංහල වෛද ක්‍රමෙහි ශල්‍ය කර්ම කිරීමේ විධියක් දැන් නැතුවා වාගේ, සකල විද්‍යා අංශ ඉගැන්වීමට පොත පත තවම සිංහලයෙහි නැහැ. පොත පත තිබෙනවා නම් සිංහලෙන් එම විද්‍යාවන් උගන්වන්ට බැරිකමක් නැහැ. සිංහලය හොඳට ව්‍යාප්ත වේගන යන භාෂාවක්. සිංහලය හොඳ ලස්සන අපූරු භාෂාවක්. එහෙත් සිංහලෙන් එම පොත පත නැති නම් මොකද කරන්නෙ? සිංහලත් ඉංගිරිසිත් දන්නා කථිකාචාර්යවරයා ඊට ගැළපෙන ඉංගිරිසි පොතකින් බලාගෙන එය සිංහලෙන් ඉගැන්වීමේ ඇති වරද මොකද? එහෙම නැතුව උගන්වන්නෙ කොහොමද? උම්මග්ග ජාතකයෙන් පුළුවන්ද, විද්‍යාව උගන්වන්නට? උම්මග්ග ජාතකය හොඳ පොතක්. මා ඒ පොත කියවා ඇති, පණස් වාරයක් පමණ. ඒ පොත එතරම් වටිනා ග්‍රන්ථ රත්නයක්. ඒ පොතේ තිබෙනවයැ, හදට යන හැටි. වල පනේ ගරු මන්ත්‍රීවරාගෙත් දඹුල්ලෙ ගරු මන්ත්‍රීවරයාගෙත් සිංහල භාෂාවට තිබෙන ආදරය මගෙත් තියෙනව. සිංහල භාෂාවට ඒ ගොල්ලන්ගෙ ආදරය ඇති හැටි මම තව ටිකකින් පෙන්වන්නම්. නවීන විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව සහ වෛද්‍ය විද්‍යාව ඉගැන්වීමට සිංහලෙන් පොත පත නැති නම්, පොත පත තිබෙන්නේ ඉංගිරිසියෙන් නම්, උගන්වන පුද්ගලයාට එම විද්‍යාවන් සිංහලෙන් ඉගැන්වීමට හැකි නම් එසේ කිරීම කවර වරදද? තමුන්නාන්සෙල මේවා උගන්වන්ට එපා කියනවාද?

විශ්ව විද්‍යාලවල ඉගැන්වීම පිළිබඳව අපි තවත් යෝජනාවක් කර තිබෙනවා. ජාත්‍යන්තර වශයෙන් යෙදෙන බොහෝ පාරිභාෂික වචන—Technical terms—තිබෙනවා. බොහෝ භාෂාවල ඒවා සමානව යෙදී තිබෙනවා. එනිසා අපත් ඒ මුල් පොතේ තිබෙන වචන ඒ විධියෙන්ම සිංහල හුරුවට සකස් කර ගැනීමට යෝජනා කර තිබෙනවා. Engine යන්නට අපි දැන් එන්ජිම යයි කියනවා. එන්ජිම යයි එයට පාවිච්චි කළාට කමක් නැහැ. එහෙත් යන්ත්‍රය යැයි කී විට මොකක්ද තේරුම? කරේ බඳින යන්ත්‍රත් තිබෙනවා. එන්ජිමක් ගෙනෙන්නට කී විට කරේ බඳින යන්ත්‍රයක් ගෙනාවොත් අලි ගම් පෙරළියක් නේද, එතන? එම නිසා එහි මුල් ඉංග්‍රීසි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වචන ගෙන සිංහල හැඩහුරුවට අග සකස් කොට, විභක්ත්‍යන්තය දමා එසේ පිළියෙළ කරගන්ට පුළුවනි. සිංහල වචනය ගැල පෙන තැන එසේ කෙරෙනවා. තවද, හැකි තරම් පොත් පත් සකස් කරගැනීම සඳහා පරිවර්තන අංශයද පුළුල් කර තිබෙනවා. එහි වරද මොකද? ලංකාවේ සෑම මධ්‍ය මහා විද්‍යාලයකටම මහා විද්‍යාලයකටම—නාම පුවරු පමණක් ගසා ළමයින් දෙතුන් සියයක් සිටින පාසල්වලට නොවෙයි, නියම මධ්‍ය මහා විද්‍යාලවලට හා මහා විද්‍යාලවලට—විශෙෂඥ ඉංගිරිසි ගුරුවරුන් ඒ ඒ විද්‍යාලවල ශිෂ්‍ය සංඛ්‍යාව අනුව බෙදා හැර තිබෙනවා; සමහර අඩු පාඩු තව නැත්තේ නොවෙයි. ඔබතුමා පුදුම වේවි, මේ අය අධ්‍යාපනය ගැන කථා කරන නමුත් විද්‍යා ගුරුවරුන් 179 දෙනෙක් අදටත් අඩු බව ඇසූ විට. විද්‍යාගාර තිබෙන පිටිසර මහා විද්‍යාලවලට සුදුසු ගුරුවරු යැවීමට කිසිම වැඩ පිළිවෙළක් යොදා තිබුණේ නැහැ, අප බලයට පැමිණෙන විට. පිටිසරට තිබෙන ආදරය! හරි ආදරය! මේ දඹුල්ලෙ ගරු මන්ත්‍රීතුමා උප ඇමති කෙනකුත් වෙලා හිටියානෙවැ අධ්‍යාපන කටයුතු පිළිබඳව. ඔන්න තත්ත්වය මොනරාගල මන්ත්‍රීතුමනි. 179 දෙනෙක් අදටත් අඩුයි. අප කෙළේ මොකක්ද? විශ්ව විද්‍යාලවලින් පිට වන උපාධිධරයන් සංයුක්ත මංඩලවලත්, පෞද්ගලික ආයතනවලත්, වෙනත් ව්‍යාපාර වලත්, විදේශ වලත් වැඩි පඩිවලට යන නිසා අපට බඳවාගත හැක්කේ ඉතාම ස්වල්ප දෙනයි. එනිසා අපි කැබිනට් මණ්ඩලයේ කරුණු සාකච්ඡා කර විශෙෂ වශයෙන් උගැන්වීමටම පස් අවුරුදු පොරොන්දුවක් පිට අවුරුදු දෙකක විශ්ව විද්‍යාල පුහුණුවක් ලබා දීමට දැන් වැඩ පිළිවෙළක් යොදාගෙන, යනවා, ඒ ඇබෑර්තු පිරවීම සඳහා.

එපමණක් නොවෙයි. සිංහල අධ්‍යාපනය මොන අවුල් තත්ත්වයකද තිබුණේ. අනේ නියෝජ්‍ය කථානායකතුමනි, ඩඩ්ලි සේනානායක රජය බලයට පැමිණෙන කාලයේ සමහර අවස්ථාවල විශ්ව විද්‍යාල ප්‍රවේශ පංක්තියේ ඉගැන්නුවෙ ශිෂ්‍ය ගුරුවරු. බදුල්ල මොනරාගල ආදී පළාත්වල මූල් ගුරුකම් දැරුවේ ජ්‍යෙෂ්ඨ සමත්තු ඇතැම් පාසල්වල. එහෙම නේද මොනරාගල මන්ත්‍රීතුමනි? අද ඒ තත්ත්වය තිබෙනවාද? ඒවා සියල්ලම සකස් කළා පමණක් නොවෙයි, නියෝජ්‍ය කථානායකතුමනි, ගණිතය, විද්‍යාව, ඉංගිරිසිය, සාහිත්‍යය—සිංහල සාහිත්‍යය, දෙමළ සාහිත්‍යය—පිළිබඳ විශෙෂඥ ගුරුවරුන් කණ්ඩායමක් අමාත්‍ය කාර්යාලයෙ රඳවාගෙන උත්තරත් සමග විශෙෂ පාඩම් සකස් කොට, මේ වාරයේදී සම්පූර්ණ කළ යුත්තේ මෙහෙමය කියා උගන්වන පාඩමුත් නියම කොට, ලංකාවේ ඉස්කෝල 9,000 ටම අරින ඕව මම හිතනව හීනයක් වෙන්න ඇති විරුද්ධ පක්ෂයටම. අප ඒ දැන් කරගෙන යනවා. කොළඹ රාජකීය විද්‍යාලයේ උගන්වන පාඩමමයි කුලියාපිටියෙ ගමේ තිබෙන ඉස්කෝලෙත් උගන්වන්නෙ. මොනරාගල ඉස්කෝලෙ උගන්වන්නෙත් ඒ පාඩම මයි.

**රාජා වෙලේගම මයා.**
*(திரு. ராஜா வெலேகம)*
(Mr. Rajah Welegama)
විද්‍යා ගුරුවරු තවම නැහැ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
නැහැ. ඒක හරි විද්‍යාගාර තිබෙන ඉස්කෝලවලටත් තවමත් 179 ක් අඩුයි. ඒකයි තත්ත්වය. අවුරුදු දෙකේදී සම්පූර්ණ කරන්න බැහැ. හදිස්සියෙ උගන්වල ගන්න බැහැ නොවැ විද්‍යාව. මෙපමණ අධ්‍යාපනය ගැන කැක්කුමක් තිබෙන පුද්ගලයනට ඒ කාලෙ මේක මතක නැති වී තිබෙනවා නොවැ. විද්‍යා ගුරුවරුන් කොහොමද අවුරුදු දෙකහමාරෙන් ලබා ගන්නෙ? සමහර නාගරික පාසල්වල පුරවාගෙන සිටි වැඩිමනත් විද්‍යා ගුරුවරුන්—උපාධිධරයන්—ඒ තැන්වලින් ගෙන සමසේ බෙදා හැරීම සඳහා දන් වැඩ කරගෙන යනවා. මා තමුන්නාන්සේලාගෙන් ඉතාම ආදරයෙන් ඉල්ලා සිටිනවා මේ මාරු වෙනස් කරන්නය ආදිය කියාගෙන එන්න එපාය කියා. සමහරුනට මේ මාරුවට තව මාස තුන හතරක් කල් දී තිබෙනවා. ඒ අය ලබන ජනවාරියෙ මාරු කෙරෙනවා. මුළු ලංකාව පුරාම විහිදුවලා අරිනව.

එපමණක් නොවෙයි, නියෝජ්‍ය කථානායකතුමනි, 3 වැනි ප්‍රමාණයේ පටන් අනිවාර්ය විෂයයක් වශයෙන් ඉංග්‍රීසි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඊරියගොල්ල]

ඉගැන්වීම කළ යුතු යයි ඒ ආණ්ඩුව විසින් නියමයක් කර තිබුණා. එහෙත් අදටත් අඩු ඉංග්‍රීසි ගුරුවරු ගණන 2,600 යි. 2,600 ක් අදටත් අඩුයි. දුර්දාන්ත අන්ත ජාතිවාදය නිසා අපේ අනාගත ශිෂ්‍ය පරම්පරාව විනාශ කළා ඒ ආණ්ඩුව. ඉංග්‍රීසි එක්ක තරහට—ගමේ නම් මේකට හොඳ කථාවක් කියනවා; මේ ගරු සභාවේදී ඒක මා කියන්න යන්නේ නැහැ; අපේ මොනරාගල මන්ත්‍රීතුමා (රාජා වෙලේගම මයා.) නම් දන්නවා ඇති; මෙහෙ නම් කියනවා, නහය එක්ක තරහට කන කැපුවා වාගෙ කියා—ඒ වාගේ ඉංගිරිසි එක්ක තරහට පිරිසර ඉස්කොළ විනාශ කළා. ඉංගිරිසි දෙවන භාෂාවක් නොකර. ඒකේ ප්‍රතිඵලයක් හැටියට, ඉංගිරිසි විෂයක් වශයෙන් ගෙන ජ්‍යෙෂ්ඨය සමත් වුණු පුද්ගලයන් ශිෂ්‍ය ගුරුවරුන් වශයෙන් බඳවා ගැනීමට තිබුණු ඇබෑර්තු 2,700 ගණන පිරවීම සඳහා ඉල්ලුම් කළේ 150 දෙනයි. අහසට ඇහෙන තරම් අපරාධයක් නොවෙද මේ කර තිබෙන්නේ. කථා කරනවා අධ්‍යාපනය අවුල් කළාය කියා—මගේ කටට එනවා, කියයුතු දෙය. ඒත් කියන්න හොඳ නැහැ මේ සභාවෙදි. ඔන්න ඕකයි ඇත්ත.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප මේ විපතෙන් මිදෙන්න කරන්නේ මොකක්ද? අප ඉංගිරිසි භාෂාව පිළිබඳ විශෙෂඥසින් යොදවා, සති අන්තයේ දවස් දෙකේ දීම ලංකාවේ ඒ ඒ පළාත්වල වරකට පළාත් තුන හතර බැගින් ගෙන සංස්කරණ පංක්ති තබාගෙන යනවා. එපමණක් නොව, නිවාඩු මාසයේදී මුළු මාසයේ සති දෙකක් නැතිනම් තුනක් සංස්කරණ පංති තබාගෙන යනවා. විද්‍යාව පිළිබඳ අලුත් ඉගැන්වීමේ ක්‍රම ගැන අවබෝධයක් ලබාදීම සඳහා එංගලන්තයෙන් විශෙෂ විද්‍යා ගුරුවරුන් බ්‍රිතාන්‍ය සභාවේ උපකාරය ඇතුව ලංකාවට කැඳවා ඒ වැඩ කටයුතු කරගෙන යනවා. සාහිත්‍යය පිළිබඳ සංස්කරණ කටයුතුත් එසේම කරගෙන යනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එපමණක්ද සිංහල භාෂාවට මේ අය කර තිබෙන්නෙ? ඉංගිරිසි පත්‍රකාරයින් කෑගහනව, ඉංගිරිසි හරියට උගන්වන්නෙ නැහැ, ඉංගිරිසි දැනීමේ තත්ත්වය පහත වැටෙනවා වැටෙනවා කියා. එහෙත් ඉංගිරිසි බස කථා කරන කවුරුන්වත් වරද්ද වරද්දා කථා කරන්නේ කලාතුරකින්. වරද්දා කථා කළොත් රජා මැරුවාය කියා හිනහා වෙනවා. ඉංගිරිසියෙන් ලියන කවුරුන්වත් වරද්ද වරද්දා ලියන්නේ නැහැ. ඉංගිරිසි පත්‍රයෙක කර්තෘ වාක්‍යයක් කවදාවත් ව්‍යාකරණ වරද්දා ලියවෙන්නෙ නැහැ. සිංහලය එහෙම නොවෙයි; විවිධයි. දහ දෙනෙක් ලියන විට දහ අතකට ලියනවා. එක් කෙනෙක් මූර්ධන්‍ය යොදා සිංහල ලියනවා. තවත් කෙනෙක් ලියනවා දන්ත්‍යය යොදා. මූර්ධන්‍යය ඉගෙන ගත් ළමයාගේ උත්තර පත්‍රය දන්ත්‍යය පිළිගත් පරීක්ෂකවරයා බැලුවොත් ලකුණු කපනවා. දන්ත්‍යය පමණක් ඉගෙන ගත් ළමයාගෙ උත්තර පත්‍ර මූර්ධන්‍යය පිළිගත් පරීක්ෂකවරයා බැලුවොත් ඒත් ලකුණු කපනවා. වචන විභක්ත්‍යන්ත කිරීම එක් කෙනෙක් කරන්නෙ එක විධියකට, තවත් කෙනෙක් තවත් විධියකට. ඇතැමෙකු නාමය බහු වචනාර්ථයෙන් ලියා ඒක වචනාර්ථයෙන් ආඛ්‍යාතය—ක්‍රියාව—යොදනවා. ඇතැමෙකු එය ඒක වචනාර්ථයෙන් ලියා බහු වචනාර්ථයෙන් ක්‍රියාව යොදනවා. මේක මළ ජූලියක්.

තමුන්නාන්සේ පුදුම වෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශිෂ්‍යයින්ගේ සිංහල භාෂාව දැනීමේ තරම ගැන. ජ්‍යෙෂ්ඨයෙන් සමත් වුණු ශිෂ්‍යයින්ගේ උත්තර පත්‍ර ගැන පරීක්ෂණයක් පැවැත්වුණා. එසේ සමත්වූ අයගෙන් සියයට හැත්තෑපස් දෙනෙකුගේ පමණ සිංහල ව්‍යවහාරය වැරදියි. මෙන්න එකල සිංහලයට තිබුණු ආදරය. සිංහල භාෂාව කාලා. එම නිසා ඒ ගැන විශෙෂ කාරක සභාවක් පත් කළා, මේ ජාතික ආණ්ඩුව, මහාචාර්ය හෙට්ටිආරච්චි මහතාගේ ප්‍රධානත්වයෙන් එක විධියෙන් සිංහල ලිවීම සකස් කිරීමට. පෙළක් පරීක්ෂකවරුන් ශිෂ්‍යයින් හරියට ලියා තිබෙන ඒවාත් වැරදියි කියා ලකුණු කපනවා. විභාගවලදී සමත් විය යුතු හුඟක් අය අසමත් වෙන්න ඇති. අසමත් විය යුතු අය සමත් වෙන්න ඇති. මෙහෙමත් අපරාධයක්. ඒ වාගේම භාෂාවට කර තිබෙන තවත් අපරාධයක මහත. ලියන එක ක්‍රමයක් මෙහි නැහැ. දහ දොළොස් විධියකට ලියනවා. එක් කෙනෙක් "ඔහු කීවේ" ය කීවොත්, අනිකා ලියනවා "ඔහු කීවාහු" ය කියලා. "ඔහු කීවාහුය" කියන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාක්‍යයේ "ඔහු" කියන වචනය බහු වචන යක් හැටියට සලකන මිනිහකුට "ඔහු" කියන වචනය ඒක වචනයක් හැටියට ඉගෙන ගත් කෙනෙකුගේ "ඔහු කීවේය" යනුවෙන් වාක්‍යයක් ලියා තිබුණු උත්තර පත්‍රයක් පරීක්ෂා කරන්ට ලැබුණොත් ලකුණු ලැබී අවසානයි. පසුගිය ආණ්ඩුව ඔය තත්ත්වයෙනුයි සිංහල ඉගැන්නුවේ. අද නොයෙක් මතභේද අනුව විවිධ විධි යට ලියන භාෂාව එකම විධියකට ලියන අන්දමට සකස් කිරීමට අප කාරක සභා වක් පත් කර තිබෙනවා. එයම මේ ජාතික ආණ්ඩුව භාෂාවට කරන විශාල සේවාවක් වෙනවා. ඒ කාරක සභාව නිර්දේශ කරන අන්දමට ලියූ පොත් හැර අනෙකුත් පොත් අප ඊට පසු පාසල්වල ඉගැන්වීමට භාර ගන්නේ නැහැ. ඔය අප කරගෙන යන වැඩයි.

ඊළඟට, ඉංගිරිසි භාෂාව ගැන මා වචන යක් කියන්නට සතුටුයි. සිංහල භාෂාව පමණක් ඉගෙන ගෙන ගියොත් රුසියාව, ප්‍රංශය, ජර්මනිය යනාදී රටවල විශ්ව විද්‍යාලවල ඉගෙන ගැනීම බොහොම අමා රුයි. ඉංගිරිසි දැනගෙන ගියොත් කොයි රටේදී වුවත් අමාරුවෙ වැටෙන්නෙ නැහැ. ඉංගිරිසි නොවෙයි, වෙන ඕනෑම ජගත් භාෂාවක් ගන්න. රුසියානු භාෂාව හෝ ප්‍රංශ භාෂාව හෝ ජර්මන් භාෂාව හෝ චීන භාෂාව හෝ ජපන් භාෂාව හෝ වෙන කුමන භාෂාවක් හෝ අප දෙවැනි භාෂා වක් වශයෙන් ඉගෙන ගන්න ඕනෑ. ජාත්‍යන්තර භාෂාවක් ඉගෙන ගන්න ඕනෑ. ජාත්‍යන්තර භාෂාවක් ඉගෙන ගන්නෙ නැතිව විදේශ රටවල පශ්චාත් උපාධි විභාගවලට පෙනී සිටීමටවත් ඉගෙන ගැනීමටවත් බැහැ. ඒත් එක තත්ත්වයක්.

අනික් කාරණය, රජයේ පමණක් නො වෙයි වෙනත් සංස්ථාවලත් පෞද්ගලික ආයතනවලත් ව්‍යාපාරවලත් රක්ෂාවලට ඉල්ලුම් කරන විට පළමුවෙන්ම අහන්නෙ ඉංගිරිසිත් දන්නවාද යන ප්‍රශ්නයයි. ලංකාව ලෝකයෙන්ම හොඳ රටයි. එහෙත් ලංකාවේ භාෂාව පාවිච්චි කරන මිනිසුන් ඉන්නෙ ලංකාවෙ පමණයි. එම නිසා තමයි කෙනෙකු රක්ෂාවකට ගැනීමේදී ඔහු දෙ වන භාෂාවකුත්, ලෝක භාෂාවකුත් දන්නවාද කියා ව්‍යාපාරිකයන් නිතරම සොයා බලන්නෙ. දෙවන භාෂාවක් ඉගෙන ගැනීම අවශ්‍යයි. වෙන කාරණයක් නිසා නොවේ නම්, කෙනෙකුට රක්ෂාවක් ලබා දීමේ පහසුව සලකාවත් දෙවන භාෂාවක් ඉගැන්විය යුතුයි.

අපේ වැඩ පිළිවෙළෙන් පිටිසර මිනිසුන ටත් නාගරික දුප්පත් මිනිසුනටත් කර දර වෙනවාලු. දුප්පත් අයගෙ දරුවනුත් දැන් ඔය පාඨශාලාවලට යනවා. අපෝ ඔවුනට මේ අයගෙ තියෙන ආදරය! ඔවුන් ගැන අඬනවා! ඉංගිරිසි ඉගැන්වීමෙන් පිටිසර ළමයිනටත් නාගරික දුප්පත් ළමයිනටත් අපරාධයක් කරන්නට යනවාය කියා මේ අය අඬනවා. ඇයි දුප් පත් ළමයිනට ඉගෙන ගන්න බැරි ද? ඉංගිරිසි උගන්වන්නෙ නොමිලයේ. දුප් පත් වූ පළියට ළමයකුට ඉගෙන ගන්න බැරි ද? දුප්පත් ළමයිනට ආනන්ද විද්‍යා ලය වැනි මහතැන්වල ඉඩක් නැද්ද ? උඹලා අයින් වෙයල්ලා කියලා ඔවුන් භාර නොගන්න සිරිතක් තියෙනවා ද? මේ කාලේ එහෙම වෙනසක් නැහැ. එම නිසා විරුද්ධ පක්ෂය මොකද මේ බොරු කියන් නෙ? වාචාල බොරු කථා කියමින් ජනතාව නොමග යවන මේ මිනිසුන්ගෙනුත් රටට වැඩක් වෙයි ද? ඇයි මේ මිත්‍යා? දුප්ප තාට තිබෙන ආදරය! අපේ නැතිලු දුප්ප තාට ආදරයක්. අපත් දුප්පත් මිනිස්සු තමයි. අපත් බොහොම අමාරුවෙන් ජීවි කාව ගෙන යන්නෙ. අපේ පැත්තෙ අයට දුප්පතා ගැන කැක්කුමක් තියෙනවා. නමුත් නාන්සෙලා තුළ දුප්පතාට තිබෙන කැක්කුම! මා දන්නවා මොකටද දැන් ඒවා කියන්නෙ.

ජාති ආලය ගැන සභ්‍යත්වය ගැන සංස්කෘතිය ගැන කථා කරනවා. ඔය සංස්කෘතිය ගැන මෙහි කථා කරන මිනිසුන්ගෙ සංස්කෘතිය ශ්‍රාවස්තියෙ නාන කාමරවල බිත්ති කියාවි. කටවල් නැතත් බිත්ති පිපිරූ තැන්වලින් කියාවි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක වැදගත් සභාවක්; ගරු සභාවක්. රටේ මොනවා කිව්වත් මෙතැන මහජන නියෝ ජිතයින් වශයෙන් අප එක්තරා තත්ත්ව යක් ආරක්ෂා කර ගන්න ඕනෑ. මෙතැන ඇත්ත කථා කරන්නට ඕනෑ. දුප්පතා ගැන අපොයි, අර තැනට ගිය කෝන්තිය! මැද කොළඹ තුන්වන ගරු මන්ත්‍රීතුමාට තිබෙන කැක්කුම ආර්ථික පරිහාණියන්ලු.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඊරියගොල්ල]

කටුසර භෝග වැවී නැතිලු. ලොකු මිනිසුන්ට වැව්ලි භාර දීලාලු. කන්නට නැත් නම් මොනා යකා ලවා වැව්වත් සිදු වන්නේ මොකක් ද? ගැමියාට ආදරේලු. ඔව්, අප ගැමියාටත් කම්කරුවාටත් තිබෙන ආදරය නිසයි, අනික් මිනිසුන්ටත් නොමිළයේ හාල් ලැබී තිබෙන්නේ. ඔවුන් කෙරෙහි ඇත්වූ අනුකම්පාව නිසා නොමිළයේ හාල් දෙන බව කල්පනා කරන්න.

හාල් ගැන කථා කරන්නට ගියහොත් වැඩි වේලාවක් ගත වේවි. එසේ වුවද කරුණු ටිකක්වත් මතක් කර දෙන්නට ඕනෑ. හාල් සලාකයෙන් සේරුවක් කැපීමේ කථාව පසුගිය අවුරුද්දේ නොවැම්බර් මාසයේ සිට මේ දක්වා හැම තැනකම විරුද්ධ පක්ෂය ගොස් කියනවා නොවේද? එහෙත් ඔය කියුම් පිළිගත්තෝ කවුරුද? අප අපරාධයක් කළ බව පිළිගෙන තිබෙන්නේ කවුරු ද? අප ගත් පියවර නිසා ඇති වී තිබෙන ප්‍රතිඵල ගරු මන්ත්‍රීවරු දන්නවා ද? දැන ගත හොත් සමහර විට භය වේවි. ලබන අවුරුද්ද වන විට මෙම ජාතික ආණ්ඩුව ආහාර ප්‍රශ්නය විසඳා ගෙන යන හැටි බලන්න. දැන් රටේ හැම තැනම මයියොක්කා හේන්, බතල හේන්, මිරිස් හේන්, වී හේන් අළුත් කෙත් තිබෙන බව විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන්ට පෙනෙන්නේ නැද්ද? ඔය හාල් සම්බන්ධව ගත් පියවරෙහි ප්‍රතිඵලයි. ගොවීන්ට දෙන ණය වෙනුවෙන් සියයට 12 පොළියක් අය කරනවාලු. ඇත්තෙන්ම මෙහෙම කථා කරන්නේ මේ රටේ මිනිසුන් මදු කිරි පානය කළ අය යයි සිතා ගෙන ද? ඔව්, තන කිරි හා ඕලන්ද ටින් කිරිපානය කර තිබෙන්නේ මැද කොළඹ තුන් වන ගරු මන්ත්‍රීතුමා විතරයි. අනෙක් අය බී තිබෙන්නේ මදු කිරි. මේ සියයට 12 කථාව මොකක්ද? එක අතකින් අස්වැන්න වැඩි කර ගැනීම සඳහා අඩු මිළට පෝර සපයනවා. වටිනාකමින් භාගයටයි, පෝර සපයන්නෙ. නියම මිළ රුපියල් 30ක් වන පෝර හොණ්ඩරයක් රුපියල් 15 ගණනේ ගොවීන්ට දෙනවා. ඒ අතර මෙම ජාතික ආණ්ඩුව මහජන මුදලින් ගොවීන්ට ණය මුදල් දෙනවා. අප මුදල් සොයන්නේ ජාතික ආණ්ඩුවේ උදවියගේ හෝ තුන් හවුල්කාරයන්ගේ ධන නිධාන වලින් භාරා ගන්නා වස්තුවෙන් නොවෙයි. නීති පනවා බලහත්කාරයෙන් 1 කෝටි 20 ලක්ෂයක් ජනතාව පාවිච්චි කරන මිරිස් කරලින් ඇනු ගෙඩියෙන් ලුණු කැටෙන්, දඬියෙන් ලෙයින් පෙරා ගන්නා ධනයෙනුයි, අප ගොවීන්ට ණය දෙන්නේ. අප වියදම් කරන්නේ අපේ මුදල්, මුදල් ඇමතිතුමාගේ හෝ අගමැතිතුමාගේ හෝ සල්ලි පණම් නොවෙයි. අප වියදම් කරන්නේ මහජනයාගේ සල්ලියි. විරුද්ධ පාර්ශ්වය බලයේ සිටි කාලයේදී නම් ඒ සල්ලි වෙන කාගේවත් ඒවා හැටියට සලකා ක්‍රියා කළා. එසේ නොවෙයි නම් සී. ඩබ්ලිව්. ඊ. එකේ හතරවරං යනවායැ? හොඳයි, සියයට 12ක පොළියක් අය කරනවා යයි කියමු. සමහර ප්‍රදේශවල අවුරුද්දකට තුන් වරක් වපුරන කුඹුරු තිබෙනවා. අවුරුද්දට දෙවරක් වපුරන කුඹුරු ඊට වැඩි ප්‍රමාණයක් තිබෙනවා. අවුරුද්දට එක් වරක් වපුරන කුඹුරු හුඟක්ම තිබෙනවා. අවුරුද්දකට කන්න තුනක් වැඩ කරන කුඹුරු තිබෙන ගොවියන් ණය මුදල් ගන්නේ මාස තුනක කාලයකටයි. ඉතින් අවුරුද්දට සියයට 12 පොළියක් ගෙවිය යුතු විට මාස තුනට ගෙවන්නට සිදු වන්නේ එයින් හතරෙන් පංගුවයි. රුපියල් සියයක ණයක් ගත්තොත් පොළිය වශයෙන් ගෙවන්නට සිදු වන්නේ රුපියල් තුනයි. [බාධා කිරීමක්] අවුරුද්දට පොළිය සියයට නවය නම් ගොවියා ගෙවිය යුතු පොළිය තවත් අඩු වෙනවා. පෝර ආදිය පහසු මිළට දෙන්නේ මේ විධියට මුදල් ලබා ගැනීමෙනුයි. වැඩි වන අස්වැන්නෙන් ස්වල්පයක් විකිණීමෙන් ගොවියන් තමන් ලබා ගත් ණය ආපසු ගෙවනවා. ඊළඟ කන්නය ආරම්භයේ දී නැවතත් ණය ලබාගෙන කන්නය අවසානයේදී පොළියත් සමග තමන් ගත් මුදල ගෙවනවා. සුළු කාලයකට සුළු මුදලක් පොළිය වශයෙන් ගෙවන්නට ගොවීන්ට සිදු වන බව ඇත්තයි. ඉතින් මේක අපරාධයක් ද? එහෙත් මෙය අපරාධයක් හැටියට පෙන්වන්නටයි, සමහරුන් උත්සාහ ගන්නේ. මේක අපරාධයක් ද? මා වී වැපිරීම අවුරුද්දකට වරක් පමණයි. ඒ පැසෙන්නට යන්නේ හය මාසයයි, නැත්නම්, වැඩිම වුණොත් හත් මාසයයි. හත් මාසෙන් වපුරන කුඹුරු වල අස්වැන්න වැඩියි. සමහර ඒවායෙහි වපුරන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නෙ මුතු සම්බ. ඒ වී වල මිළ වැඩියි. සාමාන්‍ය එච්. 4 වී බුසල රු. 12 නම්, මුතු සම්බ බුසල රු. 18 ක් 16 ක් වෙනවා. හත් මාසෙ වී වල ආදායම වැඩියි.

**ලීලාරත්න විජේසිංහ මයා.**
*(திரு. லீலாரத்ன விஜேசிங்ஹ)*
(Mr. Leelaratne Wijesinghe)
අඩුයි.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

තුන් මාසෙ වී වල අස්වැන්නට වඩා හත් මාසෙ වී වල අස්වැන්න වැඩියි. මාත් ගොවිරාළ කෙනෙක්. මා උපන්නෙත් හේනක් කොටන දවසක. ඒ නිසා වී ගැන මා හොඳට දන්නවා. හත් මාසෙ වී මාවී නැත්නම් මුතු සම්බ. සමහර පළාත් වල මුතු සම්බා වැවෙන්නෙ නෑ. ඒ පළාත් වලට වෙනත් මාවී වර්ග තිබෙනවා. මැද කොළඹ තුන්වනි ගරු මන්ත්‍රීතුමා (කෙනමන් මයා.) ගහ දන්නා අපට කොළ කඩා පාන්න හදනවා. එතුමා කුඹුරක් දැකල තියෙනවාද? පාරෙ යනකොට දකින්න ඇති. නැත්නම් ඔය කථාව කියන්නෙ නෑ. ඔන්න ඕකයි තත්ත්වය.

ඊළඟට අපේ ඉඩම් ප්‍රතිපත්තිය ගැන කථා කළ විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරු අප විසින් ධනපතියන්ට ඉඩම් දී තිබෙනවා යයි කිව්වා. ඇයි ඔක හැදුවෙ නැත්තෙ? ඉඩම් ඇමතිතුමා අවුරුදු 9ක්ම ඒ පැත්තෙත් සිටියානේ. එතුමා මේ පැත්තට ආවහම විතරයි ඒ ප්‍රතිපත්තිය නරක් වුණේ. ඒ ඇමතිතුමාට පින් සිදු වන්න අද අපට පාරෙ බැහැල යන්න පුළු වනි. නැත්නම් මෙවකට ඒකාධිපති රජ යක්. වැරදි ඇනී වන්නට පුළුවන් බව ඇත්ත. අවුරුදු 9ක් තිස්සේ පාලන අංශ යෙ විනය විනාශ කර තිබුණා. වාරිමාර්ග ක්‍රම කොහොමද හරියන්නෙ? සියලුම කේන්ද්‍රස්ථානවලට හිතවත්කමට පත් දම් කාරයින් යැවුවා. අපේ ආණ්ඩුව ආව හම සමහරුන් වැඩ නොකර අත්හැරියා. වාරිමාර්ග හදන සෑම තැන්වලම ඉන්න ඇමතිවරයාට පුළුවන් ද? හැබැයි, තව ටිකක් උන්දු වුණොත් හොඳයි. පාසලට එන ගුරුවරයා කවුද ? නො එන ගුරුවරයා කවුද යනාදිය හොයා බලන්න හැම ඉස් කෝලෙකම සිටින්න මට පුළුවන් ද?

"රාජකාරියකට පත් කරනු ලැබූ අය, ඒ රාජකාරිය මහජන සේවාවක්, අප පඩි ලබාගන්නෙ මහජනයාගෙන් අය කරගනු ලබන බදු මුදලින්, එවාට කඹුරන්නට හොඳ නැහැ, හතරවරං ගහන්න හොඳ නැහැ" යන හැඟීමෙන් වැඩ කිරීමේ යුතුකමක් ඒ අයට තිබෙනවා. ඒ කාලයේ දි වැඩ කළත් නොකළත් නැන ලැබුණේ පන්දම් කාරයන්ට නිසා, වැඩ නොකළ අයත් හිටියා. අප එක පන්දන්කාරයකු වත් කොතැනකටවත් දැන දැන යැවුවේ නෑ. [බාධා කිරීමක්] විසි තිස් දාහක් කරන විට බැරිවීමෙන් අතරින් පතර එහෙම දේවල් සිදු වන්නට ඇති. අපත් ඇට, මස්, ලෙයින් හැදුණු පෘථග්ජන මිනිස්සු. හිතවත් කමට වුවත් අප පත් කරන්නෙ වැඩය කළ හැකි අයයි. එහෙත්, එදා කෙරුනේ එහෙම නොවෙයි. එදා පත් වුණු බොහෝ දෙනා මෙදා වැඩ නොකර කඩාකප්පල්කාරී ව්‍යාපාරවල යෙදුණු බව ඇත්තක් ; ඒවා හොයන්න අපට අවුරුදු එක හමාරක් ගත වුණු බවත් ඇත්ත ; අගමැතිතුමා ඒවා සියැසින් බලන්න ගිය බවත් ඇත්ත ; ඒ යාමේ ප්‍රතිඵලයක් වශයෙන් මුළු ලංකාවෙම නව යුගයක් උදාවේගෙන එන බවත් එවාගේම ඇත්ත. විරුද්ධ පක්ෂයට ඒ ගැන බොහොම අමාරු ඇති. අගමැතිතුමා ඒව හොයන්න යන්නෙ මොකට දැයි දකුණු කොළඹ තුන් වැනි ගරු මන්ත්‍රීතුමා (කෙනමන් මයා.) අහනවා. ඇයි නරකද ගියාම? එයින් තව උනන්දුව ඇති වෙනවා නම් කොච්චර හොඳ ද?

විරුඬ පක්‍ෂයේ ගරු මන්ත්‍රීවරුන් තුළ රටට ආදරයක් තිබෙනවා නම්, ජාතිය ගැන කැක්කුමක් තිබෙනවා නම්, මේ රට ස්වයංපෝෂිත කිරීමේ අපේ ව්‍යාපාරයට තමුන්නාන්සේලාගෙ සම්පූර්ණ සහයෝගය ලැබිය යුතුයි. මේ රට අපේ. ඔබේත් මගේත්, තමුන්නාන්සෙලාගේත් රට, මෙය. අප කාගේත් රට මේක. මේ අපේ ජාතිය. තමුන්නාන්සෙලාගෙත් ජාතිය. හැමදාම, මිරිස් කරලට, හාල් අටේට, සීනි ටිකට, රෙදි යාරෙට, කරවල කෑල්ලට පිට රටවලට දත නියව නියවා ඉදීම හරි ද? තමුන්නාන්සේලා අපේ වීරෝදාර මුතුන් මිත්තන් ගැන කථා කරනවා. පරාක්‍රමබාහු රජ්ජුරුවන් හාල් පැටවු හැටි වේදිකාවේ කියනවා. පරාක්‍රමබාහු රජ්ජුරුවන් එහාට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඊරියගොල්ල]

කොපමණ හාල් පැටෙව්වත් මොකට ද අප එහෙන් මෙහාට පටවනවා නම්? නිකම් තේරුමක් නැතිව නූගත් මිනිසුන් උසිගන්වන්නට එපා. මහා පරාක්‍රමබාහු රජ්ජුරුවන්ගෙ කාලේදි අපේ මුතුන් මිත්තන් මහා සමුද්‍ර සමාන වැව් තැනෙව්වා, උඇල්ලෙනුයි, කුඩෙනුයි වැඩ කරලා. අතින් අහස උසට දාගැබ් බැන්දා. ඒවා කියලා ඇති වැඩේ මොකද තමුන්නාන්සේලා අපට මේ වැඩවලට සහයෝගය දෙන්නෙ නැත්නම්? තමුන්නාන්සේලා සහයෝගය අපට දෙනවා නම් පරාක්‍රමබාහු රජ්ජුරුවන් බැන්ද වූ වැව්වලට වඩා ලොකු වැව් අපි බන්දවන්නම්. අපට රටේ සහයෝගය ඕනෑ. රටේ නූගත් ජනයා මුළා කිරීමයි, කෙටවීමයි, තමුන්නාන්සේලාගෙ වැඩේ. ඒ නිසයි, මා මෙහෙම කියන්නෙ. [බාධා කිරීමක්].

තමුන්නාන්සේලා වෙන ඒවා නේ හැරුවෙ. වැව් හාරන්න එපායැ වතුර ගන්න. වෙන ඒවා හාරලා පුළුවන් යැ වතුර ගන්න. දැන් අපි වැව් හාරාගෙන යනවා. අපි වන්නියෙ මිනිස්සු. වන්නි පළාත්වල වැව් හාරාගෙන යනවා. සියල්ල කරන්ට එක පාරටම බැහැ නේ. අවුරුදු එකක් මේ රටේ තිබුණු අවුල් බේරන්න ගියා. තව අවුරුද්දක් ඒවා සකස් කරන්න ගියා. පිළිවෙළට වැඩ කරගෙන යනවා. දැන් ගැමියන් අපේ පැත්තෙ. ගම්වලට ගිහින් ගැමියන්ගෙ ශ්‍රමදාන ව්‍යාපාරවල හැටි බලන්න. එහේ නැහැ පක්ෂ භේද. බොහොම බය ඇති ඒ ගැන. අපේ අගමැතිතුමාගේ ව්‍යාපාරයට, අපේ කෘෂිකර්ම ඇමතිතුමාගෙ ව්‍යාපාරයට, පක්ෂ භේද නැහැ. අපේ ස්කෝලවලත් අද පක්ෂ භේද නැහැ. අපේ ගුරුවරුන් අතරෙත් පක්ෂ භේද නැහැ. මා දැන් ආඩම්බර වෙනවා, අපේ ගුරුවරුන් ගැන. ලෝකයේම නැහැ, අපේ ගුරු හමුදාව තරම් හොඳ ගුරු හමුදාවක්. ශ්‍රමදාන ව්‍යාපාරවලදී, ජූනි මාසයේදී තිබුනු වැඩ හුරු වීමේ ව්‍යාපාරයේදී, ඔවුන් බොහොම හොඳින් වැඩ කළා. මුළු ලංකාවේම ගුරුවරු ලක්ෂයක්, පාඨශාලා 9,000ක ශිෂ්‍යයන් 30,00,000ක් එකම පවුලක අය මෙන් වැඩ කළා. අපේ ගුරුවරුන් අපේ ළමයින්, ස්කෝලවල පමණක් කොයි තරම් වවා තිබෙනවාද කියා දන්නවාද? අක්කර 9,000ක් වවා තිබෙනවා, පාසල්වල පමණක්. ඒ ළමයින් මගින් ශාස්ත්‍රානුකූල ගොවිතැන දැන් ගම්වලට යනවා.

මා ගියා මගේ පෙදෙසේ පරණ වැවක් සකස් කරවන්න. ගමේ එක මිනිහෙක් වත් පක්ෂ භේදයක් ගැන සැලකුවේ නැහැ. හැම මිනිහාම ආවා. අපේ මිනිස්සු ප්‍රකෘතියෙන් හොඳයි. අපේ රට ලෝකයෙන්ම උතුම් රටය කියා මා හිතනව. අපේ ජාතියත් ප්‍රකෘතියෙන් ලෝකයෙන්ම උතුම් ජාතිය. නරක—කාලකණ්ණි, පක්ෂභජනය කරන, හැම එකකටම පක්ෂභජනය කරන, දුෂ්ට දේශපාලන නායකයොයි. නියම නායකත්වයක් ලැබුණොත් මේ රට ආසියා ලෝකයේ දිව්‍ය පුරයක් කරන්න පුළුවන්. ඒ තරමට පොළොව සරු සාරයි. තමුන්නාන්සේලා දන්නවා, අපේ පොළොවේ හැටි. වෙන රටවල තත්ත්වය ගැනත් මා දන්නවා. ආර්ථික තත්ත්වයෙන් දියුණුය කියන රටවල් ගණකට මා ගියා. බටහිර ජර්මනියට ගියා. ප්‍රංශයට ගියා. වාසනාවන්, ඒ ගමන්. මා ගියා එංගලන්තයටත්; මා ගියා ජපන් රටටත්. ඇමෙරිකාවටත් මා ගියා. එහෙත් ලංකාව තරම් ඒ එක රටක්වත් හොඳ නැහැ. ලෝකයෙන්ම උතුම් රට ලංකාවයි.

හැබැයි, ඒ රටවල මිනිස්සු වැඩ කරනවා. එහි විරුද්ධ පක්ෂයේ අය කියන්නේ නැහැ, "තොපි වැඩ කරන්ට එපා" කියා. මෝටර් ස්ට්‍රයික් කළොත් එන්ජින් ඇතුළට ඇමරි පවුඩර් දාපියව් කියා කියන්නෙ නෑ. එහෙම කියන්නෙ නැහැ. ඒකයි, වෙනස. එහි නායකත්ත්වය හොඳයි. මිනිසුන් උදේ පාන්දර පටන් වැඩ කරනවා. උස ලොම් මේස් ඇඳ ගෙන, අඩි සපත්තු ලාගෙන ලොම් කලිසම් ඇඳලා ලොම් සැට්ට ඇඳලා කරෙත් ලොම් පටියක් ඔතාගෙන වැඩ කරනවා, සීතලය නිසා. හැම අවුරුද්දකම හැම මාසයේම එහි වැඩ කරන්නට බැහැ. එහෙත් ඒ රටවල් ස්වයංපෝෂිතයි. 1948 දී එක මෝටර් බයිසිකලයක් හදන පැක්ටරියක්වත් නොතිබුණු බටහිර ජර්මනියෙ අද මුළු ලෝකයේම උසස් ඉන්ජිනේරුවන් සිටිනවා. ලක්ෂ ගණන් මෝටර් වාහන හදනවා. 1948 දී රැකී රක්ෂා නොමැති අයගේ සංඛ්‍යාව සියයට 75ක්ම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබුණු බටහිර ජර්මනියේ 1965 ඔක්තෝබර් මාසයේ මා යන විට රක්ෂා ඇබෑර්තු 6,000ක් තිබුණා. මිනිස්සු පන් කෝටියක් සිටිනවා. ඒත් රක්ෂාවලට වැඩිපුර මිනිසුන් පිටරටවලින් ගෙන්වනවා. ඉතාලියෙනුත්, ස්පාඤ්ඤයෙනුත් ගෙන්වනවා. ඒ තරමට දියුණු වුණේ වැඩ කරලයි. දේශපාලන මත අතින් බෙදුණු නායකත්ත්වය එකිනෙකාට විරුද්ධ වන්නට පුළුවනි. එහෙත් කවුරුත් රජය කළත් "තොපි හොර වැඩ කරපියව්, හෙමින් හෙමින් කරපියව්" යයි අනෙක් පක්ෂය කියන්නේ නැහැ.

මෙහෙ දොස්තරවරුනුත් හෙමින් කෙරුවනේ. එහෙ දොස්තරලා හෙමින් හෙමින් කරන්නෙ නැහැ. කොයිතරම් සමාජය නරක් වුණාද කියතොත් ජීවිතයත් මරණයත් තමන් අතට භාරව සිටින දොස්තරවරුනුත් හෙමින් හෙමින් කෙරුවනේ. නායකත්වයේ කොහේ හරි මක්බලිගෝෂල කෙනෙක් ඇති.

රාජා වෙලේගම මයා.
(திரு. ராஜா வெலேகம)
(Mr. Rajah Welegama)

අපේ රාජ්‍ය ඇමතිතුමාගෙ මල්ලි— [බාධා කිරීමක්]

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

මොන යකා හරි කවුරු වුණාම හොඳද වැඩේ? දැන් බලන්න, ලියුම් තෝරන මිනිස්සු මේ කරන්න ඇවිදපු එක. මොකක්ද මේකෙ තේරුම? අවුරුද්කට කී සැරයක් වැඩ වර්ජනය කරන වද?

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Are you coming to a new point?

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
The Hon. Iriyagolle)

Yes.

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

You can continue tomorrow.

එකල්හි වේලාව අ. භා. 8.30 වූයෙන් කටයුතු අත්සිටුවා විවාදය කල් තබන ලදී.

එතැන් සිට විවාදය 1967 ජූලි 18 වන අඟහරුවාද පවත්වනු ලැබේ.

நேரம் பி.ப. 8.30 மணியாகிவிடவே அலுவல் இடை நிறுத்தப்பட்டு விவாதம் ஒத்திவைக்கப்பெற்றது.

1967, ஜூலை 18, செவ்வாய்க்கிழமை விவாதம் மீள ஆரம்பமாகும்.

*It being 8.30 P.M. Business was interrupted, and the Debate stood adjourned.*

*Debate to be resumed on Tuesday, 18th July 1967.*

## අග්‍රාණ්ඩුකාර තුමාගෙන් ලත් සන්දේශය

## மகா தேசாதிபதியிடமிருந்து வந்த செய்தி

## MESSAGE FROM THE GOVERNOR-GENERAL

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

I have received the following Message from His Excellency the Governor-General :

" අග්‍රාණ්ඩුකාර කාර්යාලය

රජ වාසල, කොළඹ, ශ්‍රී ලංකාව.
1967 ජූලි 17

ගරු කථානායක,

1959 අංක 8 දරණ පනතින් සංශෝධනය කරනු ලැබූ (40 වෙනි අධිකාරය වන) මහාජන ආරක්ෂක ආඥාපනතේ 2 වෙනි වගන්තිය යටතේ 1967 ක්වූ ජූලි 17 වැනි දනමින් නිකුත් කරනු ලැබූ ප්‍රකාශනය මගින් ඉහත කී ආඥාපනතේ II වෙනි කොටසේ විධිවිධාන 1967 ජූලි 18 වැනි දින ක්‍රියාත්මක විය යුතු බව මවිසින් ප්‍රකාශ කරන ලදී.

ප්‍රකාශනය නිකුත් කිරීමට හේතුව මහාජන සාමය ආරක්ෂා කිරීම හා ජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය වූ සැපයීම් හා සේවාවන් පවත්වාගෙන යාම සඳහා වූ බව නියෝජිත මන්ත්‍රී මණ්ඩලය වෙත මම මෙයින් දනුම් දෙමි.

ඩබ්ලිව්. ගොපල්ලව.
අග්‍රාණ්ඩුකාරවරයා.

නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ
ගරු කථානායකතුමා. "

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

"மகா தேசாதிபதியின் கந்தோர்.

இராணி மாளிகை,
கொழும்பு,
இலங்கை,

1967 யூலை 17.

கௌரவ சபாநாயகர் அவர்களே,

1959 ஆம் ஆண்டின் 8 ஆம் இலக்கச் சட்டத்தினால் திருத்தப்பட்டபடியான (40 ஆம் அத்தியாயமான) பொது சனப் பாதுகாப்புக் கட்டளைச் சட்டத்தின் 2 ஆம் பிரிவின் கீழ் வெளியிடப்பட்ட 1967 யூலை 17 ஆம் திகதிப் பிரசித்தத்தின் மூலம் மேற் கூறப்பட்ட கட்டளைச் சட்டத்தின் II ஆம் பிரிவில் சொல்லப்பட்ட ஏற்பாடுகள் 1967 யூலை 18 ஆம் திகதி அமுலுக்கு வருமென்று நான் பிரகடனப்படுத்தி யிருக்கிறேன்.

இப் பிரசித்தத்தை வெளியிட்டதற்கு நியாயம், பொதுசன ஒழுங்கை நிலைநாட்டுவதற்கும் சமுதாயத்தின் சீவியத்திற்கு அத்தியாவசியமான வழங்குதல்களையும் சேவைகளையும் பாதுகாப்பதற்குமென்பதை இத்தால் பிரதிநிதிகள் சபைக்கு வெளிப்படுத்துகிறேன்.

டபிள்யூ. கொப்பல்லவ,
மகாதேசாதிபதி.

கௌரவ பிரதிநிதிகள் சபை சபாநாயகர் அவர்கட்கு."

"Governor-Generals' Office

Queens' House,
Colombo,
Ceylon.
17th July 1967.

MR. SPEAKER,

BY PROCLAMATION dated 17th July 1967, and issued under Section 2 of the Public Security Ordinance (Cap. 40), as amended by Act No. 8 of 1959, I have declared that the provisions of Part II of the aforesaid Ordinance shall come into operation on 18th July 1967.

I do hereby communicate to the House of Representatives that the reason for issuing the Proclamation is for the preservation of public order and for the maintenance of supplies and services essential to the life of the community.

W. GOPALLAWA,
Governor-General.

The Honourable,
the Speaker of the
House of Representatives."

## කල් තැබීම

## ஒத்திவைப்பு

## ADJOURNMENT

ප. ව. 8.31 ට නියෝජ්‍ය කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා මන්ත්‍රී මණ්ඩලය කල් තබන ලදී.

මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව, අද දින සභාසම්මතය අනුව, 1967 ජූලි 18 වන අඟහරුවාදා පූ. ව. 10 වන තෙක් කල් ගියේ ය.

பி.ப.8.31 மணிக்கு உப சபாநாயகர் வினா விடுக்காமலேயே சபையை ஒத்திவைத்தார்.

அதன்படி, சபை அதனது இன்றைய தீர்மானத்திற்கிணங்க 1967 ஜூலை 18, செவ்வாய்க்கிழமை மு. ப. 10 மணிவரை ஒத்திவைக்கப்பெற்றது.

*At 8.31 P.M.,* MR. DEPUTY SPEAKER *adjourned the House without Question put.*

*Adjourned accordingly until 10 A.M. on Tuesday, 18th July 1967, pursuant to the Resolution of the House this Day.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. **අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි.** මාස 6කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපැලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කලින් එවිය යුතුය.

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம்; தனிப்பிரதி சதம் 30, தபால்மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months. Each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1